පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා **http://pitaka.lk** වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# සංයුත්ත නිකාය

# 3

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

# අනුශාසක මණ්ඩලය

පෑලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ
මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනේ B.A., Ph.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ
කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ
පින්වත්තේ සද්ධර්මාකර පරිවෙණාධිපති ශ්‍රී විසුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පෝහද්දරමුල්ලේ ඤාණානන්දාභිධාන අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහා නායක ස්ථවිරයන්වහන්සේ
වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ
බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ
බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ
රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ
අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ
අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ
ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ
බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ
මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ
රන්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුධාලොක ස්ථවිරයන්වහන්සේ
මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ
පණ්ඩිත එච්. නන්දසාර මහතා
ආචාර්ය්‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

# සංයුක්ත නිකාය
# 3

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
## ඒ. පී. ද සොයිසා මහතා
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1954
දෙවැනි මුද්‍රණය - 2013

**ත්‍රිපිටකය**

**සංයුත්ත නිකාය 3**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මග පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගණේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2013 මාර්තු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ එකොළොස් වෙනිවූ මේ පොතට සංයුත්ත නිකායේ නිදාන වර්ගයේ සංයුත්ත අටක්ද, ඛන්දක වර්ගයේ සංයුත්තයක්ද අන්තර්ගත කළෙමි. මහ සඟි පහ අතුරෙන් මෙම නිකාය එක සඟියකි. පළමුවෙනි සඞ්ගායනාවේදී සංයුත්ත නිකාය භාරකරන ලද්දේ මහා කාශ්‍යප ශ්‍රාවක තෙරුන්වහන්සේට වේ. මේ නිකාය සගාථ වර්ගය, නිදාන වර්ගය, ඛන්ධක වර්ගය, සළායතන වර්ගය, මහා වර්ගයයි කොටස් පහකට බෙදා තිබේ. එහි ඇති සංයුත්ත පනස් හතරෙහි සූත්‍ර 7762 ක් වෙත්.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම්වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයඞ්රත්න ෆේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඞ්රත්න ෆේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, පින්වත්තේ සද්ධර්මාකර පිරිවෙනේ ආචාර්ය මණ්ඩලයද, තල්පාවිල රත්නසිරි ස්ථවිරයන් වහන්සේද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

4 - 11 - 54

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

# සංගායනාවෝ

භාරතයේ පැවැත්වූ ශාසනයේ පිරිසිදු බැව් අපෙක්ෂාවෙන් කළ ධර්මසංගායනා තුන සහ ලංකාවේ පැවැත්වූ ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමේ සංගායනාවද යන සංගායනාවෝ ප්‍රධාන වෙති. ධර්මය ලිවීම බුද්ධ කාලයේදී කෙරුණු බවට සාක්ෂ්‍ය තිබේ.

ප්‍රථම සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මසකට පසු 'අජාසත්' රජුගේ විශෙෂ අනුග්‍රහයෙන් රජගහනුවර 'සප්තපර්ණී'නම් ගල්ලෙනෙහිදී මහ කාශ්‍යප ස්ථවිරයන් ප්‍රධාන 500 ක් රහතුන් විසින් සත්මසකින් නිමකරණ ලදී.

දෙවෙනි සංගායනාව බුද්ධ පරිනිර්වාණයන් අවුරුදු 100 ක් ගතවූ පසු 'කාලාශොක' රජුගේ අනුග්‍රහයෙන් විශාලාමහනුවර වාළුකාරාමයේදී 'රේවත' ස්ථවිරයන් ප්‍රධාන 700 ක් රහතුන් විසින් අටමසකින් නිමවන ලදී.

තෙවෙනි සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු 236 ට පසු 'ධර්මාශොක' රජුගේ අනුග්‍රහයෙන් පැළලුප් නුවර අශොකාරාමයේදී 'මොග්ගලිපුත්ත' ස්ථවිරයන් ප්‍රධාන 1000 ක රහතුන් විසින් නවමසකින් නිමවන ලදී.

ධර්මය ග්‍රන්ථාරූඪ කිරීම පෙර සිට පැවති නමුත් ලංකාවේ ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමේ සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු 440 ක් ගතවූ පසු වලගම්බා රජුගේ අනුග්‍රහයෙන් මාතලේ අලුලෙනෙහිදී කරනලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන

පිට

2. නිදාන වර්ගය

2. ධාතු සංයුත්තය 857
    (3) කම්මපථ වර්ගය 857
    (4) චතුධාතු වර්ගය 879
3. අනමතග්ග සංයුත්තය 895
    (1) පළමුවෙනි වර්ගය 895
    (2) දෙවෙනි වර්ගය 909
4. කස්සප සංයුත්තය 922
5. ලාභ සත්කාර සංයුත්තය 985
    (1) පළමුවෙනි වර්ගය 985
    (2) දෙවෙනි වර්ගය 996
    (3) තුන්වෙනි වර්ගය 1005
    (4) හතරවෙනි වර්ගය 1015
6. රාහුල සංයුත්තය 1027
    (1) පළමුවෙනි වර්ගය 1027
    (2) දෙවෙනි වර්ගය 1051
7. ලක්ඛණ සංයුත්තය 1077
    (1) පළමුවෙනි වර්ගය 1077
    (2) දෙවෙනි වර්ගය 1098
8. ඕපම්ම සංයුත්තය 1121
9. භික්ඛු සංයුත්තය 1136

3. ඛන්ධක වර්ගය

1. ඛන්ධක සංයුත්තය
        මූලපණ්ණාසකය
    (1) නකුල පිතු වර්ගය 1154
    (2) අනිත්‍ය වර්ගය 1196

| | | |
|---|---|---|
| (3) | භාර වර්ගය | 1207 |
| (4) | නතුම්භාක වර්ගය | 1224 |
| (5) | අත්තදීප වර්ගය | 1241 |
| (6) | උපාය වර්ගය | 1262 |
| (7) | අරහන්ත වර්ගය | 1302 |

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංයුත්ත නිකාය.

# 2. නිදාන වර්ගය.

## 2. ධාතු සංයුත්තය.

## 3. කම්මපථ වර්ගය.

### 1. අසමාහිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි, කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අදහස් වශයෙන්, සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පව් කිරීමට බිය නැත්තෝ පව් කිරීමට බිය නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. එකඟ නොවූ සිත් ඇත්තෝ එකඟ නොවූ සිත් ඇත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. පව් කිරීමට බිය ඇත්තෝ පව් කිරීමට බිය ඇත්තන් හා සමග එක්වෙත්, සමගි වෙත්. එකඟවූ සිත් ඇත්තෝ එකඟවූ සිත් ඇත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක් වෙත්, සමගි වෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, අතීත කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වූහ, සමගි වූහ. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. පව් කිරීමට බිය නැත්තෝ පව් කිරීමට බිය නැත්තන් හා සමග එක්වූහ, සමගි වූහ. එකඟ නොවූ සිත් ඇත්තෝ එකඟ නොවූ සිත් ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. පව් කිරීමට බිය ඇත්තෝ පව් කිරීමට බිය ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ. එකඟවූ සිත් ඇත්තෝ එකඟවූ සිත් ඇත්තන් හා සමග එක්වූහ, සමගි වූහ. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද, සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය, සමගි වන්නාහුය. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. පව් කිරීමට බිය නැත්තෝ පව්කිරීමට බිය නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. එකඟ නොවූ සිත් නැත්තෝ එකඟ නොවූ සිත් නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. පව්කිරීමට බිය ඇත්තෝ පව් කිරීමට බිය ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. එකඟවූ සිත් ඇත්තෝ එකඟවූ සිත් ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය.

5. "මහණෙනි, වර්තමාන කාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පව් කිරීමට බිය නැත්තෝ පව් කිරීමට බිය නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. එකඟ නොවූ සිත් ඇත්තෝ එකඟ නොවූ සිත් ඇත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පව් කිරීමට බිය ඇත්තෝ පව් කිරීමට බිය ඇත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. එකඟවූ සිත් ඇත්තෝ එකඟවූ සිත් ඇත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්."

**(පළමුවෙනි අසමාහිත සූත්‍රය නිමි.)**

---

## 2. දුස්සීල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අදහස් වශයෙන්, සත්වයෝ එක්වෙත්, සමගි වෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පවට බිය නැත්තෝ පවට බිය නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. දුස්සීලයෝ දුස්සීලයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සීලවන්තයෝ සීලවන්තයින් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක්වෙත් සමගි වෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වූහ. සමගි වූහ. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. පවට බිය නැත්තෝ පවට බිය නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. දුස්සීලයෝ දුස්සීලයන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වූහ. සමගි වූහ. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක් වූහ, සමගි වූහ. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක් වූහ. සමගිවූහ. සීලවන්තයෝ සීලවන්තයින් හා සමග එක් වූහ. සමගිවූහ. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක්වූහ, සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. පවට බිය නැත්තෝ පවට බිය නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. දුස්සීලයෝ දුස්සීලයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වන්නාහුය සමගි වන්නාහුය. ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රඥා වන්තයෝ ප්‍රඥා වන්තයින් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

5 "මහණෙනි, දැන් වර්තමාන කාලයෙහිද සත්වයෝ අදහස් වශයෙන් එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ලජ්ජා නැත්තෝ ලජ්ජා නැත්තන් හා සමග එක් වෙත්. සමගිවෙත්. පවට බිය නැත්තෝ පවට බිය නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. දුස්සීලයෝ දුස්සීලයන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාව නැත්තෝ ප්‍රඥාව නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ශ්‍රද්ධාව ඇත්තෝ ශ්‍රද්ධාව ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ලජ්ජා ඇත්තෝ ලජ්ජා ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තන් හා සමග එක් වෙත්. සමගි වෙත්. සීලවන්තයෝ සීලවන්තයින් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රඥාව ඇත්තෝ ප්‍රඥාව ඇත්තන් හා සමග එක් වෙත්. සමගි වෙත්."

**(දෙවෙනි දුස්සීල සූත්‍රය නිමි.)**

---

## 3. පඤ්චසික්ඛාපද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනියි" කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගි වෙත්. ප්‍රාණඝාත කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක්වෙත්. සමගි වෙත්. හොරකම් කරන්නෝ හොරකම් කරන්නන් හා සමග එක්වෙත්. සමගි වෙත්. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වෙත්, සමගි වෙත්. බොරු කියන්නෝ බොරු කියන්නන් හා සමග එක්වෙත්, සමගි වෙත්. මදයට හා ප්‍රමාදයට කරුණුවූ,

රහමෙර පානය කරන්නෝ, මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කරන්නන් හා සමග එක්වෙත්, සමගි වෙත්. ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. හොරකමින් වෙන්වූවෝ හොරකමින් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කිරීමෙන් වෙන්වූවෝ මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වූහ, සමගි වූහ. (කෙසේද?) ප්‍රාණඝාත කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක්වූහ, සමගි වූහ. සොරකම් කරන්නෝ හොරකම් කරන්නන් හා සමග එක්වූහ, සමගි වූහ. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වූහ, සමගි වූහ. බොරු කියන්නෝ බොරු කියන්නන් හා සමග එක් වූහ, සමගි වූහ. මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කරන්නෝ, මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කරන්නන් හා සමග එක්වූහ, සමගි වූහ. ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වූහ, සමගි වූහ. හොරකමින් වෙන්වූවෝ හොරකමින් වෙන්වූවන් හා සමග එක්වූහ, සමගි වූහ. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ, සමගි වූහ. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ, සමගි වූහ. මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කිරීමෙන් වෙන්වූවෝ, මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ, සමගි වූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වන්නාහුය, සමගි වන්නාහුය. (කෙසේද?)

ප්‍රාණඝාත කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක් වන්නාහුය, සමගි වන්නාහුය. හොරකම් කරන්නෝ හොරකම් කරන්නන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. බොරු කියන්නෝ බොරු කියන්නන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කරන්නෝ, මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කරන්නන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. හොරකමින් වෙන්වූවෝ හොරකමින් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කිරීමෙන් වෙන්වූවෝ, මදයට හා ප්‍රමාදයට හා කරුණුවූ, රහමෙර පානය කිරීමෙන් වෙන්වූවන් හා සමග එක් වන්නාහුය, සමගි වන්නාහුය.

5. "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්, සමගි වෙත්. (කෙසේද?) ප්‍රාණඝාත කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක්වෙත්, සමගි වෙත්. හොරකම් කරන්නෝ හොරකම් කරන්නන් හා සමග එක්වෙත්, සමගි වෙත්. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වෙත්, සමගි වෙත්. බොරු කියන්නෝ බොරු කියන්නන් හා සමග එක්වෙත්, සමගි වෙත්. මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කරන්නෝ, මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කරන්නන් හා සමග එක්වෙත්, සමගි වෙත්. ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. හොරකමින් වෙන්වූවෝ හොරකමින් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. කාමයන්හි වරදවා හැසිරීමෙන්

වෙන්වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක් වෙත්, සමගි වෙත්. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කිරීමෙන් වෙන්වූවෝ, මදයට හා ප්‍රමාදයට කරුණුවූ, රහමෙර පානය කිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්.”

(තුන්වෙනි පඤ්චසික්ඛාපද සූත්‍රය නිමි.)

---

## 4. සත්තකම්මපථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ “මහණෙනි”යි කියා භික්ෂූන් ඇමතූහ. “ස්වාමීනි”යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) ප්‍රාණඝාත කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. හොරකම් කරන්නෝ හොරකම් කරන්නන් හා සමග එක්වෙත්. සමගි වෙත්. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. බොරු කියන්නෝ බොරු කියන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. කේලාම් කියන්නෝ කේලාම් කියන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ඵරුෂ වචන කියන්නෝ ඵරුෂ වචන කියන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රලාප කියන්නෝ ප්‍රලාප කියන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගිවෙත්. හොරකමින් වෙන්වූවෝ හොරකමින් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවෝ

කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගිවෙත්. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගිවෙත්. කේලාම් කීමෙන් වෙන්වූවෝ කේලාම් කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ඵරුෂ වචන කීමෙන් වෙන්වූවෝ ඵරුෂ වචන කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රලාප කීමෙන් වෙන්වූවෝ ප්‍රලාප කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක් වූහ. සමගි වූහ. (කෙසේද?) ප්‍රාණඝාත කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක්වූහ, සමගි වූහ. හොරකම් කරන්නෝ හොරකම් කරන්නන් හා සමග එක්වූහ, සමගිවූහ. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වූහ, සමගි වූහ. බොරු කියන්නෝ බොරු කියන්නන් හා සමග එක්වූහ. සමගිවූහ. කේලාම් කියන්නෝ කේලාම් කියන්නන් හා සමග එක්වූහ. සමගිවූහ. ඵරුෂ වචන කියන්නෝ ඵරුෂ වචන කියන්නන් හා සමග සමගිවූහ. ප්‍රලාප කියන්නෝ ප්‍රලාප කියන්නන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වූහ, සමගිවූහ. හොරකමින් වෙන්වූවෝ හොරකමින් වෙන්වූවන් හා සමග එක්වූහ. සමගිවූහ. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ. සමගිවූහ. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ, සමගිවූහ. කේලාම් කීමෙන් වෙන්වූවෝ කේලාම් කීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ. සමගිවූහ. ඵරුෂ වචන කීමෙන් වෙන්වූවෝ ඵරුෂ වචන කීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රලාප කීමෙන් වෙන්වූවෝ ප්‍රලාප කීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ. සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වන්නාහුය. සමගිවන්නාහුය. (කෙසේද?) ප්‍රාණඝාත

කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක් වන්නාහුය, සමගිවන්නාහුය. හොරකම් කරන්නෝ හොර කරන්නන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. බොරු කියන්නෝ බොරු කියන්නන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. කේලාම් කියන්නෝ කේලාම් කියන්නන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ඵරුෂ වචන කියන්නෝ ඵරුෂ වචන කියන්නන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රලාප කියන්නෝ ප්‍රලාප කියන්නන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. හොරකමින් වෙන්වූවෝ හොරකමින් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය, සමගිවන්නාහුය. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. කේලාම් කීමෙන් වෙන්වූවෝ කේලාම් කීමෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ඵරුෂ වචන කීමෙන් වෙන්වූවෝ ඵරුෂ වචන කීමෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. ප්‍රලාප කීමෙන් වෙන්වූවෝ ප්‍රලාප කීමෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය.

5. "මහණෙනි, දැන් වර්තමාන කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) ප්‍රාණඝාත කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. හොරකම් කරන්නෝ හොරකම් කරන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වෙත්. සමගි වෙත්. බොරු කියන්නෝ බොරු කියන්නන් හා සමග එක්වෙත්. සමගි වෙත් කේලාම් කියන්නෝ කේලාම් කියන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ඵරුෂ වචන කියන්නෝ ඵරුෂ වචන කියන්නන්

හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රලාප කියන්නෝ ප්‍රලාප කියන්නන් හා සමග එක් වෙත්. සමගිවෙත්. ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. හොරකමින් වෙන්වූවෝ හොරකමින් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගිවෙත්. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. කේලාම් කීමෙන් වෙන්වූවෝ කේලාම් කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ඵරුෂ වචන කීමෙන් වෙන්වූවෝ ඵරුෂ වචන කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගි වෙත්. ප්‍රලාප කීමෙන් වෙන්වූවෝ ප්‍රලාප කීමෙන් වෙන් වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

**(හතරවෙනි සත්තකම්මපථ සූත්‍රය නිමි.)**

---

## 5. දසකම්මපථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. ප්‍රාණඝාත කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක්වෙත් සමගි වෙත්. හොරකම් කරන්නෝ හොරකම් කරන්නන් හා සමග එක්වෙත්, සමගිවෙත්. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වෙත්, සමගිවෙත්. බොරු කියන්නෝ බොරු කියන්නන් හා සමග එක්වෙත්, සමගි වෙත්. කේලාම් කියන්නෝ කේලාම්

කියන්නන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ඵරුෂ වචන කියන්නෝ ඵරුෂ වචන කියන්නන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රලාප කියන්නෝ ප්‍රලාප කියන්නන් හා සමග එක්වෙත්, සමගිවෙත්. දැඩි ලෝභය බහුලකොට ඇත්තෝ දැඩි ලෝභය බහුලකොට ඇත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. අනුන් නැසෙත්වායි සිතන්නෝ අනුන් නැසෙත්වායි සිතන්නන් හා සමග එක්වෙත්, සමගිවෙත්. මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. හොරකමින් වෙන්වූවෝ හොරකමින් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. කේලාම් කීමෙන් වෙන්වූවෝ කේලාම් කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ඵරුෂ වචන කීමෙන් වෙන්වූවෝ ඵරුෂ වචන කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගිවෙත්. ප්‍රලාප කීමෙන් වෙන්වූවෝ ප්‍රලාප කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගි වෙත්. දැඩි ලෝභය බහුලකොට නැත්තෝ දැඩි ලෝභය බහුලව නැත්තන් හා සමග එක්වෙත්, සමගිවෙත්. අනුන් නැසෙත්වායි නොසිතන්නෝ අනුන් නැසෙත්වායි නොසිතන්නන් හා සමග එක්වෙත්, සමගිවෙත්. සම්‍යක් දෘෂ්ටිකයෝ සම්‍යක් දෘෂ්ටිකයින් හා සමග එක්වෙත්, සමගිවෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වූහ. සමගිවූහ. (කෙසේද?) ප්‍රාණඝාත කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක්වූහ, සමගිවූහ. හොරකම් කරන්නෝ හොරකම් කරන්නන් හා සමග එක්වූහ. සමගිවූහ. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වූහ, සමගිවූහ. බොරු කියන්නෝ බොරු කියන්නන් හා සමග එක්වූහ. සමගිවූහ. කේලාම් කියන්නෝ කේලාම් කියන්නන් හා සමග එක්වූහ. සමගිවූහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඵරුෂ වචන කියන්නෝ ඵරුෂ වචන කියන්නන් හා සමග එක්වූහ. සමගි වූහ. ප්‍රලාප කියන්නෝ ප්‍රලාප කියන්නන් හා සමග එක්වූහ. සමගිවූහ. දැඩි ලෝභය බහුලකොට ඇත්තෝ දැඩි ලෝභය බහුල කොට ඇත්තන් හා සමග එක්වූහ සමගිවූහ. අනුන් නැසෙත්වායි සිතන්නෝ අනුන් නැසෙත්වායි සිතන්නන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වූහ. සමගිවූහ. හොරකමින් වෙන්වූවෝ සොරකමින් වෙන්වූවන් හා සමග එක්වූහ, සමගි වූහ. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ. සමගිවූහ. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන් වූවන් හා සමග එක්වූහ, සමගිවූහ. කේලාම් කීමෙන් වෙන් වූවෝ කේලාම්කීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ. සමගිවූහ. ඵරුෂ වචන කීමෙන් වෙන්වූවෝ ඵරුෂ වචන කීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ. සමගිවූහ. ප්‍රලාප කීමෙන් වෙන්වූවෝ ප්‍රලාප කීමෙන් වෙන්වූවන් හා සමග එක්වූහ. සමගිවූහ. දැඩිලෝභය බහුලකොට නැත්තෝ දැඩිලෝභය බහුලකොට නැත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. අනුන් නැසෙත්වායි නොසිතන්නෝ අනුන් නැසෙත්වායි නොසිතන්නන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක්දෘෂ්ටිකයෝ සම්‍යක්දෘෂ්ටිකයන් හා සමග එක්වූහ. සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වන්නාහුය. සමගිවන්නාහුය. (කෙසේද?) ප්‍රාණඝාත කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක්වන්නාහුය, සමගිවන්නාහුය. හොරකම් කරන්නෝ හොරකම් කරන්නන් හා සමග එක්වන්නාහුය, සමගිවන්නාහුය. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. බොරුකියන්නෝ බොරුකියන්නන් හා සමග එක්වන්නාහුය, සමගිවන්නාහුය. කේලාම් කියන්නෝ කේලාම් කියන්නන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. ඵරුෂ වචන කියන්නෝ

එරුෂවචන කියන්නන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රලාප කියන්නෝ ප්‍රලාප කියන්නන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. දැඩි ලෝභය බහුලකොට ඇත්තෝ දැඩි ලෝභය බහුලකොට ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. අනුන් නැසෙත්වායි සිතන්නෝ අනුන් නැසෙත්වායි සිතන්නන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. ප්‍රාණඝාතයෙන් වෙන්වූවෝ ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. හොරකමින් වෙන්වූවෝ හොරකමින් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය, සමගි වන්නාහුය. කේලාම් කීමෙන් වෙන්වූවෝ කේලාම් කීමෙන් වෙන්වූවන් හා සමග එක් වන්නාහුය. සමගි වන්නාහුය. එරුෂ වචන කීමෙන් වෙන්වූවෝ එරුෂ වචන කීමෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. ප්‍රලාප කීමෙන් වෙන්වූවෝ ප්‍රලාප කීමෙන් වෙන්වූවන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. දැඩි ලෝභය බහුලකොට නැත්තෝ දැඩි ලෝභය බහුලකොට නැත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. අනුන් නැසෙත්වායි සිතන්නෝ අනුන් නැසෙත්වායි සිතන්නන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. සම්‍යක්දෘෂ්ටිකයෝ සම්‍යක් දෘෂ්ටිකයන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය.

5. "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) ප්‍රාණඝාත කරන්නෝ ප්‍රාණඝාත කරන්නන් හා සමග එක්වෙත්, සමගිවෙත්. හොරකම් කරන්නෝ හොරකම් කරන්නන් හා සමග එක්වෙත්, සමගිවෙත්. කාමයන්හි වරදවා හැසිරෙන්නෝ කාමයන්හි වරදවා හැසිරෙන්නන් හා සමග එක්වෙත් සමගිවෙත්. බොරු කියන්නෝ බොරු කියන්නන් හා සමග එක්වෙත්, සමගිවෙත්. කේලාම්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කියන්නෝ කේලාම් කියන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ඵරුෂ වචන කියන්නෝ ඵරුෂ වචන කියන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රලාප කියන්නෝ ප්‍රලාප කියන්නන් හා සමග එක්වෙත්. සමගි වෙත්. දැඩි ලෝභය බහුලකොට ඇත්තෝ දැඩි ලෝභය බහුලකොට ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. අනුන් නැසෙත්වායි සිතන්නෝ අනුන් නැසෙත්වායි සිතන්නන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් ප්‍රාණඝාතයෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගිවෙත් හොරකමින් වෙන්වූවෝ හොරකමින් වෙන්වූවන් හා සමග එක්වෙත්, සමගිවෙත්. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවෝ කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. බොරු කීමෙන් වෙන්වූවෝ බොරු කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. කේලාම් කීමෙන් වෙන්වූවෝ කේලාම් කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත් සමගිවෙත්. ඵරුෂවචන කීමෙන් වෙන්වූවෝ ඵරුෂ වචන කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත් සමගිවෙත්. ප්‍රලාප කීමෙන් වෙන්වූවෝ ප්‍රලාප කීමෙන් වෙන්වූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. දැඩිලෝභය බහුල කොට නැත්තෝ දැඩිලෝභය බහුලකොට නැත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. අනුන් නැසෙත්වායි සිතන්නෝ අනුන් නැසෙත්වායි සිතන්නන් හා සමග එක්වෙත්. සමගි වෙත්. සම්‍යක්දෘෂ්ටිකයෝ සම්‍යක්දෘෂ්ටිකයන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

**(පස්වෙනි දසකම්මපථය සූත්‍රය නිමි.)**

---

## 6. අට්ඨඞ්ගික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී

භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා සංකල්පනා ඇත්තෝ මිථ්‍යා සංකල්පනා ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. මිථ්‍යා වචන ඇත්තෝ මිථ්‍යා වචන ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා කර්මාන්ත ඇත්තෝ මිථ්‍යා කර්මාන්ත ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා ආජීව ඇත්තෝ මිථ්‍යා ආජීව ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා ව්‍යායාම ඇත්තෝ මිථ්‍යා ව්‍යායාම ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා සිහිය ඇත්තෝ මිථ්‍යා සිහිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා සමාධිය ඇත්තෝ මිථ්‍යා සමාධිය ඇත්තන් හා සමග එක් වෙත්. සමගිවෙත්. සම්‍යක් දෘෂ්ටිකයෝ සම්‍යක් දෘෂ්ටිකයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් සංකල්පනා ඇත්තෝ සම්‍යක් සංකල්පනා ඇත්තන් හා සමග එක්වෙති. සමගිවෙත්. සම්‍යක් වචන ඇත්තෝ සම්‍යක් වචන ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් කර්මාන්ත ඇත්තෝ සම්‍යක් කර්මාන්ත ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් ආජීවයෙන් යුක්තවූවෝ සම්‍යක් ආජීවයෙන් යුක්තවූවන් හා සමග එක්වෙත්. සමගි වෙත්. සම්‍යක් ව්‍යායාමයෙන් යුක්තවූවෝ සම්‍යක් ව්‍යායාමයෙන් යුක්තවූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් සිහිය ඇත්තෝ සම්‍යක් සිහිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. සම්‍යක් සමාධිය ඇත්තෝ සම්‍යක් සමාධිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්.

3. "මහණෙනි, අතීත කාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ එක්වූහ. සමගිවූහ. (කෙසේද?) මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා සංකල්පනා ඇත්තෝ මිථ්‍යා සංකල්පනා ඇත්තන් හා සමග එක්වූහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සමගිවූහ. මිථ්‍යා වචන ඇත්තෝ මිථ්‍යා වචන ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා කර්මාන්ත ඇත්තෝ මිථ්‍යා කර්මාන්ත ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා ආජීව ඇත්තෝ මිථ්‍යා ආජීව ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා ව්‍යායාම ඇත්තෝ මිථ්‍යා ව්‍යායාම ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා සිහිය ඇත්තෝ මිථ්‍යා සිහිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා සමාධිය ඇත්තෝ මිථ්‍යා සමාධිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් දෘෂ්ටිකයෝ සම්‍යක් දෘෂ්ටිකයන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් සංකල්පනා ඇත්තෝ සම්‍යක් සංකල්පනා ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් වචන ඇත්තෝ සම්‍යක් වචන ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් කර්මාන්ත ඇත්තෝ සම්‍යක් කර්මාන්ත ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් ආජීවයෙන් යුක්තවූවෝ සම්‍යක් ආජීවයෙන් යුක්තවූවන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් ව්‍යායාමයෙන් යුක්තවූවෝ සම්‍යක් ව්‍යායාමයෙන් යුක්තවූවන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් සිහිය ඇත්තෝ සම්‍යක් සිහිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් සමාධිය ඇත්තෝ සම්‍යක් සමාධිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ.

4. "මහණෙනි, අනාගත කාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ එක්වන්නාහුය. සමගිවන්නාහුය. (කෙසේද?) මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා සංකල්පනා ඇත්තෝ මිථ්‍යා සංකල්පනා ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා වචන ඇත්තෝ මිථ්‍යා වචන ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා කර්මාන්ත ඇත්තෝ මිථ්‍යා කර්මාන්ත ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා ආජීව ඇත්තෝ මිථ්‍යා ආජීව ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා ව්‍යායාම ඇත්තෝ මිථ්‍යා ව්‍යායාම ඇත්තන් හා සමග එක් වන්නාහුය. සමගිවන්නාහුය. මිථ්‍යා සිහිය ඇත්තෝ මිථ්‍යා සිහිය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා සමාධිය ඇත්තෝ මිථ්‍යා සමාධිය

ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් දෘෂ්ටිකයෝ සම්‍යක් දෘෂ්ටිකයන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. සම්‍යක් සංකල්පනා ඇත්තෝ සම්‍යක් සංකල්පනා ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය සම්‍යක් වචන ඇත්තෝ සම්‍යක් වචන ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් කර්මාන්ත ඇත්තෝ සම්‍යක් කර්මාන්ත ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් ආජීවයෙන් යුක්තවූවෝ සම්‍යක් ආජීවයෙන් යුක්තවූවන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් ව්‍යායාමයෙන් යුක්තවූවෝ සම්‍යක් ව්‍යායාමයෙන් යුක්තවූවන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් සිහිය ඇත්තෝ සම්‍යක් සිහිය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් සමාධිය ඇත්තෝ සම්‍යක් සමාධිය ඇත්තන් හා සමඟ එක්වන්නාහුය. සමගි වන්නාහුය.

**5.** මහණෙනි, දැන් වර්තමාන කාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා සංකල්පනා ඇත්තෝ මිථ්‍යා සංකල්පනා ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා වචන ඇත්තෝ මිථ්‍යා වචන ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා කර්මාන්ත ඇත්තෝ මිථ්‍යා කර්මාන්ත ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා ආජීව ඇත්තෝ මිථ්‍යා ආජීව ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා ව්‍යායාම ඇත්තෝ මිථ්‍යා ව්‍යායාම ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා සිහිය ඇත්තෝ මිථ්‍යා සිහිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා සමාධිය ඇත්තෝ මිථ්‍යා සමාධිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් දෘෂ්ටිකයෝ සම්‍යක් දෘෂ්ටිකයන් හා සමග එක්වෙත්. සමගි වෙත්. සම්‍යක් සංකල්පනා ඇත්තෝ සම්‍යක් සංකල්පනා ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් වචන ඇත්තෝ සම්‍යක් වචන ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් කර්මාන්ත ඇත්තෝ සම්‍යක් කර්මාන්ත ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක්

ආජීවයෙන් යුක්තවූවෝ සම්‍යක් ආජීවයෙන් යුක්තවූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් ව්‍යායාමයෙන් යුක්තවූවෝ සම්‍යක් ව්‍යායාමයෙන් යුක්තවූවන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් සිහිය ඇත්තෝ සම්‍යක් සිහිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් සමාධිය ඇත්තෝ සම්‍යක් සමාධිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

**(හයවෙනි අට්ඨඞ්ගික සූත්‍රය නිමි.)**

---

## 7. දසඞ්ග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි, වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, අදහස් වශයෙන් සත්වයෝ එක්වෙත්. සමගිවෙත්. (කෙසේද?) මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යාසංකල්පනා ඇත්තෝ මිථ්‍යාසංකල්පනා ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යාවචන ඇත්තෝ මිථ්‍යාවචන ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යාකර්මාන්ත ඇත්තෝ මිථ්‍යාකර්මාන්ත ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. මිථ්‍යා ආජීව ඇත්තෝ මිථ්‍යා ආජීව ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා ව්‍යායාම ඇත්තෝ මිථ්‍යා ව්‍යායාම ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා සිහිය ඇත්තෝ මිථ්‍යා සිහිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා සමාධිය ඇත්තෝ මිථ්‍යා සමාධිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා ඥානය ඇත්තෝ මිථ්‍යා ඥානය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා විමුක්තිය ඇත්තෝ මිථ්‍යා විමුක්තිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "සම්‍යක් දෘෂ්ටිකයෝ සම්‍යක් දෘෂ්ටිකයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් සංකල්පනා ඇත්තෝ සම්‍යක් සංකල්පනා ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් වචන ඇත්තෝ සම්‍යක් වචන ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් කර්මාන්ත ඇත්තෝ සම්‍යක් කර්මාන්ත ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. සම්‍යක් ආජීව ඇත්තෝ සම්‍යක් ආජීව ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් ව්‍යායාම ඇත්තෝ සම්‍යක් ව්‍යායාම ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් සිහිය ඇත්තෝ සම්‍යක් සිහිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් සමාධිය ඇත්තෝ සම්‍යක් සමාධිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් ඥානය ඇත්තෝ සම්‍යක් ඥානය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් විමුක්තිය ඇත්තෝ සම්‍යක් විමුක්තිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

4. "මහණෙනි, අතීත කාලයෙහිද අදහස් වශයෙන් සත්වයෝ එක්වූහ. සමගිවූහ. (කෙසේද?) මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා සංකල්පනා ඇත්තෝ මිථ්‍යා සංකල්පනා ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා වචන ඇත්තෝ මිථ්‍යා වචන ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා කර්මාන්ත ඇත්තෝ මිථ්‍යා කර්මාන්ත ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා ආජීව ඇත්තෝ මිථ්‍යා ආජීව ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා ව්‍යායාම ඇත්තෝ මිථ්‍යා ව්‍යායාම ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා සිහිය ඇත්තෝ මිථ්‍යා සිහිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා සමාධිය ඇත්තෝ මිථ්‍යා සමාධිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා ඥානය ඇත්තෝ මිථ්‍යා ඥානය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. මිථ්‍යා විමුක්තිය ඇත්තෝ මිථ්‍යා විමුක්තිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ.

5. "සම්‍යක් දෘෂ්ටිකයෝ සම්‍යක් දෘෂ්ටිකයන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් සංකල්පනා ඇත්තෝ සම්‍යක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

සංකල්පනා ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් වචන ඇත්තෝ සම්‍යක් වචන ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් කර්මාන්ත ඇත්තෝ සම්‍යක් කර්මාන්ත ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් ආජීව ඇත්තෝ සම්‍යක් ආජීව ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් ව්‍යායාම ඇත්තෝ සම්‍යක් ව්‍යායාම ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් සිහිය ඇත්තෝ සම්‍යක් සිහිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් සමාධිය ඇත්තෝ සම්‍යක් සමාධිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් ඥානය ඇත්තෝ සම්‍යක් ඥානය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ. සම්‍යක් විමුක්තිය ඇත්තෝ සම්‍යක් විමුක්තිය ඇත්තන් හා සමග එක්වූහ. සමගිවූහ.

**6.** "මහණෙනි අනාගත කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක් වන්නාහුය. සමගි වන්නාහුය. (කෙසේද?) මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා සංකල්පනා ඇත්තෝ මිථ්‍යා සංකල්පනා ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා වචන ඇත්තෝ මිථ්‍යාවචන ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා කර්මාන්ත ඇත්තෝ මිථ්‍යා කර්මාන්ත ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා ආජීව ඇත්තෝ මිථ්‍යා ආජීව ඇත්තන් හා සමග එක් වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා ව්‍යායාම ඇත්තෝ මිථ්‍යා ව්‍යායාම ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා සිහිය ඇත්තෝ මිථ්‍යා සිහිය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා සමාධිය ඇත්තෝ මිථ්‍යා සමාධිය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා ඥානය ඇත්තෝ මිථ්‍යා ඥානය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. මිථ්‍යා විමුක්තිය ඇත්තෝ මිථ්‍යා විමුක්තිය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

**7.** "සම්‍යක් දෘෂ්ටිකයෝ සම්‍යක් දෘෂ්ටිකයන් හා සමග එක් වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් සංකල්පනා ඇත්තෝ

සම්‍යක් සංකල්පනා ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. සම්‍යක් කර්මාන්ත ඇත්තෝ සම්‍යක් කර්මාන්ත ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගිවන්නාහුය. සම්‍යක් ආජීව ඇත්තෝ සම්‍යක් ආජීව ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් ව්‍යායාම ඇත්තෝ සම්‍යක් ව්‍යායාම ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් සිහිය ඇත්තෝ සම්‍යක් සිහිය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් සමාධිය ඇත්තෝ සම්‍යක් සමාධිය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් ඥානය ඇත්තෝ සම්‍යක් ඥානය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය. සම්‍යක් විමුක්තිය ඇත්තෝ සම්‍යක් විමුක්තිය ඇත්තන් හා සමග එක්වන්නාහුය. සමගි වන්නාහුය.

8. "මහණෙනි, දැන්, වර්තමාන කාලයෙහිද, අදහස් වශයෙන් සත්වයෝ එක් වෙත්. සමගි වෙත්. (කෙසේද?) මිථ්‍යාදෘෂ්ටිකයෝ මිථ්‍යාදෘෂ්ටිකයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා සංකල්පනා ඇත්තෝ මිථ්‍යා සංකල්පනා ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා වචන ඇත්තෝ මිථ්‍යා වචන ඇත්තන් හා සමග එක්වෙත්. සමගි වෙත්. මිථ්‍යා කර්මාන්ත ඇත්තෝ මිථ්‍යා කර්මාන්ත ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා ආජීව ඇත්තෝ මිථ්‍යා ආජීව ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා ව්‍යායාම ඇත්තෝ මිථ්‍යා ව්‍යායාම ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා සිහිය ඇත්තෝ මිථ්‍යා සිහිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා සමාධිය ඇත්තෝ මිථ්‍යා සමාධිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා ඥානය ඇත්තෝ මිථ්‍යා ඥානය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. මිථ්‍යා විමුක්තිය ඇත්තෝ මිථ්‍යා විමුක්තිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

9. "සම්‍යක් දෘෂ්ටිකයෝ සම්‍යක් දෘෂ්ටිකයන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් සංකල්පනා ඇත්තෝ සම්‍යක්

සංකල්පනා ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් වචන ඇත්තෝ සම්‍යක් වචන ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් කර්මාන්ත ඇත්තෝ සම්‍යක් කර්මාන්ත ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් ආජීව ඇත්තෝ සම්‍යක් ආජීව ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් ව්‍යායාම ඇත්තෝ සම්‍යක් ව්‍යායාම ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් සිහිය ඇත්තෝ සම්‍යක් සිහිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් සමාධිය ඇත්තෝ සම්‍යක් සමාධිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් ඥානය ඇත්තෝ සම්‍යක් ඥානය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්. සම්‍යක් විමුක්තිය ඇත්තෝ සම්‍යක් විමුක්තිය ඇත්තන් හා සමග එක්වෙත්. සමගිවෙත්.

(හත්වෙනි දසඞ්ග සූත්‍රය නිමි.)

---

(අසමාහිත සූත්‍රයද, දුස්සීල සූත්‍රයද, පඤ්චසික්ඛාපද සූත්‍රයද, සත්තකම්මපථ සූත්‍රයද, දසකම්මපථ සූත්‍රයද, සවනුව කියන ලද අට්ඨඞ්ගික සූත්‍රයද, සත්වන දසඞ්ග සූත්‍රයදැයි මේ වර්ගයෙහි සූත්‍ර සතකි.

තුන්වෙනි කම්මපථ වර්ගය නිමි.

---

# 4. චතු ධාතු වර්ගය.

## 1. චතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි, වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

"මහණෙනි, මේ ධාතු සතරකි. ඒ සතර කවරේද? එය පඨවි ධාතුව, ආපෝ ධාතුව, තේජෝ ධාතුව සහ වායෝ ධාතුවයි. මහණෙනි, මොවුහු වනාහි සතර ධාතූහු වෙති."

(පළමුවෙනි චතු සූත්‍රය නිමි.)

---

## 2. පුබ්බ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි, වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, බුද්ධත්වයට පෙරම, බුදු නොවූ බෝසත්වූම මට මේ අදහස ඇතිවිය.

"පඨවි ධාතුවේ අස්සාදය (රස විඳීම) කවරේද? ආදීනව (දෝෂ) කවරේද? නිස්සරණය (නිදහස්වීම) කවරේද?

"ආපෝ ධාතුවේ අස්සාදය කවරේද? ආදීනව කවරේද? නිස්සරණය කවරේද?

"තේජෝ ධාතුවේ අස්සාදය කවරේද? ආදීනව කවරේද? නිස්සරණය කවරේද?

"වායෝ ධාතුවේ අස්සාදය කවරේද? ආදීනව කවරේද? නිස්සරණය කවරේද?

3. "මහණෙනි, ඒ මට මේ සිත ඇති විය. පඨවි ධාතුව නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මෙය පඨවි ධාතුවේ අස්සාදයයි. පඨවි ධාතුවේ යම් අනිත්‍ය බවක්, දුක් බවක්, පෙරලෙන ස්වභාවයක් වේද, මෙය පඨවි ධාතුවේ ආදීනවයයි. පඨවි ධාතුවේ යම් ඡන්දරාගය දුරු කිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වේද, මෙය පඨවි ධාතුවේ නිස්සරණයයි.

4. "ආපෝ ධාතුව නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මෙය ආපෝ ධාතුවේ අස්සාදයයි. ආපෝ ධාතුවේ යම් අනිත්‍ය බවක්, දුක් බවක්, පෙරලෙන ස්වභාවයක් වේද, මෙය ආපෝ ධාතුවේ ආදීනවයයි. පඨවි ධාතුවේ යම් ඡන්දරාගය දුරු කිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වේද, මෙය ආපෝ ධාතුවේ නිස්සරණයයි.

5. "තේජෝ ධාතුව නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මෙය තේජෝ ධාතුවේ අස්සාදයයි. තේජෝ ධාතුවේ යම් අනිත්‍ය බවක්, දුක් බවක්, පෙරලෙන ස්වභාවයක් වේද, මෙය තේජෝ ධාතුවේ ආදීනවයයි. තේජෝ ධාතුවේ යම් ඡන්දරාගය දුරු කිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වේද, මෙය තේජෝ ධාතුවේ නිස්සරණයයි.

6. "වායෝ ධාතුව නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මෙය වායෝ ධාතුවේ අස්සාදයයි. වායෝ ධාතුවේ යම් අනිත්‍ය බවක්, දුක් බවක්, පෙරලෙන ස්වභාවයක් වේද, මෙය වායෝ ධාතුවේ ආදීනවයයි. වායෝ ධාතුවේ යම් ඡන්දරාගය දුරු කිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වේද, මෙය වායෝ ධාතුවේ නිස්සරණයයි.

7. "මහණෙනි, මම යම්තාක් කල් මේ සතර ධාතුන්ගේ මෙසේ අස්සාදය, අස්සාදය වශයෙන්ද, ආදීනවය, ආදීනවය වශයෙන්ද, නිස්සරණය, නිස්සරණය වශයෙන්ද, ඇති පරිදි නොදත්තෝද, මහණෙනි, ඒ තාක් මම දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත, ප්‍රජාව සහිත ලෝකයෙහි අතිඋතුම් සම්‍යක් සම්බොධියට නොපැමිණියෙමියයි දැන නොගත්තෙමි.

8. "මහණෙනි, යම් තැනක පටන් මම මේ සතර ධාතුන්ගේ මෙසේ අස්සාදය අස්සාදය වශයෙන්ද, ආදීනවය ආදීනවය වශයෙන්ද, නිස්සරණය නිස්සරණය වශයෙන්ද, ඇතිසේ දැන ගත්තෙම්ද. මහණෙනි, ඉක්බිති, මම දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, මහණ බමුණන් සහිත, ප්‍රජාව සහිත, ලෝකයෙහි අතිඋතුම් සම්‍යක් සම්බොධියට පැමිණියෙමියයි

දැනගත්තෙමි. මාහට ප්‍රත්‍යවෙක්ෂා ඥානයෙන් දැකීමද, පහළවිය. 'මාගේ අර්හත්ඵල සමාධිය කම්පා නොකළ හැකිය යන ඥානය පහළවිය. මේ අන්තිම ජාතියයි. දැන් නැවත ඉපදීමක් නැත්තේය."

**(දෙවෙනි පුබ්බ සූත්‍රය නිමි.)**

---

## 3. අචරි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි, වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මම පඨවි ධාතුවේ අස්සාදය (රසවිඳීම) සෙවීමෙහි හැසුරුනෙමි. පඨවි ධාතුවේ යම් අස්සාදයක්වීද, එය අවබෝධ කෙළෙමි. යම්තාක් පඨවි ධාතුවේ අස්සාදයක් වේද, මාගේ ප්‍රඥාවෙන් එය දක්නාලදී. මහණෙනි, මම පඨවි ධාතුවේ ආදීනව (දෝෂ) සෙවීමෙහි හැසුරුනෙමි. පඨවි ධාතුවේ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් පඨවි ධාතුවේ ආදීනවයක් වේද, (ඒ තාක්) මාගේ ප්‍රඥාවෙන් එය දැනගන්නා ලදී. මහණෙනි, මම පඨවි ධාතුවේ නිස්සරණය (නිදහස්වීම) සෙවීමෙහි හැසුරුනෙමි. පඨවි ධාතුවේ යම් නිස්සරණයක් වීද, එය අවබොධ කෙළෙමි. යම් තාක් පඨවි ධාතුවේ නිස්සරණයක් වේද, මාගේ ප්‍රඥාවෙන් එය දැන ගන්නා ලදී.

3 'මහණෙනි, මම ආපෝ ධාතුවේ අස්සාදය සෙවීමෙහි හැසුරුනෙමි. ආපෝ ධාතුවේ යම් අස්සාදයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ආපෝධාතුවේ අස්සාදයක් වීද, (ඒතාක්) මාගේ ප්‍රඥාවෙන් එය දක්නාලදී. මහණෙනි, මම ආපෝ ධාතුවේ ආදීනව සෙවීමෙහි හැසුරුනෙමි. ආපෝ ධාතුවේ

යම් ආදීනවයක් වේද, එය අවබෝධ කෙළෙමි. යම්තාක් ආපෝ ධාතුවේ ආදීනවයක් වේද, (ඒතාක්) මාගේ ප්‍රඥාවෙන් එය දැනගන්නාලදී. මහණෙනි, මම ආපෝ ධාතුවේ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි. ආපෝ ධාතුවේ යම් නිස්සරණයක්වීද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ආපෝ ධාතුවේ යම් නිස්සරණයක් වේද, (ඒතාක්) මාගේ ප්‍රඥාවෙන් එය දැනගන්නාලදී.

4. "මහණෙනි, මම තේජෝ ධාතුවේ අස්සාදය සෙවීමෙහි හැසුරුනෙමි. තේජෝ ධාතුවෙහි යම් අස්සාදයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් තේජෝ ධාතුවේ අස්සාදයක් වීද, (ඒතාක්) මාගේ ප්‍රඥාවෙන් එය දක්නාලදී. මහණෙනි, මම තේජෝ ධාතුවේ ආදීනව සෙවීමෙහි හැසුරුනෙමි. තේජෝ ධාතුවේ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් තේජෝ ධාතුවේ ආදීනවයක් වේද, (ඒතාක්) මාගේ ප්‍රඥාවෙන් එය දැනගන්නාලදී. මහණෙනි, මම තේජෝ ධාතුවේ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි. තේජෝධාතුවේ යම් නිස්සරණයක් වීද, එය අවබොධ කෙළෙමි. යම්තාක් තේජෝ ධාතුවේ නිස්සරණයක් වේද, (ඒතාක්) මාගේ ප්‍රඥාවෙන් එය දැනගන්නාලදී.

5. "මහණෙනි, මම වායෝ ධාතුවේ අස්සාදය සෙවීමෙහි හැසුරුනෙමි. වායෝ ධාතුවේ යම් අස්සාදයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් වායෝ ධාතුවේ අස්සාදයක් වීද, (ඒතාක්) මාගේ ප්‍රඥාවෙන් එය දක්නාලදී. මහණෙනි, මම වායෝ ධාතුවේ ආදීනව සෙවීමෙහි හැසුරුනෙමි. වායෝ ධාතුවේ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් වායෝ ධාතුවේ ආදීනවයක් වේද, (ඒතාක්) මාගේ ප්‍රඥාවෙන් එය දැනගන්නාලදී. මහණෙනි, මම වායෝ ධාතුවේ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි. වායෝ ධාතුවේ යම් නිස්සරණයක් වීද, එය අවබෝධ කෙළෙමි. යම්තාක් වායෝ ධාතුවේ නිස්සරණයක් වේද, (ඒතාක්) මාගේ ප්‍රඥාවෙන් එය දැනගන්නාලදී.

6. "මහණෙනි, මම යම්තාක් කල් මේ සතර ධාතූන්ගේ අස්සාදය අස්සාදය වශයෙන්ද, ආදීනව ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණය වශයෙන්ද, ඇතිසේ දැන නොගත්තෙම්ද, මහණෙනි, ඒතාක් මම දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, මහණ බමුණන් සහිත, දෙව්මිනිසුන් සහිත, ප්‍රජාව සහිත, ලෝකයෙහි අතිඋතුම් සම්‍යක් සම්බෝධියට නොපැමිණියෙම්යයි දැනනොගත්තෙමි. මහණෙනි, යම් තැනක පටන් මම මේ සතර ධාතූන්ගේ අස්සාදය අස්සාදය වශයෙන්ද, ආදීනව ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණය වශයෙන්ද, ඇතිසේ දැනගත්තෙම්ද, මහණෙනි, ඉක්බිති, මම දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, මහණ බමුණන් සහිත, ප්‍රජාව සහිත, ලෝකයෙහි අතිඋතුම් සම්‍යක් සම්බෝධියට පැමිණියෙම්යයි දැනගත්තෙමි. මාහට ප්‍රත්‍යවෙක්ෂා ඥානයෙන් දැකීම්ද පහළවිය. මාගේ අර්හත්ඵල සමාධිය කම්පා නොකළ හැකිය යන ඥානය පහළවිය. මේ අන්තිම ජාතියයි. දැන් නැවත ඉපදීමක් නැත්තේය."

(තුන්වෙනි අචරි සූත්‍රය නිමි.)

## 4. නොවෙදං සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ඉදින් මේ පඨවි ධාතුවෙහි අස්සාදයක් (රස විඳීමක්) නැත්තේ නම් සත්වයෝ මේ පඨවි ධාතුවෙහි නො ඇලෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි පඨවි ධාතුවෙහි අස්සාදයක් ඇත්තේ වේද, එනිසා සත්වයෝ පඨවි ධාතුවෙහි ඇලෙති. මහණෙනි, ඉදින් මේ පඨවි ධාතුවෙහි

ආදීනවයක් (දෝෂයක්) නැත්තේ නම් මේ සත්වයෝ පඨවි ධාතුවෙහි නොකලකිරෙන්නාහුය මහණෙනි, යම් හෙයකින් වනාහි පඨවි ධාතුවෙහි ආදීනවයක් ඇත්තේ වේද, එනිසා සත්වයෝ පඨවි ධාතුවෙහි කලකිරෙති. මහණෙනි, ඉදින් මේ පඨවි ධාතුවෙහි නිස්සරණයක් (නිදහස්වීමක්) නොවූයේ නම් සත්වයෝ පඨවි ධාතුවෙන් නික්ම නොයන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි පඨවි ධාතුවෙහි නිස්සරණය ඇත්තේ වේද, එනිසා සත්වයෝ පඨවි ධාතුවෙන් නික්ම යෙති.

3. "මහණෙනි, ඉදින් මේ ආපෝ ධාතුවෙහි අස්සාදයක් නොවූයේ නම් සත්වයෝ මේ ආපෝ ධාතුවෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි ආපෝ ධාතුවෙහි අස්සාදයක් ඇත්තේ වේද, එනිසා සත්වයෝ ආපෝ ධාතුවෙහි ඇලෙති. මහණෙනි, ඉදින් මේ ආපෝ ධාතුවෙහි ආදීනව නොවූයේ නම් මේ සත්වයෝ ආපෝ ධාතුවෙහි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි ආපෝ ධාතුවෙහි ආදීනව ඇත්තේ වේද, එනිසා සත්වයෝ ආපෝ ධාතුවෙහි කලකිරෙති. මහණෙනි, ඉදින් මේ ආපෝ ධාතුවෙහි නිස්සරණයක් නොවූයේ නම් සත්වයෝ මේ ආපෝ ධාතුවෙන් නිදහස් නොවෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි ආපෝ ධාතුවෙහි නිස්සරණයක් ඇත්තේ වේද එනිසා සත්වයෝ ආපෝ ධාතුවෙන් නිදහස් වෙති.

4. "මහණෙනි, ඉදින් මේ තේජෝ ධාතුවෙහි අස්සාදයක් නොවූයේ නම් සත්වයෝ මේ තේජෝ ධාතුවෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි තේජෝ ධාතුවෙහි අස්සාදයක් ඇත්තේ වේද, එනිසා සත්වයෝ තේජෝ ධාතුවෙහි ඇලෙති. මහණෙනි, ඉදින් මේ තේජෝ ධාතුවෙහි ආදීනව නොවූයේ නම් මේ සත්වයෝ තේජෝ ධාතුවෙහි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි තේජෝ ධාතුවේ ආදීනව ඇත්තේ වේද, එනිසා සත්වයෝ තේජෝ ධාතුවෙහි කලකිරෙයි. මහණෙනි, ඉදින් තේජෝ ධාතුවෙහි නිස්සරණයක් නොවූයේ නම් සත්වයෝ මේ තේජෝ ධාතුවෙන් නිදහස් නොවන්නාහුය. මහණෙනි, යම් හෙයකින්

වනාහි තේජෝ ධාතුවෙහි නිස්සරණයක් ඇත්තේ වේද, එනිසා සත්වයෝ තේජෝ ධාතුවෙන් නිදහස් වෙති.

**5.** "මහණෙනි, ඉදින් මේ වායෝ ධාතුවෙහි අස්සාදයක් නොවූයේ නම් සත්වයෝ මේ වායෝ ධාතුවෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි වායෝ ධාතුවෙහි අස්සාදයක් ඇත්තේ වේද, එනිසා සත්වයෝ වායෝධාතුවෙහි ඇලෙති. මහණෙනි, ඉදින් මේ වායෝ ධාතුවෙහි ආදීනව නොවූයේ නම් මේ සත්වයෝ වායෝ ධාතුවෙහි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි වායෝ ධාතුවේ ආදීනව ඇත්තේ වේද, එනිසා සත්වයෝ වායෝ ධාතුවෙහි කලකිරෙති. මහණෙනි, ඉදින් මේ වායෝ ධාතුවෙහි නිස්සරණයක් නොවූයේ නම් සත්වයෝ මේ වායෝ ධාතුවෙන් නිදහස් නොවන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි වායෝ ධාතුවෙහි නිස්සරණයක් ඇත්තේ වේද, එනිසා සත්වයෝ වායෝ ධාතුවෙන් නිදහස් වෙති.

**6.** "මහණෙනි, යම්තාක් කල් සත්වයෝ මේ සතර ධාතූන්ගේ අස්සාදය අස්සාදය වශයෙන්ද, ආදීනවය ආදීනවය වශයෙන්ද, නිස්සරණය නිස්සරණය වශයෙන්ද, ඇතිසේ නොදත්තාහුවෙත්ද, මහණෙනි, ඒතාක් මේ සත්වයෝ දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, මහණ බමුණන් සහිත, ප්‍රජාව සහිත, ලෝකයෙන් බැහැර වූවාහු, වෙන් වූවාහු, මිදුනාහු, සීමා නොකරනලද සිතින් යුක්තව වාසය නොකළාහුය. මහණෙනි, යම් කලක සිට වනාහි සත්වයෝ මේ සතර ධාතූන්ගේ අස්සාදය අස්සාදය වශයෙන්ද, ආදීනව ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණය වශයෙන්ද, ඇතිසේ දත්තාහු වෙත්ද, මහණෙනි, එකල්හි සත්වයෝ දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, මහණ බමුණන් සහිත, ප්‍රජාවෙන් යුත් ලෝකයෙන් බැහැර වූවාහු, වෙන් වූවාහු, මිදුනාහු, සීමා නොකරනලද සිතින් යුක්තව වාසය කෙරෙති."

**(සතරවෙනි නෝවේදං සූත්‍රය නිමි.)**

## 5. දුක්ඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ පඨවි ඒකාන්තයෙන් දුක් වූවක්, දුකින් පෙළුණක්, දුකට බැසගන්නා ලද්දක්, සැපයෙන් බැස නොගන්නා ලද්දක් වීනම් සත්වයෝ මේ පඨවි ධාතුවෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි පඨවි ධාතුව සැප වූවක්, සැපයෙන් යුක්ත වූවක්, සැපයෙන් බැස ගන්නා ලද්දක්, දුකින් බැස නොගන්නා ලද්දක් වූයේ නම් මේ සත්වයෝ පඨවි ධාතුවෙහි ඇලෙත්.

3. "මහණෙනි, මේ ආපෝ ධාතුවද වනාහි ඒකාන්තයෙන් දුක් වූවක්, දුකින් යුක්ත වූවක්, දුකින් බැසගන්නා ලද්දක්, සැපයෙන් බැස නොගන්නා ලද්දක් නම් සත්වයෝ මේ ආපෝධාතුවෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් වනාහි ආපෝ ධාතුව සැප වූවක්, සැපයෙන් යුක්ත වූවක්, සැපයෙන් බැසගන්නා ලද්දක්, දුකින් බැස නොගන්නා ලද්දක් වේද, එනිසා සත්වයෝ ආපෝ ධාතුවෙහි ඇලෙත්.

4. "මහණෙනි, මේ තේජෝ ධාතුවද වනාහි ඒකාන්තයෙන් දුක් වූවක්, දුකින් යුක්ත වූවක්, දුකින් බැස ගන්නා ලද්දක්, සැපයෙන් බැස නොගන්නා ලද්දක් නම් සත්වයෝ මේ තේජෝ ධාතුවෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි තේජෝධාතුව සැපවූවක්, සැපයෙන් යුක්තවූවක්, සැපයෙන් බැසගන්නාලද්දක් දුකින් බැසනොගන්නා ලද්දක් වේද, එනිසා සත්වයෝ තේජෝ ධාතුවෙහි ඇලෙත්.

5. "මහණෙනි, මේ වායෝ ධාතුවද වනාහි ඒකාන්තයෙන් දුක් වූවක්, දුකින් යුක්තවූවක්, දුකින් බැසගන්නා ලද්දක්,

සැපයෙන් බැස නොගන්නා ලද්දක් නම් සත්වයෝ මේ වායෝ ධාතුවෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි වායෝ ධාතුව සැප වූවක්, සැපයෙන් යුක්තවූවක්, සැපයෙන් බැසගන්නා ලද්දක්, දුකින් බැස නොගන්නා ලද්දක් වේද, එනිසා සත්වයෝ වායෝ ධාතුවෙහි ඇලෙත්.

**6** "මහණෙනි, මේ පඨවි ධාතුවද ඒකාන්තයෙන් සැප වූවක්, සැපයෙන් යුක්තවූවක්, සැපයෙන් බැසගන්නා ලද්දක්, දුකින් බැස නොගන්නා ලද්දක් වූයේ නම් සත්වයෝ මේ පඨවි ධාතුවෙහි නො කලකිරෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි පඨවි ධාතුව දුක්වූවක්, දුකින් යුක්ත වූවක්, දුකින් බැසගන්නා ලද්දක්, සැපයෙන් බැස නොගන්නා ලද්දක් වේද, එනිසා සත්වයෝ පඨවි ධාතුවෙහි කලකිරෙත්.

**7.** 'මහණෙනි, මේ ආපෝ ධාතුවද වනාහි ඒකාන්තයෙන් සැපවූවක්, සැපයෙන් යුක්තවූවක්, සැපයෙන් බැස ගන්නා ලද්දක්, දුකින් බැස නොගන්නා ලද්දක් නම් සත්වයෝ මේ ආපෝ ධාතුවෙහි නො කලකිරෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි ආපෝ ධාතුව දුක් වූවක්, දුකින් යුක්ත වූවක්, දුකින් බැස ගන්නා ලද්දක්, සැපයෙන් බැස නොගන්නා ලද්දක් වේද, එනිසා සත්වයෝ ආපෝ ධාතුවෙහි කලකිරෙත්.

**8.** "මහණෙනි, මේ තේජෝධාතුවද වනාහි ඒකාන්තයෙන් සැපවූවක්, සැපයෙන් යුක්තවූවක්, සැපයෙන් බැසගන්නා ලද්දක්, දුකින් බැසනොගන්නා ලද්දක් නම් සත්වයෝ මේ තේජෝ ධාතුවෙහි නො කලකිරෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි තේජෝ ධාතුව දුක්වූවක්, දුකින් යුක්ත වූවක්, දුකින් බැස ගන්නා ලද්දක්, සැපයෙන් බැස නොගන්නා ලද්දක් වේද, එනිසා සත්වයෝ තේජෝ ධාතුවෙහි කලකිරෙත්.

**9.** "මහණෙනි, මේ වායෝධාතුවද වනාහි ඒකාන්තයෙන් සැපවූවක්, සැපයෙන් යුක්තවූවක් සැපයෙන් බැසගන්නා ලද්දක්, දුකින් බැස නොගන්නා ලද්දක් නම් සත්වයෝ මේ වායෝ ධාතුවෙහි නො කලකිරෙන්නාහුය මහණෙනි, යම් හෙයකින් වනාහි වායෝ ධාතුව දුක් වූවක්, දුකින් යුක්ත වූවක්, දුකින්

බැසගන්නා ලද්දක්, සැපයෙන් බැස නොගන්නා ලද්දක් වේද, එනිසා සත්වයෝ වායෝ ධාතුවෙහි කලකිරෙත්.”

**(පස්වෙනි දුක්ඛ සූත්‍රය නිමි.)**

---

## 6. අභිනන්දන සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**2.** “මහණෙනි, යමෙක් පඨවි ධාතුවට සතුටු වෙයිද, හෙතෙම දුකට සතුටු වෙයි. යමෙක් දුකට සතුටු වෙයිද, හෙතෙම දුකින් නොමිදුනේයයි කියමි.

**3.** “යමෙක් අපෝ ධාතුවට සතුටුවෙයිද, හෙතෙම දුකට සතුටු වෙයි. යමෙක් දුකට සතුටු වෙයිද, හෙතෙම දුකින් නොමිදුනේයයි කියමි.

**4.** “යමෙක් තේජෝ ධාතුවට සතුටු වෙයිද, හෙතෙම දුකට සතුටු වෙයි. යමෙක් දුකට සතුටු වෙයිද, හෙතෙම දුකින් නොමිදුනේයයි කියමි.

**5.** “යමෙක් වායෝ ධාතුවට කැමති වෙයිද, හෙතෙම දුකට සතුටු වෙයි. යමෙක් දුකට සතුටු වෙයිද, හෙතෙම දුකින් නොමිදුනේයයි කියමි.”

**6.** “මහණෙනි, යමෙක් පඨවි ධාතුවට සතුටු නොවෙයිද, හෙතෙම දුකට සතුටු නොවෙයි. යමෙක් දුකට සතුටු නොවෙයිද, හෙතෙම දුකින් මිදුනේයයි කියමි.

**7.** “මහණෙනි, යමෙක් ආපෝ ධාතුවට සතුටු නොවෙයිද, හෙතෙම දුකට සතුටු නොවෙයි. යමෙක් දුකට සතුටු නොවෙයිද, හෙතෙම දුකින් මිදුනේයයි කියමි.

8. "මහණෙනි, යමෙක් තේජෝ ධාතුවට සතුටු නොවෙයිද, හෙතෙම දුකට සතුටු නොවෙයි. යමෙක් දුකට සතුටු නොවෙයිද, හෙතෙම දුකින් මිදුනේයයි කියමි.

9. "මහණෙනි, යමෙක් වායෝ ධාතුවට සතුටු නොවෙයිද, හෙතෙම දුකට සතුටු නොවෙයි. යමෙක් දුකට සතුටු නොවෙයිද, හෙතෙම දුකින් මිදුනේයයි කියමි.

**(හයවෙනි අභිනන්දන සූත්‍රය නිමි.)**

---

## 7. උප්පාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසයකරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, පඨවි ධාතුවෙහි යම් හටගැන්මක්, සිටීමක්, ඉපදීමක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීමයි. රෝගයන්ගේ සිටීමයි. ජරාමරණයාගේ පහළවීමයි.

3. "ආපෝ ධාතුවෙහි යම් හටගැන්මක්, සිටීමක්, ඉපදීමක්, පහළවීමක් වේද, මෙය දුක්ඛයාගේ ඉපදීමයි. රෝගයන්ගේ සිටීමයි. ජරාමරණයාගේ පහළවීමයි.

4. "තේජෝ ධාතුවෙහි යම් හටගැන්මක්, සිටීමක්, ඉපදීමක්, පහළවීමක් වේද, මෙය දුක්ඛයාගේ ඉපදීමයි. රෝගයන්ගේ සිටීමයි. ජරාමරණයාගේ පහළවීමයි.

5. "වායෝ ධාතුවෙහි යම් හටගැන්මක්, සිටීමක්, ඉපදීමක්, පහළවීමක් වේද, මෙය දුක්ඛයාගේ ඉපදීමයි. රෝගයන්ගේ සිටීමයි. ජරාමරණයාගේ පහළවීමයි.

**6.** "මහණෙනි, පඨවි ධාතුවෙහි වනාහි යම් නැතිවීමක් (නිරොධයක්), සංසිඳීමක්, විනාශවීමක් වේද, මෙයද දුක්ඛයාගේ නැතිවීමයි. (නිරොධයයි.) රෝගයන්ගේ සංසිඳීමයි. ජරාමරණයාගේ විනාශයයි.

**7.** "ආපෝ ධාතුවෙහි යම් නැතිවීමක් (නිරොධයක්), සංසිඳීමක්, විනාශවීමක් වේද, මෙයද දුක්ඛයාගේ නැතිවීමයි. (නිරොධයයි.) රෝගයන්ගේ සංසිඳීමයි. ජරාමරණයාගේ විනාශයයි.

8. "තේජෝ ධාතුවෙහි යම් නැතිවීමක් (නිරොධයක්), සංසිඳීමක්, විනාශවීමක් වේද, මෙයද දුක්ඛයාගේ නැතිවීමයි. (නිරොධයයි.) රෝගයන්ගේ සංසිඳීමයි. ජරාමරණයාගේ විනාශයයි.

**9.** "වායෝ ධාතුවෙහි යම් නැතිවීමක් (නිරොධයක්), සංසිඳීමක්, විනාශවීමක් වේද, මෙයද දුක්ඛයාගේ නැතිවීමයි. (නිරොධයයි.) රෝගයන්ගේ සංසිඳීමයි. ජරාමරණයාගේ විනාශයයි."

**(හත්වෙනි උප්පාද සූත්‍රය නිමි.)**

---

## 8. සමණ බ්‍රාහ්මණ සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**2.** "මහණෙනි, මේ ධාතු සතරදෙනෙකි. (ඒ) සතර කවරේද? පඨවිධාතුව, ආපෝධාතුව, තේජෝධාතුව සහ වායෝධාතුවයි. මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ සතරධාතුන්ගේ අස්සාදයද, ආදීනවද, නිස්සරණයද, ඇතිසේ නොදනිත්ද, මහණෙනි, මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ

ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය හෝ බ්‍රාහ්මණාර්ථය හෝ මේ ආත්මයෙහිදීම තෙමේ දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකෙරෙත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ සතර ධාතූන්ගේ අස්සාදයද, ආදීනවද, නිස්සරණයද ඇතිසේ දනිත්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණාර්ථය හෝ බ්‍රාහ්මණාර්ථය හෝ මේ ආත්මයෙහිදීම තෙමේ දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කෙරෙත්."

**(අටවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය නිමි.)**

---

## 9. සමණ බ්‍රාහ්මණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි, කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ ධාතු සතර දෙනෙකි. (ඒ) සතර දෙන කවරේද? පඨවිධාතුව, ආපෝධාතුව, තේජෝධාතුව සහ වායෝ ධාතුවයි. මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ සතර ධාතූන්ගේ ඇතිවීමද, නැතිවීමද, අස්සාදයද, ආදීනවයද, නිස්සරණයද ඇතිසේ නොදනිත්ද," "මහණෙනි, මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද නොවෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණ භාවයේ ඵලය හෝ බ්‍රාහ්මණ භාවයේ ඵලය හෝ මේ ආත්ම භාවයෙහිදීම තෙමේ දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකෙරෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ සතර ධාතූන්ගේ අස්සාදයද, ආදීනවද, නිස්සරණයද ඇතිසේ දනිත්ද, මහණෙනි, යම් මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණ භාවයේ ඵලය හෝ බ්‍රාහ්මණ භාවයේ ඵලය හෝ මේ ආත්මයෙහිදීම තෙමේ දැන, ප්‍රත්‍යක්ෂ කොට, ඊට පැමිණ, වාසය කෙරෙති."

**(නවවෙනි සමණ බ්‍රාහ්මණ සූත්‍රය නිමි.)**

---

## 10. සමණ බ්‍රාහ්මණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි, කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ පඨවි ධාතුව නොදනිත්ද, පඨවිධාතුව ඇතිවීමේ හේතුව නොදනිත්ද, පඨවිධාතුවේ නැතිවීම නොදනිත්ද, පඨවි ධාතුව නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදනිත්ද, ආපෝධාතුව නොදනිත්ද, ආපෝධාතුව ඇතිවීමට හේතුව නොදනිත්ද, ආපෝධාතුවේ නැතිවීම නොදනිත්ද, ආපෝධාතුව නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය නොදනිත්ද, තේජෝ ධාතුව නොදනිත්ද, තේජෝධාතුව ඇතිවීමට හේතුව නොදනිත්ද, තේජෝධාතුවේ නැතිවීම නොදනිත්ද, තේජෝ ධාතුව නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය නොදනිත්ද, වායෝ ධාතුව නොදනිත්ද, වායෝධාතුව ඇතිවීමට හේතුව නොදනිත්ද, වායෝධාතුවේ නැතිවීම නොදනිත්ද, වායෝධාතුව නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය නොදනිත්ද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද නොවෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණ භාවයේ ඵලය හෝ බ්‍රාහ්මණ භාවයේ ඵලය හෝ මේ ආත්ම භාවයෙහිදීම තෙමේ දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය නොකෙරෙත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ පඨවි ධාතුව දනිත්ද, පඨවි ධාතුව දනිත්ද, පඨවි ධාතුව ඇතිවීමේ හේතුව දනිත්ද පඨවිධාතුවේ නැතිවීම දනිත්ද, පඨවිධාතුව නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය දනිත්ද, ආපෝධාතුව දනිත්ද, ආපෝධාතුව ඇතිවීමට හේතුව දනිත්ද, ආපෝධාතුවේ නැති වීම දනිත්ද ආපෝධාතුව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය දනිත්ද, තේජෝධාතුව දනිත්ද, තේජෝධාතුව ඇතිවීමට හේතුව දනිත්ද, තේජෝධාතුවේ නැතිවීම දනිත්ද, තේජෝ ධාතුව නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය දනිත්ද, වායෝ ධාතුව දනිත්ද, වායෝධාතුව ඇතිවීමට හේතුව දනිත්ද, වායෝධාතුවේ නැතිවීම දනිත්ද, වායෝධාතුව නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය දනිත්ද,

4. "මහණෙනි, මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණභාවයේ ඵලය හෝ බ්‍රාහ්මණ භාවයේ ඵලය හෝ මේ ආත්මභාවයෙහිදීම තෙමේ දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය කෙරෙත්.

**(දසවෙනි සමණ බ්‍රාහ්මණ සූත්‍රය නිමි)**

---

(චතු සූත්‍රයද, පුබ්බ සූත්‍රයද, අචරි සූත්‍රයද, නොවෙදං සූත්‍රයද, දුක්ඛ සූත්‍රයද, අභිනන්දන සූත්‍රයද, උප්පාද සූත්‍රය සහ සමණ බ්‍රාහ්මණ සූත්‍ර තුනදැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයකි.)

**(4. චතු ධාතු වර්ගය නිමි.)**

**2. ධාතු සංයුක්තය නිමි.**

---

# 3. අනමතග්ග සංයුත්තය.

## 1. වර්ගය.

### 1. තිණකට්ඨ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි, කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසී තණ්හාවෙන් බැඳී ගමන් කරන්නාවූ සැරිසරන්නාවූ සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග (කෙළවර) ඇත්තේය. පූර්ව කෙළවරක් නොපෙනෙන්නේය.

3. "මහණෙනි, යම්සේ වනාහි පුරුෂයෙක් මේ දඹදිව යම්තාක් තණ, ලී දඬු, අතු සහ කොළ වේද, (ඒ සියල්ල) කපා එක් තැනකට රැස්කරන්නේ වේද, රැස්කොට සතරඟුල් සතරඟුල් කැලි කපා 'මේ මාගේ මවය. මේ මාගේ මවුගේ මවය'යි කියා තබන්නේ වේද. මහණෙනි, ඒ පුරුෂයාගේ මවුගේ මවුවරු කෙළවරක් නොවෙත්. එහෙත් මේ දඹදිව තණ, ලී දඬු, අතු, කොළ, කෙළවර වන්නේය. අවසාන වන්නේය. ඊට හේතුව කවරේද?

3. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසුනු තණ්හාවෙන් බැඳුණු ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ සත්වයාගේ මේ සංසාරය නොදක්නා ලද, කෙළවර ඇත්තේ වේද, පූර්ව කෙළවරක් නොපෙනෙයිද එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් බොහෝ කලක් මුළුල්ලෙහි දුක් අනුභව කරනලදී. දැඩි දුක්

අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී සොහොන් බිම තර කරන ලදී.

'මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය."

**(පළමුවෙනි තිණකට්ඨ සූත්‍රය නිමි.)**

---

## 2. පඨවි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන් කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග (කෙළවර) ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය.

3 "මහණෙනි, යම්සේ වනාහි පුරුෂයෙක් මේ මහ පොළොව ඩෙබර ඇට ඩෙබර ඇට පමණ ගුළිකොට, "මේ මාගේ පියාය, මේ ඔහුගේ පියායයි" කියා එක් තැනක තබන්නේ වේද, මහණෙනි, ඒ පුරුෂයාගේ පියවරුන්ගේ පියවරු කෙළවරට නොපැමිණෙත්. එහෙත් මේ මහ පොළොව කෙළවරවීමට, අවසානවීමට යන්නේය. ඊට හේතුව කවරේද?

4. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේ වේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තරකරන ලදී.

"මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නොඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය."

(දෙවෙනි පඨවි ධාතු සූත්‍රය නිමි.)

---

## 3. අස්සු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි, කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන් කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග (කෙළවර) ඇත්තේය මුල් කොනත් නොපෙනෙන්නේය.

3. "මහණෙනි, තොප විසින් බොහෝ කලක් මුළුල්ලෙහි දුක් අනුභව කරන ලදී. මහණෙනි, කුමක් සිතන්නහුද? මේ දීර්ඝ කාලයෙහි ඇවිදින කල්හි සැරිසරන කල්හි අමනාප වූවන් හා සමග එක්වීමෙන් සහ මනාපවූවන්ගෙන් වෙන්වීමෙන් හඬන්නාවූ වැළපෙන්නාවූ තොපගෙන් ගැලූ යම් කඳුලක් වේද, සතර මහා සාගරයෙහි යම් ජලයක් වේද, මේ දෙකින් කුමක් වනාහි වැඩිවේද?"

4. "ස්වාමීනි, අපි වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද පරිදි ධර්මය දනිමු. ස්වාමීනි, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ මේ දීර්ඝ කාලයෙහි අමනාපවූවන් හා සමග එක්වීමෙන් සහ මනාපවූවන්ගෙන් වෙන්වීමෙන්, හඬන්නාවූ වැළපෙන්නාවූ අපගේ ගැලූ යම් කඳුලක් වේද, එයම ඉතා අධිකවේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

5. "මහණෙනි, යහපති! යහපති!! මහණෙනි, තොප මා විසින් දේශනා කරන ලද පරිදි ධර්මය දැනගැනීම යහපත්ය.

මහණෙනි, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ මේ දීර්ඝ කාලයෙහි අමනාපවූවන් හා සමග එක්වීමෙන් හා මනාපවූවන් ගෙන් වෙන්වීමෙන්ද, හඬන්නාවූ, වැළපෙන්නාවූ තොපගේ ගැලූ යම් කඳුලක් වේද, එයම ඉතා අධිකවේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

6. "මහණෙනි, තොප විසින් බොහෝ කාලයක් මුළුල්ලෙහි මවගේ මරණයෙන්වූ දුක විඳින ලදී. මවගේ මරණයෙන්වූ දුක විඳින්නාවූ අමනාපයන් හා සමග එක්වීමෙන්, මනාපයන්ගෙන් වෙන්වීමෙන්, හඬන්නාවූද, වැළපෙන්නාවූද, තොපගේ යම් කඳුලක් වේද, එයම ඉතා අධිකවේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

7. "මහණෙනි, තොප විසින් බොහෝ කලක් මුළුල්ලෙහි පියාගේ මරණයෙන් වූ දුක විඳින ලදී. පියාගේ මරණයෙන්වූ දුක විඳින්නාවූ, අමනාපයන් හා සමග එක්වීමෙන්, මනාපයන්ගෙන් වෙන්වීමෙන් හඬන්නාවූද වැළපෙන්නාවූද, තොපගේ යම් කඳුලක් වේද, එයම ඉතා අධිකවේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

8. "මහණෙනි, තොප විසින් බොහෝ කලක් මුළුල්ලෙහි සහෝදරයාගේ මරණයෙන්වූ දුක විඳින ලදී. සහෝදරයාගේ මරණයෙන්වූ දුක විඳින්නාවූ, අමනාපයන් හා සමග එක්වීමෙන්, මනාපයන්ගෙන් වෙන්වීමෙන් හඬන්නාවූද, වැළපෙන්නාවූද තොපගේ යම් කඳුලක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

9. 'මහණෙනි, බොහෝ කලක් මුළුල්ලෙහි සහෝදරියගේ මරණයෙන්වූ දුක විඳින ලදී. සහෝදරියගේ මරණයෙන්වූ දුක විඳින්නාවූ, අමනාපයන් හා සමග එක්වීමෙන්, මනාපයන් ගෙන් වෙන්වීමෙන්, හඬන්නාවූද, වැළපෙන්නාවූද, තොපගේ යම් කඳුලක් වේද, එයම ඉතා අධිකවේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

10. "මහණෙනි, බොහෝ කලක් මුළුල්ලෙහි පුත්‍රයාගේ මරණයෙන්වූ දුක විඳින ලදී. පුත්‍රයාගේ මරණයෙන්වූ දුක

විඳින්නාවූ, අමනාපයන් හා සමග එක්වීමෙන්, මනාපයන්ගෙන් වෙන්වීමෙන්, හඬන්නාවූද, වැළපෙන්නාවූද, තොපගේ යම් කඳුලක් වේද, එයම ඉතා අධිකවේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

11. "මහණෙනි, බොහෝ කලක් මුළුල්ලෙහි දුවගේ මරණයෙන්වූ දුක විඳින ලදී. දුවගේ මරණයෙන්වූ දුක විඳින්නාවූ, අමනාපයන් හා සමග එක්වීමෙන්, මනාපයන්ගෙන් වෙන්වීමෙන්, හඬන්නාවූද, වැළපෙන්නාවූද, තොපගේ යම් කඳුලක් වේද, එයම ඉතා අධිකවේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

12. "මහණෙනි, බොහෝ කලක් මුළුල්ලෙහි නෑයන්ගේ විනාශයෙන්වූ දුක විඳින ලදී. නෑයන්ගේ මරණයෙන්වූ දුක විඳින්නාවූ, අමනාපයන් හා සමග එක්වීමෙන්, මනාපයන්ගෙන් වෙන්වීමෙන්, හඬන්නාවූද, වැළපෙන්නාවූද, තොපගේ යම් කඳුලක් වේද, එයම ඉතා අධිකවේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

13 "මහණෙනි, බොහෝකලක් මුළුල්ලෙහි වස්තූන්ගේ විනාශයෙන්වූ දුක විඳින ලදී. වස්තූන්ගේ විනාශයෙන්වූ දුක විඳින්නාවූ, අමනාපයන් හා සමග එක්වීමෙන්, මනාපයන්ගෙන්, වෙන්වීමෙන්, හඬන්නාවූද, වැළපෙන්නාවූද, තොපගේ යම් කඳුලක් වේද, එයම ඉතා අධිකවේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

14. "මහණෙනි, බොහෝ කලක් මුළුල්ලෙහි රෝගයන් නිසාවූ විනාශය විඳින ලදී. රෝගයන් නිසාමවූ දුක විඳින්නාවූ, අමනාපයන් හා සමග එක්වීමෙන් මනාපයන්ගෙන් වෙන්වීමෙන්, හඬන්නාවූද, වැළපෙන්නාවූද තොපගේ යම් කඳුලක් වේද, එයම ඉතා අධිකවේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය. ඊට හේතුව කවරේද? මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු තණ්හාවෙන් බැඳුනු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද, අග ඇත්තේ වේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක්

අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තර කරන ලදී. මහණෙනි, සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය."

**(තුන්වෙනි අස්සු සූත්‍රය නිමි.)**

---

## 4. ඛීර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි, කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන් කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේය. මුල කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? මේ දීර්ඝ කාලය තුළ ඇවිදින ලද හැසිරෙන ලද, තොප විසින් පානය කරන ලද යම් මව් කිරක් වේද, සතර මහා සාගරයෙහි යම් දියක් වේද, මේ දෙකින් කුමක් වනාහි ඉතා අධික වේද?

3. "ස්වාමීනි, අපි වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද පරිදි ධර්මය දනිමු, ස්වාමීනි, අප විසින් මේ දීර්ඝ කාලය තුළ ඇවිදින ලද හැසිරෙන ලද පානය කරන ලද යම් මව් කිරක් වේද, මෙයම ඉතා අධිකවේ. සතර මහා සාගරයෙහි ජලය අධික නොවේමය."

4. "මහණෙනි, යහපති! යහපති!! මහණෙනි, මා විසින් දේශනා කරන ලද ධර්මය තොපි එසේ දන්නහුය. මහණෙනි, මේ දීර්ඝ කාලයෙහි ඇවිදින ලද හැසිරෙන ලද තොප විසින් පානය කරන ලද, යම් මව් කිරක් වේද, එයම ඉතා අධිකවේ.

සතර මහා සාගරයෙහි ජලය අධික නොවේමය. ඊට හේතුව කවරේද?

"මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුනු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේ වේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරනලදී. සොහොන් බිම තරකරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය."

**(සතරවෙනි ඛීර සූත්‍රය නිමි.)**

---

## 5. පබ්බත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, කල්පය වනාහි කොතරම් දීර්ඝවේද?"

3. "මහණෙනි, කල්පය වනාහි දීර්ඝය. එය මෙතෙක් අවුරුදුය කියා හෝ මෙතෙක් අවුරුදු සියයක්ය කියා හෝ මෙතෙක් අවුරුදු දහසක්ය කියා හෝ මෙතෙක් අවුරුදු ලක්ෂයක්ය හෝ කියා ගණන් කිරීමට පහසු නොවේ. "ස්වාමීනි, උපමාවක් දේශනා කිරීමට හැක්කේද?"

4. "මහණ, හැකියයි" භාග්‍යවතුන්වහන්සේ වදාළසේක. "මහණ, යම්සේ වනාහි දිගින් යොදුනක් ඇති, පුළුලින් යොදුනක් ඇති, උසින් යොදුනක් ඇති, පලුදු රහිතවූ, සිදුරු රහිතවූ,

ඒකඝනවූ, මහා ගල් පර්වතයක් වේද, ඒ ගල් පර්වතය පුරුෂයෙක් අවුරුදු සියයකට සියයකට වරක් කසී සලුවකින් පිරිමදින්නේ වේද, මහණ, මේ ආකාරයෙන් ඒ මහා ගල් පර්වතය ගෙවීමට කෙළවරවීමට යන්නේය. කල්පය කෙළවර නොවන්නේය.

5. "මහණ, කල්පය වනාහි මෙසේ දීර්ඝය. මහණ මෙසේ දීර්ඝවූ කල්පයන්ගෙන් නොයෙක් කල්ප සැරිසරන ලද්දේය. නොයෙක් කල්ප සියගණන් සැරිසරන ලද්දේය. නොයෙක් කල්ප දහස්ගණන් සැරිසරන ලද්දේය. නොයෙක් කල්ප ලක්ෂගණන් සැරිසරන ලද්දේය. ඊට හේතුව කවරේද?

"මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුනු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේ වේද, මුල් කොනත් නො දකියිද, එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තරකරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය."

**(පස්වෙනි පබ්බත සූත්‍රය නිමි)**

---

## 6. සාසප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි, කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

2. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ, ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

3. "ස්වාමීනි, කල්පය වනාහි කොපමණ දීර්ඝවේද?" "මහණ, කල්පය වනාහි දීර්ඝය. එය මෙතෙක් අවුරුදුය කියා හෝ මෙතෙක් වර්ෂ සියයක්ය කියා හෝ මෙතෙක් වර්ෂ දහසක්ය කියා හෝ මෙතෙක් වර්ෂ ලක්ෂයක්ය කියා හෝ ගණන් කිරීමට පහසු නොවේ."

"ස්වාමීනි, උපමාවක් දේශනාකිරීමට හැක්කේද?"

4. "මහණ, හැක්කේයයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මහණ, යම්සේ වනාහි දිගින් යොදුනක් ඇත්තාවූ, පුළුලින් යොදුනක් ඇත්තාවූ, උසින් යොදුනක් ඇත්තාවූ අබ පිරවූ, කොතගසන ලද්දාවූ, (මුදුන් කරන ලද්දාවූ,) යකඩින් කරන ලද ප්‍රාකාරයෙන් යුක්තවූ, නගරයක් වේද, ඉක්බිති පුරුෂයෙක් අවුරුදු සියයකට සියයකට වරක් එක්එක් අබ ඇටය පිටට දමන්නේ වේද, මහණ, මේ ක්‍රමයෙන් ඒ මහා අබ ගොඩ වහා කෙළවරවීමට, අවසාන වීමට යන්නේය, කල්පය කෙළවර නොවන්නේමය.

5. "මහණ, කල්පය වනාහි මෙසේ දීර්ඝය. මහණ, මෙසේ දීර්ඝවූ, කල්පයන්ට වනාහි නොයෙක් කල්පයන් අදහස් කරන ලද්දේය. නොයෙක් කල්ප සියගණන් අදහස් කරන ලද්දේය. නොයෙක් කල්ප ලක්ෂ ගණන් අදහස්කරන ලද්දේය. ඊට හේතුව කවරේද?

6. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුනු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේ වේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තරකරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය."

**(හයවෙනි සාසප සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 7. සාවක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ.

"ස්වාමීනි, කොපමණ බහුලවූ කල්පයෝ වනාහි අතීත වූවාහුද, ඉක්ම ගියාහුද?"

3. "මහණෙනි, බොහෝ කල්පයෝ අතීත වූවාහුය. ඉක්ම ගියාහුය. ඒ ඉකුත්වූ කල්පයන් මෙතෙක් කල්පය කියා හෝ මෙතෙක් කල්ප සියයක්ය කියා හෝ, මෙතෙක් කල්ප දහසක්ය කියා හෝ, මෙතෙක් කල්ප ලක්ෂයක්ය කියා හෝ ගණන් කිරීමට පහසු නොවේ."

"ස්වාමීනි, උපමාවක් දේශනා කිරීමට හැක්කේද?"

4. "මහණෙනි, හැකියයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මහණෙනි, මේ ශාසනයෙහි අවුරුදු සියයක් ආයුෂ ඇත්තාවූ, අවුරුදු සියයක් ජීවත් වන්නාවූ, ශ්‍රාවකයෝ සතර දෙනෙක් ඇත්තාහුය. ඒ ශ්‍රාවකයෝ දිනපතා කල්ප ලක්ෂයක් කල්ප ලක්ෂයක් බැගින් සිහි කරන්නාහුය. මහණෙනි, ඒ ශ්‍රාවකයන් විසින් කල්පයෝ සිහිනොකරන ලද්දාහුම වූවාහුය. ඉක්බිති, ඒ අවුරුදු සියයක් ආයුෂ ඇත්තාවූ, අවුරුදු සියයක් ජීවත්වන්නාවූ, ඒ ශ්‍රාවකයෝ සතරදෙන අවුරුදු සියයක්, අවුරුදු සියයක්හුගේ ඇවෑමෙන් කාලක්‍රියා කරන්නාහුය.

5. "මහණෙනි, මෙසේ වනාහි බොහෝ කල්පයෝ අතීත වූවාහුය. ඉක්ම ගියාහුය. ඒ කල්පයන් මෙතෙක් කල්පය කියා හෝ මෙතෙක් කල්ප සියයක්ය කියා හෝ මෙතෙක් කල්ප දහසක්ය කියා හෝ මෙතෙක් කල්ප ලක්ෂයක්ය කියා හෝ ගණන් කිරීමට පහසු නොවේ. ඊට හේතුව කවරේද?

"මහණෙනි, අවිජ්ජාවෙන් වැසුනු, තණ්හාවෙන් බැඳුනු ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයාගේ මේ සංසාරය නොදක්නා ලද, අග ඇත්තේවේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තරකරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය."

**(හත්වෙනි සාවක සූත්‍රය නිමි.)**

---

## 8. ගංගා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම්වූ වේළුවනයෙහි (හුන වනයෙහි) වාසය කරන සේක. ඉක්බිති එක්තරා බමුණෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ඒ බමුණා භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

"භවත් ගෞතමයෙනි, කොපමණ බහුලවූ, කල්පයෝ අතීත වූවාහුද, ඉක්ම ගියාහුද?

2. "බමුණ, බොහෝ කල්පයෝ වනාහි අතීත වූවාහුය. ඉක්ම ගියාහුය. ඔවුහු මෙතෙක් කල්පයන්ය කියා හෝ මෙතෙක් කල්ප සියයක්ය කියා හෝ මෙතෙක් කල්ප දහසක්ය කියා හෝ මෙතෙක් කල්ප ලක්ෂයක්ය කියා හෝ ගණන් කිරීමට පහසු නොවේ."

"භවත් ගෞතමයිනි, උපමාවක් කීමට හැක්කේද?"

"බමුණ, හැකිය"යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. බමුණ, යම්සේ වනාහි මේ ගංගා නදිය යම් තැනෙකින් පටන්

ගනීද, යම් තැනකින් මහමුහුදට වැටෙයිද, මේ අතර යම් වැල්ලක් වේද, ඒ වැල්ල මෙතෙක් වැලිය කියා හෝ, මෙතෙක් වැලිඇට සියය කියා හෝ, මෙතෙක් වැලිඇට දහසය කියා හෝ, මෙතෙක් වැලිඇට ලක්ෂය කියා හෝ ගණන් කිරීමට පහසු නොවේ. බමුණ, අතීතවූ, ඉක්මගියාවූ, කල්පයන් වනාහි ඊට වඩා වැඩිය. ඔවුහු මෙතෙක් කල්පයන්ය කියා හෝ, මෙතෙක් කල්ප සියයක්ය කියා හෝ, මෙතෙක් කල්ප දහසක්ය කියා හෝ, මෙතෙක් කල්ප ලක්ෂයක්ය කියා හෝ ගණන් කිරීමට පහසු නොවේ. ඊට හේතු කවරේද?

3. "බමුණ, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නාලද අග ඇත්තේ වේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි, බමුණ, මෙසේ තොප විසින් දුක් අනුභව කරනලදී. දැඩි දුක් අනුභව කරනලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තර කරනලදී. බමුණ, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නොඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය."

මෙසේ දේශනා කළ කල්හි ඒ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

4. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. යම්සේ යටිකුරු කළ භාජනයක් උඩුකුරු කරන්නේද, (තණකොළ ආදියෙන්) වැසුනක් වැහුම් හරින්නේද, මංමුළාවූවෙකුට මග හෝ කියන්නේද, (ගණ අඳුරෙහි) ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දල්වන්නේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ නොයෙක් පරිද්දෙන් ධර්මය දේශනා කරන ලදී. ස්වාමීනි, ඒ ධර්මය ඇසූ මම භාග්‍යවතුන්වහන්සේ සරණකොට යමි. ධර්මයද, සංඝයාද සරණකොට යමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිම්කොට සරණ ගිය උපාසකයකු කොට මා සලකනසේක්වා."

**(අට වෙනි ගංගා සූත්‍රය නිමි.)**

---

## 9. දණ්ඩ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඩු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන්කරන්නාවූ සැරිසරන්නාවූ සත්වයන්ගේ මේ සංසාරය නොදක්නාලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, යම්සේ වනාහි ඈත අහසට වීසිකරනලද දණ්ඩ වනාහි වරෙක මුලින් බිම වදින්නේවේද, වරෙක මැදින් බිම වදින්නේවේද, වරෙක අගින් බිම වදින්නේවේද, එසේම මහණෙනි, අවිද්‍යාවෙන් වටකරන ලද්දාවූ, තණ්හාවෙන් බඳින ලද්දාවූ, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ සත්වයෝ වරෙක මේ ලෝකයෙන් පරලෝකයට යෙති. වරෙක පරලෝකයෙන් මේ ලෝකයට එති. ඊට හේතු කවරේද?

3. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නාලද අග ඇත්තේවේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තර කරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නොඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය."

**(නවවෙනි දණ්ඩ සූත්‍රය නිමි.)**

---

## 10. පුග්ගල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවරවූ ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කරනසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

2. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන්කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙණෙන්නේය. මහණෙනි, මෙසේ කල්පයක් ඇවිදින්නාවූ, හැසිරෙන්නාවූ, එක් පුද්ගලයෙකුගේ මහත්වූ ඇටසැකිල්ල, ඇට ගොඩ, ඇට රාශිය, ඉදින් එකතුකරන්නෙම් වන්නේ නම් එකතු කරන ලද්දද විනාශ නොකරන්නේ නම් මේ වේපුල්ල පර්වතය යම්පමණද එපමණ වන්නේය. ඊට හේතු කවරේද?

3. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නාලද අග ඇත්තේවේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි, මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තර කරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නොඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය.

"භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, ඊට අනතුරුව මේ ගාථාවන් දේශනා කළසේක.

> 1. එක කල්පයක එක පුද්ගලයෙකුගේ ඇටගොඩ 'වේපුල්ල' පර්වතයක් හා සමාන වන්නේය යන මෙය මහර්ෂීවූ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී.

2. එසේ කියනලද මහා වේපුල්ල පර්වතය වනාහි මගධරට වැස්සන්ගේ (අගනුවර) ගිරිබ්බජයෙහිවූ ගිජ්ඣකූට පර්වතයට උතුරෙන් පිහිටියේය.

3. යම් හෙයකින් දුක්ඛ සත්‍යයද, දුක්ඛ සමුදය සත්‍යයද, දුක්ඛ නිරොධ සත්‍යයද, දුක්ඛ නිරොධ ගාමිනී පටිපදා සත්‍යය නම්වූ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයද යන චතුරාර්‍ය්‍ය සත්‍යයන් සම්‍යක් ප්‍රඥාවෙන් දකියිද,

4. (ඒ) පුද්ගලතෙම උඩත්පිරිසෙයින් සත්වරක් සසර ගමන්කොට, සියලු සංයෝජනයන් (බැඳුම්) කෙළවර කිරීමෙන් දුක් කෙළවර කරන්නේ වෙයි.

**(දසවෙනි පුග්ගල සූත්‍රය නිමි.)**

---

(තිණකට්ඨ සූත්‍රය, පඨවි සූත්‍රය, අස්සු සූත්‍රය, ඛීර සූත්‍රය, පබ්බත සූත්‍රය, සාසප සූත්‍රය, සාවක සූත්‍රය, ගංගා සූත්‍රය, දණ්ඩ සූත්‍රය, සහ පුග්ගල සූත්‍රයදැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයකි.)

**(පළමුවෙනි වර්ගය නිමි.)**

---

## 2. වර්ගය.

### 1. දුග්ගත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන්කරන්නාවූ සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය

නොදක්නාලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, විරූපවූ අත් පා වලින් යුක්තවූ යම් දිළින්දෙකු (තොපි) දක්නහුද, මෙහිදී අප විසිනුත් මේ දීර්ඝ කාලයෙහිදී, මෙවැනි තත්වයක් විඳිනලදැයි නිෂ්ඨාවට (නිගමනයට) පැමිණිය යුතුයි.

"ඊට හේතුව කවරේද?"

3. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නාලද අග ඇත්තේවේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරනලදී. දැඩි දුක් අනුභව කරනලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම කරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය.

**(පළමුවෙනි දුග්ගත සූත්‍රය නිමි.)**

---

## 2. සුඛිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන් කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නාලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, (අලංකාරයෙන්) සැදුම් ලද්දාවූද, යම් සුඛිතවූවෙකු (තොපි) දක්නහුද, මෙහිදී අප විසිනුත් මේ දීර්ඝ කාලයෙහිදී, මෙවැනි තත්වයක් විඳිනලදැයි නිෂ්ඨාවට (නිගමනයට) පැමිණිය යුතුයි.

"ඊට හේතුව කවරේද?"

3. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නාලද අග ඇත්තේවේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තර කරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නොඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය.

**(දෙවෙනි සුඛිත සූත්‍රය නිමි.)**

---

## 3. තිංස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වේළුවනයෙහි' (හුනවනයෙහි) වාසය කරනසේක. ඉක්බිති සියල්ලන්ම ආරණ්‍යකවූ, සියල්ලන්ම පිණ්ඩපාතිකවූ සියල්ලන්ම පාංසුකූලිකවූ, සියල්ලන්ම තේචීවරිකවූ, සියල්ලන්ම සංයෝජන සහිතවූ, (පෘථග්ජනවූ) තිසක් පමණවූ, පාවාරට වැසි භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට නමස්කාරකොට, එක් පැත්තක හුන්නාහුය.

2. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මේ සිත පහළවිය. 'මේ තිසක් පමණ පාවෙය්‍යක භික්ෂූහු වනාහි සියල්ලෝම ආරණ්‍යක වූවාහුය. සියල්ලෝම පිණ්ඩපාතිකයහ. සියල්ලෝම පාංසුකූලිකයහ. සියල්ලෝම තේචීවරිකයහ. සියල්ලෝම සංයෝජන සහිතයහ. යම්සේ මේ ආසනයෙහිදීම මොවුන්ගේ සිත් (තණ්හාදී) ආශ්‍රවයන්ගෙන් දැඩිකොට නොගෙන ඉන් මිදෙත්ද (රහත්වෙත්ද) එසේ මම මොවුන්ට ධර්මය දේශනා කරන්නෙම් නම් ඉතා හොඳය' කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා

ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

3. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන්කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නාලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? මේ දීර්ඝ කාලයෙහි ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, තොපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ, ගැලුවාවූ යම් ලෙයක් වේද, සතර මහා සාගරයෙහි යම් දියක් වේද, මේ දෙකින් කුමක් වනාහි ඉතා අධික වේද?"

4. "ස්වාමීනි, අපි වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද පරිදි ධර්මය දනිමු. ස්වාමීනි, මේ දීර්ඝ කාලයෙහි ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, අපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

5. "මහණෙනි, යහපති! යහපති!! මහණෙනි, මා විසින් දේශනා කරනලද ධර්මය තොපි ඒ ආකාරයෙන් දන්නාහුය. මහණෙනි, මේ දීර්ඝකාලයෙහි ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, තොපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය. මහණෙනි, බොහෝ කාලයක් මුළුල්ලෙහි ගොන්ව ඉපදුණාවූ තොපගේ හිස් සිඳීමෙන් ගැලූ යම් ලෙයක් වේද, එයම ඉතා අධිකවේ. සතර මහාසාගරයෙහි ජලය අධික නොවේමය.

6. "මහණෙනි, බොහෝ කාලයක් මුළුල්ලෙහි මීගොන්ව ඉපද තොපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි ජලය අධික නොවේමය.

"මහණෙනි, බොහෝ කාලයක් මුළුල්ලෙහි එළුව ඉපද තොපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි ජලය අධික නොවේමය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, බොහෝ කාලයක් මුළුල්ලෙහි බැටළුව ඉපද තොපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි ජලය අධික නොවේමය.

"මහණෙනි, බොහෝ කාලයක් මුළුල්ලෙහි මුවව ඉපද තොපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි ජලය අධික නොවේමය.

"මහණෙනි, බොහෝකාලයක් මුළුල්ලෙහි සූකරව (හූරුව) ඉපද තොපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි ජලය අධික නොවේමය.

"මහණෙනි, බොහෝ කාලයක් මුළුල්ලෙහි කුකුළුව ඉපද තොපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි ජලය අධික නොවේමය.

"මහණෙනි, බොහෝ කාලයක් මුළුල්ලෙහි ගම්පහරණ සොරුයයි අල්වාගෙන තොපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි ජලය අධික නොවේමය.

"මහණෙනි, බොහෝ කාලයක් මුළුල්ලෙහි මංපහරණ සොරුයයි (මංකොල්ල කාරයෝයයි) අල්ලාගෙන තොපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

"මහණෙනි, බොහෝ කාලයක් මුළුල්ලෙහි අන් අඹු සොරුයයි අල්ලාගෙන තොපගේ හිස් සිඳීමෙන් වැගුරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතා අධික වේ. සතර මහා සාගරයෙහි දිය අධික නොවේමය.

"ඊට හේතුව කවරේද?

7. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නාලද අග ඇත්තේවේද, මුල් කොනත් නොදකියිද,

එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තර කරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය."

භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක. සතුටු සිත් ඇත්තාවූ, ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ ඒ දේශනාවට සතුටුවූහ. මේ දේශනාව පවත්වන කල්හි වනාහි තිසක් පමණවූ පාවෙය්‍යක භික්ෂූන්ගේ සිත් (තණ්හාදී) ආශ්‍රවයන්ගෙන් දැඩිකොට නොගෙන ඉන් මිදුනාහුය.

**(තුන්වෙනි තිංස සූත්‍රය නිමි.)**

---

## 4. මාතා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසයකරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී ගමන් කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, මේ දීර්ඝ කාලයෙහිදී, යම් සත්වයෙක් මවක් නොවූයේ වේද, එබඳු සත්වයෙක් සුලබ නොවේ. ඊට හේතුව කවරේද?

3. මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේ වේද, මුල් කොනත් නොදකියිද මහණෙනි, මෙසේ තොප විසින් දුක අනුභව කරන ලදී. දැඩි

දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තර කරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය.

**(සතරවෙනි මාතා සූත්‍රය නිමි.)**

---

## 5. පිතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන්කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, මේ දීර්ඝ කාලයෙහිදී, පියෙක් නොවූ යම් සත්වයෙක් වේද, එබඳු සත්වයෙක් සුලබ නොවේ. ඊට හේතුව කවරේද?

3. මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේවේද, මුල් කොනත් නොදකියිද, එහෙයින් මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තරකරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය.

**(පස්වෙනි පිතු සූත්‍රය නිමි.)**

---

## 6. භාතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬුසිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන් කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, මේ දීර්ඝ කාලයෙහිදී, සහෝදරයෙක් නොවූ යම් සත්වයෙක් වේද, එබඳු සත්වයෙක් සුලබ නොවේ. ඊට හේතුව කවරේද?

3. මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේ වේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තරකරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය.

**(හයවෙනි භාතු සූත්‍රය නිමි.)**

---

## 7. භගිනි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන්වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන් කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, මේ දීර්ඝ කාලයෙහිදී, සහෝදරියක් නොවූ යම් සත්වයෙක් වේද, එබඳු සත්වයෙක් සුලබ නොවේ. ඊට හේතුව කවරේද?

3. මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේ වේද, මුල් කොනත් නොදකියිද එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තරකරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය.

**(හත්වෙනි භගිනි සූත්‍රය නිමි.)**

---

## 8. පුත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන් කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, මේ දීර්ඝ කාලයෙහිදී, පුතෙක්

නොවූ යම් සත්වයෙක් වේද, එබඳු සත්වයෙක් සුලබ නොවේ. ඊට හේතුව කවරේද?

3. මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේවේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තර කරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය.

**(අටවෙනි පුත්ත සූත්‍රය නිමි.)**

---

## 9. ධීතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන් කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, මේ දීර්ඝ කාලයෙහිදී, දුවක් නොවූ යම් සත්වයෙක් වේද, එබඳු සත්වයෙක් සුලබ නොවේ.

ඊට හේතුව කවරේද?

3. මහණෙනි, අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුනු, ඇවිදින්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේ වේද, මුල් කොනත් නොදකියිද, එහෙයිනි. මහණෙනි, මෙසේ තොප විසින් දුක් අනුභව කරන

ලදී. දැඩි දුක් අනුභව කරන ලදී. ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තරකරන ලදී. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය.

**(නවවෙනි ධීතු සූත්‍රය නිමි.)**

---

## 10. වේපුල්ල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ "ගිජ්ඣකූට" පර්වතයෙහි වාසය කරනසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන්හට කථාකළ සේක. 'ස්වාමීනි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක.

2. "මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන් කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, පෙරවූවක් කියමි. එනම්:- මේ "වේපුල්ල" පර්වතයට "පාචීන වංස" යන නාමයක් ඇතිවිය. මහණෙනි, ඒ කාලයෙහි වනාහි මෙහි මිනිසුන්ට "තිවර" යන නාමය ඇතිවිය. මහණෙනි, "තිවර" මිනිසුන්ගේ ආයුෂ ප්‍රමාණය අවුරුදු හතළිස් දහසක්වූයේය. මහණෙනි, "තිවර" නම් ඒ මිනිස්සු "පාචීන වංස" නම් පර්වතයට සිව් දිනකින් නගිති. සිව් දිනකින් බසිති.

3. "මහණෙනි, ඒ කාලයෙහි වනාහි භාග්‍යවත්වූ, අර්හත්වූ "කකුසඳ" නම් සම්මාසම්බුදු රජාණන් වහන්සේ ලෝකයෙහි උපන් සේක. මහණෙනි, භාග්‍යවත්වූ, අර්හත්වූ "කකුසඳ" සම්මා සම්බුදු රජාණන් වහන්සේට "විධූරය" "සඤ්ජීවය" යන අග්‍රවූ, භද්‍රවූ, ශ්‍රාවක දෙනමක් වූයේය. මහණෙනි, බලව් මේ පර්වතයාගේ ඒ නාමයද අතුරුදන් විය. ඒ මිනිස්සුද කාලක්‍රියා

කළාහුය. ඒ භාග්‍යවතුන් වහන්සේද පිරිනිවන් පෑ සේක. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ සැනසීම් රහිතයහ. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන් කෙරෙන් මිදීමට සුදුසුමය.

4. "මහණෙනි, පෙරවූවක් කියමි. එනම්:- මේ "වේපුල්ල" පර්වතයට "වංකක" යන නාමය ඇතිවිය. මහණෙනි, ඒ කාලයෙහි වනාහි මෙහි මිනිසුන්ට "රෝහිතස්ස" යන නාමය ඇතිවිය. මහණෙනි, "රෝහිතස්ස" නම් මිනිසුන්ගේ ආයුෂ ප්‍රමාණය අවුරුදු තිස් දහසක් වූයේය. මහණෙනි, "රෝහිතස්ස" නම් මිනිස්සු "වංකක" නම් පර්වතයට තෙදිනකින් නගිති. තෙදිනකින් බසිති.

"මහණෙනි, ඒ කාලයෙහි වනාහි, භාග්‍යවත්වූ අර්හත්වූ, "කෝනාගමන" නම් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලෝකයෙහි උපන්සේක. මහණෙනි, භාග්‍යවත්වූ, අර්හත්වූ "කෝනාගමන" නම් සම්මාසම්බුදු රජාණන් වහන්සේට "භියය්‍ය", "සුත්තරය" යන අග්‍රවූ, භද්‍රවූ, ශ්‍රාවක දෙනමක් වූයේය. මහණෙනි, බලව් මේ පර්වතයාගේ ඒ නාමයද අතුරුදන් වීය. ඒ මිනිස්සුද කාලක්‍රියා කළාහුය. ඒ භාග්‍යවතුන් වහන්සේද පිරිනිවන් පෑ සේක. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ සැනසීම් රහිතය. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන් කෙරෙන් මිදීමට සුදුසුමය.

5. "මහණෙනි, පෙරවූවක් කියමි. එනම්:- මේ "වේපුල්ල" පර්වතයට "සුඵස්ස" යන නාමය ඇතිවිය. මහණෙනි, ඒ කාලයෙහි වනාහි මේ මිනිසුන්ට "අප්පිය" යන නාමය ඇතිවිය. මහණෙනි, 'අප්පිය' නම් මිනිසුන්ගේ ආයුෂ ප්‍රමාණය අවුරුදු විසිදහසක් වූයේය. මහණෙනි, "අප්පිය" නම් මිනිස්සු "සුඵස්ස" නම් පර්වතයට දෙදිනකින් නගිති. දෙදිනකින් බසිති.

"මහණෙනි, ඒ කාලයෙහි වනාහි, භාග්‍යවත්වූ, අර්හත්වූ "කස්සප" නම් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලෝකයෙහි උපන්සේක. මහණෙනි, භාග්‍යවත්වූ, අර්හත්වූ, "කස්සප" නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේට තිස්සය, භාරද්වාජය යන අග්‍රවූ භද්‍රවූ, ශ්‍රාවක දෙනමක් වූයේය. මහණෙනි, බලව් මේ පර්වතයාගේ ඒ නාමයද අතුරුදන් විය. ඒ මිනිස්සුද කාලක්‍රියා කළාහුය. ඒ භාග්‍යවතුන් වහන්සේද පිරිනිවන් පෑ සේක, මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ සැනසීම් රහිතයහ. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන් කෙරෙන් මිදීමට සුදුසුමය.

**6.** "මහණෙනි, මේ කාලයෙහි වනාහි මේ "වේපුල්ල" පර්වතයට "වේපුල්ල" පර්වතයයි කියාම නාමය ඇතිවිය. මහණෙනි, මේ කාලයෙහි මෙහි මිනිසුන්ට "මාගධක" යන නාමය ඇතිවිය. මහණෙනි, මෙකල මිනිසුන්ගේ ආයුෂ ප්‍රමාණය අල්පය. ස්වල්පය, ටිකය. යමෙක් බොහෝ කාලයක් ජීවත්වේ නම් හෙතෙම අවුරුදු සියයක් හෝ ඊට ස්වල්පයක් වැඩිය හෝ ජීවත් වෙයි. මහණෙනි, "මාගධක" නම් මිනිස්සු "වේපුල්ල" නම් පර්වතයට මොහොතකින් නගිති. මොහොතකින් බසිති."

"මහණෙනි, මේ කාලයෙහි වනාහි භාග්‍යවත්වූ අර්හත්වූ, සම්‍යක්සම්බුද්ධවූ මම ලෝකයෙහි උපන්නේ වෙමි. මහණෙනි, මට වනාහි "සාරිපුත්තය, මොග්ගල්ලානය" යන අග්‍රවූ, භද්‍රවූ, ශ්‍රාවක දෙනමක් වන්නේය, මහණෙනි, මේ ඒ කාලයයි. මේ පර්වතයාගේ මේ නමද අතුරුදහන් වන්නේය. මේ මිනිස්සුද කාලක්‍රියා කරන්නාහුය. මමද පිරිනිවන් පාන්නෙමි. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ සැනසීම් රහිතයහ. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන් කෙරෙන් මිදීමට සුදුසුමය. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ

සේක. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, අනතුරුව මේ ගාථාවන් දේශනාකළ සේක.

"තිවරයන්හට පාචීනවංස නම් පර්වතය විය. රොහිතස්සයන්ට වංකක නම් පර්වතය විය. අප්පියයන්හට සුඵස්ස නම් පර්වතය විය. මාගධකයන්හට වේපුල්ල නම් පර්වතය විය."

"සංස්කාරයෝ ඒකාන්තයෙන් අනිත්‍යයහ. ඉපදීම හා බිඳීම ස්වභාව කොට ඇත්තාහ. ඉපද නිරුද්ධ වෙත්. ඔවුන්ගේ සංසිඳීම සැප වන්නේය.

**(දසවෙනි වේපුල්ල සූත්‍රය නිමි.)**

---

දුග්ගත සූත්‍රය, සුඛිත සූත්‍රය, තිංස සූත්‍රය, මාතා සූත්‍රය, පිතු සූත්‍රය, භාතු සූත්‍රය, භගිනි සූත්‍රය, පුත්ත සූත්‍රය, ධීතු සූත්‍රය සහ වේපුල්ල සූත්‍රයයි කියා මේ වර්ගයෙහි සූත්‍ර දහයකි.

**දෙවෙනි වර්ගයයි.**

**3. අනමතග්ග සංයුත්තය නිමි.**

---

# 4. කස්සප සංයුත්තය.

## 1. සන්තුට්ඨි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මහා කස්සපතෙමේ ලැබුණු යම් කිසි සිවුරකින් සතුටු වන්නෙක්ව ලැබුණු යම්කිසි සිවුරකින් සතුටු

වීමෙහි ගුණ කියන්නේද වෙයි. සිවුරු උදෙසා නුසුදුසුවූ සිවුරු සැපයීමට නොබසී, සිවුරු නොලැබීම හේතු කොට ගෙන නොතැවෙයි. ලැබුවාවූද, සිවුරු තෘෂ්ණාවෙන් නොබැඳී මූර්ඡා නොවී තෘෂ්ණාවට යට නොවී ආදීනව දකිමින් සසරින් නික්මෙත්, නුවණින් යුක්තව පරිභොග කරයි.

3. "මහණෙනි, ලැබෙන යම්කිසි පිණ්ඩපාතයෙන්ද සතුටුවූ මේ මහා කස්සපතෙම (එහි) ගුණ කියන්නේ වෙයි. පිණ්ඩපාත හේතුවෙන් නුසුදුසුවූ, අයෝග්‍ය සෙවීමකට නොපැමිණෙයි. නොලද්දාවූ, පිණ්ඩපාතය ගැන නොතැවෙයි, ලද්දාවූ පිණ්ඩපාතය ගැන පහවූ ලෝභ ඇත්තේ, අධික තණ්හාවෙන් මුළා නොවූයේ, තණ්හාවෙන් යට නොවූයේ ආදීනව (දොස්) දක්නේ, සසරින් එතරවීමේ නුවණින් යුක්ත වූයේ වළඳයි. (පරිභෝග කෙරෙයි.)

4. "මහණෙනි, ලැබෙන යම්කිසි සේනාසනයෙන්ද, සතුටුවූ, මේ මහා කස්සපතෙම (එහි) ගුණ කියන්නේ වෙයි. සේනාසන හේතුවෙන් නුසුදුසුවූ, අයෝග්‍ය සෙවීමකට නොපැමිණෙයි. නොලද්දාවූ සේනාසන ගැන නොතැවෙයි. ලද්දාවූ සේනාසන ගැන පහවූ ලෝභ ඇත්තේ, අධික තණ්හාවෙන් මුළා නොවූයේ, තණ්හාවෙන් යට නොවූයේ ආදීනව (දොස්) දක්නේ, සසරින් එතර වීමේ නුවණින් යුක්තවූයේ වළඳයි. (පරිභෝග කෙරෙයි.)

5. "මහණෙනි, ලැබෙන යම්කිසි ගිලන්පස බෙහෙත් පිරිකරයෙන්ද, සතුටුවූ, මේ මහා කස්සපතෙම (එහි) ගුණ කියන්නේ වෙයි. ගිලන්පස බෙහෙත් පිරිකර හේතුවෙන් නුසුදුසුවූ, අයොග්‍ය සෙවීමකට නොපැමිණෙයි. නොලද්දාවූ, ගිලන්පස බෙහෙත් පිරිකර ගැන නොතැවෙයි. ලද්දාවූ, ගිලන්පස බෙහෙත් පිරිකර ගැන පහවූ ලෝභ ඇත්තේ, අධික තණ්හාවෙන් මුළා නොවූයේ, තණ්හාවෙන් යට නොවූයේ ආදීනව (දොස්) දක්නේ, සසරින් එතර වීමේ නුවණින් යුක්තවූයේ වළඳයි. (පරිභෝග කෙරෙයි.)

6. "මහණෙනි, එනිසා මෙහිදී, මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) ලැබුණු යම් ඒ සිවුරකින් සතුටු වන්නෙමු. ලැබුණු

යම් ඒ සිවුරකින් සතුටුවීමෙහි ගුණ කියන්නෝ වෙමු. සිවුරු නිසා නුසුදුසුවූ, නුසුදුසු සෙවීමකට නොපැමිණෙන්නෙමු සිවුරු නොලැබීම හේතුකොටගෙන නොතැවෙන්නෙමු. සිවුරු ලැබීම නිසා තණ්හාවෙන් නොබැඳී මුර්ඡා නොවී නොගිලී ආදීනව දකිමින් සසරින් එතරවන නුවණින් යුක්තව පරිභෝග කරන්නෙමු. ලැබුණු යම්කිසි පිණ්ඩපාතයකින් ලැබෙන යම්කිසි පිණ්ඩපාතයකින් සතුටු වූවෝ, (එහි) ගුණ කියන්නෝ වෙමු. පිණ්ඩපාත හේතුවෙන් නුසුදුසුවූ, අයෝග්‍ය සෙවීමකට නොපැමිණෙන්නෙමු. නොලද්දාවූ, පිණ්ඩපාතය ගැණ නොතැවෙන්නෙමු. ලද්දාවූ පිණ්ඩපාතයෙහි පහවූ ලෝභ ඇත්තෝ, අධිකවූ තණ්හාවෙන් මුළා නොවූවෝ, තණ්හාවෙන් යට නොවූවෝ ආදීනව (දොස්) දක්නෝ, එතර වීමේ නුවණින් යුක්තවූවෝ පරිභෝග කරන්නෙමු. (වළඳින්නෙමු.)

7. "මහණෙනි, ලැබුණු යම්කිසි සේනාසනයකින් සතුටු වූවෝ, (එහි) ගුණ කියන්නෝ වෙමු. සේනාසන හේතුවෙන් නුසුදුසුවූ, අයෝග්‍ය සෙවීමකට නොපැමිණෙන්නෙමු. නොලද්දාවූ, සේනාසනය ගැණ නොතැවෙන්නෙමු. ලද්දාවූ සේනාසනයෙහි පහවූ ලෝභ ඇත්තෝ, අධිකවූ තණ්හාවෙන් මුළා නොවූවෝ, තණ්හාවෙන් යට නොවූවෝ ආදීනව (දොස්) දක්නෝ, එතරවීමේ නුවණින් යුක්තවූවෝ පරිභෝග කරන්නෙමු. (වළඳන්නෙමු.)

8. "මහණෙනි, ලැබුණු යම්කිසි ගිලන්පස බෙහෙත් පිරිකරකින් සතුටු වූවෝ, (එහි) ගුණ කියන්නෝවෙමු. ගිලන්පස බෙහෙත් පිරිකර හේතුවෙන් නුසුදුසුවූ, අයෝග්‍ය සෙවීමකට නොපැමිණෙන්නෙමු. නොලද්දාවූ, ගිලන්පස බෙහෙත් පිරිකර ගැණ නොතැවෙන්නෙමු. ලද්දාවූ ගිලන්පස බෙහෙත් පිරිකරයෙහි පහවූ ලෝභ ඇත්තෝ, අධිකවූ තණ්හාවෙන් මුළා නොවූවෝ, තණ්හාවෙන් යට නොවූවෝ ආදීනව (දොස්) දක්නෝ, එතරවීමේ නුවණින් යුක්තවූවෝ පරිභෝග කරන්නෙමු. (වළඳන්නෙමු.)

9. "මහණෙනි, මෙසේ වනාහි හික්මිය යුතුයි. මහණෙනි, (මම) ඒ නුඹලාට කස්සපයන් හා සමාන වීම පිණිස අවවාද

කරන්නෙමි. යමෙක් වනාහි කස්සපයන් හා සමානවේද, අවවාද කරන ලද්දාවූ තොප විසිනුදු එසේ වීම සඳහා පිළිපැදිය යුතුයි.

(පළමුවෙනි සන්තුට්ඨි සූත්‍රය නිමි.)

---

## 2. අනොත්තාපී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේද, බරණැස් නුවර 'මිගදාය' නම් ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේකස්ථානයෙන් නැගී ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් හා සමග සතුටු වූයේය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා, එක් පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය.

2. "ඇවැත් කස්සපයිනි, කෙලෙස් තවන වීය්‍ය්‍යය නැත්තේ, පාපයට භය නැත්තේ, ධර්මාවබෝධය පිණිස සුදුසු නොවෙයි. නිර්වාණය පිණිස සුදුසු නොවෙයි. අති උතුම් රහත් බව ලැබීම පිණිස සුදුසු නොවෙයි. කෙළෙස් තවන වීය්‍ය්‍යය ඇත්තේ, පාපයට භය ඇත්තේ, ධර්මාවබෝධය පිණිස සුදුසුවෙයි. නිර්වාණය පිණිස සුදුසු වෙයි. අති උතුම් රහත් බව ලැබීම පිණිස සුදුසුවේයයි කියනු ලැබේ.

3. "ඇවැත්නි, කොපමණකින් වනාහි කෙලෙස් තවන වීය්‍ය්‍යය නැත්තේ, පාපයට බිය නැත්තේ ධර්මාවබෝධය පිණිස සුදුසු නොවන්නේ, නිවන් ලැබීම පිණිස සුදුසු නොවන්නේ, අති උතුම් රහත්බව ලැබීම පිණිස සුදුසු නොවන්නේ වේද? ඇවැත්නි, කොපමණකින් වනාහි කෙලෙස් තවන වීය්‍ය්‍යය ඇත්තේ පාපයට භය ඇත්තේ, ධර්මාවබෝධය පිණිස සුදුසු

වන්නේ, නිවන් ලැබීමට සුදුසු වන්නේ, අති උතුම් රහත් බව ලැබීම පිණිස සුදුසු වන්නේ වේද?

4. "ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම මා හට නූපන්නාවූ, ලාමකවූ, අකුශල ධර්මයෝ උපදින්නාවූ අනර්ථය පිණිස පවතින්නාහුයයි. වීර්‍ය්‍යය නොකෙරෙයිද, මාහට උපන්නාවූ, ලාමකවූ, අකුශල ධර්මයෝ ප්‍රහීණ නොවන්නාහු, අනර්ථය පිණිස පවතින්නාහුයයි, වීර්‍ය්‍යය නො කෙරෙයිද "මට නූපන්නාවූ, කුශල ධර්මයෝ නූපදින්නාහු, අනර්ථය පිණිස පවතින්නාහුයයි, වීර්‍ය්‍යය නොකෙරෙයිද, මට උපන්නාවූ, කුසල ධර්මයෝ නිරුද්ධ (නැති) වන්නාහු, අනර්ථය පිණිස පවත්නාහුයයි. වීර්‍ය්‍යය නොකෙරෙයිද, ඇවැත්නි, මෙසේ වනාහි කෙලෙස් තවන වීර්‍ය්‍යය නොකරන්නේ වෙයි.

5. "මහණෙනි, කෙසේ නම් භය නැත්තේ වේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම මට නූපන්නාවූ, ලාමකවූ, අකුශල ධර්මයෝ උපදින්නාහු, අනර්ථය පිණිස පවතින්නාහුයයි, භය නොවෙයිද? මට උපන්නාවූ, ලාමකවූ, අකුශල ධර්මයෝ ප්‍රහීණ නොවන්නාහු, අනර්ථය පිණිස පවත්නාහුයයි භය නොවෙයිද මට නූපන්නාවූ කුශලධර්මයෝ නූපදින්නාහු, අනර්ථය පිණිස පවතින්නාහුයයි භය නොවෙයිද? 'මට උපන්නාවූ, කුශල ධර්මයෝ නිරුද්ධ (නැති) වන්නාහු, අනර්ථය පිණිස පවතින්නාහුයයි. භය නොවෙයිද ඇවැත්නි, මෙසේ වනාහි භය නැත්තේ වෙයි. ඇවැත්නි, මෙසේ වනාහි කෙලෙස් තවන වීර්‍ය්‍යය නැත්තාවූ, භය නැත්තාවූ මහණතෙමේ ධර්මාවබෝධය පිණිස සුදුසු නොවන්නේය. නිවන් ලැබීම පිණිස සුදුසු නොවන්නේය. අති උතුම් රහත් බව ලැබීම පිණිස සුදුසු නොවන්නේය.

6. "ඇවැත්නි, කෙසේ නම් කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ වේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම 'මට නූපන්නාවූ, ලාමකවූ, අකුශල ධර්මයෝ උපදින්නාහු, අනර්ථය පිණිස පවතින්නාහුයයි වීර්‍ය්‍යය කෙරෙයිද, 'මට උපන්නාවූ ලාමකවූ, අකුශල ධර්මයෝ ප්‍රහීණ නොවන්නාහු, අනර්ථය පිණිස පවතින්නාහුයයි, වීර්‍ය්‍යය කෙරෙයිද, මට නූපන්නාවූ,

කුශලධර්මයෝ නූපදින්නාහු අනර්ථය පිණිස පවතින්නාහුයයි වීය්‍ර්‍යය කෙරෙයිද මට උපන්නාවූ, කුශල ධර්මයෝ නිරුද්ධ (නැති) වන්නාහු, අනර්ථය පිණිස පවතින්නාහුයයි. වීය්‍ර්‍යය කෙරෙයිද ඇවැත්නි, මෙසේ වනාහි කෙලෙස් තවන වීය්‍ර්‍යයෙන් යුක්තවූයේ වෙයි.

7. "ඇවැත්නි, කෙසේ නම් භය ඇත්තේ වේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම 'මට නූපන්නාවූ, ලාමකවූ, අකුශල ධර්මයෝ උපදින්නාහු අනර්ථය පිණිස පවතින්නාහුයයි භය වෙයිද, 'මට උපන්නාවූ, ලාමකවූ, අකුශල ධර්මයෝ ප්‍රහීණ නොවන්නාහු, අනර්ථය පිණිස පවතින්නාහුයයි, භය වෙයිද මට නූපන්නාවූ, කුශල ධර්මයෝ නූපදින්නාහු අනර්ථය පිණිස පවතින්නාහුයයි භය වෙයිද 'මට උපන්නාවූ, කුශල ධර්මයෝ නිරුද්ධ (නැති) වන්නාහු, අනර්ථය පිණිස පවතින්නාහුයයි' භය වෙයිද. ඇවැත්නි, මෙසේ වනාහි භය ඇත්තේ වෙයි. ඇවැත්නි, මෙසේ වනාහි කෙලෙස් තවන වීය්‍ර්‍යය ඇත්තේ පව්කිරීමට භය ඇත්තේ ධර්මාවබෝධය පිණිස සුදුසුවූයේ නිර්වාණය පිණිස සුදුසු වූයේ අති උතුම් රහත් බව ලැබීමට සුදුසු වූයේ වෙයි.

**(දෙවෙනි අනොත්තාපී සූත්‍රය නිමි.)**

---

## 3. චන්දූපමා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, කයින්ද ඈත්ව සිතින්ද ඈත්ව කුලයන්හි නිතර අලුත් කෙනෙක්ව, හැඩි දැඩි පැවතුම් නැතිව චන්ද්‍රයා

හා සමානව කුලයන් කරා එළඹෙව්. (පැමිණෙව්.) මහණෙනි, යම්සේ වනාහි පුරුෂයෙක් තෙම කයින්ද ඈත්ව සිතින්ද ඈත්ව ගරාවැටුණු ළිඳක් හෝ ප්‍රපාතයක් හෝ ඉවුර සිදීගිය ගඟක් හෝ බලන්නේ වේද, මහණෙනි, එසේම කයද ඈත් කොට සිතද ඈත් කොට කුලයන්හි නිතර අලුත් කෙනෙක්ව, හැඩි දැඩි පැවතුම් නැතිව චන්ද්‍රයා හා සමානව කුලයන් කරා එළඹෙව්. මහණෙනි, කස්සප තෙම කයද ඈත්කොට සිතද ඈත්කොට කුලයන්හි නිතර අලුත් කෙනෙකු මෙන් හැඩි දැඩි පැවතුම් නැතිව චන්ද්‍රයා හා සමානව කුලයන් කරා එළඹෙයි. (පැමිණෙයි.)

3. "මහණෙනි, කුමක් සිතන්නහුද? කෙබඳු මහණ තෙමේ කුලයන් කරා එළඹෙන්නට සුදුසු වෙයිද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තෝය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තෝය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහුය. ස්වාමීනි, මේ වචනයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේටම වැටහේ නම් ඒ මැනවි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහුයයි." (කීවාහුය.) ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අහසෙහි අත්ල සෙලවූසේක. "මහණෙනි, යම්සේ මේ අත්ල අහසෙහි නොරඳාද, අල්ලා නොගනීද, නොබැඳේද, මහණෙනි, මෙසේම කුලයන්ට එළඹෙන යම්කිසි භික්ෂුවකගේ සිත කුලයන්හි නොරඳයිද, අල්ලා නොගනියිද, නොබැඳෙයිද, 'ලාභ කැමැත්තෝ ලාභ ලබත්වා, පින් කැමැත්තෝ පින් කෙරෙත්වායි,' තමහට ලැබෙන දෙයින් සතුටු වන්නේද, එසේම අනුන්ගේ ලාභය ගැන සතුටු වන්නේද, මහණෙනි, එවැනි මහණ තෙමේ කුලයන් කරා එළඹෙන්නට සුදුසු වන්නේයි. මහණෙනි, කුලයන් කරා එළඹුනාවූ, කස්සපගේ සිත කුලයන්හි නොරැඳෙයි. අල්ලා නොගනියි. නොබැඳෙයි. 'ලාභ කැමැත්තෝ ලාභ ලබත්වා, පින් කැමැත්තෝ පින් කෙරෙත්වායි' තමහට ලැබෙන ලාභයෙන් සතුටු වෙයි. එසේ අනුන්ට ලැබෙන ලාභයෙන් සතුටු වෙයි. මහණෙනි, එවැනිවූ භික්ෂුතෙමේ කුලයන් කරා එළඹෙන්නට සුදුසු වෙයි.

4. "මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? කෙබඳු ස්වභාව ඇත්තාවූ භික්ෂුවගේ ධර්මදේශනාව පිරිසිදු නොවේද? කෙබඳු ස්වභාව ඇත්තාවූ භික්ෂුවගේ ධර්මදේශනාව පිරිසිදු වේද?" "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන්වහන්සේ මුල්කොට ඇත්තෝය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තෝය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තෝය. ස්වාමීනි, මේ වචනයේ අදහස භාග්‍යවතුන් වහන්සේම කියා දෙන සේක් නම් (භාග්‍යවතුන් වහන්සේටම වැටහෙනසේක් නම්) ඉතා හොඳයයි" කීවාහුය. "මහණෙනි, එසේ වීනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි" වදාළසේක. "එසේය ස්වාමීනියි," කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

5. "මහණෙනි, යම්කිසි මහණෙක් තෙම මෙවැනි සිතින් යුක්තව අනුන්ට ධර්මය දේශනා කෙරේද? (කෙසේද?) 'මොවුහු මාගේ ධර්මය අසත් නම්, යෙහෙකි. අසා ධර්මයෙහි පැහැදෙත් නම් යෙහෙකි, පැහැදී මට පැහැදුනු ආකාරයක් කෙරෙත් නම් ඉතා හොඳය' කියායි. මහණෙනි, මෙවැනි භික්ෂුවගේ ධර්මදේශනාව අපිරිසිදු වෙයි. මහණෙනි, යම්කිසි මහණෙක් තෙම මෙවැනි සිතින් යුක්තව අනුන්ට ධර්මය දේශනා කෙරේද? (කෙසේද?) භාග්‍යවතුන් වහන්සේ විසින් (මේ) ධර්මය මනාකොට දේශනා කරන ලද්දේය. තමා විසින්ම දැක්ක යුත්තේය. කල් නොගොසින්ම විපාක දෙන්නේය. එව, බලවයි කීමට සුදුසුය. තමාගේ සන්තානයෙහි එළවා ගැනීමට හෙවත් තම තමන් විසින්ම එළඹීමට සුදුසුය. නුවණ ඇත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දත යුත්තේය. මොවුහු මාගේ ධර්මය අසත් නම්, අසා ධර්මය දැනගනිත් නම්, දැන ගෙන, ඒ අයුරු පිළිපදිත් නම් ඉතා හොඳය කියායි. මෙසේ ධර්මයෙහි යහපත් බව කරුණු කොට අනුන්ට ධර්මය දේශනා කෙරෙයි. කරුණාව නිසා අනුන්ට ධර්මය දේශනා කෙරෙයි. දයාව නිසා අනුන්ට ධර්මය දේශනා කෙරෙයි. අනුකම්පාව උපදවා අනුන්ට ධර්මය දේශනා කෙරෙයි. මහණෙනි, මෙවැනි භික්ෂුවගේ ධර්ම දේශනාව පිරිසිදු වෙයි.

**6.** "මහණෙනි, කස්සපතෙම මෙවැනි සිත් ඇත්තේ අනුන්ට ධර්මය දේශනා කෙරෙයි. (කෙසේද?) භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්මය මනාකොට දේශනා කරන ලද්දේය. තමා විසින්ම දැක්ක යුත්තේය. කල් නොගොසින්ම විපාක දෙන්නේය. එව, බලවයි කීමට සුදුසුය. තමාගේ සන්තානයෙහි එළවා ගැනීමට හෙවත් තම තමන් විසින්ම එළඹීමට සුදුසුය. නුවණ ඇත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දත යුත්තේය. මොවුහු ධර්මය අසත් නම්, අසා ධර්මය දැන ගනිත් නම්, දැනගෙන, ඒ අයුරු පිළිපදිත් නම් හොඳය කියායි, මෙසේ ධර්මයෙහිවූ, යහපත් බව නිසා අනුන්ට ධර්මය දේශනා කෙරෙයි. කරුණාව නිසා අනුන්ට ධර්මය දේශනා කෙරෙයි. දයාව නිසා අනුන්ට ධර්මය දේශනා කෙරෙයි. අනුකම්පාව උපදවා අනුන්ට ධර්මය දේශනා කෙරෙයි. මහණෙනි, (මම) තොපට කස්සපයන් හා සමාන වීමට අවවාද කරන්නෙමි. යමෙක් කස්සපයන් හා සමාන වන්නේද, අවවාද කරන ලද්දාවූ තොප විසින් එසේ වනු සඳහා පිළිපැදිය යුත්තේය.

**(තුන්වෙනි චන්ද්‍රූපමා සූත්‍රය නිමි.)**

---

## 4. කුලූපග සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**2.** "මහණෙනි, කුමක් සිතන්නහුද? කෙබඳු භික්ෂුවක් කුල ගෙවලට එළඹෙන්නට සුදුසු වේද? කෙබඳු භික්ෂුවක් කුල ගෙවලට එළඹෙන්නට නුසුදුසු වේද?" "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේ පමුණු වන්නා කොට ඇත්තෝය.

භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තෝය. ස්වාමීනි, මේ වචනයේ අදහස භාග්‍යවතුන් වහන්සේම කියා දෙන සේක්නම් (භාග්‍යවතුන් වහන්සේටම වැටහෙන සේක් නම්) ඉතා හොඳයයි" කීවාහුය. "මහණෙනි, එසේ වීනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි" වදාළසේක. "එසේය ස්වාමීනි," කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

3. "මහණෙනි, මෙවැනි සිත් ඇත්තාවූ යම්කිසි මහණෙක් තෙම වනාහි කුලගෙවලට එළඹෙයිද, (කෙබඳු සිත් ඇත්තාවූදයත්) 'මටම දෙත්වා නොදීම නොකෙරෙත්වා. මට බොහෝ කොටම දෙත්වා. ස්වල්පකොට නොදෙත්වා. මට ප්‍රණීත කොටම දෙත්වා. අප්‍රණීත කොට නො දෙත්වා. මට ඉක්මන් කොටම දෙත්වා. ප්‍රමාදකොට නොදෙත්වා. මට සකස්කොටම දෙත්වා. සකස් නොකොට නොදෙත්වා.

4. "මහණෙනි, ඒ මෙවැනි සිත් ඇත්තාවූ, කුලගෙවලට එළඹෙන්නාවූ මහණහට, ඉදින් නොදෙත්ද, ඒ හේතුවෙන් මහණතෙම පීඩාවට පත්වෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් විඳියි. ස්වල්පයක් දෙත්ද, බොහෝකොට නොදෙත්ද, ඒ හේතුවෙන් මහණතෙම පීඩාවට පත්වෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් විඳියි. අප්‍රණීත කොට දෙත්ද, ප්‍රණීත කොට නොදෙත්ද, ඒ හේතුවෙන් මහණතෙම පීඩාවට පත්වෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් විඳියි. ප්‍රමාදව දෙත්ද, ශීඝ්‍රව නොදෙත්ද, ඒ හේතුවෙන් මහණතෙම පීඩාවට පත්වෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් විඳියි. සකස් නොකොට දෙත්ද, සකස්කොට නොදෙත්ද, ඒ හේතුවෙන් මහණතෙම පීඩාවට පත්වෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් විඳියි. මහණෙනි, මෙවැනි භික්ෂුව වනාහි කුලගෙවලට එළඹීමට සුදුසු නොවෙයි.

5 "මහණෙනි, මෙබඳු සිත් ඇත්තාවූ, යම්කිසි මහණෙක් තෙම වනාහි කුල ගෙවලට එළඹෙයිද, (කෙබඳු සිත් ඇත්තාවූදයත්) මටම දෙත්වා. නොදීම නොකෙරෙත්වා. මට

බොහෝකොටම දෙත්වා. ස්වල්පකොට නොදෙත්වා, මට ප්‍රණීතකොටම දෙත්වා. අප්‍රණීතකොට නොදෙත්වා. මට ඉක්මන්කොටම දෙත්වා. ප්‍රමාදකොට නොදෙත්වා. මට සකස්කොටම දෙත්වා. සකස් නොකොට නොදෙත්වා යන මෙය අන්‍ය කුල ගෙවලින් කෙසේ ලබන්නාහුද කියායි. මහණෙනි, ඒ එවැනි සිත් ඇත්තාවූ, කුලගෙවලට එළඹෙන්නාවූ, මහණහට ඉදින් නොදෙත්ද, ඒ හේතුවෙන් මහණතෙම පීඩාවට පත් නොවෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් නොවිඳියි. ස්වල්පයක් දෙත්ද, බොහෝකොට නොදෙත්ද, ඒ හේතුවෙන් මහණතෙම පීඩාවට පත් නොවෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් නොවිඳියි. අප්‍රණීත කොට නොදෙත්ද, ඒ හේතුවෙන් මහණ තෙම පීඩාවට පත් නොවෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් නොවිඳියි. ප්‍රමාදව දෙත්ද, සීඝ්‍රව නොදෙත්ද, ඒ හේතුවෙන් මහණතෙම පීඩාවට පත් නොවෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් නොවිඳියි. සකස් නොකොට දෙත්ද, සකස් කොට නොදෙත්ද, ඒ හේතුවෙන් මහණතෙම පීඩාවට පත් නොවෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් නොවිඳියි. මහණෙනි, මෙවැනි භික්ෂුව වනාහි කුල ගෙවලට එළඹෙන්නට සුදුසු වෙයි.

**6.** "මහණෙනි, කස්සපතෙම මෙවැනි සිත් ඇත්තේ කුල ගෙවලට එළඹෙයි. (කෙසේ සිත් ඇත්තේද යත්:-) මටම දෙත්වා. නොදීම නොකෙරෙත්වා. මට බොහෝ කොටම දෙත්වා. ස්වල්පකොට නොදෙත්වා. මට ප්‍රණීත කොටම දෙත්වා. අප්‍රණීත කොට නොදෙත්වා. මට ඉක්මන් කොටම දෙත්වා. ප්‍රමාදකොට නොදෙත්වා. මට සකස් කොටම දෙත්වා. සකස් නොකොට නොදෙත්වා යන මෙය අන්‍යවූ කුල ගෙවලින් කෙසේ ලබන්නාහුද' කියායි. මහණෙනි, ඒ මෙවැනි සිත් ඇතිව, කුල ගෙවලට එළඹෙන්නාවූ, කස්සප හට ඉදින් නොදෙත්ද, ඒ හේතුවෙන් කස්සපතෙම පීඩාවට පත් නොවෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් නොවිඳියි. ස්වල්පයක් දෙත්ද, බොහෝකොට නොදෙත්ද, ඒ හේතුවෙන් කාශ්‍යපතෙම පීඩාවට පත් නොවෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොවිඳියි. අප්‍රණීත කොට දෙත්ද, ප්‍රණීතකොට නොදෙත්ද, ඒ හේතුවෙන් කස්සපතෙම පීඩාවට පත් නොවෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් නොවිඳියි. ප්‍රමාදව දෙත්ද, ශීඝ්‍රව නොදෙත්ද, ඒ හේතුවෙන් කස්සප තෙම පීඩාවට පත් නොවෙයි., හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් නොවිඳියි. සකස් නොකොට දෙත්ද, සකස් කොට නොදෙත්ද, ඒ හේතුවෙන් කස්සප තෙම පීඩාවට පත් නොවෙයි. හෙතෙම ඒ හේතුවෙන් දුකක් දොම්නසක් නොවිඳියි. මහණෙනි, ඒ කස්සප හා සමාන වීමට (මම) තොපට අවවාද කරන්නෙමි. යමෙක් කස්සප හා සමාන වූයේද අවවාද කරන ලද්දාවූ තොප විසින් එසේ වනු සඳහා පිළිපැදිය යුතුයි.

**(හතරවෙනි කුලූපග සූත්‍රය නිමි.)**

---

## 5. ජිණ්ණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් වේළුවනයෙහි (හුන වනයෙහි) වසන සේක.

ඉක්බිති ආයුෂ්මත් මහා කස්සපතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය. "කස්සපය නුඹ දැන් මහළුවූයෙහිය. නුඹට මේ හණින් කළාවූ, පැරණිවූ පාංශුකූල සිවුරු බරවෙත්. කස්සපය, ඒ නිසා නුඹ ගෘහපතියන්ගේ සිවුරුද දරව. ආරාධනාකොට දෙන ලද බත්ද වළඳව. මාගේ සමීපයෙහිද වාසය කරව" කියායි.

2. "ස්වාමීනි, මම වනාහි බොහෝ කාලයක් මුළුල්ලෙහි ආරණ්‍යකද, ආරණ්‍යක භාවයෙහි ගුණ කියන්නේද වීමි. පිණ්ඩපාතිකද, පිණ්ඩපාතිකයෙහි ගුණ කියන්නේද වීමි.

පාංසුකූලිකද, පාංසුකූලිකයෙහි ගුණ කියන්නේද වීමි. තේචීවරිකද, තේචීවරිකත්වයෙහි ගුණ කියන්නේද වූයෙමි. අල්පෙච්ඡද, අල්පෙච්ඡ භාවයෙහි ගුණ කියන්නේද වූයෙමි. ලද දෙයින් සතුටු වූයේද, ලද දෙයින් සතුටුවීමෙහි ගුණ කියන්නේද වූයෙමි. අතිශය විවේකයෙන් යුක්තවූයේද, අතිශය විවේක ස්වභාවයෙහි ගුණ කියන්නේද වූයෙමි. බොහෝ දෙනා සමග හෝ ගැටුනෝ බොහෝ දෙනා සමග නොගැටීමෙහි ගුණ කියන්නේද වූයෙමියි කීය.

3. "කස්සපය, නුඹ කිනම් අර්ථයක් දකිමින් දීර්ඝකාලයක් මුළුල්ලෙහි ආරණ්‍යකත්, ආරණ්‍යක භාවයෙහි ගුණ කියන්නේත් වූයෙහිද? පිණ්ඩපාතිකත්, පිණ්ඩපාතයෙහි ගුණ කියන්නේත් වූයෙහිද? පාංසුකූලිකත්, පාංසුකූලිකත්වයෙහි ගුණ කියන්නේත් වූයෙහිද? තේචීවරිකත්, තේචීවරිකත්වයෙහි ගුණ කියන්නේත් වූයෙහිද? අල්පෙච්ඡත්, අල්පෙච්ඡභාවයෙහි ගුණ කියන්නේත් වූයෙහිද? ලද දෙයින් සතුටු වූයේත්, ලද දෙයින් සතුටු වීමෙහි ගුණ කියන්නේත් වූයෙහිද? අතිශය විවේකයෙන් යුක්තවූයේත්, අතිශය විවේක ස්වභාවයෙහි ගුණ කියන්නේත් වූයෙහිද? නො ගැටුනේත්, නොගැටීමෙහි ගුණ කියන්නේත් වූයෙහිද? පටන් ගන්නා ලද වීර්‍ය්‍යය ඇත්තේත්, පටන් ගන්නා ලද වීර්‍ය්‍යයෙහි ගුණ කියන්නේත් වූයෙහිද?"

4 "ස්වාමීනි, මම වනාහි අර්ථ දෙකක් දකිමින් බොහෝ කාලයක් මුළුල්ලෙහි ආරණ්‍යකද, ආරණ්‍යක භාවයෙහි ගුණ කියන්නේද වූයෙමි. පිණ්ඩපාතිකද, පිණ්ඩපාතයෙහි ගුණ කියන්නේද වූයෙමි. පාංසුකූලිකද, පාංසුකූලික භාවයෙහි ගුණ කියන්නේද වූයෙමි. තේචීවරිකද, තේචිවරිකත්වයෙහි ගුණ කියන්නේද වූයෙමි. අල්පෙච්ඡද, අල්පෙච්ඡ භාවයෙහි ගුණ කියන්නේද වූයෙමි. ලද දෙයින් සතුටු වූයේද, ලද දෙයින් සතුටුවීමෙහි ගුණ කියන්නේද වූයෙමි. අතිශය විවේක ස්වභාවයෙන් යුක්ත වූයේද, අතිශය විවේක ස්වභාවයෙහි ගුණ කියන්නේද වූයෙමි. නොගැටුනේද, නොගැටීමෙහි ගුණ කියන්නේද වූයෙමි. පටන් ගන්නා ලද, වීර්‍ය්‍යය ඇත්තේද, පටන් ගන්නා ලද, වීර්‍ය්‍යයෙහි ගුණ කියන්නේද වූයෙමි. තමාගේ මේ

ආත්මභාවයෙහි සැපවිහරණය දකිමින්ද, අනාගත පරම්පරාවට අනුකම්පාකරමින්ද, අනාගත පරම්පරා තොමෝ දෘෂ්ටානුගතියට පැමිණෙන්නී නම් ඉතා හොඳය කියායි. යම් ඒ බුද්ධානු බුද්ධශ්‍රාවකයෝ වූවාහුද, ඔවුහු දීර්ඝ කාලයක් මුළුල්ලෙහි ආරණ්‍යකයෝද, ආරණ්‍යක භාවයේ ගුණ කියන්නෝද වූහ. පිණ්ඩපාතිකයෝද; පිණ්ඩපාතයෙහි ගුණ කියන්නෝද වූහ. පාංසුකූලිකයෝද පාංසුකූලික භාවයෙහි ගුණ කියන්නෝද වූහ. තේචීවරිකයෝද, තේචීවරිකත්වයෙහි ගුණ කියන්නෝද වූහ. අල්පෙච්ඡයෝද, අල්පෙච්ඡ භාවයෙහි ගුණ කියන්නෝද වූහ. ලද දෙයින් සතුටු වූවෝද, ලද දෙයින් සතුටුවීමෙහි ගුණ කියන්නෝද වූහ. අතිශය විවේක ස්වභාවයෙන් යුක්තවූවෝද, අතිශය විවේක ස්වභාවයෙහි ගුණ කියන්නෝද වූහ. නොගැටුනෝද, නොගැටීමෙහි ගුණ කියන්නෝද වූහ. පටන් ගන්නා ලද වීර්‍ය්‍යය ඇත්තෝද, පටන් ගන්නා ලද, වීර්‍ය්‍යයෙහි ගුණ කියන්නෝද වූහ. ඒ බුද්ධානු බුද්ධ ශ්‍රාවකයෝ ඒ සඳහා පිළිපදින්නාහුය. ඒ බුද්ධානු බුද්ධ ශ්‍රාවකයන්ට ඒ පිළිපැදීම බොහෝ කාලයක් මුළුල්ලෙහි හිත පිණිස, සැප පිණිස වන්නේය.

5. "ස්වාමීනි, මම වනාහි මේ අර්ථ දෙක දකිමින් බොහෝ කාලයක් මුළුල්ලෙහි ආරණ්‍යකද, ආරණ්‍යක භාවයෙහි ගුණ කියන්නේද වූයෙමි. පිණ්ඩපාතිකද, පිණ්ඩපාතයෙහි ගුණ කියන්නේද වූයෙමි. පාංසුකූලිකද, පාංසුකූලිකත්වයෙහි ගුණ කියන්නේද වූයෙමි. තේචීවරිකද, තේචීවරිකත්වයෙහි ගුණ කියන්නේද වූයෙමි. අල්පෙච්ඡද, අල්පෙච්ඡ භාවයෙහි ගුණ කියන්නේද වූයෙමි. ලද දෙයින් සතුටුවූයේද, ලද දෙයින් සතුටුවීමෙහි ගුණ කියන්නේද වූයෙමි. අතිශය විවේක ස්වභාවයෙන් යුක්තවූයේද, අතිශය විවේක ස්වභාවයෙහි ගුණ කියන්නේද වූයෙමි. නොගැටුනේද, නොගැටීමෙහි ගුණ කියන්නේද වූයෙමි. පටන් ගන්නා ලද වීර්‍ය්‍යය ඇත්තේද, පටන් ගන්නා ලද වීර්‍ය්‍යයෙහි ගුණ කියන්නේද වූයෙමි." "යහපති, යහපති කස්සපය. කස්සපය, නුඹ වනාහි බොහෝදෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සැප පිණිස, ලෝකයාට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ට අර්ථය පිණිස, හිත පිණිස, සැප පිණිස,

පිළිපන්නෙහිය. කස්සපය, එහෙයින් මෙහිදී නුඹ හණින් කළ දිරූ, පාංසුකූල චීවරද, දරව. පිණ්ඩපාතයෙහිද හැසිරෙව ආරණ්‍යයෙහිද වාසය කරවයි" (වදාළසේක.)

**(පස්වෙනි ජිණ්ණ සූත්‍රය නිමි.)**

---

## 6. ඕවාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් ලත් වේළුවනයෙහි (හුනවනයෙහි) වාසය කරනසේක.

ඉක්බිති ආයුෂ්මත් මහා කස්සපතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන්හට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "කස්සපය, භික්ෂූන්හට අවවාදකරව. කස්සපය, භික්ෂූන්හට ධර්මය දේශනා කරව. කස්සපය මම හෝ භික්ෂූන්හට අවවාද කරන්නෙමි. නුඹ හෝ කරව. මම හෝ භික්ෂූන්ට දැහැමි කථාවක් (ධර්මදේශනා) කරන්නෙමි. නුඹ හෝ කරවයි" කියායි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දැන් භික්ෂූහු වනාහි දුර්වචවූවාහු (අවවාද කිරීමට අපහසුවූවෝව) දුර්වච බව ඇති කරන කරුණුවලින් යුක්තව අනුශාසනාව ගෞරවයෙන් නොපිළිගන්නෝව වෙසෙත්.

3. "ස්වාමීනි, මම මේ ශාසනයෙහි, 'මහණ, එව. කවරෙක් ඉතා බොහෝකොට ධර්මදේශනා කරන්නේද? කවරෙක් ඉතා හොඳට ධර්මදේශනා කරන්නේද? කවරෙක් ඉතා වැඩි වේලා ධර්මදෙශනා කරන්නේ දැයි?" කියා ශ්‍රැතයෙන් (උගත්කමින්) ඔවුනොවුන් අබිබවා (යටත්කොට) වාදකරන්නාවූ, ආනන්ද තෙරුන්ගේ ශිෂ්‍යයෙකුවූ "භණ්ඩු" නම් භික්ෂුවක්ද, අනුරුද්ධ තෙරුන්ගේ ශිෂ්‍යයෙකුවූ, "ආභිඤ්ජික" නම් භික්ෂුවක්ද දැක්කෙමියි කීය.

4. ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේ වහා එක්තරා භික්ෂුවකට කථාකළසේක. "මහණ, නුඹ මෙහි එව. ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන්ලා කැඳවනසේකැයි, මාගේ වචනයෙන් ආනන්දයන්ගේ ශිෂ්‍ය "භණ්ඩු" නම් භික්ෂුවද, අනුරුද්ධයන්ගේ ශිෂ්‍ය "අභිඤ්ජික" නම් භික්ෂුවද කැඳවයි" වදාළසේක. "එසේය ස්වාමීනියි" කියා ඒ මහණ තෙම වනාහි භාග්‍යවතුන් වහන්සේට උත්තරදී, ඒ භික්ෂූන් යම්තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, ඒ භික්ෂූන්ට 'ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවන සේකැයි' කීය. "ඇවැත්නි, එසේයයි" කියා ඒ භික්ෂූන් දෙනම ඒ භික්ෂුවට පිළිතුරුදී, භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ, ඒ භික්ෂූන්ට වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

5. "මහණෙනි, තොපි වනාහි උගත්කමින් ඔවුනොවුන් අභිබවා වාදකරන්නාහුය යනු සැබෑද? (කෙසේද?) 'මහණ එව කවරෙක් ඉතා බොහෝකොට ධර්මදේශනා කරන්නේද? කවරෙක් ඉතා හොඳට ධර්මදෙශනා කරන්නේද? කවරෙක් ඉතා වැඩි කාලයක් ධර්මදෙශනා කරන්නේද?' කියායි." "එසේය. ස්වාමීනි," "මහණෙනි, කිමෙක්ද මා විසින් තොපට මෙසේ ධර්මය දේශනා කළබව දන්නහුද? 'එව මහණෙනි, තොපි, උගත්කමින් ඔවුනොවුන් අභිබවා වාදකරව් (කෙසේද?) 'එව මහණ, කවරෙක් ඉතා බොහෝකොට ධර්මදෙශනා කරන්නේද? කවරෙක් ඉතා හොඳට ධර්මදෙශනා කරන්නේද? කවරෙක් ඉතා වැඩිකාලයක් ධර්ම දේශනා කරන්නේද? කියායි." "ස්වාමීනි, එසේ නොවේමය" "මහණෙනි, ඉදින් තොපි (මා විසින්) මෙසේ ධර්මය දේශනාකළ බව නොදන්නාහු නම්, හිස් පුරුෂයිනි, තොපි කුමක් නිසා කුමක් දන්නාහු, කුමක් දක්නාහු, මෙසේ මනාකොට දේශනා කරනලද, ශාසනයෙහි (ධර්මවිනයෙහි) පැවිදිවූවාහු උගත්කමින් ඔවුනොවුන් අභිබවා වාදකරන්නහුද? (කෙසේද?) 'එව මහණ, කවරෙක් ඉතා බොහෝකොට ධර්මදෙශනා කරන්නේද? කවරෙක් ඉතා හොඳට ධර්මදෙශනා

කරන්නේද? කවරෙක් ඉතා වැඩිකාලයක් ධර්මදෙශනා කරන්නේද?' කියායි."

6. ඉක්බිති, ඒ භික්ෂු දෙනම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා දෙක ළඟ හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාහුය. "ස්වාමීනි, වරද, බාලයකුසේ, මුළාවූවෙකුසේ, අදක්ෂයකුසේ අප ඉක්මවා ගියේය. ඒ අපි මෙසේ මනාකොට දෙශනා කරනලද, ශාසනයෙහි පැවිදිවූවාහු, උගත්කමින් ඔවුනොවුන් අභිබවා වාදකෙළෙමු. (කෙසේද?) 'මහණ, එව. කවරෙක් ඉතා බොහෝකොට ධර්මදෙශනා කරන්නේද? කවරෙක් ඉතා හොඳට ධර්මදෙශනා කරන්නේද? කවරෙක් ඉතා වැඩිකාලයක් ධර්මදෙශනා කරන්නේද?' කියායි. ස්වාමීනි, මත්තෙහි සංවරය පිණිස භාග්‍යවතුන් වහන්සේ ඒ අපගේ වරද වරද වශයෙන් පිළිගන්නා සේක්වා." "මහණෙනි, එසේනම් වරද, බාලයකුසේ, මුළාවූවකුසේ. අදක්ෂයකුසේ තොප ඉක්මවා ගියේය. ඒ තොපි මෙසේ මනාකොට දේශනා කරනලද, ශාසනයෙහි (ධර්මවිනයෙහි) පැවිදිවූවාහු, උගත්කමින් ඔවුනොවුන් අභිබවා (යටකොට) වාදකළාහුය (කෙසේද?) 'මහණ, එව. කවරෙක් ඉතා බොහෝ කොට ධර්මදෙශනා කරන්නේද? කවරෙක් ඉතා හොඳට ධර්මදෙශනා කරන්නේද? කවරෙක් ඉතා වැඩි කාලයක් ධර්මදෙශනා කරන්නේද?' කියායි. මහණෙනි, යම්හෙයකින් වරද වරද වශයෙන් දැක, ධර්මානුකූලව පිළියම් කරව්ද, අපි තොපගේ ඒ වරද පිළිගනිමු. මහණෙනි, යමෙක් වරද වරද වශයෙන් දැක, ධර්මානුරූපව පිළියම් කෙරෙයිද, මත්තෙහි සංවරයෙහි පිහිටයිද, මෙය ආර්‍ය්‍ය විනයෙහි වැඩීම වන්නේය.

**(හයවෙනි ඕවාද සූත්‍රය නිමි)**

---

## 7. ඕවාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

ඉක්බිති, ආයුෂ්මත් මහා කස්සපතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන්හට භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළසේක. "කස්සපය භික්ෂූන්හට අවවාද කරව, කස්සපය භික්ෂූන්හට ධර්මදේශනා කරව, කස්සපය, මම හෝ භික්ෂූන්හට අවවාද කරන්නෙමි. නුඹ හෝ කරව, මම හෝ භික්ෂූන්හට දැහැමි කථාවක් (ධර්මදෙශනාවක්) කරන්නෙමි. නුඹ හෝ කරවයි" කියායි. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, දැන් භික්ෂූන් වනාහි දුර්වච වූවාහු දුර්වචබව ඇතිකරණ කරුණුවලින් යුක්තවූවාහු නොඉවසන්නාහු, අනුශාසනාව ගෞරවයෙන් නො පිළිගන්නාහුය.

2. "ස්වාමීනි, යම් කිසිවෙකුහට කුශලධර්මයන්හි ශ්‍රද්ධාව නැත්තේවේද, කුශලධර්මයන්හි, ලජ්ජාව (හිරි) නැත්තේවේද, කුශලධර්මයන්හි භය (ඔත්තප්ප) නැත්තේ වේද, කුශලධර්මයන්හි වීර්‍ය්‍යය නැත්තේ වේද, කුශලධර්මයන්හි ප්‍රඥාව නැත්තේ වේද, ඔහුට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණෙත්ද, කුශලධර්මයන්හි හානියම කැමති විය යුත්තේය. වෘද්ධිය (වැඩීම) කැමැති නොවිය යුත්තේය. ස්වාමීනි, යම්සේ වනාහි අවපක්ෂයෙහි චන්ද්‍රයාට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණේද, (එය) වර්ණයෙන්, මණ්ඩලයෙන්, ආලෝකයෙන් සහ ආරෝහපරිණාහ (උසමහත්) සම්පත්තියෙන්ද පිරිහේමය. ස්වාමීනි, එසේම යම්කිසිවෙකුහට කුශලධර්මයන්හි ශ්‍රද්ධාව නැත්තේවේද, කුශලධර්මයන්හි ලජ්ජාව (හිරි) නැත්තේවේද, කුශලධර්මයන්හි භය (ඔත්තප්ප) නැත්තේ වේද, කුශලධර්මයන්හි වීර්‍ය්‍යය නැත්තේවේද, කුශලධර්මයන්හි ප්‍රඥාව නැත්තේවේද, ඔහුට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණෙත්ද, කුශලධර්මයන්හි හානියම කැමැතිවිය යුත්තේය. වෘද්ධිය (වැඩීම) කැමැති නොවිය යුත්තේය.

3 "ස්වාමීනි, අශ්‍රද්ධාවත් පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. ස්වාමීනි, පාපයට ලජ්ජානැති පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. ස්වාමීනි, පාපයට භය නැති පුරිස පුද්ගලයා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යනු පරිහානිය මැයි. ස්වාමීනි, කුසීත පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. ස්වාමීනි, ප්‍රඥාව නැති පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. ස්වාමීනි, ක්‍රොධකරන පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. ස්වාමීනි, වෛරකරන පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. ස්වාමීනි, මොහුට අවවාද කරන්නාවූ කල්‍යාණමිත්‍රයෝ නැත යනු පරිහානියමැයි. ස්වාමීනි, යම් කිසිවෙකුහට කුශලධර්මයන්හි ශ්‍රද්ධාව ඇත්තේවේද, කුශල ධර්මයන්හි, ලජ්ජාව (හිරි) ඇත්තේවේද කුශලධර්මයන්හි භය (ඔත්තප්ප) ඇත්තේවේද, කුශල ධර්මයන්හි වීර්‍ය්‍යය ඇත්තේවේද? ඔහුට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණෙත්ද, කුශල ධර්මයන්හි වෘද්ධියම (වැඩීමම) කැමැතිවිය යුත්තේය. හානිය කැමැති නොවිය යුත්තේය. ස්වාමීනි, යම්සේ වනාහි පුර පක්ෂයෙහි චන්ද්‍රයාට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණෙත්ද, (එය) වර්ණයෙන්, මණ්ඩලයෙන්, ආලෝකයෙන් සහ ආරෝහ පරිණාහ (උස්මහත්) සම්පත්තියෙන්ද වැඩේමය.

4. "ස්වාමීනි, එසේම යම් කිසිවෙකුහට කුශල ධර්මයන්හි ශ්‍රද්ධාව ඇත්තේ වේද, කුශල ධර්මයන්හි ලජ්ජාව (හිරි) ඇත්තේවේද, කුශලධර්මයන්හි භය (ඔත්තප්ප) ඇත්තේ වේද, කුශලධර්මයන්හි වීර්‍ය්‍යය ඇත්තේවේද, කුශල ධර්මයන්හි ප්‍රඥාව ඇත්තේ වේද, ඔහුට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණෙත්ද, කුශල ධර්මයන්හි වෘද්ධියම කැමැති විය යුත්තේය. හානිය කැමැති නොවිය යුත්තේය.

5. "ස්වාමීනි, ශ්‍රද්ධාවත් පුරුෂ පුද්ගලයා යනු දියුණුවමැයි. ස්වාමීනි, පාපයට ලජ්ජා ඇති පුරිස පුද්ගලයා යනු දියුණුව මැයි. ස්වාමීනි, පාපයට භය ඇති පුරිස පුද්ගලයා යනු දියුණුවමැයි. ස්වාමීනි, පටන්ගන්නාලද වීර්‍ය්‍යය ඇති පුරිස පුද්ගලයා යනු දියුණුවමැයි. ස්වාමීනි, ප්‍රඥාව ඇති පුරිස පුද්ගලයා යනු දියුණුවමැයි. ස්වාමීනි, ක්‍රොධ නොකරන පුරිස පුද්ගලයා යනු දියුණුවමැයි. ස්වාමීනි, වෛර නොකරන පුරිස පුද්ගලයා යනු දියුණුවමැයි. ස්වාමීනි, මොහුට අවවාදකරන කල්‍යාණමිත්‍රයෝ ඇත යනු දියුණුවමැයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**6.** යහපති! යහපති!, කස්සපය, කස්සපය, යම්කිසිවෙකුහට කුශලධර්මයන්හි ශ්‍රද්ධාව නැත්තේවේද, කුශලධර්මයන්හි ලජ්ජාව (හිරි) නැත්තේවේද, කුශලධර්මයන්හි භය (ඔත්තප්ප) නැත්තේවේද, කුශලධර්මයන්හි වීර්‍ය්‍යය නැත්තේවේද, කුශල ධර්මයන්හි ප්‍රඥාව නැත්තේවේද, ඔහුට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණෙත්ද, කුශලධර්මයන්හි හානියම කැමැති විය යුත්තේය. වෘද්ධිය (වැඩීම) කැමැති නොවිය යුත්තේය. කස්සපය, යම්සේ වනාහි අවපක්ෂයෙහි චන්ද්‍රයාහට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණේද, (එය) වර්ණයෙන්, මණ්ඩලයෙන්, ආලෝකයෙන්, සහ ආරොහපරිණාහ සම්පත්තියෙන්ද, පිරිහේමය. කස්සපය, එසේම වනාහි යම්කිසිවෙකුහට කුශලධර්මයන්හි ශ්‍රද්ධාව නැත්තේවේද. කුශලධර්මයන්හි ලජ්ජාව (හිරි) නැත්තේවේද, කුශලධර්මයන්හි භය (ඔත්තප්ප) නැත්තේවේද, කුශලධර්මයන්හි වීර්‍ය්‍යය නැත්තේවේද, කුශල කර්මයන්හි ප්‍රඥාව නැත්තේවේද. ඔහුට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණෙත්ද, කුශලධර්මයන්හි හානියම කැමැති විය යුත්තේය. වෘද්ධිය (වැඩීම) කැමැති නොවිය යුත්තේය.

**7.** "කස්සපය, අශ්‍රද්ධාවත් පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. කස්සපය, පාපයට ලජ්ජා නැති පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. කස්සපය, පාපයට භය නැති පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. කස්සපය, කුසීත පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. කස්සපය, ප්‍රඥාවනැති, පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. කස්සපය, ක්‍රොධකරන පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. කස්සපය, වෛරකරන පුරිස පුද්ගලයා යනු පරිහානියමැයි. කස්සපය, මොහුට අවවාද කරන්නාවූ කල්‍යාණ මිත්‍රයෝ නැත යනු පරිහානියමැයි. කස්සපය, යම්කිසිවෙකුහට කුශලධර්මයන්හි ශ්‍රද්ධාව ඇත්තේ වේද, කුශලධර්මයන්හි ලජ්ජාව (හිරි) ඇත්තේවේද? කුශල ධර්මයන්හි භය (ඔත්තප්ප) ඇත්තේවේද? කුශලධර්මයන්හි වීර්‍ය්‍යය ඇත්තේවේද, කුශලධර්මයන්හි ප්‍රඥාව ඇත්තේ වේද, ඔහුට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණෙත්ද, කුශලධර්මයන්හි වෘද්ධියම (වැඩීමම) කැමැතිවිය යුත්තේය. හානිය කැමති නොවිය යුත්තේය.

8. "කස්සපය, යම්සේ වනාහි පුරපක්ෂයෙහි චන්ද්‍රයාහට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණෙත්ද, (එය) වර්ණයෙන්, මණ්ඩලයෙන්, ආලෝකයෙන් සහ ආරොහපරිණාහ සම්පත්තියෙන්ද වැඩේමය. කස්සපය, එසේම වනාහි යම්කිසිවෙකුහට කුශලධර්මයන්හි ශ්‍රද්ධාව ඇත්තේ වේද, කුශලධර්මයන්හි ලජ්ජාව (හිරි) ඇත්තේවේද, කුශල ධර්මයන්හි භය (ඔත්තප්ප) ඇත්තේවේද, කුශලධර්මයන්හි වීර්‍ය්‍යය ඇත්තේවේද, කුශලධර්මයන්හි ප්‍රඥාව ඇත්තේවේද ඔහුට යම් රැයක් හෝ දවසක් හෝ පැමිණෙත්ද, කුශල ධර්මයන්හි වෘද්ධියම කැමැතිවිය යුත්තේය. හානිය කැමැති නොවිය යුත්තේය.

9. "කස්සපය, ශ්‍රද්ධාවත් පුරුෂ පුද්ගලයා යනු දියුණුව මැයි. කස්සපය, පාපයට ලජ්ජාව ඇති පුරිස පුද්ගලයා යනු දියුණුවමැයි. කස්සපය, පාපයට භය ඇති පුරිස පුද්ගලයා යනු දියුණුවමැයි. කස්සපය, පටන්ගන්නාලද වීර්‍ය්‍යය ඇති පුරිස පුද්ගලයා යනු දියුණුවමැයි. කස්සපය, ප්‍රඥාව ඇති, පුරිස පුද්ගලයා යනු දියුණුවමැයි. කස්සපය, ක්‍රොධ නොකරන පුරිස පුද්ගලයා යනු දියුණුවමැයි. කස්සපය, වෛර නොකරන පුරිස පුද්ගලයා යනු දියුණුවමැයි. කස්සපය, මොහුට අවවාද කරන කල්‍යාණ මිත්‍රයෝ ඇත යනු දියුණුවමැයි.

**(හත්වෙනි ඕවාද සූත්‍රය නිමි.)**

---

## 8. ඕවාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

2. ඉක්බිති ආයුෂ්මත් මහා කස්සපතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් හට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක. "කස්සපය භික්ෂූන්හට

අවවාද කරව. කස්සපය භික්ෂූන්හට ධර්මය දේශනා කරව. කස්සපය, මම හෝ භික්ෂූන්හට අවවාද කරන්නෙමි. නුඹ හෝ කරව. මම හෝ භික්ෂූන්හට දැහැමි කථාවක් (ධර්මදේශනාවක්) කරන්නෙමි. නුඹ හෝ කරවයි" කියායි. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දැන් භික්ෂූහු වනාහි දුර්වචවූවාහු දුර්වච බව ඇතිකරන කරුණුවලින් යුක්ත වූවාහු. නොඉවසන්නාහු, අනුශාසනාව ගෞරවයෙන් නොපිළිගන්නාහුය."

3. කස්සපය, එසේමය පෙර ස්ථවිර භික්ෂූහු වනාහි ආරණ්‍යකයෝද, ආරණ්‍යකත්වයෙහි ගුණ කියන්නෝද වූවාහුය. පිණ්ඩපාතිකයෝද, පිණ්ඩපාතයෙහි ගුණකියන්නෝද වූවාහුය. පාංසුකූලිකයෝද, පාංසුකූලිකත්වයෙහි ගුණ කියන්නෝද වූවාහුය. තේචීවරිකයෝද, තේචීවරිකත්වයෙහි ගුණ කියන්නෝද වූවාහුය. අල්පෙච්ඡයෝද, අල්පෙච්ඡභාවයෙහි ගුණ කියන්නෝද වූවාහුය. ලද දෙයින් සතුටුවූවෝද, ලද දෙයින් සතුටුවීමෙහි ගුණ කියන්නෝද, වූවාහුය. විවේකයෙන් යුක්තවූවෝද, විවේකයෙන් යුක්තවීමෙහි ගුණ කියන්නෝද වූවාහුය. පිරිස් හා නොගැටීමෙන් යුක්තවූවෝද, පිරිස් හා නොගැටීමෙහි ගුණ කියන්නෝද, වූවාහුය. පටන්ගන්නාලද වීර්‍ය්‍ය ඇත්තෝද, පටන්ගන්නාලද වීර්‍ය්‍යයෙහි ගුණ කියන්නෝද, වූවාහුය. එහිදී යම් භික්ෂුවක් ආරණ්‍යකත්, ආරණ්‍යකත්වයෙහි ගුණ කියන්නේත් වේද, පිණ්ඩපාතිකත්, පිණ්ඩපාතිකත්වයෙහි ගුණ කියන්නේත්වේද, පාංසුකූලිකත් පාංසුකූලිකත්වයෙහි ගුණකියන්නේත්වේද, තේචීවරිකත් තේචීවරිකත්වයෙහි ගුණකියන්නේත් වේද, අල්පෙච්ඡත් අල්පෙච්ඡ භාවයෙහි ගුණ කියන්නේත් වේද, ලදදෙයින් සතුටුවූයේත්, ලදදෙයින් සතුටුවීමෙහි ගුණ කියන්නේත් වේද අතිශය විවේකයෙන් යුක්තවූයේත්, අතිශය විවේකයෙන් යුක්තවීමෙහි ගුණ කියන්නේත් වේද, පිරිස් හා නොගැටීමෙන් යුක්තවූයේත්, පිරිස් හා නොගැටීමෙහි ගුණ කියන්නේත් වේද, පටන්ගන්නාලද වීර්‍ය්‍යය ඇත්තේත්, පටන්ගන්නාලද වීර්‍ය්‍යයෙහි ගුණ කියන්නේත් වේද, ඒ මහණහට ස්ථවිර භික්ෂූහු ආසනයෙන් නිමන්ත්‍රණය කෙරෙති. (ආසනය දෙති) (කෙසේද?) 'මහණ, (මෙහි) එන්න

මේ මහණතෙම කිනම් ඇත්තේද? මේ මහණතෙම භද්‍රය (යහපත්ය.) මේ මහණ තෙම ශික්ෂාකාමීවේ. මහණ, මෙහි එන්න. මේ ආසනයෙහි හිඳගන්න' කියායි."

4. "කස්සපය, එකල්හි නවක භික්ෂූන්ට මෙසේ සිතෙයි. යම් ඒ භික්ෂුවක් වනාහි ආරණ්‍යකත් ආරණ්‍යකත්වයෙහි ගුණ කියන්නේත් වේද, පිණ්ඩපාතිකත්, පිණ්ඩපාතිකත්වයෙහි ගුණ කියන්නේත් වේද, පාංසුකූලිකත් පාංසුකූලිකත්වයෙහි ගුණකියන්නේත් වේද, තේචීවරිකත් තේචීවරිකත්වයෙහි ගුණ කියන්නේත් වේද, අල්පෙච්ඡත් අල්පෙච්ඡභාවයෙහි ගුණකියන්නේත් වේද, ලද දෙයින් සතුටුවූයේත්, ලද දෙයින් සතුටුවීමෙහි ගුණ කියන්නේත් වේද, අතිශය විවේකයෙන් යුක්තවූයේත්, අතිශය විවේකයෙන් යුක්තවීමෙහි ගුණ කියන්නේත් වේද, පිරිස් හා නොගැටීමෙන් යුක්තවූයේත්, පිරිස් හා නොගැටීමෙහි ගුණ කියන්නේත් වේද, පටන්ගන්නාලද වීර්‍ය්‍යය ඇත්තේත්, පටන්ගන්නාලද වීර්‍ය්‍යයෙහි ගුණ කියන්නේත් වේද, ඒ මහණහට ස්ථවිර භික්ෂූහු ආසනයෙන් නිමන්ත්‍රණය කෙරෙති. (ආසනය දෙති.) (කෙසේද?) 'මහණ, (මෙහි) එන්න. මේ මහණතෙම කිනම් ඇත්තේද? මේ මහණතෙම භද්‍රය (යහපත්ය.) මේ මහණ තෙම ශික්ෂාකාමීවේ. මහණ, මෙහි එන්න. මේ ආසනයෙහි හිඳගන්න" කියායි. ඔවුහු ඒ සඳහා පිළිපදිති. ඔවුන්ට ඒ පිළිපැදීම බොහෝ කාලයක් මුළුල්ලෙහි හිත, සැප පිණිස වෙයි.

5. "කස්සපය, දැන් වනාහි ස්ථවිර භික්ෂූහු, ආරණ්‍යක වන්නෝත්, ආරණ්‍යක භාවයෙහි ගුණ කියන්නෝත් වෙති. පිණ්ඩපාතික වන්නෝත් පිණ්ඩපාතිකත්වයෙහි ගුණ කියන්නෝත් වෙති. පංසුකූලික වන්නෝත් පාංසුකූලිකත්වයෙහි ගුණ කියන්නෝත් වෙති. තේචීවරික වන්නෝත් තේචීවරිකත්වයෙහි ගුණ කියන්නෝත් වෙති. අල්පෙච්ඡ වන්නෝත් අල්පෙච්ඡ භාවයෙහි ගුණ කියන්නෝත් වෙති. ලදදෙයින් සතුටු වන්නෝත් ලදදෙයින් සතුටුවීමෙහි ගුණ කියන්නෝත් වෙති. අතිශය විවේකයෙන් යුක්ත වන්නෝත් අතිශය විවේකයෙන් යුක්ත

වීමෙහි ගුණ කියන්නෝත් වෙති. පිරිස් හා ගැටීමෙන් යුක්ත වන්නෝත් පිරිස් හා නොගැටීමෙහි ගුණ කියන්නෝත් වෙති. පටන්ගන්නාලද වීර්‍ය්‍යයෙන් යුක්ත වන්නෝත් පටන්ගන්නාලද වීර්‍ය්‍යයෙහි ගුණ කියන්නෝත් වෙති. එහිදී යම් භික්ෂුවක් ප්‍රසිද්ධ වූයේත්, කීර්තියෙන් යුක්ත වූයේත්, චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස සහ බෙහෙත් පිරිකර ලැබීමෙන් යුක්තවූයේත් වේද, ඔහුට ස්ථවිර භික්ෂූහු ආසනයෙන් නිමන්ත්‍රණය කෙරෙත්. (ස්ථවිර භික්ෂූහු ඔහුට ආසනයෙහි වාඩිවීමට ආරාධනා කෙරෙති) (කෙසේද?) 'මහණ, එන්න. මේ මහණතෙම කිනම් ඇත්තේද? මේ මහණතෙම ඒකාන්තයෙන් යහපත් (භද්‍ර) දැකුම් ඇත්තේය. ඒ මහණතෙම ඒකාන්තයෙන් සබ්‍රහ්ම චාරීන්ට කැමැත්තේය. එන්න මහණ මේ ආසනයෙහි හිඳගන්න කියායි"

**6.** කස්සපය, එහිදී, නවක භික්ෂූන්ට මෙසේ සිතෙයි. යම් ඒ භික්ෂුවක් වනාහි ප්‍රසිද්ධ වූයේත්, කීර්තියෙන් යුක්තවූයේත්, චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස සහ බෙහෙත් පිරිකර ලැබීමෙන් යුක්තවූයේත් වේද, ඔහුට ස්ථවිර භික්ෂූහු ආසනයෙහි වාඩිවීමට ආරාධනා කෙරෙති (කෙසේද?) 'මහණ, එන්න. මේ මහණතෙම කිනම් ඇත්තේද? මේ මහණ තෙම ඒකාන්තයෙන් යහපත් (භද්‍ර) දැකුම් ඇත්තේය. මේ මහණතෙම ඒකාන්තයෙන් සබ්‍රහ්මචාරීන්ට කැමැත්තේය. එන්න මහණ, මේ ආසනයෙහි හිඳගන්න කියායි.' ඔවුහු ඒ ලාභසත්කාර ඉපැද්දීම සඳහා පිළිපදිති. ඔවුන්ට ඒ පිළිපැදීම බොහෝ කාලයක් මුළුල්ලෙහි හිත සැප පිණිස නොවෙයි.

**7.** "කස්සපය, යම් හෙයකින් ඒගැන මනාකොට කියන්නේ (මෙසේ) කියන්නේය. (කෙසේද?) 'බ්‍රහ්මචාරීහු බ්‍රහ්මචාරී උපද්‍රවයෙන් (සිව්පසය කෙරෙහිවූ අධික ලෝභකමින්) උපද්‍රැතවූවාහුය. බ්‍රහ්මචාරීහු බ්‍රහ්මචාරී අභිභවනයෙන් (අධික ප්‍රාර්ථනාවෙන්) අභිභවනය (යුක්ත) වූවාහුය, කියායි. කස්සපය, ඒගැන මනාකොට කියන තැනැත්තේ මෙසේ කියන්නේය. (කෙසේද?) 'බ්‍රහ්මචාරීහු බ්‍රහ්මචාරී උපද්‍රවයෙන් (සිව්පසය කෙරෙහිවූ අධික ලෝභකමින්) උපද්‍රැතවූවාහුය. බ්‍රහ්මචාරීහු

බ්‍රහ්මචාරී අභිභවනයෙන් (සිව්පසය කෙරෙහිවූ අධික ප්‍රාර්ථනාවෙහි.) අභිභවනය (අධිකසේ ප්‍රාර්ථනා කරන්නෝ) වූවාහුය, කියායි.”

(අටවෙනි ඕවාද සූත්‍රය නිමි.)

---

## 9. ඣානාභිඤ්ඤා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, මම යම්තාක්කල් කැමැති වෙම්ද, ඒතාක් කාමයන්ගෙන් වෙන්වම (සියලු) අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමද්ධ්‍යානයට පැමිණ, වාසය කරමි. මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කැමැති වෙයිද, ඒතාක් කාමයන්ගෙන් වෙන්වම (සියලු) අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමද්ධ්‍යානයට පැමිණ, වාසය කරයි.

3. “මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද, ඒතාක් විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් සිතේ පැහැදීම ඇති කරන්නාවූ, හිතේ එකඟ බව ඇති කරන්නාවූ, විතර්ක රහිතවූ විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයද්ධ්‍යානයට පැමිණ වාසය කරමි. මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් සිතේ පැහැදීම ඇති කරන්නාවූ, හිතේ එකඟ බව ඇති කරන්නාවූ විතර්ක රහිතවූ, විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයද්ධ්‍යානයට පැමිණ වාසය කරයි.

4. "මහණෙනි, මම යම්තාක් කල් කැමතිවෙම්ද ඒතාක් ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසයකරමි. සිහියෙන් යුක්තවූයේ කයින් වින්දෙමි. යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ සිහියෙන් යුක්තවූයේ සැප විහරණ ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියත්ද ඒ තුන්වනද්ධ්‍යානයට පැමිණ වාසය කරමි. මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද ඒතාක් ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරයි. සිහියෙන් යුක්තවූයේ කයින් විඳියි. යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ සිහියෙන් යුක්තවූයේ සැප විහරණ ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියත්ද ඒ තුන්වනද්ධ්‍යානයට පැමිණ වාසය කරයි.

5. "මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද ඒතාක් සැපය නැති කිරීමෙන්, දුක නැති කිරීමෙන්, කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන්, දුක් නැත්තාවූ, සැප නැත්තාවූ, උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති සතරවන ද්ධ්‍යානයට පැමිණ, වාසය කරමි. මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් සැපය නැති කිරීමෙන් දුක් නැති කිරීමෙන්, කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන් දුක් නැත්තාවූ, සැප නැත්තාවූ, උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති සතරවන ද්ධ්‍යානයට පැමිණ වාසය කරයි.

6. "මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද ඒතාක් සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන්, පටිඝ ගැටීම් සංඥාවන් නැති කිරීමෙන්, නානත්ත සංඥාවන් මෙනෙහි නො කිරීමෙන් 'ආකාසය අනන්තයයි' ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරමි. මහණෙනි, කස්සප තෙමේද යම් තාක් කල් කැමැතිවෙයිද, ඒතාක් සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් පටිඝ ගැටීම් සංඥාවන් නැතිකිරීමෙන් නානත්ත සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් 'ආකාසය අනන්තයයි' ආකාසානඤ්චායතනයට පැමිණ, වාසය කරයි.

7. 'මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද ඒතාක් සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා,

'විඤ්ඤාණය' අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරමි. මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද ඒතාක් සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා, 'විඤ්ඤාණය අනන්තයයි' විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි.

8. "මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද ඒතාක් සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා, කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ, වාසය කරමි. මහණෙනි, කාශ්‍යප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද ඒතාක් සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි.

9. "මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද ඒතාක් සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ, වාසය කරමි. මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැතිවෙයිද ඒතාක් සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ, වාසය කරයි.

10. "මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද ඒතාක් සියලු ආකාරයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිත නිරෝධයට පැමිණ, වාසය කරමි. මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැතිවෙයිද ඒතාක් සියලු ආකාරයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිත නිරෝධයට පැමිණ වාසය කරයි.

11. "මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද ඒතාක් නොයෙක් ආකාරවූ, ඍද්ධිවිධි වෙන් වෙන් කොට (අනුභව කරමි) දක්වමි. (කෙසේද?) එකෙක්ව බොහෝ වෙමි. බොහෝ සේව එකෙක් වෙමි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය විනිවිද, පවුර විනිවිද, පර්වතය විනිවිද, නොහැපෙමින් යමි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කරමි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබිඳ ගමන් කරමි. පක්ෂියෙකු

මෙන් අහසෙහිද පයඹිංකයෙන් (අරම්ණිය ගොතා) හිඳගෙනම යම්. මේ මහත් ඍද්ධි ඇති, මහත් අනුභාව ඇති, සඳහිරු දෙදෙන අතගාමි. පිරිමදිමි. බඹලොව තෙක් ශරීරයෙන් වසඟ කරමි. මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැතිවෙයිද, ඒතාක් නොයෙක් ආකාරවූ, ඍද්ධිවිධි වෙන් වෙන් කොට (අනුභව කරයි.) දක්වයි. (කෙසේද?) එකෙක්ව බොහෝ වෙයි. බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය විනිවිද, පවුර විනිවිද, පර්වතය විනිවිද, නොහැපෙමින් යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කරයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබිඳ ගමන් කරයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පයඹිංකයෙන් (අරම්ණිය ගොතා) හිඳගෙනම යයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි. පිරිමදියි. බඹලොව තෙක් ශරීරයෙන් වසඟ කරයි.

12. මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද, ඒතාක් පිරිසුදුවූ, මිනිස් කණ ඉක්මවා පැවැත්තාවූ, දිවකණින් දිව්‍යමය වූද, මනුෂ්‍යමය වූද, දුරවූද, ළඟවූද, ශබ්ද අසමි. මහණෙනි, කස්සපතෙමේද යම්තාක් කල් කැමැති වෙයිද ඒතාක් පිරිසුදුවූ, මිනිස් කණ ඉක්මවා පැවැත්තාවූ දිව කණින් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරවූද, ළඟවූද, ශබ්ද අසයි.

13. මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද, ඒතාක් අන්‍ය සත්වයින්ගේ අන්‍ය පුද්ගලයින්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දනිමි. (කෙසේද?) රාග සහිත සිත රාග සහිත සිත යයි දනිමි. රාග රහිත සිත රාග රහිත සිතයයි දනිමි. ද්වෙෂ සහිත සිත ද්වෙෂ සහිත සිතයයි දනිමි. ද්වෙෂ රහිත සිත ද්වෙෂ රහිත සිතයයි දනිමි. මෝහ සහිත සිත මෝහ සහිත සිතයයි දනිමි. මෝහ රහිත සිත මෝහ රහිත සිතයයි දනිමි. විසුරුණු සිත විසුරුණු සිතයයි දනිමි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිතයයි දනිමි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිතයයි දනිමි. කාම සහිත සිත කාම සහිත සිතයයි දනිමි. ලෞකික සිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිත යයි දනිමි.

සමාධි ගතවූ සිත සමාධිගතවූ සිතයයි දනිමි. සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනිමි. (ක්ලෙශයන්ගෙන්) මිදුණු සිත (ක්ලෙශයන්ගෙන්) මිදුනු සිත යයි දනිමි. (ක්ලෙශයන්ගෙන්) නොමිදුනු සිත (ක්ලෙශයන්ගෙන්) නොමිදුණු සිතයයි දනිමි. මහණෙනි, කස්සපතෙමේද යම්තාක් කල් කැමැතිවෙයිද, ඒතාක් අන්‍ය සත්වයින්ගේ අන්‍ය පුද්ගලයින්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දනියි. (කෙසේද?) රාග සහිත සිත රාග සහිත සිතයයි දනියි. රාග රහිත සිත රාග රහිත සිතයයි දනියි. ද්වෙෂ සහිත සිත ද්වෙෂ සහිත සිතයයි දනියි. ද්වෙෂ රහිත සිත ද්වෙෂ රහිත සිතයයි දනියි. මෝහ සහිත සිත මෝහ සහිත සිතයයි දනියි. මෝහ රහිත සිත මෝහ රහිත සිතයයි දනියි. හැකුළුණු සිත හැකුළුණු සිතයයි දනියි. විසුරුණු සිත විසුරුණු සිතයයි දනියි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිතයයි දනියි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිතයයි දනියි. කාම සහිත සිත කාම සහිත සිතයයි දනියි. ලෞකික සිත ලෞකික සිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනියි. සමාධි ගතවූ සිත සමාධිගතවූ සිතයයි දනියි. සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනියි. (ක්ලෙශයන්ගෙන්) මිදුනු සිත (ක්ලෙශයන්ගෙන්) මිදුනු සිතයයි දනියි. (ක්ලෙශයන්ගෙන්) නොමිදුනු සිත (ක්ලෙශයන්ගෙන්) නොමිදුනු සිතයයි දනියි.

14. මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද ඒතාක් නානාප්‍රකාරවූ පෙර වාසය කළ තැන් සිහිකරමි. (හේ කෙසේද?) එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශ වෙන) කල්පයන්ද, නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද අසවල් තැන උපන්නෙමි. එහි මෙනම් ඇත්තේ වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේවීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු දුක් සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේ වීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේවීමි.

මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු සැප දුක් වින්දේ වීමි. මෙබඳු ආයුෂ ඇත්තේ වීමි. ඒ මම එතැනින් චුතව මේ මනුෂ්‍යාත්ම භාවයෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිත වූ, උදෙසීම් සහිතවූ, නානාප්‍රකාරවූ, පෙර විසූ කඳ පිළිවෙළ සිහි කරමි. මහණෙනි, කස්සපතෙමේද යම්තාක් කල් කැමැතිවෙයිද, ඒතාක් නානාප්‍රකාරවූ පෙර වාසය කළ තැන් සිහිකරයි. (හේ කෙසේද?) 'එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිහක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශවෙන) කල්පයන්ද, නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත, විවර්ත කල්පයන්ද අසවල් තැන උපන්නෙමි. එහි මෙනම් ඇත්තේ වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු දුක් සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේ වීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේ වීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු සැප දුක් වින්දේ වීමි. මෙබඳු ආයුෂ ඇත්තේ වීමි. ඒ මම එතැනින් චුතව මේ මනුෂ්‍යාත්ම භාවයෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිතවූ උදෙසීම් සහිතවූ, නානාප්‍රකාරවූ, පෙර විසූ කඳ පිළිවෙළ සිහිකරයි.

**15.** මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද, ඒතාක් පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටියාවූ දිවැසින් චුත වන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය අනුව මිය පරලොව ගියාවූ සත්වයන් දකිමි. (කෙසේද?) ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනෝ දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්‍ය්‍යයන්හට දොස් කීවාහු, මිථ්‍යා දෘෂ්ටිගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින්

මතු, සැපයෙන් පහවූ නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන නරකයෙහි උපන්නාහුයයිද?

**16.** මහණෙනි, මහාකස්සප තෙමේද යම්තාක් කල් කැමැතිවෙයිද ඒතාක් පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටියාවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය අනුව මිය පරලොව ගියාවූ සත්වයන් දකියි. (කෙසේද?) ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනෝ දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්‍ය්‍යයන් හට දොස් කීවාහු, මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන නරකයෙහි උපන්නාහුයයිද? දැනගනිමි. මේ පින්වත් සත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්ත වූවාහු, වාක් සුචරිතයෙන් යුක්තවූවාහු, මනෝ සුචරිතයෙන් යුක්තවූවාහු, ආර්‍ය්‍යයන්හට දොස් නොකීවාහු, සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු, සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන්වූවාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු ස්වර්ග ලෝකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටී. දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ, (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ, (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය පරිදි මිය පරලොව ගියාවූ සත්වයන් දැනගනිමි.

**17.** මහණෙනි මම ආශ්‍රවයන් (කෙලෙස්) ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ, චේතෝ විමුත්තියද; අර්හත් ඵල සමාධියද, පඤ්ඤාවිමුත්තියද (අර්හත් ඵල ප්‍රඥාවද) මේ ආත්මයෙහිදී තෙමේම දැන ප්‍රත්‍යක්ෂ කොට, ඊට පැමිණ, වාසය කරමි. මහණෙනි, කස්සපතෙමේද ආශ්‍රවයන් (කෙලෙස්) ක්ෂය කිරීමෙන්, ආශ්‍රව රහිතවූ, චේතෝ විමුත්තියද (අර්හත් ඵල සමාධියද) පඤ්ඤාවිමුත්තියද (අර්හත් ඵල ප්‍රඥාවද) මේ

ආත්මයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂ කොට, ඊට පැමිණ වාසය කරයි.

(නවවෙනි ඣානාභිඤ්ඤා සූත්‍රය නිමි.)

---

## 10. උපස්සය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් මහා කස්සපතෙමේ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක.

ඉක්බිති ආයුෂ්මත් ආනන්දතෙම පාත්‍ර සිවුරු ගෙන ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන්හට මෙය කීයේය. "ස්වාමීනි, කස්සප ස්ථවිරයන් වහන්ස, එක්තරා භික්ෂුණී ආරාමයක් යම්තැනෙක්හිද, එතැන්හි යමුයි" කියායි. "ඇවැත් ආනන්දය, තෙපි යව්. තොපට බොහෝ කටයුතු ඇත්තේයයි" කීයේය. දෙවෙනුවත් ආයුෂ්මත් ආනන්දතෙම ආයුෂ්මත් මහාකස්සප තෙරුන්හට මෙය කීයේය. "ස්වාමීනි, කස්සප ස්ථවිරයන් වහන්ස, එක්තරා භික්ෂුණී ආරාමයක් යම්තැනෙක්හිද එතැන්හි යමුයි" කියායි. "ඇවැත් ආනන්දය ඔබ යන්න. ඔබට බොහෝ කෘත්‍යය ඇත්තේය. බොහෝ කටයුතු ඇත්තේයයි" කීයේය.

2. තෙවනුවත් ආයුෂ්මත් ආනන්දතෙම ආයුෂ්මත් මහා කස්සප තෙරුන්හට මෙය කීයේය. "ස්වාමීනි, කස්සප ස්ථවිරයන් වහන්ස, එක්තරා භික්ෂුණී ආරාමයක් යම් තැනෙක්හිද එතැන්හි යමුයි" කියායි.

ඉක්බිති ආයුෂ්මත් කස්සප ස්ථවිරතෙම පෙරවරු කාලයෙහි හැඳ පාත්‍ර සිවුරු ගෙන, ආයුෂ්මත් ආනන්ද තෙරුන් පසු ගමන්කරන ශ්‍රමණයකුකොට, එක්තරා භික්ෂුණී ආරාමයක් යම්තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, පණවනලද ආසනයෙහි වැඩහුන්නේය. ඉක්බිති බොහෝ භික්ෂුණීහු

ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියාහුය. පැමිණ, ආයුෂ්මත් මහාකස්සප ස්ථවිරයන්ට වැඳ, එක්පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂුණීන්ට ආයුෂ්මත් මහාකස්සප ස්ථවිරතෙම දැහැමි කථාවෙන් කරුණු දැක්විය. (එහි) සමාදන් කරවිය. තියුණු කරවිය. ප්‍රසන්න කරවිය. ඉක්බිති, ආයුෂ්මත් මහාකස්සප ස්ථවිරතෙම ඒ භික්ෂුණීන්ට දැහැමි කථාවෙන් කරුණු දක්වා, (එහි) සමාදන් කරවා, තියුණු කරවා, ප්‍රසන්න කරවා හුනස්නෙන් නැගිට වැඩියේය.

3. ඉක්බිති ථුල්ලතිස්සා නම් භික්ෂුණිය නොසතුටුවූවා, නොසතුටු වචනයක් කීවාය. (එනම්:-) "කිමෙක්ද? මහා කස්සප ආයසීයන් වහන්සේ පණ්ඩිත භික්ෂුවක්වූ, ආනන්ද ආයසීයන් වහන්සේගේ සමීපයෙහි ධර්මය දේශනා කළයුතුයයි හඟිනසේක්ද? යම්සේ ඉඳිකටු වෙළෙන්දෙක් ඉඳිකටු සාදන්නාගේ සමීපයෙහි ඉඳිකටු විකිණිය යුතුයයි හඟින්නේ වේද, එසේම මහාකස්සප ආයසීයන් වහන්සේ, පණ්ඩිත භික්ෂුවක්වූ, ආනන්ද ආයසීයන් වහන්සේගේ සමීපයෙහි ධර්මය දේශනා කළයුතුයයි හඟිනසේක්ය කියායි.

4. ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරතෙම කියන්නාවූ ථුල්ලතිස්සා භික්ෂුණියගේ මේ වචනය ඇසූයේය. ඉක්බිති ආයුෂ්මත් මහාකස්සප ස්ථවිරතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්හට මෙය කීයේය. "ඇවැත් ආනන්දය, කිමෙක්ද? මම ඉඳිකටු වෙළෙන්දෙක්ද? නුඹ ඉඳිකටු සාදන්නෙක්ද? නැතහොත් මා ඉඳිකටු සාදන්නෙක්ද? නුඹ ඉඳිකටු වෙළෙන්දෙක්ද?" කියායි. "ස්වාමීනි කස්සපයන් වහන්ස, සමාවන සේක්වා. ස්ත්‍රිය අඥානයයි" කීයේය. "ඇවැත් ආනන්දය, නුඹ සිටින්න. නුඹ ගැන සංඝතෙමේ මත්තෙහි පරීක්ෂා නොකෙරේවා.

"ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියේදී, 'මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද ඒතාක් කාමයන්ගෙන් වෙන්වම (සියලු) අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ, විචාරසහිතවූ,

විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමද්ධ්‍යානයට පැමිණ, වාසය කරමියි' භික්ෂු සංඝයාට දැක්වූයෙහිද?

**5.** 'මහණෙනි, ආනන්ද තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් කාමයන්ගෙන් වෙන්වම (සියලු) අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමද්ධ්‍යානයට පැමිණ, වාසයකෙරෙයි' කියා 'ස්වාමීනි, ඒ එසේ නොවේමය.' ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී, භික්ෂු සංඝයාට 'මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද ඒතාක් කාමයන්ගෙන් වෙන්ව (සියලු) අකුශලය ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමද්ධ්‍යානයට පැමිණ, වාසය කරමි.

'මහණෙනි, කස්සප තෙමේද යම්තාක්කල් කැමැති වෙයිද, ඒතාක් කාමයන්ගෙන් වෙන්වම (සියලු) අකුශලධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමද්ධ්‍යානයට පැමිණ, වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

**6** "ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂු සංඝයාට දක්වනු ලැබූයෙහිද, 'මහණෙනි, මම යම්තාක්කල් කැමැති වෙම්ද, ඒතාක් විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් සිතේ පැහැදීම ඇතිකරන්නාවූ, හිතේ එකඟබව ඇතිකරන්නාවූ, විතර්ක රහිතවූ විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයද්ධ්‍යානයට පැමිණ වාසය කරමි."

'මහණෙනි, ආනන්ද තෙමේ යම්තාක් කල් කැමැති වෙම්ද ඒතාක් විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් සිතේ පැහැදීම ඇති කරන්නාවූ, හිතේ එකඟබව ඇති කරන්නාවූ, විතර්ක රහිතවූ, විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයද්ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි"

"ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුවෙමි. 'මහණෙනි, මම යම්තාක්කල් කැමැති වෙම්ද, ඒතාක් විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් සිතේ පැහැදීම ඇතිකරන්නාවූ, හිතේ එකඟබව ඇතිකරන්නාවූ, විතර්ක රහිතවූ, විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයද්ධ්‍යානයට පැමිණ වාසය කරමි.

'මහණෙනි, කාශ්‍යප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද ඒතාක් විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් සිතේ පැහැදීම ඇතිකරන්නාවූ, හිතේ එකඟබව ඇතිකරන්නාවූ, විතර්ක රහිතවූ, විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයද්ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි' කියා දක්වනු ලැබුවෙමි."

7. "ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂු සංඝයාට දක්වනු ලැබූයෙහිද, 'මහණෙනි, මම යම්තාක්කල් කැමති වෙම්ද, ඒ තාක් ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරමි. සිහියෙන් යුක්ත වූයේ, කයින් සැප වින්දෙමි. යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ සිහියෙන් යුක්ත වූයේ සැප විහරණ ඇත්තේයයි, ආර්‍ය්‍යයෝ කියත්ද ඒ තුන්වන ධ්‍යානයට පැමිණ, වාසය කරමි. මහණෙනි, ඇවැත් ආනන්ද තෙමේද යම් තාක් කල් කැමති වෙයිද, ඒ තාක් ප්‍රීතිය ඉක්ම වීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කෙරෙයි. සිහියෙන් යුක්ත වූයේ කයින් සැප වින්දේය. යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ සිහියෙන් යුක්තවූයේ සැප විහරණය ඇත්තේයයි, ආර්‍ය්‍යයෝ කියත්ද, ඒ තුන්වන ද්ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි' කියා දක්වනු ලැබුවෙමි."

"ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුවෙමි. 'මහණෙනි, මම යම්තාක්කල් කැමති වෙම්ද ඒ තාක් ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරමි. සිහියෙන් යුක්ත වූයේ කයින් වින්දෙමි. යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ

සිහියෙන් යුක්ත වූයේ කයින් සැප විහරණ ඇත්තේයයි ආර්‍යයෝ කියත්ද ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වාසය කරමි. මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමති වෙයිද ඒ තාක් ප්‍රීතිය ඉක්ම වීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරයි. සිහියෙන් යුක්ත වූයේ කයින් සැප වින්දේය. යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ සිහියෙන් යුක්ත වූයේ සැප විහරණ ඇත්තේයයි ආර්‍යයෝ කියත්ද ඒ තුන්වන ධ්‍යානයට පැමිණ, වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

8. "ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂු සංඝයාට දක්වනු ලැබුයෙහිද, 'මහණෙනි, මම යම්තාක් කල් කැමති වෙම්ද ඒ තාක් සැපය නැති කිරීමෙන්, දුක නැති කිරීමෙන් කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන්, දුක් නැත්තාවූ, සැප නැත්තාවූ, උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරමි.

'මහණෙනි, ආනන්දය, යම්තාක් කල් කැමැති වෙයිද, ඒ තාක් සැපය නැති කිරීමෙන්, දුක නැති කිරීමෙන්, කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන්, දුක් නැත්තාවූ, සැප නැත්තාවූ, උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

"ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂු සංඝයාට දක්වනු ලැබුවෙමි.

'මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද ඒ තාක් සැපය නැති කිරීමෙන්, දුක නැති කිරීමෙන්, කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන්, දුක් නැත්තාවූ, සැප නැත්තාවූ, උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරමි.

'මහණෙනි, කස්සප තෙමේ යම්තාක් කල් කැමැති වෙයිද ඒ තාක් සැපය නැති කිරීමෙන්, දුක නැති කිරීමෙන් කල් ඇතිවම

සොමනස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන්, දුක් නැත්තාවූ, සැපනැත්තාවූ, උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුයෙමි.' "

**9.** "ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂු සංඝයාට දක්වනු ලැබුයෙහිද, 'මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද ඒ තාක් සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් පටිඝ (ගැටීම්) සංඥාවන් නැති කිරීමෙන්, නානත්ත සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් 'ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරමි.'

'මහණෙනි, ඇවැත් ආනන්දතෙමේ යම්තාක් කල් කැමැති වෙයිද ඒ තාක් සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් පටිඝ (ගැටීම්) සංඥාවන් නැති කිරීමෙන්, නානත්ත සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් 'ආකාසය අනන්තයයි. ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

"ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂු සංඝයාට දක්වනු ලැබුවෙමි. 'මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද ඒතාක් සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් පටිඝ (ගැටීම්) සංඥාවන් නැති කිරීමෙන් නානත්ත සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරමි."

'මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද ඒතාක් සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන්, පටිඝ ගැටීම් සංඥාවන් නැති කිරීමෙන්, නානත්ත සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් "ආකාසය අනන්තයයි" ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරයි කියා දක්වනු ලැබුවෙමි."

**10.** "ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂු සංඝයාට දක්වනු

ලැබුයෙහිද? 'මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා, විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤානඤ්චායතනයට පැමිණ වාසය කරමි' කියායි.

'මහණෙනි, ආනන්ද තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද ඒතාක් සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා, විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

"ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුවෙමි.

'මහණෙනි, මම යම්තාක්කල් කැමැතිවෙම්ද ඒ තාක් සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා, විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරමි. මහණෙනි, කස්සපතෙමේද යම්තාක් කල් කැමැති වෙයිද ඒතාක් සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා, විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

11. "ඇවැත්, ආනන්දය ඒ කිමැයි සිතන්නෙහිද නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිද භික්ෂු සංඝයාට දක්වනු ලැබුයෙහිද.

'මහණෙනි, මම යම්තාක්කල් කැමැති වෙම්ද, ඒතාක් සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා, කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ, වාසය කරමි.

'මහණෙනි, ආනන්ද තෙමේද යම්තාක්කල් කැමැතිවෙයිද, ඒතාක් සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා, කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

"ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුවෙමි.

'මහණෙනි, මම යම්තාක්කල් කැමැති වෙම්ද, ඒතාක් සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා, කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරමි.

'මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා, කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

12. "ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුයෙහිද? 'මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද ඒතාක් සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරමි.

'මහණෙනි, ආනන්ද තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ, වාසය කෙරෙයි කියා දක්වනු ලැබීමි.' "

"ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුවෙමි.

'මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරමි.

'මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

13. "ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුයෙහිද? 'මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඒතාක් සියලු ආකාරයෙන් නේවසඤ්ඤානාස්ඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිත නිරෝධයට පැමිණ වාසය කරමි.

'මහණෙනි, ආනන්ද තෙමේද යම්තාක් කල් කැමැතිවෙයිද ඒතාක් සියලු ආකාරයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිත නිරොධයට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

"ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුවෙමි.

'මහණෙනි, මම යම්තාක් කල් කැමැතිවෙම්ද, ඒතාක් සියලු ආකාරයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිත නිරෝධයට පැමිණ වාසය කෙරෙමි.

'මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් සියලු ආකාරයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිත නිරෝධයට පැමිණ වාසය කෙරේය කියා දක්වනු ලැබුවෙමි."

14. "ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුයෙහිද? 'මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් නොයෙක් ආකාරවූ, ඍද්ධිවිධි වෙන් වෙන් කොට (අනුභව කරමි) දක්වමි. (කෙසේද?) එකෙක්ව බොහෝ වෙමි. බොහෝසේව එකෙක් වෙමි. ප්‍රකටබවට, මුවහබවට, අහසෙහි මෙන් බිත්තිය විනිවිද, පවුර විනිවිද, පර්වතය විනිවිද, නොහැපෙමින් යමි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කරමි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබිඳ ගමන් කරමි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පයඞ්කයෙන් (අරමිණිය ගොතා) හිඳගෙනම යමි. මේ මහත් ඍද්ධි ඇති, මහත් අනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගාමි, පිරිමදිමි. බඹලොව තෙක් ශරීරයෙන් වසඟ කරමි.

'මහණෙනි, ආනන්ද තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් නොයෙක් ආකාරවූ, ඍද්ධිවිධි වෙන් වෙන් කොට

(අනුභව කරයි) දක්වයි. (කෙසේද?) එකෙක්ව බොහෝ වෙයි. බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට මුවහබවට, අහසෙහි මෙන් බිත්තිය විනිවිද, පවුර විනිවිද, පර්වතය විනිවිද, නොහැපෙමින් යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කරයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබිඳ ගමන් කරයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පයඹංකයෙන් (අරමිණියා ගොතා) හිඳගෙනම යයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් අනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි. බඹලොව තෙක් ශරීරයෙන් වසඟ කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි.”

“ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුවෙමි.

‘මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් නොයෙක් ආකාරවූ, ඍද්ධිවිධි වෙන් වෙන් කොට (අනුභව කරමි) දක්වමි. (කෙසේද?) එකෙක්ව බොහෝ වෙමි. බොහෝසේව එකෙක් වෙමි. ප්‍රකට බවට, මුවහබවට, අහසෙහි මෙන් බිත්තිය විනිවිද, පවුර විනිවිද, පර්වතය විනිවිද, නොහැපෙමින් යමි දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම්, කරමි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබිඳ ගමන් කරමි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පයඹංකයෙන් (අරමිණිය ගොතා) හිඳගෙනම යමි. මේ මහත් ඍද්ධි ඇති, මහත් අනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගාමි, පිරිමදිමි. බඹලොව තෙක් ශරීරයෙන් වසඟ කරමි.

‘මහණෙනි, කස්සප තෙමේද, යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් නොයෙක් ආකාරවූ, ඍද්ධිවිධි වෙන් වෙන් කොට (අනුභව කරයි) දක්වයි. (කෙසේද?) එකෙක්ව බොහෝ වෙයි. බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහබවට, අහසෙහි මෙන් බිත්තිය විනිවිද, පවුර විනිවිද, පර්වතය විනිවිද, නොහැපෙමින් යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම්, කරයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබිඳ ගමන් කරයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පයඹංකයෙන් (අරමිණිය ගොතා)

හිඳගෙනම යයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් අනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි. බඹලොව තෙක් ශරීරයෙන් වසඟකෙරෙයි කියා දක්වනු ලැබුවෙමි.”

15. “ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුයෙහිද? ‘මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් පිරිසුදුවූ, මිනිස් කණ ඉක්මවා පැවැත්තාවූ, දිව කණින් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරවූද ළඟවූද, ශබ්ද අසමි.

‘මහණෙනි, ආනන්ද තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් පිරිසුදුවූ, මිනිස්කණ ඉක්මවා පැවැත්තාවූ, දිවකණින් දිව්‍යමයවූද, මනුෂ්‍යමය වූද, දුරවූද, ළඟවූද, ශබ්ද අසයි කියා දක්වනු ලැබුවෙමි.”

“ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂු සංඝයාට දක්වනු ලැබුවෙමි.

‘මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් පිරිසුදුවූ, මිනිස්කණ ඉක්මවා පැවැත්තාවූ, දිවකණින් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරවූද, ළඟවූද, ශබ්ද අසමි.

‘මහණෙනි, කස්සපතෙමේද, යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් පිරිසුදුවූ, මිනිස්කණ ඉක්මවා පැවැත්තාවූ, දිවකණින් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරවූද, ළඟවූද ශබ්ද අසයි කියා දක්වනු ලැබුවෙමි.”

16. “ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුයෙහිද? මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් අන්‍ය සත්වයින්ගේ අන්‍ය පුද්ගලයින්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දනිමි. (කෙසේද?) රාග සහිත සිත රාග සහිත සිතයයි දනිමි. රාග රහිත සිත රාග රහිත සිතයයි දනිමි. ද්වේෂ සහිත සිත ද්වේෂ සහිත සිතයයි දනිමි. ද්වේෂ රහිත සිත ද්වේෂ රහිත

සිතයයි දනිමි. මෝහ සහිත සිත මෝහ සහිත සිතයයි දනිමි. මෝහ රහිත සිත මෝහ රහිත සිතයයි දනිමි. හැකුළුණු සිත හැකුළුණු සිතයයි දනිමි. විසුරුණු සිත විසුරුණු සිතයයි දනිමි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිතයයි දනිමි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිතයයි දනිමි. කාම සහිත සිත කාම සහිත සිතයයි දනිමි. ලෞකික සිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනිමි. සමාධි ගතවූ සිත සමාධි ගතවූ සිතයයි දනිමි. සමාධි ගතනොවූ සිත සමාධි ගතනොවූ සිතයයි දනිමි. (ක්ලේශයන්ගෙන්) මිදුනු සිත (ක්ලේශයන්ගෙන්) මිදුනු සිතයයි දනිමි. (ක්ලේශයන්ගෙන්) නොමිදුනු සිත (ක්ලේශයන්ගෙන්) නොමිදුනු සිතයයි දනිමි.'

'මහණෙනි, ආනන්ද තෙමේද, යම්තාක් කල් කැමැතිවෙයිද, ඒතාක් අන්‍ය සත්වයින්ගේ අන්‍ය පුද්ගලයින්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දනියි. (කෙසේද?) රාග සහිත සිත රාග සහිත සිතයයි දනියි. රාග රහිත සිත රාග රහිත සිතයයි දනියි. ද්වේෂ සහිත සිත ද්වේෂ සහිත සිතයයි දනියි. ද්වේෂ රහිත සිත ද්වේෂ රහිත සිතයයි දනියි. මෝහ සහිත සිත මෝහ සහිත සිතයයි දනියි. මෝහ රහිත සිත මෝහ රහිත සිතයයි දනියි. හැකුළුණු සිත හැකුළුණු සිතයයි දනියි. විසුරුණු සිත විසුරුණු සිතයයි දනියි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිතයයි දනියි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිතයයි දනියි. කාම සහිත සිත කාම සහිත සිතයයි දනියි. ලෞකික සිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනියි. සමාධි ගතවූ සිත සමාධි ගතවූ සිතයයි දනියි. සමාධි ගතනොවූ සිත සමාධි ගතනොවූ සිතයයි දනියි. (ක්ලේශයන්ගෙන්) මිදුනු සිත (ක්ලේශයන්ගෙන්) මිදුනු සිතයයි දනියි. (ක්ලේශයන්ගෙන්) නොමිදුනු සිත (ක්ලේශයන්ගෙන්) නොමිදුනු සිතයයි දැන ගනියි. කියා දක්වනු ලැබුවෙමි."

"ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුවෙමි.

'මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් අන්‍ය සත්වයින්ගේ අන්‍ය පුද්ගලයින්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දනිමි. (කෙසේද?) රාග සහිත සිත රාග සහිත සිත යයි දනිමි. රාග රහිත සිත රාග රහිත සිතයයි දනිමි. ද්වේෂ සහිත සිත ද්වේෂ සහිත සිතයයි දනිමි. ද්වේෂ රහිත සිත ද්වේෂ රහිත සිතයයි දනිමි. මෝහ සහිත සිත මෝහ සහිත සිතයයි දනිමි. මෝහ රහිත සිත මෝහ රහිත සිතයයි දනිමි. හැකුළුණු සිත හැකුළුණු සිතයයි දනිමි. විසුරුණු සිත විසුරුණු සිතයයි දනිමි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිතයයි දනිමි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිතයයි දනිමි. කාම සහිත සිත කාම සහිත සිතයයි දනිමි. ලෞකික සිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනිමි. සමාධිගතවූ සිත සමාධි ගතවූ සිතයයි දනිමි. සමාධි ගතනොවූ සිත සමාධි ගතනොවූ සිතයයි දනිමි. (ක්ලේශයන්ගෙන්) මිදුනු සිත (ක්ලේශයන්ගෙන්) මිදුනු සිතයයි දනිමි. (ක්ලේශයන්ගෙන්) නොමිදුනු සිත (ක්ලේශයන්ගෙන්) නොමිදුනු සිතයයි දනිමි. දැනගතිමි.

මහණෙනි, කස්සප තෙමේද, යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් අන්‍ය සත්වයින්ගේ අන්‍ය පුද්ගලයින්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දනියි. (කෙසේද?) රාග සහිත සිත රාග සහිත සිතයයි දනියි. රාග රහිත සිත රාග රහිත සිතයයි දනියි. ද්වේෂ සහිත සිත ද්වේෂ සහිත සිතයයි දනියි. ද්වේෂ රහිත සිත ද්වේෂ රහිත සිතයයි දනියි. මෝහ සහිත සිත මෝහ සහිත සිතයයි දනියි. මෝහ රහිත සිත මෝහ රහිත සිතයයි දනියි. හැකුළුණු සිත හැකුළුණු සිතයයි දනියි. විසුරුණු සිත විසුරුණු සිතයයි දනියි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිතයයි දනියි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිතයයි දනියි. කාම සහිත සිත කාම සහිත සිතයයි දනියි. ලෞකික සිත් අතුරෙන් උසස්වූ සිත අනුත්තර සිතයයි දනියි. සමාධි ගතවූ සිත සමාධිගතවූ සිතයයි දනියි. සමාධි ගතනොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනියි. (ක්ලේශයන්ගෙන්) මිදුනු සිත (ක්ලේශයන්ගෙන්) මිදුනු සිතයයි දනියි. (ක්ලේශයන්ගෙන්)

නොමිදුනු සිත (ක්ලේශයන්ගෙන්) නොමිදුනු සිතයයි දැනගනියි. කියා දක්වනු ලැබුවෙමි.”

17. “ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුයෙහිද? මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් නානාප්‍රකාරවූ පෙර වාසය කළ තැන් සිහිකරමි. (හේ කෙසේද?) එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශවෙන) කල්පයන්ද. නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත, විවර්ත කල්පයන්ද අසවල් තැන උපන්නෙමි. එහි මෙනම් ඇත්තේවීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේවීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු දුක්සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේවීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේවීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු සැප දුක් වින්දේවීමි. මෙබඳු ආයුෂ ඇත්තේවීමි. ඒ මම එතැනින් චුතව මේ මනුෂ්‍යාත්මභාවයෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිතවූ, උදෙසීම් සහිතවූ, නානාප්‍රකාරවූ, පෙර විසූ කඳ පිළිවෙළ සිහිකරමි.

‘මහණෙනි, ආනන්ද තෙමේද, යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් නානාප්‍රකාරවූ පෙර වාසය කළ තැන් සිහි කරයි. (හේ කෙසේද?) එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශවෙන) කල්පයන්ද, නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත, විවර්ත කල්පයන්ද, අසවල් තැන උපන්නෙමි. එහි මෙනම් ඇත්තේවීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේවීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු දුක් සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසවල් තැන උපන්නෙමි.

එතැන්හිද මෙසේ නම් ඇත්තේවීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේවීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු සැප දුක් වින්දේවීමි. මෙබඳු ආයුෂ ඇත්තේවීමි. ඒ මම එතැනින් චුතව මේ මනුෂ්‍යාත්මභාවයෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිතවූ, උදෙසීම් සහිතවූ, නානාප්‍රකාරවූ, පෙර විසූ කඳපිළිවෙළ සිහිකෙරෙයි කියා දක්වනු ලැබුවෙමි.”

“ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුවෙමි.

‘මහණෙනි, මම යම්තාක්කල් කැමැති වෙම්ද, ඒතාක් නානාප්‍රකාරවූ පෙර වාසය කළ තැන් සිහිකරමි. (හේ කෙසේද?) එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශවෙන) කල්පයන්ද, නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත, විවර්ත කල්පයන්ද අසවල් තැන උපන්නෙමි. එහි මෙනම් ඇත්තේවීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේවීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු දුක් සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේවීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේවීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු සැප දුක් වින්දේවීමි. මෙබඳු ආයුෂ ඇත්තේවීමි. ඒ මම එතැනින් චුතව මේ මනුෂ්‍යාත්මභාවයෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිතවූ, උදෙසීම් සහිතවූ, නානාප්‍රකාරවූ, පෙර විසූ කඳ පිළිවෙළ සිහිකරමි.

‘මහණෙනි, කාශ්‍යප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් නානාප්‍රකාරවූ පෙර වාසය කළ තැන් සිහි කරයි. (හේ කෙසේද?) එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති

දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශවෙන) කල්පයන්ද, නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත, විවර්ත කල්පයන්ද අසවල් තැන උපන්නෙමි. එහි මෙනම් ඇත්තේවීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේවීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු දුක් සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේවීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේවීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු සැප දුක් වින්දේවීමි. මෙබඳු ආයුෂ ඇත්තේවීමි. ඒ මම එතනින් චුතව මේ මනුෂ්‍යාත්ම භාවයෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිතවූ, උදෙසීම් සහිතවූ, නානාප්‍රකාරවූ, පෙර විසූ කඳපිළිවෙළ සිහිකෙරෙයි කියා දක්වනු ලැබුවෙමි.”

18. “ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂුසංඝයාට දක්වනු ලැබුයෙහිද? ‘මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටියාවූ දිවැසින් චුත වන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය අනුව මිය පරලොව ගියාවූ සත්වයන් දකිමි. (කෙසේද?) ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනෝ දුශ්චරිතයෙන් යුක්තවූවාහු ආර්‍ය්‍යයන්හට දොස්කීවාහු, මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු, සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන නරකයෙහි උපන්නාහුයයිද.

‘මේ පින්වත් සත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්ත වූවාහු, වාක් සුචරිතයෙන් යුක්තවූවාහු, මනෝ සුචරිතයෙන් යුක්තවූවාහු ආර්‍ය්‍යයන්හට දොස් නොකීවාහු, සම්‍යක් දෘෂ්ටි ඇත්තාහු, සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු, ස්වර්ග ලෝකයෙහි උපන්නාහුයයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටි, දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ, (ශරීර) වර්ණ ඇත්තාවූද මනාවූ, (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය පරිදි මිය පරලොව ගියාවූ සත්වයන් දැනගතිමි.

'මහණෙනි, ආනන්ද තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටියාවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය අනුව මිය පරලොව ගියාවූ සත්වයන් දකියි. (කෙසේද?) ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනෝ දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්‍යයන්හට දොස් කීවාහු, මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු, සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන නරකයෙහි උපන්නාහුයයිද.'

'මේ පින්වත් සත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්තවූවාහු, වාක් සුචරිතයෙන් යුක්තවූවාහු, මනෝ සුචරිතයෙන් යුක්තවූවාහු, ආර්‍යයන්හට දොස් නොකීවාහු, සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු, සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු, ස්වර්ග ලෝකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටි, දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ, (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ, (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය පරිදි මිය පරලොව ගියාවූ සත්වයන් දැනගනියි කියා දක්වනු ලැබුවෙමි."

"ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිද භික්ෂුසංඝයාට දක්වනු ලැබුවෙමි.

'මහණෙනි, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටියාවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය අනුව මිය පරලොව ගියාවූ සත්වයන් දකිමි. (කෙසේද?) ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනෝ දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, ආර්‍ය්‍යයන්හට දොස් කීවාහු, මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු, සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන නරකයෙහි උපන්නාහුයයිද'

'මේ පින්වත් සත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්තවූවාහු, වාක් සුචරිතයෙන් යුක්තවූවාහු, මනෝ සුචරිතයෙන් යුක්තවූවාහු ආර්‍ය්‍යයන්හට දොස් නොකීවාහු, සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු, ස්වර්ග ලෝකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටි, දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ, (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ, (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය පරිදි මිය පරලොව ගියාවූ සත්වයන් දැනගතිමි.

'මහණෙනි, කස්සප තෙමේද යම්තාක් කල් කැමැති වෙයිද, ඒතාක් පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටියාවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත්ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද' කර්මය අනුව මිය පරලොව ගියාවූ සත්වයන් දකියි. (කෙසේද?) ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනෝ දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්‍ය්‍යයන්හට දොස් කීවාහු,

මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු, සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන නරකයෙහි උපන්නාහුයයිද.'

'මේ පින්වත් සත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්තවූවාහු, වාක් සුචරිතයෙන් යුක්තවූවාහු, මනෝ සුචරිතයෙන් යුක්තවූවාහු, ආර්‍ය්‍යයන්හට දොස් නොකීවාහු, සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු, ස්වර්ග ලෝකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටි, දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ, (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ, (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය පරිදි මිය පරලොව ගියාවූ සත්වයන් දැන ගතියි කියා දක්වනු ලැබුවෙමි,"

**19.** "ඇවැත් ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? නුඹ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදු භික්ෂු සංඝයාට දක්වනු ලැබුයෙහිද 'මහණෙනි, මම ආශ්‍රවයන් (කෙලෙස්) ක්ෂය කිරීමෙන්ද, ආශ්‍රව රහිතවූ, චේතෝ විමුත්තියද, (අර්හත් ඵල සමාධියද) පඤ්ඤවිමුත්තියද, මේ ආත්මයෙහිදී තෙමේ ම දැන, ප්‍රත්‍ය කොට, ඊට පැමිණ වාසය කරමි.

'මහණෙනි, ආනන්දතෙමේද ආශ්‍රවයන් (කෙලෙස්) ක්ෂය කිරීමෙන්, ආශ්‍රව රහිතවූ, චේතෝ විමුත්තියද, පඤ්ඤා විමුක්තියද (අර්හත් ඵල ප්‍රඥාවද) මේ ආත්මයෙහිදී තෙමේ ම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

"ස්වාමීනි, එය එසේ නොවේමය. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිදී භික්ෂු සංඝයාට දක්වනු ලැබුවෙමි.'

'මහණෙනි, මම ආශ්‍රවයන් (කෙලෙස්) ක්ෂය කිරීමෙන්, ආශ්‍රව රහිතවූ, චේතෝ විමුක්තියද, තෙමේ ම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කියා දක්වනු ලැබුවෙමි.'

'මහණෙනි, කස්සප තෙමේද ආශ්‍රවයන් (කෙලෙස්) ක්ෂය කිරීමෙන්, ආශ්‍රව රහිතවූ, චේතෝ විමුත්තියද, පඤ්ඤා විමුත්තියද (අර්හත් ඵල ප්‍රඥාවද) මේ ආත්මයෙහිදී තෙමේ ම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කෙරෙයි කියා දක්වනු ලැබුවෙමි."

"ඇවත, යමෙක් මාගේ ෂට් අභිඥාවන් වැසිය යුතුයයි හඟින්නේවේ නම්, හෙතෙම හත්රියන් හෝ හත් රියන් හමාරක් හෝ වූ, ඇතෙකු තල්පතකින් වැසිය යුතුයයි හඟින්නෙකු වැනිය.

ථුල්ලතිස්සා මෙහෙණද බ්‍රහ්මචරියාවෙන් (ශාසනයෙන්) චුතවූවාය."

**(දසවෙනි උපස්සය සූත්‍රය නිමි.)**

---

## 11. චීවර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ඇවැත් මහා කස්සපතෙම රජගහනුවර කලන්දකනිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරනසේක. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම මහත්වූ භික්ෂු සංඝයා හා සමග 'දක්ෂිණගිරියෙහි' චාරිකාවෙහි හැසිරෙයි. එසමයෙහි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගේ බෙහෙවින් ළදරුවූ, තිසක් පමණ ශිෂ්‍ය භික්ෂූහු ශික්ෂාව ප්‍රතික්ෂේප කොට ගිහිවූවාහු වෙති.

2. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවීරතෙම "දක්ෂිණ ගිරියෙහි" කැමතිතාක් චාරිකාවෙහි හැසිර, රජගහනුවර වේළුවන නම් "කලන්දක නිවාපය" යම් තැනෙක්හිද, ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේට වැඳ, එක්පසක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්හට ආයුෂ්මත් මහාකස්සප ස්ථවිරයන් වහන්සේ මෙය කීයේය.

"ඇවැත් ආනන්දයෙනි, කිනම් අර්ථයක් නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් කුලයන්හි 'තිකභෝජනය' (ගණ භොජන ශික්ෂාපදය) පණවන ලදද?

"ස්වාමීනි, කරුණු තුනක් නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් කුලයන්හි 'තිකභෝජනය' පණවනලදී. (එනම්:-) දුශ්ශීල පුද්ගලයන්හට නිග්‍රහකිරීම පිණිසද, සිල්වත් භික්ෂූන්ගේ පාසුවිහරණය පිණිසත්, පාප අදහස් ඇත්තෝ පක්ෂයක් ගෙන සංඝයා භෙද නොකෙරෙත්වා කියාද කුලයන් කෙරෙහි අනුකම්පාව නිසාද යන කරුණු තුනය. ස්වාමීනි, කස්සප ස්ථවිරයන් වහන්ස, මේ තෙවැදෑරුම් අර්ථය නිසා භාග්‍යවතුන්වහන්සේ කුලයන්හි 'තිකභෝජනය' පණවන ලදී" "ඇවැත් ආනන්දයිනි, එසේ තිබියදී නුඹ කවර කාරණයක් නිසා, මේ ඉන්ද්‍රිය සංවරයක් නැත්තාවූ, භෝජනයෙහි ප්‍රමාණය නොදන්නාවූ, නිදිවර්ජිත කිරීමෙහි නොයෙදුනාවූ' අලුත් මහණුන් හා සමග චාරිකාවෙහි හැසිරෙයිද? බෝගපැල විනාශ කරමින් ඇවිදින්නෙහියයි හඟිමි. කුලයන් නසමින් ඇවිදින්නෙහියයි හඟිමි. ඇවැත් ආනන්දයිනි, තොපගේ මේ අලුත් පිළිවෙළින් තොපගේ පිරිස විනාශ වන්නීය. තොපගේ පිරිස බිඳෙන්නීය. මේ* කුමාර (ළදරු) තෙමේ තමාගේ ප්‍රමාණය නොදන්නේයයි කීය."

"ස්වාමීනි, කස්සප ස්ථවිරයන් වහන්ස, මාගේ හිසකෙස් ද පැසීගොස්ය. එතකුදු වුවත් අපි අද දක්වාත් ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේගේ ළදරුවා කියා ආමන්ත්‍රණයකිරීමෙන් නොමිදෙමුයි කීයේය."

"එය එසේමය. ඇවැත් ආනන්දය, නුඹ මේ ඉන්ද්‍රිය සංවරයක් නැත්තාවූ භෝජනයෙහි ප්‍රමාණය නොදන්නාවූ, නිදි වර්ජිත කිරීමෙහි නොයෙදුනාවූ, අලුත් මහණුන් හා සමග චාරිකාවෙහි හැසිරෙහිය. ධාන්‍ය පැල විනාශ කරමින් හැසිරෙහියයි හඟිමි. කුලයන් විනාශකරමින් හැසිරෙහියයි හඟිමි.

* මහා කස්සප ස්ථවිරයන් වහන්සේ වයස්ගතවූ පසුත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට දරුවා කියා කථා කරති.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇවැත් ආනන්දය, නුඹගේ මේ අලුත් පිලිවෙළින් පිරිස බිඳෙයි ඇවැත් ආනන්දය, නුඹගේ පිරිස විනාශ වෙයි. මේ කුමාරයා (ළදරුවා) තමාගේ ප්‍රමාණය නොදන්නේයයි කීය.

3. මහා කස්සප ආයුෂ්‍යන් වහන්සේ විසින් පණ්ඩිත භික්ෂුවක්වූ, ආනන්ද ආයුෂ්‍යන් වහන්සේ කුමාර වාදයෙන් නින්දා කරනු ලැබුවේයයි ථුල්ලනන්දා නම් භික්ෂුණිය ඇසුවාය. ඉක්බිති එයින් නොසතුටු සිත් ඇත්තාවූ, ථුල්ල නන්දා භික්ෂුණිය නොසතුටු වචනයක් නිකුත්කළාය. (එනම්:) කිමෙක්ද? මහා කස්සප ආයුෂ්‍යන් වහන්සේ පෙර අන්‍ය තීර්ථකව සිටුවාවූ මහා කස්සප ආයුෂ්‍යන් වහන්සේ පණ්ඩිත භික්ෂුවක්වූ, ආනන්ද ආයුෂ්‍යන් වහන්සේ කුමාර වාදයෙන් නින්දා කළයුත්තෙකැයි හඟින්නේද?" කියායි.

ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේ ථුල්ල නන්දා භික්ෂුණිය විසින් කියනලද මේ වචනය ඇසූහ. ඉක්බිති ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්හට මෙය කීයේය. "ඇවැත් ආනන්දයිනි, ථුල්ලනන්දා භික්ෂුණිය විසින් ඉක්මන්වී, කරුණු නොසලකා වචනයක් කියනලදී. ඇවැත්නි, මම වනාහි යම් තැනක පටන් හිසකෙස් දැලිරවුල් බාවා, (බැහැර කරවා) කසාවත් හැඳ, අගාර නම් ලත් ගිහිගෙයින් නික්ම, අනගාරිය නම් ලත් ශාසනයෙහි පැවිදිවූයේ වෙම්ද, (එතැන් පටන් මම) ඒ භාග්‍යවත්වූ, අර්හත්වූ, සම්මා සම්බුදුන් හැර, අන්‍ය ශාස්තෘවරයකු දැක්වීමට නොදනිමි. ඇවැත්නි, පෙර ගිහිගෙයි වාසය කරන්නාවූ මට මේ සිත ඇතිවූයේය. 'ගිහිගෙයි විසීම් අවහිරය. රජස් (දූවිලි) උපදනා තැනකි. පැවිදිවීම අබ්භොකාස්ථානයයි. (එළිමහන් තැනයි.) ගිහිගෙයි වසන්නන් විසින් ඒකාන්තයෙන් සම්පූර්ණවූ, ඒකාන්තයෙන් පිරිසිදුවූ, සෝදනලද හක්ගෙඩියක් මෙන් පිරිසිදුවූ මේ බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නට පහසු නොවේ. මම කෙස් රවුළු කපා හැර, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම, අනගාරිකව, පැවිදි වන්නෙම් නම් ඉතා හොඳය කියායි. ඇවැත්නි, පසුව ඒ මම කපනලද රෙදි කැබලිවලින් දෙපට සිවුරක් කොට

ලෝකයෙහි යම් රහත්හු වෙත්ද, ඒ රහතුන් උදෙසා කෙස් රවුළු කපා හැර, කසාවත් හැඳ, ගිහිගෙයින් නික්මී, අනගාරිකව පැවිදිවූයෙමි. ඒ මම මෙසේ පැවිදිව දීර්ඝ මාර්ගයට පිළිපන්නේ, රජගහනුවරටද, නාලන්දාවටද අතරෙහිවූ බහුපුත්තචෛතිය නම් ස්ථානයෙහි වැඩහුන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දැක්කෙමි. දැක, මට මේ සිත පහළවිය.

4. 'ඉදින් මම ශාස්තෘවරයෙකු දක්නෙම් නම් එය මේ භාග්‍යවතුන් වහන්සේම දැක්මය. ඉදින් මම සම්‍යක් ප්‍රතිපත්තියෙහි ගමන් කළ කෙනෙකු දැක්නෙම් නම් ඒ භාග්‍යවතුන් වහන්සේම දැක්මය. ඉදින් මම සියල්ල අවබොධ කළ කෙනෙකු දක්නෙම් නම් ඒ භාග්‍යවතුන් වහන්සේම දැක්මය' කියායි. ඇවැත්නි, ඒ මම වනාහි එහිදීම භාග්‍යවතුන් වහන්සේගේ සිරි පා දෙක ළඟ වැටී, භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘන් වහන්සේ වනසේක. මම (ඔබවහන්සේගේ) ශ්‍රාවකයෙක් වෙමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘන්වහන්සේ වනසේක. මම (ඔබවහන්සේගේ) ශ්‍රාවකයෙක් වෙමි.' ඇවැත්නි, මෙසේ කී කල්හි මට භාග්‍යවතුන් වහන්සේ මෙය කීසේක. 'කස්සපය, යමෙක් වනාහි මෙසේ මුළුහිතින්ම යුක්තවූ, ශ්‍රාවකයෙකුහට නොදැන දනිමියි කියයි නම්, නොදැක දක්නෙමියි කියයි නම් ඔහුගේ හිසද පැලෙන්නේය. කස්සපය, මම වනාහි දැනම දනිමියි කියමි. දැකම දකිමියි කියමි. එහෙයින් කස්සපය, මෙහිදී නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) ස්ථවිර භික්ෂූන් කෙරෙහිද නවක භික්ෂූන් කෙරෙහිද, මද්ධ්‍යම භික්ෂූන් කෙරෙහිද, මාගේ තියුණුවූ හිරි ඔතප් (ලජ්ජා භය) දෙක එළඹ සිටියේ වන්නේය කියායි. කස්සපය, නුඹ මෙසේ හික්මිය යුතුයි. කස්සපය, මෙහිදී නුඹ මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) කුශලින් යුක්තවූ, යම්කිසි ධර්මයක් අසම්ද, ඒ සියල්ල අර්ථ සහිත කොට, මෙනෙහිකොට, මුළුසිතින් එක්තැන් කොට, යොමුකරනලද කන් ඇතිව, ධර්මය අසන්නෙමියි කියායි. කස්සපය, නුඹ මෙසේ හික්මිය යුතුයි. කස්සපය, මෙහිදී නුඹ මෙසේ හික්මිය යුතුයි.

(කෙසේද?) මාගේ සොම්නස් සහගත කායගතාසතිය අත්නොහරින්නේයයි කියායි. කස්සපය, නුඹ මෙසේ හික්මිය යුතුයි.

5. "ඇවත, ඊටපසු භාග්‍යවතුන් වහන්සේ මේ අවවාදයෙන් මට අවවාද කොට, හුනස්නෙන් නැඟිට වැඩිසේක.

"ඇවත, මම වනාහි සත් දිනක් පමණක් නය සහිත "රට්ඨපිණ්ඩය" (රටවැසියන් දෙන පිණ්ඩපාතය) අනුභව කෙළෙමි. ඉක්බිති අටවැනිදා රහත්ඵලය පහළවිය. ඉක්බිති ඇවත, භාග්‍යවතුන් වහන්සේ මගින් ඉවත්වී, යම් තැනෙක්හි එක්තරා රුක්මුලක් වූයේද එතැනට වැඩිසේක. ඇවත, අනතුරුව මම කඩකොට කපනලද රෙදි කැබලිවලින් කළ දෙපොට සිවුර සතරට නවා ආසනයක් පනවා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයෙමි. 'ස්වාමීනි, මෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩසිටිනසේක්වා. එය මට බොහෝ කාලයක් මුළුල්ලෙහි හිත පිණිස, සැප පිණිස වන්නේය' කියායි. ඇවත, භාග්‍යවතුන් වහන්සේ පණවනලද ආසනයෙහි වැඩහුන්සේක. ඇවත, වැඩහුන්නාවූ, භාග්‍යවතුන් වහන්සේ මට මෙසේ වදාළේය. 'කස්සපය, තාගේ කැපූ රෙදිකැබලිවලින් කළ (පට පිලෝතිකය) දෙපොට සිවුර මෘදුය' කියායි. 'ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ මට අනුකම්පාකොට කැපූ රෙදි කැබලිවලින් කළ දෙපොට සිවුර පිළිගන්නාසේක්වායි' කීයෙමි. කස්සපය, නුඹ හණ නූලින් කරනලද, (පාවිච්චිකිරීමෙන්) පරණවූ මාගේ පාංසුකූල චීවරය වනාහි දරන්නෙහිද? 'ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ හණනූලින් කරනලද, (පාවිච්චිකිරීමෙන්) පරණවූ පාංසුකූල චීවරය දරන්නෙමි ඇවත, යම් ඒ පුද්ගලයෙක් වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ලයෙන්ද මුඛයෙන්ද පහළවූ, ධර්මයෙන් උපන්නාවූ, ධර්මයෙන් නිර්මිතවූ, ධර්මයට දායාදකොට ඇත්තාවූ, පුත්‍රතෙම හන නූලෙන් කරනලද (පාවිච්චිකිරීමෙන්) පරණවූ පාංසුකූල සිවුර පිළිගත්තේයයි මනාකොට කියන්නේ නම් භාග්‍යවතුන් වහන්සේගේ ලයෙන් මුඛයෙන්ද පහළවූ, ධර්මයෙන් උපන්නාවූ, ධර්මයෙන් නිර්මිතවූ, ධර්මයට දායාදවූ, හණ නූලෙන් කරනලද, (පාවිච්චි කිරීමෙන්) පරණවූ පාංසුකූල සිවුර පිළිගත් පුත්‍රයාය යන මෙය මටම කියයුතු වන්නේය."

**6.** "ඇවත, මම වනාහි යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් කාමයන්ගෙන් වෙන්වම (සියලු) අකුශල ධර්මයන් වෙන්වම විතර්ක සහිතවූ විචාර රහිතවූ විතර්කයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරමි.

"ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒ තාක් විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් සිතේ පැහැදීම ඇති කරන්නාවූ, හිතේ එකඟ බව ඇති කරන්නාවූ, විතර්ක රහිතවූ විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරමි."

"ඇවත, මම යම්තාක් කල් කැමැතිවෙම්ද, ඒතාක් කල් ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරමි. සිහියෙන් යුක්තවූයේ කයින් වින්දේමි. යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ සිහියෙන් යුක්තවූයේ සැප විහරණ ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියත්ද ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වාසයකරමි.

"ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් සැපය නැතිකිරීමෙන්, දුක නැතිකිරීමෙන්, කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන්, දුක් නැත්තාවූ, සැප නැත්තාවූ, උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරමි"

"ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන්, පටිඝ (ගැටීම්) සංඥාවන් නැතිකිරීමෙන්, නානත්ත සංඥාවන් මෙනෙහි නොකිරීමෙන්, "ආකාසය අනන්තයයි" ආකාසානඤ්චා-යතනයට පැමිණ වාසය කරමි."

"ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා "විඤ්ඤාණය අනන්තයයි" විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරමි.

"ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා, කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරමි."

"ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා, නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරමි.

"ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් සියලු ආකාරයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා, සඤ්ඤාවේදයිත නිරෝධයට පැමිණ වාසය කරමි.'

7. "ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් නොයෙක් ආකාරවූ, ඍද්ධිවිධි වෙන් වෙන් කොට (අනුභව කරමි) දක්වමි. (කෙසේද?) එකෙක්ව බොහෝ වෙමි. බොහෝසේව එකෙක් වෙමි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය විනිවිද, පවුර විනිවිද, පර්වතය විනිවිද, නොහැපෙමින් යමි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කරමි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබිඳ ගමන් කරමි. පක්ෂියකු මෙන් අහසෙහිද පයඖංකයෙන් (අරමිණිය ගොතා) හිඳගෙනම යමි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගාමි. පිරිමදිමි. බඹලොව තෙක් ශරීරයෙන් වසඟ කරමි."

8. "ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් පිරිසිදුවූ, මිනිස් කණ ඉක්මවා පැවැත්තාවූ, දිවකණින් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරවූද, ළඟවූද ශබ්ද අසමි.

9. "ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් අන්‍ය සත්වයින්ගේ, අන්‍ය පුද්ගලයින්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දනිමි. (කෙසේද?) රාග සහිත සිත රාග සහිත සිතයයි දනිමි. රාග රහිත සිත රාග රහිත සිතයයි දනිමි. ද්වෙෂ සහිත සිත ද්වෙෂ සහිත සිතයයි දනිමි. ද්වෙෂ රහිත සිත ද්වෙෂ රහිත සිතයයි දනිමි. මෝහ සහිත සිත මෝහ සහිත සිතයයි දනිමි. මෝහ රහිත සිත මෝහ රහිත සිතයයි දනිමි. හැකුළුණු සිත හැකුළුණු සිතයයි දනිමි. විසුරුණු සිත විසුරුණු සිතයයි දනිමි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිතයයි දනිමි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිතයයි දනිමි. කාම

සහිත සිත කාම සහිත සිතයයි දනිමි. ලෞකික සිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනිමි. සමාධිගතවූ සිත සමාධිගතවූ සිතයයි දනිමි. සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනිමි. (ක්ලේශයන්ගෙන්) මිදුනු සිත (ක්ලේශයන්ගෙන්) මිදුනු සිතයයි දනිමි. (ක්ලේශයන්ගෙන්) නොමිදුනු සිත (ක්ලේශයන්ගෙන්) නොමිදුනු සිතයයි දැනගනිමි.

**10.** "ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් නානාප්‍රකාරවූ පෙර වාසයකළ තැන් සිහි කරමි. හේ කෙසේද? එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිහක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශවෙන) කල්පයන්ද; නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත, විවර්ත කල්පයන්ද අසවල් තැන උපන්නෙමි. එහි මෙනම් ඇත්තේවීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේවීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු දුක් සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේවීමි. මෙබඳු (ශරීර) වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු සැප දුක් වින්දේවීමි. මෙබඳු ආයුෂ ඇත්තේවීමි. ඒ මම එතැනින් චුතව මේ මනුෂ්‍යාත්මභාවයෙහි උපන්නෙමියි මෙසේ ආකාර සහිතවූ, උදෙසීම් සහිතවූ, නානාප්‍රකාරවූ, පෙර විසූ කඳ පිළිවෙළ සිහිකරමි."

"ඇවත, මම යම්තාක් කල් කැමැති වෙම්ද, ඒතාක් පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටියාවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ (ශරීරා) වර්ණ ඇත්තාවූද, මනාවූ (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්මය අනුව මිය පරලොව ගියාවූ සත්වයන් දකිමි. (කෙසේද?) ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහු, මනෝ දුශ්චරිතයෙන් යුක්තවූවාහු,

ආයර්‍යයන්හට දොස් කීවාහු, මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු, සැපයෙන්පහවූ නපුරුගති ඇති, යටිකුරුව වැටෙන නරකයෙහි උපන්නාහුයයිද.

මේ පින්වත් සත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්ත වූවාහු, වාක් සුචරිතයෙන් යුක්තවූවාහු, මනෝ සුචරිතයෙන් යුක්තවූවාහු, ආයර්‍යයන්හට දොස් නොකීවාහු, සම්‍යක් දෘෂ්ටි ඇත්තාහු, සම්‍යක් දෘෂ්ටිකර්ම සමාදන් වූවාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු ස්වර්ග ලෝකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින්, චුතවන්නාවූද, උපදින්නාවූද, හීන (ලාමක) වූද, ප්‍රණීත (උසස්) වූද, මනාවූ (ශරීර) වර්ණ ඇත්තාවූද, මනාවූ (ශරීර) වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද යහපත් ගති නැත්තාවූද, කර්මය පරිදි මිය පරලොව ගියාවූ සත්වයන් දැනගනිමි.

11. "ඇවත, ආශ්‍රවයන් (කෙලෙස්) ක්ෂයකිරීමෙන්, ආශ්‍රව රහිතවූ, චේතෝ විමුක්තියද (අර්හත්ඵල සමාධියද), පඤ්ඤා විමුක්තියද (අර්හත්ඵල ප්‍රඥාවද), මේ ආත්මයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කරමි.

"ඇවත, යමෙක් මාගේ ෂට්අභිඥාවන් වැසිය යුතුයයි හඟින්නේවේද, හෙතෙම හත්රියන් හෝ හත්රියන් හමාරක් හෝ වූ ඇතෙකු තල්පතකින් වැසිය යුතුයයි හඟින්නෙකු වැනිය. ථුල්ලනන්දා භික්ෂුණියද බ්‍රහ්මචරියාවෙන් (ශාසනයෙන්) චුතවූවාය.

**(එකොළොස්වෙනි චීවර සූත්‍රය නිමි.)**

---

## 12. පරම්මරණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද බරණැස්නුවර මිගදායෙහි

ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්. ඉක්බිති, ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරතෙමේ සවස් කාලයෙහි විවේක ස්ථානයෙහි නැඟී සිටියේ, ආයුෂ්මත් මහාකස්සප ස්ථවිරතෙම යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් හා සමග සතුටුවූයේය. සතුටු විය යුතුවූත් සිහිකටයුතුවූත් කථාවකොට නිමවා, එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍රතෙම ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන්හට මෙය කීයේය.

2. "ඇවැත් කස්සපය, කිමෙක්ද? සත්වතෙම මරණින් පසුවෙයිද? ඇවත, සත්වයා මරණින් පසුවෙයි යනමෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණලදී. කිමෙක්ද ඇවත, සත්වයා මරණින් පසු නොවෙයිද? සත්වයා මරණින් පසු නොවෙයි යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී. කිමෙක්ද? ඇවත සත්වයා මරණින් පසු වන්නේත්, නොවන්නේත් වෙයිද? ඇවත, සත්වයා මරණින් පසු වන්නේත්, නොවන්නේත් වෙයි යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී. කිමෙක්ද ඇවත? සත්වයා මරණින් පසු නොවන්නේත්, නොවනු නොවන්නේත් වෙයිද? ඇවත, සත්වයා මරණින් පසු සත්වයෙක් නොවන්නේත්, නොවනු නොවන්නේත් වෙයි යන මෙයද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී. ඇවැත, කුමක් හෙයින් මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදද? ඇවත, මෙය වනාහි අර්ථසහිතවූවක් නොවන්නේය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට පූර්වභාග ප්‍රතිපදාවක් නොවන්නේය. එසේම කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිරෝධය පිණිසද, සංසිඳීම පිණිසද, දැනගැනීම පිණිසද, අවබෝධය පිණිසද, නිර්වාණය පිණිසද නොවන්නේය. ඒ නිසා එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදී."

3. "ඇවැත, එසේනම් කුමක් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදද? ඇවත, මෙය වනාහි දුකයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. මෙය දුක්ඛසමුදයයි (දුක් ඇතිවීමේ හේතුවයයි) භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. මෙය

දුක්ඛ නිරෝධයයි (දුක් නැතිවීමයයි) භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. මෙය දුක්ඛ නිරෝධ ගාමිනීපටිපදාවයයි (දුක් නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගයයි) භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. ඇවත, මෙය කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද? ඇවත, මෙය වනාහි අර්ථසහිත වන්නේය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට පූර්වභාග ප්‍රතිපදාව වන්නේය. එසේම කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිරෝධය පිණිසද, සංසිඳීම පිණිසද, දැනගැනීම පිණිසද, අවබෝධය පිණිසද, නිර්වාණය පිණිසද, වන්නේය. ඒ නිසා එය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී."

**(දොළොස්වෙනි පරම්මරණ සූත්‍රය නිමි.)**

---

## 13. සද්ධම්මප්පතිරූපක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක.

ඉක්බිති, ආයුෂ්මත් මහා කස්සපතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් මහාකාශ්‍යපතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

2. "ස්වාමීනි, යම්හෙයකින් පෙර ශික්ෂාපදයෝ ඉතා ස්වල්ප වූවාහුද බොහෝවූ භික්ෂූහු රහත් බැව්හි පිහිටියාහුද, ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද? ස්වාමීනි, යම් හෙයකින් දැන් ශික්ෂාපදයෝ ඉතා බොහෝ වූවාහුද ඉතා ස්වල්පවූ භික්ෂූහු රහත්බැව්හි පිහිටියාහුද, ඊට හේතුව කවරේද, ප්‍රත්‍යය කවරේද?" 'කස්සපය, මෙය වනාහි මෙසේ වෙයි. සත්වයන් පිරිහෙන කල්හි සද්ධර්මය අන්තර්ධාන වන කල්හි ශික්ෂාපද ඉතා බොහෝ වෙත්. ඉතා ස්වල්පවූ භික්ෂූහු රහත්බැව්හි පිහිටත්. කස්සපය,

යම්තාක් ලෝකයෙහි "සද්ධර්ම ප්‍රතිරූපකයන් (පෙනුමෙන් සද්ධර්මය වැන්නක්) නූපදීද, ඒතාක් සද්ධර්මයාගේ අන්තර්ධානය නොවේ. කස්සපය, යම්තැනක පටන් ලෝකයෙහි සද්ධර්මප්‍රතිරූපකයක් (පෙනුමෙන් සද්ධර්මය වැන්නක්) උපදීද, එකල්හි සද්ධර්මයාගේ අන්තර්ධානය වෙයි. කස්සපය, යම්සේ වනාහි යම්තාක්කල් ජාතරූප ප්‍රතිරූපකයක් (පෙනුමෙන් රත්රන් වැන්නක්) ලෝකයෙහි නූපදීද, ඒතාක්කල් ජාතරූපයාගේ (රත්රනයේ) අන්තර්ධාන නොවේ. කස්සපය, යම් තැනක පටන් ජාතරූප පතිරූපකයක් (පෙනුමෙන් රත්රන් වැන්නක්) ලෝකයෙහි උපදීද, අනතුරුව ජාතරූපයාගේ (රත්රනයේ) අන්තර්ධානය වෙයි. කස්සපය, මෙසේම වනාහි යම්තාක්කල් සද්ධර්ම ප්‍රතිරූපකයක් (පෙනුමෙන් සද්ධර්මය වැන්නක්) ලෝකයෙහි නූපදීද? ඒතාක්කල් සද්ධර්මයාගේ අන්තර්ධානය නොවේ. කස්සපය, යම්තැනක පටන් සද්ධර්මප්‍රතිරූපකයක් (පෙනුමෙන් සද්ධර්මය වැන්නක්) ලෝකයෙහි උපදීද, එකල්හි සද්ධර්මයාගේ අන්තර්ධානය වෙයි.

3. "කස්සපය, පඨවීධාතුව සද්ධර්මය අන්තර්ධාන නො කෙරෙයි. අපොධාතුව සද්ධර්මය අන්තර්ධාන නොකෙරෙයි. තේජෝධාතුව සද්ධර්මය අන්තර්ධාන නොකෙරෙයි. වායෝ ධාතුව සද්ධර්මය අන්තර්ධාන නොකෙරෙයි. එතකුදුවුවත් මේ ශාසනයෙහිම ඒ සද්ධර්මය අන්තර්ධාන කරන්නාවූ මෝඩ (හිස්) පුරුෂයෝ උපදිති. කස්සපය, යම්සේ වනාහි නැවක් බඩු පිරවීමෙන්ම කිඳෙයිද, කස්සපය සද්ධර්මය වනාහි එසේ පර්‍යාප්ති ප්‍රතිපත්ති පිරීමෙන් අන්තර්ධාන නොවේ.

4. කස්සපය, සද්ධර්මය පිරිහෙන්නාවූ සද්ධර්මයාගේ නැතිවීම පිණිස අන්තර්ධානවීම පිණිස පවත්නාවූ මේ ධර්මයෝ පස්දෙනෙක් වෙත්. කවර පසක්ද? කස්සපය, මේ ශාසනයෙහි භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාවෝ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැතිව, යටහත් පහත් පැවතුම් නැතිව වාසය කෙරෙත්ද, ධර්මය කෙරෙහි ගෞරව නැතිව යටහත් පහත් පැවතුම් නැතිව වාසය කෙරෙත්ද, සංඝයා කෙරෙහි ගෞරව

නැතිව, යටහත් පහත් පැවැතුම් නැතිව වාසය කෙරෙත්ද, ශික්ෂාව කෙරෙහි ගෞරව නැතිව, යටහත් පහත් පැවැතුම් නැතිව වාසය කෙරෙත්ද, සමාධිය කෙරෙහි ගෞරව නැතිව, යටහත් පහත් පැවැතුම් නැතිව වාසය කෙරෙත්ද, කස්සපය මේ කරුණු පස සද්ධර්මය පිරිහෙන්නාවූ සද්ධර්මයාගේ නැතිවීම පිණිස, අන්තර්ධානවීම පිණිස පවත්නා කරුණු වෙත්.

5. "කස්සපය, සද්ධර්මයාගේ පැවැත්ම පිණිස, නැති නොවීම පිණිස, අන්තර්ධාන නොවීම පිණිස පවත්නාවූ කරුණු පසක් වෙත්. කවර පසක්ද? කස්සපය, මේ ශාසනයෙහි භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාවෝ ශාස්තෘන්වහන්සේ කෙරෙහි ගෞරව සහිතව, යටහත් පහත් පැවැතුම් ඇතිව වාසය කෙරෙත්ද, ධර්මය කෙරෙහි ගෞරව සහිතව යටහත් පහත් පැවතුම් සහිතව වාසය කෙරෙත්ද, සංඝයා කෙරෙහි ගෞරව සහිතව, යටහත් පහත් පැවැතුම් සහිතව වාසය කෙරෙත්ද, ශික්ෂාව කෙරෙහි ගෞරව සහිතව, යටහත් පහත් පැවැතුම් සහිතව වාසය කෙරෙද්ද සමාධිය කෙරෙහි ගෞරව සහිතව, යටහත් පහත් පැවැතුම් සහිතව වාසය කෙරෙත්ද, කස්සපය මේ ධර්මයෝ පස්දෙන වනාහි සද්ධර්මයාගේ පැවැත්ම පිණිස, නැති නොවීම පිණිස, අන්තර්ධාන නොවීම පිණිස පවත්නාහුය.

**(දහතුන්වෙනි සද්ධම්මපතිරූපක සූත්‍රය නිමි.)**

---

(සන්තුට්ඨි සූත්‍රය, අනොත්තාපී සූත්‍රය, චන්දොපමා සූත්‍රය, කුලූපග සූත්‍රය, ජිණ්ණ සූත්‍රය, ඔවාද සූත්‍ර තුනය, ඣානාභිඤ්ඤා සූත්‍රය, උපස්සය සූත්‍රය, චීවර සූත්‍රය, පරම්මරණ සූත්‍රය සහ සද්ධම්මපතිරූපක සූත්‍රය දැයි මේ කස්සප සංයුත්තයෙහි සූත්‍ර දහතුනකි.)

**(කස්සප සංයුත්තය නිමි.)**

---

# 5. ලාභසක්කාර සංයුත්තය.

## 1. වර්ගය.

### 1. දාරුණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි, කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, ලාභ සත්කාර ස්තුති ප්‍රශංසා දරුණුය. කටුකය. එරුෂය. අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුත්තේය. (කෙසේද?) උපන්නාවූ ලාභ සත්කාර ස්තුති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර ස්තුති ප්‍රශංසා අපගේ කුසල් සිත යම්සේ මැඩගෙන නොසිටින්නේද ඒ ආකාරයෙනි. මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(පළමුවෙනි දාරුණ සූත්‍රය නිමි.)**

---

### 2. බාළිස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, එරුෂය, අතිඋතුම් රහත් ඵලාවබොධයට අනතුරු

වන්නේය. මහණෙනි, යම්සේ වනාහි බිලීබාන්නෙක් ඇම ඇමිණූ බිලිය ගැඹුරුවූ, මහමුහුදෙහි දමන්නේවේද, ඒ බිලිය එක්තරා ඇම දුටු මාලුවෙක් ගිලින්නේය. මහණෙනි, මෙසේ වනාහි ඒ බිලී බාන්නාගේ බිලිය ගිලූ මාලුවා දුකට විනාශයට පැමිණියේ බිලී බාන්නාට කැමැත්තක් කළ හැකිවෙයි.

3. "මහණෙනි, බිලීබාන්නා යන මේ වචනය වනාහි පවිටුවූ, මාරයාහට කියන නාමයකි. මහණෙනි, බිළිය යන මේ වචනය ලාභ සත්කාර ස්තුති ප්‍රශංසාවන්ට කියන නාමයකි. මහණෙනි, යම්කිසි මහණෙක් තෙම වනාහි උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා රස විඳියිද, ආශා කෙරෙයිද? මහණෙනි, මේ මහණ තෙම මාරයාගේ බිළිය ගිලින ලද්දේ දුකට පැමිණියේයයි කියාද, විනාශයට පැමිණියේයයි කියාද, මාරයාහට කැමැත්තක් කළ හැකි වූයේයයි කියාද කියනු ලැබේ. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි, මහණෙනි. තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(දෙවෙනි බාළිස සූත්‍රය නිමි.)**

---

## 3. කුම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, පෙරවූ දෙයක් කියමි. එක්තරා මුහුදක

මහත්වූ කැසුබු කුලයක් බොහෝ කාලයක පටන් වාසය කරන්නේ විය.

"මහණෙනි, ඉක්බිති එක්තරා කැස්බෙක් වනාහි එක්තරා කැස්බෙකුට මෙය කීයේය. 'දරුව, කැස්බ, නුඹ වනාහි ඒ ප්‍රදේශයට නොයවයි' කියායි. මහණෙනි, ඒ කැසුබු තෙම ඒ ප්‍රදේශයට ගියේය. ඒ මේ කැස්බාට වැද්දෙක් ඇවුලුම් බිලියකින් ගැසුවේය.

3. "මහණෙනි, ඉක්බිති ඒ කැසුබුතෙම ඒ අවවාද කළ කැස්බා යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. මහණෙනි, ඒ අවවාද දුන් කැසුබුවා එන්නාවූ ඒ විදුම් කෑ කැසුබුවා දුරදීම දුටුවේය. දැක ඒ විදුම් කෑ කැස්බාහට මෙය කීයේය, 'දරුව, කැස්බා, කිමෙක්ද? නුඹ ඒ ප්‍රදේශයට නොගියෙහිද?' 'කැසුබු පියාණෙනි, මම වනාහි ඒ ප්‍රදේශයට ගියෙමි.' 'දරුව, කැස්බ, කිමෙක්ද? (නුඹට) වනාහි ඇවුලුම් බිලියකින් පහර දෙනු ලැබුයෙහිද?' 'කැසුබු පියාණෙනි, මම වනාහි ඇවුලුම් බිලියකින් පහර දෙනු ලැබූවෙමි. මාගේ පසුපස මා අනුව ගමන් කරන්නාවූ, මේ නූලක්ද ඇත්තේය.' 'එසේනම් කැසුබු දරුව තුවාල කරන ලද්දේය. එසේනම් නසන ලද්දේය. දරුව, කැස්බ, මේ වැද්දා විසින් තාගේ පිය වරුද, සීයා වරුද දුකට පත්කරනු ලැබූහ. විනාශයට පත්කරනු ලැබූහ. දරුව කැසිබුව, නුඹ දැන් යව. දැන් නුඹ අපගේ නොවේයයි කීවේය.'

4. "මහණෙනි, වැද්දා යන මේ වචනය වනාහි පවිටුවූ, මාරයාහට කියන නාමයකි. මහණෙනි, ඇවුලුම් බිලිය යන මේ වචනය වනාහි ලාභ සත්කාර ස්තුති ප්‍රශංසාවට කියන නාමයකි. මහණෙනි, නූල යන මේ වචනය වනාහි ආශාවට කියන නාමයකි. යම්කිසි මහණෙක් තෙම වනාහි උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා රස විඳියි. ආශා කෙරෙයි.

"මහණෙනි, මේ මහණතෙම (පවිටු මාරයාගේ) ඇවුලුම් බිලියට ගිජුව දුකට පැමිණියේය. විනාශයට පැමිණියේයයි කියාද, පවිටු මාරයාහට කැමැත්තක් කළ හැකි වූයේයයි කියාද, කියනු ලැබේ. මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය,

කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි.

**(තුන්වෙනි කුම්ම සූත්‍රය නිමි.)**

---

## 4. දීඝ ලෝමී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, යම්සේ වනාහි දික් ලොම් ඇති එළුදෙනක් කටු ලැහැබකට පිවිසෙන්නේ වේද, ඕ ඒ ඒ තැන ලැගෙන්නීය. ඒ ඒ තැන රැඳෙන්නීය. ඒ ඒ තැන බැඳෙන්නීය, ඒ ඒ තැන විනාශයට පැමිණෙන්නීය.

3. "මහණෙනි, එසේම වනාහි මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලද්දේ විනාශ කළ කුසල් සිත් ඇත්තේ පෙරවරු (උදේට) කාලයෙහි හැඳ පොරවා පාත්‍රය ගෙන කුඩා ගමකට හෝ මහ ගමකට හෝ පිඬු පිණිස යන්නේද, හෙතෙම ඒ ඒ තැන, ලැගෙයි. ඒ ඒ තැන රැඳෙයි. ඒ ඒ තැන්හිදී විනාශයට පැමිණෙයි.

"මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු

කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි. මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(සතරවෙනි දීඝ ලෝමී සූත්‍රය නිමි.)**

---

## 5. පුළේළක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි, වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි' යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. 'මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, යම්සේ වනාහි අසූචි අනුභව කරන්නාවූ, අභ්‍යන්තරයෙහි අසූචි පිරුණාවූ, ගූථයෙන් පිරුණාවූ, අසූචියෙහි ජීවත්වන පණුවෙක් උගේ ඉදිරියෙහිද මහත්වූ අසූචි ගොඩක් වෙයි. ඒ අසූචි අනුභව කොට ජීවත්වෙන පණුවා මම වනාහි අසූචි අනුභව කරන්නෙක්මි. අභ්‍යන්තරයෙහි අසූචියෙන් පිරුණෙක්මි. ගූථයෙන් පිරුණේ වෙමි. මාගේ ඉදිරියෙහිද මේ මහත්වූ අසූචි ගොඩක් ඇත්තේයයි කියමින් අනෙක් පණුවන් පහත් කොට හඟියි.

3. "මහණෙනි, එසේම වනාහි මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලද්දේ විනාශ කළ කුසල් සිත් ඇත්තේ පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පොරවා පාත්‍රය ගෙන කුඩා ගමකට හෝ මහා ගමකට හෝ පිඬු පිණිස යන්නේය. හෙතෙම එහිදී ඇතිතාක් වළඳන ලද්දේද වෙයි. හෙට පිණිස ආරාධනා කරන ලද්දේදවෙයි. ඔහුගේ

පාත්‍රයද පිරුණේ වෙයි. හෙතෙම ආරාමයට ගොස්, භික්ෂු සංඝයා මැද පුරසාරම් දොඩයි. (කෙසේද?) 'ඇතිතාක් වැළඳුයේ වෙමි. හෙට දවස පිණිසද ආරාධනා කරනු ලැබුයේ වෙමි. මාගේ මේ පාත්‍රයද පිරුණේ වෙයි. මම චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස සහ බෙහෙත් පිරිකර ලබන්නෙක් වෙමි. මේ අන්‍ය භික්ෂූහු වනාහි ස්වල්ප පින් ඇත්තෝය. අල්පෙශාක්‍යයෝය. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස සහ බෙහෙත් පිරිකරද නොලබන්නෝය' කියායි. හෙතෙම ඒ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලද්දේ විනාශ කරන ලද කුසල් සිත් ඇත්තේ අන්‍යවූ සිල්වත් භික්ෂූන් පහත්කොට හඟියි.

4. "මහණෙනි, එය වනාහි ඒ මෝඩ පුරුෂයාට දීර්ඝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස හෙතුවෙයි. මහණෙකි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, එරුෂය, අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල්සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි.

**(පස්වෙනි පුනේළක සූත්‍රය නිමි.)**

---

## 6. අසනි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, හෙනසැරය කාහට වදීවාද? නො පැමිණෙන ලද රහත් ඵලය ඇති ඒ ශෛක්ෂ පුද්ගලයාහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පැමිණේවා.

3. මහණෙනි, හෙන සැරය යනු ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවට නමකි. මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(හයවෙනි අසනි සූත්‍රය නිමි.)**

---

## 7. දිද්ධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසයකරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, විසපෙවූ, හීයෙන් කාහට විදේවාද? නොපැමිණෙන ලද රහත් බැව් ඇත්තාවූ ඒ ශෛක්ෂයාහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පැමිණේවා. මහණෙනි, විස පෙවූ හීය යනු ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවන්ට නමකි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නො කෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(හත්වෙනි දිද්ධ සූත්‍රය නිමි.)**

---

## 8. සිගාල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, තෙපි රෑ එළිවෙන ජාමයෙහි හූ කියන්නාවූ ජර සිවලෙකුගේ ශබ්දයක් ඇසුවාහුද?"

"එසේය ස්වාමීනි."

3. "මහණෙනි, මේ ජරසිගාලතෙම වනාහි මුළු ශරීරයෙහි ලොම් හැලී වණ සෑදෙන රෝගයක් "උක්කන්තක" නම් රෝගයෙන් ස්පර්ශ කරන ලද්දේ, බෙනයට ගියේද සතුටු නොවෙයි. රුක්මුලට ගියේද සතුටු නොවෙයි. එළිමහන් තැනකට ගියේද සතුටු නොවෙයි. යම් යම් තැනකට යයිද, යම් යම් තැනෙක සිටියිද, යම් යම් තැනෙක හිඳියිද, යම් යම් තැනෙක හොවියිද (දිගාවෙයිද) ඒ ඒ තැන විනාශයට පැමිණෙයි.

4. "මහණෙනි, එසේම මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලද්දේ විනාශකරන ලද කුසල් සිත් ඇත්තේ ශූන්‍යාගාරයට ගියේද සතුටු නොවෙයි. රුක්මුලට ගියේද සතුටු නොවෙයි. එළිමහන් තැනට ගියේද සතුටු නොවෙයි. යම් යම් තැනක යයිද, යම් යම් තැනෙක සිටියිද, යම් යම් තැනක හිඳියිද, යම් යම් තැනෙක නිදයිද, ඒ ඒ තැන විනාශයට පැමිණෙයි.

5. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, එරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි.

**(අටවෙනි සිගාල සූත්‍රය නිමි.)**

---

## 9. වේරම්බ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, එරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, ඉහළ ආකාශයෙහි "වේරම්බ" නම් වාතයෝ හමත්. ඒ ඉහළ ආකාශයෙහි යම් පක්ෂියෙක් යයිද, ඔහු මේ "වේරම්බ" වාතයෝ වීසි කෙරෙති. "වේරම්බ" වාතයෙන් විසිකරන ලද ඒ පක්ෂියාගේ පාදයෝ අන් දිසාවකට යෙති.

පියාපත් අන් දිශාවකට යෙති. හිස අන් දිශාවකට යයි. කය අන් දිසාවකට යයි.

3. "මහණෙනි, එසේම මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලද්දේ විනාශ කරන ලද කුසල් සිත් ඇත්තේ පෙරවරු (උදේ) කාලයෙහි හැඳ පාත්‍ර සිවුරු ගෙන, නොරක්නා ලද්දාවූම කයින්ද, නොරක්නා ලද වචනයෙන්ද, නොරක්නා ලද සිතින්ද, එළඹ නොසිටියාවූ, සිහියෙන්ද, සංවර නොකරන ලද ඉන්ද්‍රියයන්ගෙන්ද, යුක්තව ගමට හෝ නියම් ගමට හෝ පිඬු පිණිස පිවිසෙයි. ඒ මහණතෙම එහිදී නපුරු කොට හඳින ලද හෝ නපුරුකොට පොරොවන ලද හෝ ස්ත්‍රියක් දකියි. නපුරු කොට අඳින ලද හෝ නපුරු කොට පොරොවන ලද හෝ ස්ත්‍රියක් දුටු ඔහුගේ සිත රාගය තෙමේ විනාශ කරයි. හෙතෙම රාගයෙන් විනාශකළ සිත හේතුකොට ගෙන ශික්ෂාව ප්‍රතික්ෂෙප කොට ගිහිවෙයි. "වෙරම්බ" වාතයෙන් විසිකරන ලද පක්ෂියාගේ මෙන් ඒ ඔහුගේ සිවුරු අන් කෙනෙක් ගෙන යත්. අන් කෙනෙක් පාත්‍රය ගෙන යත්. අන් කෙනෙක් නිසීදනය (හිඳිනාකඩ) ගෙන යත්. අන් කෙනෙක් ඉදිකටු ගුලාව ගෙන යත්.

4. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබොධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි.

(නවවෙනි වේරම්බ සූත්‍රය නිමි.)

---

## 10. සගාථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, මම මේ ශාසනයෙහි සත්කාරයෙන් මඩනාලද විනාශ කරන ලද කුසල් සිත් ඇති, ශරීරය බිඳීමෙන් මරණින් මතු සැප නැත්තාවූ, නපුරු ගති ඇත්තාවූ, නපුරු වැටීම් ඇත්තාවූ, නිරයෙහි උපන්නාවූ, ඇතැම් පුද්ගලයකු දකිමි.

3. "මහණෙනි, මම මේ ශාසනයෙහි අසත්කාරයෙන් මඩනා ලද්දාවූ, විනාශ කළ කුසල් සිත් ඇති, කය බිඳීමෙන් මරණින් මතු, සැප නැත්තාවූ, නපුරු ගති ඇත්තාවූ, නපුරු වැටීම් ඇත්තාවූ, නිරයෙහි උපන්නාවූ ඇතැම් පුද්ගලයකු දකිමි. මහණෙනි, මම මේ ශාසනයෙහි සත්කාරයෙන්ද, අසත්කාරයෙන්ද යන ඒ දෙකින්ම මඩනා ලද්දාවූ, විනාශ කළ කුසල් සිත් ඇති, කය බිඳීමෙන් මරණින් මතු, සැප නැත්තාවූ, නපුරු ගති ඇත්තාවූ, නපුරු වැටීම් ඇත්තාවූ, නිරයෙහි උපන්නාවූ ඇතැම් පුද්ගලයකු දකිමි.

4. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි. මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක. මෙය දේශනා කොට, ඊට අනතුරුව මේ ගාථා දෙකද වදාළසේක.

1. "අර්හත් ඵල සමාධියෙන් යුක්තව වාසය කරන්නාවූ යමෙකුගේ සත්කාර කිරීමෙන්ද, සත්කාර නොකිරීමෙන්ද යන දෙයාකාරයෙන්ම සමාධිය කම්පා නොවේද?"

2. "නිතර සමාධියෙන් යුක්තවූ මාර්ගඥානයෙන් හා විදර්ශනා ඥානයෙන් යුක්තවූ සතර උපාදානයන්ගේ ක්ෂය කිරීමයයි කියන ලද නිර්වාණයෙහි ඇලුණාවූ ඔහු සත්පුරුෂයයි කීහු."

**(දසවෙනි සගාථ සූත්‍රය නිමි.)**

---

(දාරුණ සූත්‍රය, බාළිස සූත්‍රය, කුම්මාස සූත්‍රය, දීඝ ලෝමී සූත්‍රය, පුනේළක සූත්‍රය, අසනි සූත්‍රය, දිද්ධ සූත්‍රය, සිගාල සූත්‍රය, වේරම්බ සූත්‍රය සහ සගාථ සූත්‍රය දැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයකි.)

**(පළමුවෙනි වර්ගය නිමි.)**

---

## 2. වර්ගය.

### 1. පාති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගතිමි. (කෙසේද?) මේ ආයුෂ්මත්තෙම රිදීසුණු පිරවූ රත්රන් පාත්‍රයක් නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය කියායි. (එහෙත්) පසු කලකදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවන්ගෙන් මඩනා ලදුව විනාශවූ කුසල් සිත් ඇතිව දැන දැන බොරු කියන්නාවූ, ඔහු දක්නෙමි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, එරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(පළමුවෙනි පාති සූත්‍රය නිමි.)**

---

## 2. පාති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, එරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගතිමි (කෙසේද?) මේ ආයුෂ්මත්තෙම රත්රන් සුණු පිරවූ, රිදී පාත්‍රයක් නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය කියායි. පසුකලකදී ලාභ

සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලදුව විනාශවූ කුසල් සිත් ඇතිව, දැන දැන බොරු කියන්නාවූ ඔහු දක්නෙමි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි,' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(දෙවෙනි පාති සූත්‍රය නිමි.)**

---

## 3. සුවණ්ණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගතිමි. (කෙසේද?) මේ ආයුෂ්මත්තෙම රත්රන් කාසියක් නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය කියායි. පසුකලකදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනාලදුව විනාශවූ කුසල් සිත් ඇතිව, දැන දැන බොරු කියන්නාවූ ඔහු දක්නෙමි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි,' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(තුන්වෙනි සුවණ්ණ සූත්‍රය නිමි.)**

---

## 4. සුවණ්ණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගතිමි. (කෙසේද?) මේ ආයුෂ්මත්තෙම රන්කාසි සියයක් නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය කියායි. පසුකලකදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනාලදුව විනාශවූ කුසල් සිත් ඇතිව, දැන දැන බොරු කියන්නාවූ ඔහු දක්නෙමි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු

කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි,' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(සතරවෙනි සුවණ්ණ සූත්‍රය නිමි.)**

---

## 5. සිඞ්ගි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගතිමි. (කෙසේද?) මේ ආයුෂ්මත්තෙම සිඞ්ගි නම් රන්කාසියක් නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය කියායි. පසුකලකදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලදුව විනාශවූ කුසල් සිත් ඇතිව, දැන දැන බොරු කියන්නාවූ ඔහු දක්නෙමි.

3. 'මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ

කුසල් සිත විනාශ නොකෙරේවායි,' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(පස්වෙනි සිඞ්ගි සූත්‍රය නිමි.)**

## 6. සිඞ්ගි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගනිමි. (කෙසේද?) මේ ආයුෂ්මත් තෙම සිඞ්ගි නම් රන්කාසි සියයක් නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය කියායි. පසු කලකදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනාලදුව විනාශවූ කුසල් සිත් ඇතිව, දැන දැන බොරු කියන්නාවූ ඔහු දක්නෙමි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභසත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි,' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(හයවෙනි සිඞ්ගි සූත්‍රය නිමි.)**

## 7. පුථුවි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගතිමි. (කෙසේද?) මේ ආයුෂ්මත්තෙම රත්රන්වලින් පිරුණාවූ පෘථුවිය නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය කියායි. පසුකලකදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලදුව විනාශවූ කුසල් සිත් ඇතිව, දැන දැන බොරු කියන්නාවූ ඔහු දක්නෙමි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(හත්වෙනි පුථුවි සූත්‍රය නිමි.)**

---

## 8. කිඤ්චික්ඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින්

කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගතිමි. (කෙසේද?) මේ ආයුෂ්මත්තෙම කිසියම් ආමිසයක් නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය කියායි. පසු කලකදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලදුව විනාශවූ කුසල් සිත් ඇතිව, දැන දැන බොරු කියන්නාවූ ඔහු දක්නෙමි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි,' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(අටවෙනි කිඤ්චික්ඛ සූත්‍රය නිමි.)**

---

## 9. ජීවිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගනිමි. (කෙසේද?) මේ ආයුෂ්මත්තෙම ජීවිතය නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය කියායි. පසුකලකදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලදුව විනාශවූ කුසල් සිත් ඇතිව, දැන දැන බොරු කියන්නාවූ ඔහු දක්නෙමි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(නවවෙනි ජීවිත සූත්‍රය නිමි.)**

---

## 10. ජනපද කලයාණී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගනිමි. (කෙසේද?)

මේ ආයුෂ්මත්තෙම ජනපද කල්‍යාණිය (ජනපදයෙහි වූ උතුම් ස්ත්‍රිය) නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය කියායි. පසුකලකදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලදුව විනාශවූ කුසල් සිත් ඇතිව, දැන දැන බොරු නොකියන්නේය කියායි. පසුකලකදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලදුව විනාශවූ කුසල් සිත් ඇතිව, දැන දැන බොරු කියන්නාවූ ඔහු දක්නෙමි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරුව කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(දසවෙනි ජනපද කල්‍යාණී සූත්‍රය නිමි.)**

---

(පාති සූත්‍ර දෙකද, සුවණ්ණ සූත්‍ර දෙකද, අන්‍යවූ සිඞ්ගි සූත්‍ර දෙකද, පුථුවි සූත්‍රයද, කිඤ්චික්ඛ සූත්‍රයද, ජීවිත සූත්‍රය සහ ජනපද කල්‍යාණී සූත්‍රයදැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයකි.)

**දෙවෙනි වර්ගය නිමි.**

---

# 3. වර්ගය.

## 1. මාතුගාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ.

'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, යමෙකුගේ සිත ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවලින් මැඩගෙන සිටින්නේද, එහිදී, තනිව සිටින්නාවූ ඔහුගේ සිත එක් ස්ත්‍රියක් මැඩගෙන සිටින්නීය.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(පළමුවෙනි මාතුගාම සූත්‍රය නිමි.)**

---

## 2. කල්‍යාණි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, යමෙකුගේ සිත ලාභ සත්කාර කීර්තියෙන් මැඩගෙන සිටින්නේ නම් එහිදී තනිව සිටින්නාවූ ඔහුගේ සිත එක් ජනපද කල්‍යාණියක් (ජනපදයෙහිවූ උතුම් ස්ත්‍රියක්) මැඩගෙන සිටින්නීය.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙසේ හික්මියයුතු වන්නේය, (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු, උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(දෙවෙනි කල්‍යාණී සූත්‍රය නිමි.)**

---

## 3. පුත්‍ර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ශ්‍රද්ධාවෙන් උපාසිකාවක් තොමෝ ප්‍රියවූ, මනාපවූ, එකම පුතුහට මනාකොට කියන්නී මෙසේ කියන්නීය. (කෙසේද?) 'දරුව, චිත්ත ගහපති තෙමේ සහ හත්ථාලවක තෙමේ යම්සේද, එසේ වෙයි' කියන්නීය.

3. "මහණෙනි, මේ චිත්ත ගහපති තෙමේද හත්ථාලවක තෙමේද, මාගේ ශ්‍රාවක උපාසකයන්ගේ තරාදිය වෙයි. මිනුම වෙයි. 'දරුව, ඉදින් නුඹ වනාහි ගිහිගෙයින් නික්ම, ශාසනයෙහි පැවිදි වන්නෙහි නම් ශාරිපුත්‍ර මොග්ගල්ලාන දෙනම යම්සේද, එසේ වේවයි' කියන්නීය.

4 "මහණෙනි, මේ සාරිපුත්ත මොග්ගල්ලානයෝ මාගේ ශ්‍රාවක භික්ෂූන්ගේ තරාදියයි මිනුමයි. 'දරුව, ශෛක්ෂ්‍යවූ,

නොපැමිණි රහත් බැව් ඇත්තාවූ නුඹට වනාහි ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෝ නොපැමිණෙත්වායි' කියන්නීය. මහණෙනි, ඉදින් ශෛක්ෂ්‍යවූ (හික්මෙන්නාවූ) නොලත් රහත් බැව් ඇත්තාවූ, ඒ මහණහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පැමිණේද, ඒ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ඔහුට අන්තරාය පිණිස වෙයි.

5. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

(තුන්වෙනි පුත්‍ර සූත්‍රය නිමි.)

---

## 4. ධීතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, ශ්‍රද්ධාවත් උපාසිකාවක් තොමෝ ප්‍රියවූ, මනාපවූ, එකම දූහට මනාකොට කියන්නී මෙසේ කියන්නීය. (කෙසේද?) 'දුවනියෙනි, ඛුජ්ජුත්තර උපාසිකාවද, නන්ද මාතෘවූ වේළුකණ්ඩකී උපාසිකාවද යම්සේද, එසේ වෙයි.' කියන්නීය. මහණෙනි, මේ ඛුජ්ජුත්තරා උපාසිකාවත්, වේළුකණ්ඩකී

නන්දමාතා උපාසිකාවත් මාගේ ශ්‍රාවිකා උපාසිකාවන්ගේ තරාදිය වෙත්, මිනුම වෙත්. දියෙනියනි, ඉදින් නුඹ වනාහි ගිහිගෙයින් නික්ම, ශාසනයෙහි පැවිදි වන්නෙහි නම්, ඛේමා උප්පලවණ්ණා භික්ෂුණීන් යම්සේද, එසේ වේවයි' කියන්නීය. මහණෙනි මේ ඛේමා, උප්පලවණ්ණා භික්ෂුණීහු මාගේ ශ්‍රාවිකා භික්ෂුණීන්ගේ තරාදියයි, මිනුමයි. 'දියෙනියනි, ශෛක්ෂ්‍යවූ, නොපැමිණි රහත් බැව් ඇත්තාවූ නුඹට වනාහි ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා නොපැමිණෙත්වායි' කියන්නීය.

3. "මහණෙනි, ඉදින් ශෛක්ෂ්‍යවූ (හික්මෙන්නාවූ) නොලත් රහත් බැව් ඇත්තාවූ, ඒ භික්ෂුණියට ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවෝ පැමිණෙද්ද ඒ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවෝ ඔහුට අන්තරාය පිණිස වෙයි. මහණෙනි, මෙසේ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(සතරවෙනි ධීතු සූත්‍රය නිමි.)**

---

## 5. ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රහ්මණයෙක් හෝ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ ආශ්වාදයද, ආදීනවද, නිස්සරණයද ඇතිපරිදි නොදනිත්ද, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ ආශ්වාදයද, ආදීනවද, නිස්සරණයද, ඇතිවීම, ඇති පරිදි නොදනිත්ද, ලාභ, සත්කාර කීර්ති, ප්‍රශංසාවගේ ආශ්වාදයද, ආදීනවද, නිස්සරණයද, නැතිවීම, ඇති පරිදි නොදනිත්ද, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ ආශ්වාදයද, ආදීනවද, නිස්සරණයද, නැති කිරීමට ගමන් කළයුතු මාර්ගය ඇති පරිදි නොදනිත්ද (ඔවුහු) තමන් දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ ආශ්වාදයද, ආදීනවද, නිස්සරණයද ඇති පරිදි දනිත්ද, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ ආශ්වාදයද, ආදීනවද, නිස්සරණයද, ඇතිවීම ඇති පරිදි දනිත්ද, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ ආශ්වාදයද, ආදීනවද, නිස්සරණයද, නැතිවීම, ඇතිපරිදි දනිත්ද, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ ආශ්වාදයද, ආදිනවද, නිස්සරණයද නැතිකිරීමට ගමන් කළයුතු මාර්ගය ඇතිපරිදි දනිත්ද (ඔවුහු) තමන් දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කරත්."

**(පස්වෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය නිමි.)**

---

## 6. ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. 'මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ ඇතිවීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවද, නිස්සරණයද ඇතිපරිදි නොදනිත්ද, (ඔවුහු) තමන් දැන ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ සමුදය (ඇතිවීම) ද විනාශයද, ආශ්වාදයද, ආදීනවද, නිස්සරණයද ඇති පරිදි දනිත්ද, (ඔවුහු) තමන් දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කරත්.

**(හයවෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය නිමි.)**

---

## 7. ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා සිව්පස නොදනිත්ද, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ හේතුව නොදනිත්ද, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ නැතිවීම නොදනිත්ද, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා නැතිකිරීමට පැමිණෙන මාර්ගය නොදනිත්ද, (ඔවුහු) තමන් දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකෙරෙත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාව දනිත්ද, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා ඇතිවීමේ හේතුව දනිත්ද, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවන්ගේ නැතිවීම දනිත්ද, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා

නැතිකිරීමට පැමිණෙන මාර්ගය දනිත්ද (ඔවුහු) තමන් දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කෙරෙති."

(හත්වෙනි ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය නිමි.)

---

## 8. ඡවි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. 'මහණෙනි, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය. මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා සිවිය සිඳියි. සිවිය සිඳ, සම සිඳියි, සම සිඳ, මස් සිඳියි. මස් සිඳ, නහර සිඳියි. නහර සිඳ, ඇට සිඳියි. ඇට සිඳ, ඇටමිඳුලුවල හැපී සිටියි. මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, එරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

(අටවෙනි ඡවි සූත්‍රය නිමි.)

---

## 9. රජ්ජු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී

භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. ‘මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා සිවිය සිඳියි. සිවිය සිඳ, සම සිඳියි. සම සිඳ, මස් සිඳියි. මස් සිඳ, නහර සිඳියි. නහර සිඳ, ඇට සිඳියි. ඇට සිඳ, ඇටමිඳුලුවල හැපී සිටියි.

3. ‘මහණෙනි, යම්සේ වනාහි බලවත් පුරුෂයෙක්තෙම අශ්ව කෙඳිවලින් කළ රැනකින් (කකුලේ) කෙණ්ඩය වෙළා තද කරන්නේ නම්; ඒ රැහැන සිවිය සිඳින්නේය. සිවිය සිඳ, හම සිඳින්නේය. හම සිඳ, මස් සිඳින්නේය. මස් සිඳ නහර සිඳින්නේය. නහර සිඳ, ඇට සිඳින්නේය. ඇට සිඳ, ඇටමිදුලුවල හැපී සිටින්නේය. මහණෙනි, එසේම වනාහි ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා සිවිය සිඳියි. සිවිය සිඳ, සම සිඳියි. සම සිඳ, මස් සිඳියි. මස් සිඳ, නහර සිඳියි. නහර සිඳ ඇට සිඳියි. ඇට සිඳ ඇටමිඳුලුවල හැපී සිටියි.

4. “මහණෙනි, මෙසේ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) ‘උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන්නාවූ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා අපගේ කුසල්සිත විනාශ නොකෙරේවා’ යි මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි.

(නවවෙනි රජ්ජු සූත්‍රය නිමි.)

---

## 10. භික්ඛු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී

භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම් ඒ ආශ්‍රවයන් ක්ෂය කළාවූ, රහත්වූ, භික්ෂුවක් වෙයිද, ඒ මහණහටද ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අන්තරාය පිණිස වේයයි මම කියමි." මෙසේ දේශනා කළ කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේට මෙය කීයේය.

"ස්වාමීනි, කවර හෙයකින් ක්ෂීණාශ්‍රව මහණහුට වනාහි ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අන්තරාය පිණිසවේද?" "ආනන්දය ඒ රහත් භික්ෂුවගේ වෙනස් නොවන යම් අර්හත් ඵල නම්වූ චේතොවිමුක්තියක් වේද, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ඒ චේතොවිමුක්තියට අන්තරාය කරයයි මම නොකියමි.

3. "ආනන්දය, අප්‍රමාදවූ, කෙළෙස් තවන වීර්‍ය්‍ය ඇත්තාවූ, නිවන කරා යවන ලද සිත් ඇත්තාවූ, ඵල සමාපත්තියට පැමිණ වාසය කරන්නාවූ, යම් ශ්‍රමණයෝ වෙත්ද, ඒ ශ්‍රමණයන්හට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අන්තරාය පිණිස වේයයි මම කියමි.

4. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"ආනන්දය, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා, දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර, කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි,' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(දසවෙනි භික්ඛු සූත්‍රය නිමි.)**

(මාතුගාම සූත්‍රය, කල්‍යාණී සූත්‍රය, පුත්‍ර සූත්‍රය, ධීතු සූත්‍රය, සමණ බ්‍රාහ්මණ සූත්‍ර තුනය, ඡවි සූත්‍රය, රජ්ජු සූත්‍රය, සහ භික්ඛු සූත්‍රයදැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයකි.)

**තුන්වෙනි වර්ගය නිමි.**

---

## 4. වර්ගය.

### 1. භින්දි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය

“මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලද නැසුණු කුසල් සිත් ඇත්තාවූ දෙවදත්තතෙමේ සංඝයා භේද කළේය. මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය. අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) ‘උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි’ මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මියයුතුයි.”

**(පළමුවෙනි භින්දි සූත්‍රය නිමි.)**

---

## 2. මූල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

“මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලද නැසුණු කුසල් සිත් ඇති දෙවදත්තගේ කුසල මූලධර්ම විනාශයට ගියේය. මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) ‘උපන්නවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි’ මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි.

**(දෙවෙනි මූල සූත්‍රය නිමි.)**

---

## 3. ධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. ‘මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය. අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලද නැසුණු කුසල් සිත් ඇති දේවදත්ත මහණහුගේ කුසල මූලය කුශල ධර්මය විනාශයට ගියේය. මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අතිඋතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි' මහණෙනි තොපවිසින් මෙසේ වනාහි හික්මිය යුතුයි.

**(තුන්වෙනි ධම්ම සූත්‍රය නිමි.)**

---

## 4. සුක්ක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනාලද නැසුණු කුසල් සිත් ඇති දේවදත්ත මහණහුගේ කුසල ධර්මය විනාශයට ගියේය.

3. මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ

කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

(සතරවෙනි සුක්ක සූත්‍රය නිමි.)

## 5. පක්කන්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ දේවදත්ත ගිය නොබෝ කලකින් රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ දෙවදත්ත අරබයා භික්ෂූන් ඇමතූසේක.

2. "මහණෙනි, තමාගේ විනාශය පිණිස දෙවදත්තහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පහළවිය. තමාගේ පිරිහීම පිණිස දෙවදත්තහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පහළවිය.

"මහණෙනි, යම්සේ කෙසෙල් ගස වනාහි තමාගේ විනාශය පිණිස ඵල දරයිද, පිරිහීම පිණිස ඵලදරයිද, මහණෙනි, මෙසේම වනාහි තමාගේ විනාශය පිණිස දේවදත්ත මහණහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පහළවිය. පිරිහීම පිණිස දේවදත්ත මහණහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පහළවිය.

3. "මහණෙනි, යම්සේ හුණ ගස වනාහි තමාගේ විනාශය පිණිස ඵලදරයිද, පිරිහීම පිණිස ඵල දරයිද, මහණෙනි, එසේම වනාහි තමාගේ විනාශය පිණිස දේවදත්ත මහණ හට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පහළවිය. පිරිහීම පිණිස දේවදත්ත මහණහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පහළවිය. මහණෙනි, යම්සේ බට ගස වනාහි තමාගේ විනාශය පිණිස ඵල දරයිද, පිරිහීම පිණිස ඵල දරයිද, මහණෙනි, එසේම වනාහි තමාගේ විනාශය පිණිස දේවදත්ත මහණහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පහළවිය. පිරිහීම පිණිස දේවදත්ත මහණහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංස පහළවිය.

4. මහණෙනි, යම්සේ වනාහි අශ්වතරීය (කොටළුවාට දාව වෙළඹ කුස උපන්නී) තමාගේ විනාශය පිණිස ගැබ් ගන්නීද,

පිරිහීම පිණිස ගැබ් ගන්නීද, මහණෙනි, මෙසේම වනාහි තමාගේ විනාශය පිණිස දේවදත්ත මහණහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පහළ විය. පිරිහීම පිණිස දේවදත්ත මහණහට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පහළ විය.

**5.** මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**6.** ශාස්තෘන් වහන්සේ මෙය වදාරා අනතුරුව ශාස්තෘන් වහන්සේ මේ ගාථාව දේශනා කළසේක.

> "ඒකාන්තයෙන් ඵලය කෙසෙල් ගස යම්සේ නසයිද, ඵලය උණ ගස යම්සේ නසයිද, ඵලය බට ගස යම්සේ නසයිද, ගර්භය අශ්වතරිය (කොටලුවාට දාව වෙළඹ කුස උපන්නීය.) යම්සේ නසයිද, එසේම සත්කාරය ලාමක පුරුෂයා නසයි."

**(පස්වෙනි පක්කන්ත සූත්‍රය නිමි.)**

---

## 6. රථ සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම්වූ වේළුවනයෙහි (හුන වනයෙහි) වාසය කරන සේක.

එකල්හි වනාහි අජාසත් කුමාරයා දේවදත්ත මහණහට උපස්ථාන කිරීම පිණිස රථ පන්සියයකින් උදේ සවස යයි. ගෙන යායුතු බත් හැලි පන්සියයක්ද ගෙනයයි.

2 ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක හුන්නාහුය. එක් පැත්තක හුන්නාවූ, ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය. " ස්වාමීනි, අජාසත් කුමාරයා වනාහි දේවදත්ත මහණහට උපස්ථාන කිරීම පිණිස උදේ සවස රථ පන්සියයකින් යයි. ගෙන යායුතු බත් සැළි පන්සියයක්ද ගෙනයයි කියායි."

3. "මහණෙනි, දේවදත්ත මහණහුගේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවට සතුටු නොවව්. මහණෙනි, යම්තාක් අජාසත් කුමාරයා දේවදත්ත මහණහට උපස්ථාන කිරීම පිණිස උදේ සවස රථ පන්සියයකින් යන්නේද, ගෙන යායුතු බත්සැළි පන්සියයකුත් ගෙන යන්නේද, මහණෙනි, ඒතාක් දේවදත්ත මහණහට කුශල ධර්මයන්හි හානියක්ම කැමැතිවිය යුත්තේය. වෘද්ධියක් (වැඩීමක්) කැමැති නොවිය යුත්තේය.

4. "මහණෙනි, යම්සේ වනාහි නපුරු බල්ලෙකුගේ නාසයෙහි අශ්ව පිත හෝ මත්ස්‍ය පිත හෝ දමන්නේද, මහණෙනි එසේ වනාහි ඒ බල්ලා බොහෝ සෙයින් නපුරු වේද, මහණෙනි, එසේම වනාහි යම්තාක් අජාසත් කුමරු දේවදත්ත මහණහට උපස්ථාන කිරීම පිණිස උදේ සවස රථ පන්සියයකින් යන්නේ වේද, ගෙන යායුතු බත්සැළි පන්සියයකුත් ගෙන යන්නේ වේද, මහණෙනි, ඒතාක් දේවදත්ත මහණහට කුශල ධර්මයන්හි හානියක්ම කැමැතිවිය යුත්තේය. වෘද්ධියක් (වැඩීමක්) කැමැති නොවිය යුත්තේය.

5. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(හයවෙනි රථ සූත්‍රය නිමි.)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

## 7. මාතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මම මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගනිමි. (කෙසේද?) 'මේ ආයුෂ්මත්තෙම වනාහි මව නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය' කියායි. පසු කලෙක්හිදී, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් මඩනා ලදුව විනාශවුණු කුසල් සිත් ඇතිව, දැන දැන බොරු කියන, ඒ මේ පුද්ගලයා දකිමි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි.' මහණෙනි, තොප විසින් වනාහි මෙසේ හික්මිය යුතුයි."

**(හත්වෙනි මාතු සූත්‍රය නිමි.)**

---

## 8. පිතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ

සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

'මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මම මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගනිමි. (කෙසේද?) 'මේ ආයුෂ්මත්තෙම වනාහි පියා නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය' කියායි. පසු කලෙක්හිදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසායෙන් මඩනා ලදුව නැසුණු කුසල් සිත් ඇතිව, දැන දැන බොරු කියන මේ පුද්ගලයා දකිමි.

3. "මහණෙනි, මෙසේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි,' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(අටවෙනි පිතු සූත්‍රය නිමි.)**

---

## 9. භාතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය. අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

'මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මම මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගනිමි. (කෙසේද?) 'මේ ආයුෂ්මත්තෙම වනාහි සොහොයුරා නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය' කියායි. පසු කලෙක්හිදී ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසායෙන් මඩනා ලදුව නැසුණු කුසල් සිත් ඇතිව දැන දැන බොරු කියන මේ පුද්ගලයා දකිමි.

3. "මහණෙනි, මෙසේ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා, දරුණුය, කටුකය, ඵරුෂය. අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(නවවෙනි භාතු සූත්‍රය නිමි.)**

---

## 10. භගිනි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

'මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මම මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගනිමි. (කෙසේද?) 'මේ ආයුෂ්මත් තෙම වනාහි සොහොයුරිය නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය' කියායි. පසු කලෙක්හිදී

ලාභ සත්කාර කීර්ති ප්‍රශංසායෙන් මඩනා ලදුව නැසුණු කුසල් සිත් ඇතිව දැන දැන බොරු කියන මේ පුද්ගලයා දකිමි.

3. "මහණෙනි, මෙසේ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා, දරුණුය, කටුකය, ඵරුෂය. අති උතුම් රහත් ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මියයුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවා'යි මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(දහවෙනි භගිනි සූත්‍රය නිමි.)**

---

## 11. පුත්‍ර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය. අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය

'මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මම මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගනිමි. (කෙසේද?) 'මේ ආයුෂ්මත්තෙම වනාහි පුත්‍රයා නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය' කියායි. පසු කලෙක්හිදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසායෙන් මඩනාලදුව නැසුණු කුසල් සිත් ඇතිව දැන දැන බොරු කියන මේ පුද්ගලයා දකිමි.

3. "මහණෙනි, මෙසේ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය. අති උතුම් රහත් ඵලාවබෝධයට

අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරු කරන්නෙමු. උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි,' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(එකොළොස්වෙනි පුත්‍ර සූත්‍රය නිමි.)**

---

## 12. ධීතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය. අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

"මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මම මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගනිමි. (කෙසේද?) 'මේ ආයුෂ්මත්තෙම වනාහි දුව නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය' කියායි. පසුකලෙක්හිදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසායෙන් මඩනාලදුව නැසුණු කුසල් සිත් ඇතිව දැන දැන බොරු කියන මේ පුද්ගලයා දකිමි.

3. "මහණෙනි, මෙසේ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය, අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා

අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි,' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

(දොළොස්වෙනි ධීතු සූත්‍රය නිමි.)

## 13. පජාපතී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා හික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ හික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය. අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය.

'මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙකු මම මෙසේ (මාගේ) සිතින් (ඔහුගේ) සිත පිරිසිඳ දැනගනිමි. (කෙසේද?) 'මේ ආයුෂ්මත්තෙම වනාහි භායසීාව නිසා හෝ දැන දැන බොරු නොකියන්නේය කියායි. පසු කලෙක්හිදී ලාභ සත්කාර කීර්ති ප්‍රශංසායෙන් මඩනාලදුව නැසුණු කුසල් සිත් ඇතිව දැන දැන බොරු කියන මේ පුද්ගලයා දකිමි.

3. "මහණෙනි, මෙසේ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය, කටුකය, ඵරුෂය. අති උතුම් රහත්ඵලාවබෝධයට අනතුරු කරන්නේය. මහණෙනි, ඒ නිසා මෙහිදී මෙසේ හික්මිය යුතු වන්නේය. (කෙසේද?) 'උපන්නාවූ, ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන්නාවූ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපගේ කුසල් සිත විනාශ නොකෙරේවායි,' මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

(දහතුන්වෙනි පජාපතී සූත්‍රය නිමි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(හින්දි සූත්‍රය, මූල සූත්‍රය, ධම්ම සූත්‍රය, සුක්ක සූත්‍රය, පක්කන්ත සූත්‍රය, රථ සූත්‍රය, මාතු සූත්‍රය, පිතු සූත්‍රය, භාතු සූත්‍රය, භගිනී සූත්‍රය, පුත්‍ර සූත්‍රය, ධීතු සූත්‍රය සහ පජාපතී සූත්‍රයයි කියා මේ වර්ගයෙහි සූත්‍ර දහතුනෙකි.

(සතරවන වර්ගය නිමි.)
(ලාභ සත්කාර සංයුත්තය නිමි.)

---

# 6. රාහුල සංයුත්තය.

## 1. වර්ගය.

### 1. චක්ඛු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. ඉක්බිති ආයුෂ්මත් ‘රාහුල’ මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ‘රාහුල’ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

3. “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දහම් දෙසන සේක් නම් යෙහෙකි. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නිවන කරා යවන ලද සිත් ඇතිව වාසය කරන්නෙමි”යි කියායි.

4. “රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? ඇස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?”-‘ස්වාමීනි, අනිත්‍යය.’

‘යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?’ ‘ස්වාමීනි, දුකය.’

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම් එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

5. "කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-'ස්වාමීනි, අනිත්‍යය'

'යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. නැහැය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසු ද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

5. 'දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.

6. කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

7. 'සිත නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්‍යශ්‍රාවකතෙම ඇසෙහිත් කලකිරෙයි. කණෙහිත් කලකිරෙයි. නැහැයෙහිත් කලකිරෙයි. දිවෙහිත් කලකිරෙයි. කයෙහිත් කලකිරෙයි. සිතෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නො ඇලීමෙන් ක්ලෙශයන්ගෙන් මිදෙයි. (ක්ලෙශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලෙශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්ම චර්‍යාවෙහි හැසිර නිම කරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළ යුත්තක් නැතැයි දැන ගනියි.

**(පළමුවෙනි චක්ඛු සූත්‍රය නිමි.)**

---

## 2. රූප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. ඉක්බිති, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේට වැඳ එක්පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ හට මෙය කීයේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දහම් දෙසනසේක් නම් යෙහෙකි. ඒ මම

භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නිවන කරා යවන ලද සිත් ඇතිව, වාසය කරන්නෙමියි කියායි.

3. රාහුලය, ඒ කිමැයි හඟන්නෙහිද? රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. 'ශබ්දය, නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

5. 'ගන්ධය, නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?'-ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය'

6. 'රසය, නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

7. 'ස්පර්ශය, නිත්‍ය හෝ අනිත්‍යය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.

'යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?', 'ස්වාමීනි, දුකය.'

යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. ධර්මය, නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

9. රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආයර්‍ය්‍යශ්‍රාවකතෙම රූපයෙහිත් කලකිරෙයි. ශබ්දයෙහිත් කලකිරෙයි. ගන්ධයෙහිත් කලකිරෙයි. රසයෙහිත් කලකිරෙයි. ස්පර්ශයෙහිත් කලකිරෙයි, ධර්මයෙහිත් කලකිරෙයි. කලකිරුණේ නො ඇලෙයි. නො ඇලීමෙන් ක්ලෙශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලෙශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිම කරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්ම භාවය පිණිස කළ යුත්තක් නැතැයි දැන ගනියි.

**(දෙවෙනි රූප සූත්‍රය නිමි.)**

---

## 3. විඤ්ඤාණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

ඉක්බිති ආයුෂ්මත් ‘රාහුල’ මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේහට මෙය කීයේය. “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දහම් දෙසන සේක් නම් යෙහෙකි. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නිවන කරා යවන ලද සිත් ඇතිව, වාසය කරන්නෙමියි” කියායි.

2. ‘රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? චක්ඛු විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?’-‘ස්වාමීනි, අනිත්‍යය.’

‘යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?’-‘ස්වාමීනි, දුකය.’

‘යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?’-‘ස්වාමීනි, එය නුසුදුසුය.’

3. ‘සෝත විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?’-‘ස්වාමීනි, අනිත්‍යය.’

‘යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?’-‘ස්වාමීනි, දුකය.’

‘යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?’-‘ස්වාමීනි, එය නුසුදුසුය.’

4. ‘ඝාණ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?’-‘ස්වාමීනි, අනිත්‍යය.’

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි එය නුසුදුසුය.'

**5.** 'ජිව්හා විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**6.** 'කාය විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**7.** 'මනෝ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**8.** 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙම චක්ඛු විඤ්ඤාණයෙහිත්

කලකිරෙයි. සෝත විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. ඝාණ විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. ජිව්හා විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. කාය විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. මනෝ විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඤාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිම කරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

(තුන්වෙනි විඤ්ඤාණ සූත්‍රය නිමි.)

---

## 4. සම්ඵස්ස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

2. ඉක්බිති ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේහට මෙය කීයේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ, මට කොටින් දහම් දෙසන සේක් නම් යෙහෙකි. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නිවන කරා යවන ලද සිත් ඇතිව, වාසය කරන්නෙමියි කියායි."

3. 'රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? චක්ඛු සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?' - ස්වාමීනි, එය නුසුදුසුය.'

**4.** 'සෝත සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**5.** 'ඝාන සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**6** 'ජිව්හා සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**7.** 'කාය සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'මනෝ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

9. "රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍යශ්‍රාවකතෙම චක්ඛු සම්ඵස්සයෙහිත් කලකිරෙයි. සෝත සම්ඵස්සයෙහිත් කලකිරෙයි. ඝාන සම්ඵස්සයෙහිත් කලකිරෙයි. ජිව්හා සම්ඵස්සයෙහිත් කලකිරෙයි. කාය සම්ඵස්සයෙහිත් කලකිරෙයි. මනෝ සම්ඵස්සයෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඥානය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍යාවෙහි හැසිර නිම කරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි."

**(සතරවෙනි සම්ඵස්ස සූත්‍රය නිමි.)**

---

## 5. වේදනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

ඉක්බිති ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේහට මෙය කීයේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දහම් දෙසන සේක්නම් යෙහෙකි. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නිවන කරා යවනලද සිත් ඇතිව, වාසය කරන්නෙමියි" කියායි.

2. 'රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? චක්ඛුසම්ඵස්සයෙන් උපන් වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

3. 'සෝත සම්ඵස්සයෙන් උපන් වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමකු වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. 'ඝාන සම්ඵස්සයෙන් උපන් වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**5.** 'ජිව්හා සම්ඵස්සයෙන් උපන් වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද? එය දුක් හෝ සැප හෝ වේද?- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**6.** 'කාය සම්ඵස්සයෙන් උපන් වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම් එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**7.** 'මනෝ සම්ඵස්සයෙන් උපන් වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙම චක්ඛු සම්ඵස්සයෙන් උපන් වේදනාවෙහිත් කලකිරෙයි. සෝත සම්ඵස්සයෙන් උපන් වේදනාවෙහිත් කලකිරෙයි. ඝාන සම්ඵස්සයෙන් උපන්

වේදනාවෙහිත් කලකිරෙයි. ජිව්හා සම්ඵස්සයෙන් උපන් වේදනාවෙහිත් කලකිරෙයි. කාය සම්ඵස්සයෙන් උපන් වේදනාවෙහිත් කලකිරෙයි. මනෝ සම්ඵස්සයෙන් උපන් වේදනාවෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිම කරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

**(පස්වෙනි වේදනා සූත්‍රය නිමි.)**

---

## 6. සඤ්ඤා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක.

2. ඉක්බිති ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දහම් දෙසන සේක් නම් යෙහෙකි. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා තනිව වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නිවන කරා යවන ලද සිත් ඇතිව, වාසය කරන්නෙමියි" කියායි.

3. 'රාහුලය, ඒ කිමැයි හඟන්නෙහිද? රූප සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම් පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. 'ශබ්ද සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

5. ගන්ධ සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

6. 'රස සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

7. 'ස්පර්ශ සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'ධර්ම සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

9. "රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම රූප සංඥාවෙහිත් කලකිරෙයි. ශබ්ද සංඥාවෙහිත් කලකිරෙයි. ගන්ධ සංඥාවෙහිත් කලකිරෙයි. රස සංඥාවෙහිත් කලකිරෙයි. ස්පර්ශ සංඥාවෙහිත් කලකිරෙයි. ධර්ම සංඥාවෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන් ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිම කරණ ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළ යුත්තක් නැතැයි දැනගනියි."

**(හයවෙනි සංඥා සූත්‍රය නිමි.)**

---

## 7. සඤ්චෙතනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

ඉක්බිති ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේහට මෙය කීයේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දහම් දෙසන සේක්නම් යෙහෙකි. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නිවන කරා යවන ලද සිත් ඇතිව, වාසය කරන්නෙමියි" කියායි.

2. 'රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? රූප සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

3. 'ශබ්ද සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. 'ගන්ධ සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5. 'රස සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

6. 'ස්පර්ශ සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

7. 'ධර්ම සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙම රූප සඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. ශබ්ද සඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. ගන්ධ සඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. රස සඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. ස්පර්ශ සඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. ධර්ම සඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය

යන ඥානය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිම කරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

(හත්වෙනි සඤ්චෙතනා සූත්‍රය නිමි.)

---

## 8. තණ්හා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

ඉක්බිති, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය, "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දහම් දෙසන සේක් නම් යෙහෙකි. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නිවන කරා යවනලද සිත් ඇතිව, වාසය කරන්නෙමියි කියායි.

2. 'රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද?'-'රූප තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි එය නුසුදුසුය.'

3. 'ශබ්ද තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි එය නුසුදුසුය.'

**4.** 'ගන්ධ තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළු නම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**5.** 'රස තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?-ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-ස්වාමීනි, එය නුසුදුසුය.'

**6.** 'ස්පර්ශ තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-ස්වාමීනි, එය නුසුදුසුය.'

**7.** 'ධර්ම තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙම රූප තණ්හාවෙහිත් කලකිරෙයි. ශබ්ද තණ්හාවෙහිත් කලකිරෙයි. ගන්ධ තණ්හාවෙහිත් කලකිරෙයි. රස තණ්හාවෙහිත් කලකිරෙයි. ස්පර්ශ තණ්හාවෙහිත් කලකිරෙයි. ධර්ම තණ්හාවෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඥානය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමකරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

**(අටවෙනි තණ්හා සූත්‍රය නිමි.)**

---

## 9. ධාතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

2. ඉක්බිති, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේහට මෙය කීයේය. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දහම් දෙසන සේක්නම් යෙහෙකි. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, තනිව, වෙන්ව, අප්‍රමාදව,

කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නිවන කරා යවන ලද සිත් ඇතිව, වාසය කරන්නෙමියි" කියායි.

3. 'රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? පඨවි ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. 'අපෝ ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-ස්වාමීනි, එය නුසුදුසුය.'

5. 'තේජෝ ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

6. 'වායෝ ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

7. 'ආකාස ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'විඤ්ඤාණ ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි එය නුසුදුසුය.'

**9.** 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍යශ්‍රාවක තෙම පඨවි ධාතුවෙහිත් කලකිරෙයි. ආපෝ ධාතුවෙහි කලකිරෙයි. තේජෝ ධාතුවෙහිත් කලකිරෙයි. වායෝ ධාතුවෙහිත් කලකිරෙයි. ආකාශ ධාතුවෙහිත් කලකිරෙයි. විඤ්ඤාණ ධාතුවෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඤාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍යාවෙහි හැසිර නිමකරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

**(නවවෙනි ධාතු සූත්‍රය නිමි.)**

# 10. බන්ධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

2. ඉක්බිති ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දහම් දෙසනසේක් නම් යෙහෙකි. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා තනිව වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නිවන කරා යවන ලද සිත් ඇතිව වාසය කරන්නෙමි කියායි.

3. 'රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද?' 'රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?' 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙනසුළු නම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. 'වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

5. 'සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

6. 'සංස්කාරය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, නුසුදුසුය.'

7. 'විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?' ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙනසුළු නම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම රූපය කෙරෙහිත් කලකිරෙයි. වේදනාව කෙරෙහිත් කලකිරෙයි. සංඥාව කෙරෙහිත් කලකිරෙයි. සංස්කාර කෙරෙහිත් කලකිරෙයි. විඤ්ඤාණය කෙරෙහිත් කලකිරෙයි.

'කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලෙශයන් ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලෙශයන්ගෙන්) මිදුනේය යන ඤාණය උපදියි. ඉපදීම

කෙළවර විය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමකරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

(දසවෙනි ඛන්ධ සූත්‍රය නිමි.)

---

(චක්ඛු සූත්‍රය, රූප සූත්‍රය, විඤ්ඤාණ සූත්‍රය, සම්ඵස්ස සූත්‍රය, වේදනා සූත්‍රය, සඤ්ඤා සූත්‍රය, සඤ්චේතනා සූත්‍රය, තණ්හා සූත්‍රය, ධාතු සූත්‍රය සහ ඛන්ධ සූත්‍රය දැයි මේ වර්ගයෙහි සූත්‍ර දසයකි.)

පළමුවන වර්ගය නිමි.

---

## 2. වර්ගය.

### 1. චක්ඛු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. ඉක්බිති ආයුෂ්මත් 'රාහුල' මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් 'රාහුල' මහණහට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනාකළ සේක.

3. "රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? ඇස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?' 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම් එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. "කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

5. 'නැහැය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

6. 'දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

7. 'කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'මනස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

පටුන



'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**9.** 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඇසෙහිත් කලකිරෙයි. කණෙහිත් කලකිරෙයි. නැහැයෙහිත් කලකිරෙයි. දිවෙහිත් කලකිරෙයි. කයෙහිත් කලකිරෙයි. මනසෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නො ඇලීමෙන් ක්ලෙශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලෙශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලෙශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර, නිම කරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළ යුත්තක් නැතැයි දැන ගනියි.'

**(පළමුවෙනි චක්ඛු සූත්‍රය නිමි.)**

---

## 2. රූප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. ඉක්බිති, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණහට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනාකළසේක.

3. 'රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. 'ශබ්දය, නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

5. 'ගන්ධය, නිත්‍යය හෝ අනිත්‍ය හෝ වේද?'-ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

6. රසය, නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

7. 'ස්පර්ශය, නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.

'යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?', 'ස්වාමීනි, දුකය.'

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. ධර්මය, නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

9. 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්‍යශ්‍රාවකතෙම රූපයෙහිත් කලකිරෙයි. ශබ්දයෙහිත් කලකිරෙයි. ගන්ධයෙහිත් කලකිරෙයි. රසයෙහිත් කලකිරෙයි. ස්පර්ශයෙහිත් කලකිරෙයි, ධර්මයෙහිත් කලකිරෙයි. කලකිරුණේ නො ඇලෙයි. නො ඇලීමෙන් ක්ලෙශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලෙශයන් ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍යාවෙහි හැසිර නිම කරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැන ගනියි.'

**(දෙවෙනි රූප සූත්‍රය නිමි.)**

---

## 3. විඤ්ඤාණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති ආයුෂ්මත් 'රාහුල' මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ,

භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් රාහුල මහණහට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

3. 'රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? චක්ඛු විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. 'සෝත විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

5. 'ඝාණ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි එය නුසුදුසුය.'

6. 'ජිව්හා විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

7. 'කාය විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'මනෝ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

9. 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙම චක්ඛු විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. සෝත විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. ඝාණ විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. ජිව්හා විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. කාය විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. මනෝ විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිම කරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

**(තුන්වෙනි විඤ්ඤාණ සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 4. සම්ඵස්ස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

2. ඉක්බිති ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණහට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

3. 'රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? චක්ඛු සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?-' ස්වාමීනි, එය නුසුදුසුය.'

4. 'සෝත සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

5. 'ඝාන සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**6.** 'ජිව්හා සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- ස්වාමීනි දුකය'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**7.** 'කාය සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**8.** 'මනෝ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**9.** "රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙම චක්ඛු සම්ඵස්සයෙහිත් කලකිරෙයි. සෝත සම්ඵස්සයෙහිත් කලකිරෙයි. ඝාන සම්ඵස්සයෙහිත් කලකිරෙයි. ජිව්හා සම්ඵස්සයෙහිත් කලකිරෙයි.

කය සම්ඵස්සයෙහිත් කලකිරෙයි. මනෝ සම්ඵස්සයෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිම කරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි."

(සතරවෙනි සම්ඵස්ස සූත්‍රය නිමි.)

---

## 5. වේදනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

ඉක්බිති ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණහට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

2. 'රාහුලය, චක්ඛුසම්ඵස්සයෙන් ඇතිවන වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍ය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළු නම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

3. 'සෝත සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**4.** 'ඝාන සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**5.** 'ජිව්හා සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද? එය දුක් හෝ සැප හෝ වේද?- ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**6.** 'කාය සම්ඵස්සයෙන් උපන් වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම් එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**7.** 'මනෝ සම්ඵස්සයෙන් ඇතිවන වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍යශ්‍රාවකතෙම චක්ඛු සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාවෙහිත් කලකිරෙයි. සෝත සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාවෙහිත් කලකිරෙයි. ඝාන සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාවෙහිත් කලකිරෙයි. ජිව්හා සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාවෙහිත් කලකිරෙයි. කාය සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාවෙහිත් කලකිරෙයි. මනෝ සම්ඵස්සයෙන් ඇතිවෙන වේදනාවෙහිත් කලකිරෙයි. කලකිරුණේ නො ඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවරවිය. බ්‍රහ්මචර්‍යාවෙහි හැසිර නිමකරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින් පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

**(පස්වෙනි වේදනා සූත්‍රය නිමි.)**

---

## 6. සඤ්ඤා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක.

2. ඉක්බිති ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණහට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

3. 'රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? රූප සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම් පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**4.** 'ශබ්ද සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**5.** 'ගන්ධ සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**6.** 'රස සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**7.** 'ස්පර්ශ සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'ධර්ම සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළුනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

9. "රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම රූප සංඥාවෙහිත් කලකිරෙයි. ශබ්ද සංඥාවෙහිත් කලකිරෙයි. ගන්ධ සංඥාවෙහිත් කලකිරෙයි. රස සංඥාවෙහිත් කලකිරෙයි. ස්පර්ශ සංඥාවෙහිත් කලකිරෙයි. ධර්ම සංඥාවෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිම කරණ ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළ යුත්තක් නැතැයි දැනගනියි."

**(හයවෙනි සංඥා සූත්‍රය නිමි.)**

---

## 7. සඤ්චෙතනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

ඉක්බිති ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණහට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

2. 'රාහුලය, ඒ කිමැයි හඟින්නෙහිද? රූප සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

3. 'ශබ්ද සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. 'ගන්ධ සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

5. 'රස සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**6.** 'ස්පර්ශ සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**7.** 'ධර්ම සඤ්චෙතනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙම රූපසඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. ශබ්ද සඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. ගන්ධ සඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. රස සඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. ස්පර්ශ සඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. ධර්ම සඤ්චෙතනාවෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඥානය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි

හැසිර නිම කරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

**(හත්වෙනි සඤ්චෙතනා සූත්‍රය නිමි.)**

---

## 8. තණ්හා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

ඉක්බිති, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණහට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

2. 'රාහුලය, 'රූප තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි එය නුසුදුසුය.'

3. 'ශබ්ද තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි එය නුසුදුසුය.'

**4.** 'ගන්ධ තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-ස්වාමීනි, එය නුසුදුසුය.'

**5.** 'රස තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-ස්වාමීනි, එය නුසුදුසුය.'

**6.** 'ස්පර්ශ තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-ස්වාමීනි, එය නුසුදුසුය.'

**7.** 'ධර්ම තණ්හාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙම රූප තණ්හාවෙහිත් කලකිරෙයි. ශබ්ද තණ්හාවෙහිත් කලකිරෙයි. ගන්ධ තණ්හාවෙහිත් කලකිරෙයි. රස තණ්හාවෙහිත් කලකිරෙයි. ස්පර්ශ තණ්හාවෙහිත් කලකිරෙයි. ධර්ම තණ්හාවෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමකරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

**(අටවෙනි තණ්හා සූත්‍රය නිමි.)**

---

## 9. ධාතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

2. ඉක්බිති, ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් රාහුල මහණහට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

3. 'රාහුලය, පඨවි ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- 'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'- 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**4.** 'ආපෝ ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-ස්වාමීනි, එය නුසුදුසුය.'

**5.** 'තේජෝ ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

**6.** 'වායෝ ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

7. 'ආකාස ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම්, එය මාගේය, එය මම වෙමි, එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'විඤ්ඤාණ ධාතුව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක්නම්, පෙරළෙන සුළුනම් එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-ස්වාමීනි එය නුසුදුසුය.'

9. 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙම පඨවි ධාතුවෙහිත් කලකිරෙයි. ආපෝ ධාතුවෙහිත් කලකිරෙයි. තේජෝ ධාතුවෙහිත් කලකිරෙයි. වායෝ ධාතුවෙහිත් කලකිරෙයි. ආකාශ ධාතුවෙහිත් කලකිරෙයි. විඤ්ඤාණ ධාතුවෙහිත් කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලේශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලේශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලේශයන්ගෙන්) මිදුනේය යන ඤාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමකරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

**(නවවෙනි ධාතු සූත්‍රය නිමි.)**

---

## 10. ඛන්ධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. ඉක්බිති ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් රාහුල මහණහට භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

3. 'රාහුලය, රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද? ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙනසුළු නම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

4. 'වේදනාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

5. 'සංඥාව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?'-ස්වාමීනි දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

6. 'සංස්කාරය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?' 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුළු නම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, නුසුදුසුය.'

7. 'විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-'ස්වාමීනි, අනිත්‍යය.'

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?' 'ස්වාමීනි, දුකය.'

'යමක් වනාහි අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙනසුළු නම්, එය මාගේය, එය මම වෙමි. එය මාගේ ආත්මයයි. දැකීමට සුදුසුද?'-'ස්වාමීනි, එය නුසුදුසුය.'

8. 'රාහුලය, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම රූපයෙහිත් කලකිරෙයි. වේදනාවෙහිත් කලකිරෙයි. සංඥාවෙහිත් කලකිරෙයි. සංස්කාරයෙහිත් කලකිරෙයි. විඤ්ඤාණයෙහිත් කලකිරෙයි.

'කලකිරුණේ නොඇලෙයි. නොඇලීමෙන් ක්ලෙශයන්ගෙන් මිදෙන්නේය. (ක්ලෙශයන්ගෙන්) මිදුනු කල්හි (ක්ලෙශයන්ගෙන්) මිදුනේය යන ඥාණය උපදියි. ඉපදීම කෙළවර විය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමකරන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මින්පසු මේ ආත්මභාවය පිණිස කළයුත්තක් නැතැයි දැනගනියි.'

(දසවෙනි ඛන්ධ සූත්‍රය නිමි.)

---

## 11. අනුසය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති ආයුෂ්මත් රාහුලතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් රාහුලතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

"ස්වාමීනි, කෙසේ දන්නහුට, කෙසේ දක්නහුට වනාහි මේ විඤ්ඤාණය සහිත කයෙහිද, බාහිරවූ සවිඤ්ඤාණක සහ

අවිඤ්ඤාණක කයෙහිද යන සියලු නිමිතිවල මමයයි ගන්නා දෘෂ්ටියද මාගේයයි ගන්නා තණ්හාවද මානානුශයද ඇති නොවෙත්ද?”

3. “රාහුලය, අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීතවූද, අනාගතවූද; වර්තමානවූද යම්කිසි රූපයක් වේද, (ඒ) සියලු රූපය ‘මෙය මාගේ නොවේ. මෙය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය ඇති පරිදි විදර්ශනා ප්‍රඥාවෙන් සහ මාර්ග ප්‍රඥාවෙන් මනාකොට දකියිද,

“අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි වේදනාවක් වේද, (ඒ) සියලු වේදනාව මෙය මාගේ නොවේ. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය ඇති පරිදි විදර්ශනා ප්‍රඥාවෙන් හා මාර්ග ප්‍රඥාවෙන් මනාකොට දකියි.

4. “අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි සංඥාවක් වේද, (ඒ) සියලු සංඥාව මෙය මාගේ නොවේ. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය ඇති පරිදි විදර්ශනා ප්‍රඥාවෙන් හා මාර්ග ප්‍රඥාවෙන් මනාකොට දකියි.

“අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි සංස්කාරයක් වේද, (ඒ) සියලු සංස්කාර මෙය මාගේ නොවේ. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය ඇති පරිදි විදර්ශනා ප්‍රඥාවෙන් හා මාර්ග ප්‍රඥාවෙන් මනාකොට දකියි.

5. “අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, යම්කිසි විඤ්ඤාණයක් වේද, (ඒ)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සියලු විඤ්ඤාණය මෙය මාගේ නොවේය. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය ඇති පරිදි විදර්ශනා ප්‍රඥාවෙන් හා මාර්ග ප්‍රඥාවෙන් මනාකොට දකියි.

"රාහුලය, මෙසේ දන්නහුට, මෙසේ දක්නහුට වනාහි මේ විඤ්ඤාණය සහිත කයෙහිද, බාහිරවූ, සවිඤ්ඤාණක සහ අවිඤ්ඤාණක කයෙහිද යන සියලු නිමිතිවල මමයයි ගන්නා තණ්හාවත් මානානුශයත් ඇති නොවෙති."

**(එකොළොස්වෙනි අනුශය සූත්‍රය නිමි.)**

---

## 12. අපගත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක.

2. ඉක්බිති ආයුෂ්මත් රාහුල මහණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් රාහුල මහණතෙම වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙය කීයේය.

"ස්වාමීනි, කෙසේ දන්නහුට, කෙසේ දක්නහුට වනාහි මේ විඤ්ඤාණය සහිත කයෙහිද, බාහිරවූ (පිටස්තරවූ) සවිඤ්ඤාණක සහ අවිඤ්ඤාණක කයෙහිද යන සියලු නිමිතිවල මමයයි ගන්නා දෘෂ්ටියෙනුත්, මාගේයයි ගන්නා තණ්හාවෙනුත් මානයෙනුත් පහවූ මාන කොට්ඨාශයන් ඉක්මවූ, ශාන්තවූ, මනාකොට මිදුනාවූ, සිත ඇතිවෙයිද?"

"රාහුලය, අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි රූපයක්වේද, (ඒ) සියලු රූපය මෙය මාගේ නොවේ. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය ඇති පරිදි

විදර්ශනාප්‍රඥාවෙන් හා මාර්ගප්‍රඥාවෙන් මනාකොට දැක, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේ වෙයි.

3. "අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඖලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූ ද යම්කිසි වේදනාවක් වේද, (ඒ) සියලු වේදනාව මෙය මාගේ නොවේ. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි මෙසේ ඇති පරිදි විදර්ශනා ප්‍රඥාවෙන් හා මාර්ග ප්‍රඥාවෙන් මනාකොට දැක, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේ වෙයි.

"අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඖලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි සංඥාවක් වේද, (ඒ) සියලු සංඥාව මෙය මාගේ නොවේ. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය ඇති පරිදි විදර්ශනා ප්‍රඥාවෙන් හා මාර්ග ප්‍රඥාවෙන් මනාකොට දැක, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේ වෙයි.

4. "අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඖලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි සංස්කාරයක් වේද, (ඒ) සියලු සංස්කාර මෙය මාගේ නොවේ. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි මෙසේ ඇති පරිදි විදර්ශනා ප්‍රඥාවෙන් හා මාර්ග ප්‍රඥාවෙන් මනාකොට දැක, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේ වෙයි.

"අද්ධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඖලාරිකවූ හෝ සුඛුමවූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ අතීතවූද, අනාගතවූද, වර්තමානවූද යම්කිසි විඥ්ඥාණයක් වේද, (ඒ) සියලු විඥ්ඥාණය මෙය මාගේ නොවේ. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය ඇති පරිදි විදර්ශනා ප්‍රඥාවෙන් හා මාර්ග ප්‍රඥාවෙන් දැන මනාකොට දැක, (තණ්හාදී වශයෙන්) දැඩිකොට නොගැනීමෙන් මිදුනේ වෙයි.

5. "රාහුලය, මෙසේ දන්නහුට, මෙසේ දක්නහුට වනාහි විඤ්ඤාණය සහිත කයෙහිද, බාහිරවූ සවිඤ්ඤාණක සහ අවිඤ්ඤාණක කයෙහිද යන සියලු නිමිතිවල මමයයි ගන්නා දෘෂ්ටියෙන්ද, මාගේයයි ගන්නා තණ්හාවෙන්ද, මානයෙන්ද පහවූ, මාන කොට්ඨාසයන් ඉක්මවූ, ශාන්තවූ, මනාකොට මිදුනාවූ මනස ඇතිවේයයි වදාළසේක."

**(දොළොස්වෙනි අපගත සූත්‍රය නිමි.)**

---

(චක්ඛු සූත්‍රය, රූප සූත්‍රය, විඤ්ඤාණ සූත්‍රය, සම්ඵස්ස සූත්‍රය, වේදනා සූත්‍රය, සඤ්ඤා සූත්‍රය, සඤ්චෙතනා සූත්‍රය, තණ්හා සූත්‍රය, ධාතු සූත්‍රය, ඛන්ධ සූත්‍රය, අනුසය සූත්‍රය සහ අපගත සූත්‍රයයි කියා මේ වර්ගයෙහි සූත්‍ර දොළොසකි.)

**(දෙවෙනි වර්ගය නිමි.)**

**(රාහුල සංයුත්තය නිමි.)**

---

# 7. ලක්ඛණ සංයුත්තය.

## 1. වර්ගය.

### 1. අට්ඨි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම්ලත් වේළුවනයෙහි වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම, පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන්හට මෙය කීයේය. "ඇවැත් ලක්ඛණය, යමු

රජගහනුවරට පිඩුපිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය.

2. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී, සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන තෙරුන් හට මෙය කීයේය. "ආයුෂ්මත් මොග්ගල්ලානයෙනි, (ඔබවහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?" "ඇවැත්, ලක්ඛණය, මේ ප්‍රශ්නයට (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙමේද රජගහනුවර පිඩු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි වැඩියාහුය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නාහුය, එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙසේ කීයේය. "ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්වහන්සේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඇවැත් මොග්ගල්ලානයෙනි, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. ඇවැත්නි, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම අහසින් ගමන්කරන්නාවූ, ඇටසැකිලි ප්‍රේතයකු දැක්කෙමි. යක්ෂ ගිජුලිහිණියෝද, යක්ෂ කවුඩෝද, යක්ෂ උකුස්සෝද එළව එළවා, ඒ මොහුගේ ඉලඇට අතරෙහි විදිති. ඒ ඇටසැකිලි ප්‍රේතයා බැගෑපත් හඬ නගයි. ඇවැත්නි ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්වර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේද, කියායි.' ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක.

4. "මහණෙනි, යම්හෙයකින් වනාහි ශ්‍රාවකයෙක් තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂාත් හෝ කරන්නේවේද, ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ, ශ්‍රාවකයෝ වාසයකෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහුනම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක්පිණිස වන්නේය. මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම ගෝඝාතකයෙක් (හරක් මරන්නෙක්) විය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සියගණනක්, බොහෝ වර්ෂ දහස්ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳින්නේයයි" වදාළසේක.

(පළමුවෙනි අට්ඨිසූත්‍රය නිමි.)

---

## 2. පේසි සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුනවනයෙහි) වාසයකරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරතෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාසිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත්

ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් හට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබවහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?" "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙමේද රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින්පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු, භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක වැඩහුන්නාහුය. එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ, එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම අහසින් ගමන් කරන්නාවූ, මංසපේසි (මස්පෙති) ප්‍රේතයකු දැක්කෙමි. යක්ෂ ගිජුලිහිණියෝද, යක්ෂ කවුඩෝද, යක්ෂ උකුස්සෝද, එළව, එළවා ඒ මොහුගේ (මස්පෙති) උදුරා දමති. විනාශ කරති. ඒ මංසපේසි (මස්පෙති) ප්‍රේතයා බැගෑපත් හඬ නගයි. ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය' කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථා කළසේක"

4. "මහණෙනි, යම්හෙයකින් වනාහි ශ්‍රාවකයෙක් තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂාත් හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ, ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඤාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහු නම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක්පිණිස වන්නේය.

5. "මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම ගෝඝාතකයෙක් විය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සියගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලැබේයයි" වදාළසේක.

**(දෙවෙනි පේසි සූත්‍රය නිමි.)**

---

## 3. පිණ්ඩ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරතෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර, සිවුරුගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬුපිණිස පිවිසෙමුයයි" කියායි.

"ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය.

ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම "ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් හට මෙය කීයේය. ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබවහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

"ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය.

3. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙමේද රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු, භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක වැඩහුන්නාහුය. එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම අහසින් ගමන් කරන්නාවූ, මංස පිණ්ඩ (මස්පිඬු) ප්‍රේතයෙකු දැක්කෙමි. යක්ෂ ගිජුලිහිණියෝද, යක්ෂ කවුඩෝද, යක්ෂ උකුස්සෝද එළව, එළවා ඒ මොහුගේ (මස්පිඬු) උදුරා දමති. විනාශකරති. ඒ මංස පිණ්ඩ (මස්පිඬු) ප්‍රේතයා බැගෑපත් හඬ නගයි.

"ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත්

වන්නේද, මෙබඳුවූ ආත්ම භාවයක් ලැබීමකුදු වන්නේය කියායි.” ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් හට කථා කළ සේක.

5. “මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති.

5. “මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නො අදහන්නාහුය. යම් අය මා නො අදහන්නාහු නම් එය ඔවුන් හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

6. “මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම සාකුණිකයෙක් (පක්ෂීන් මරා විකුණා ජීවත් වන්නෙක්) විය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක් බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්ම භාවයක් ලැබීම විඳිනු ලැබේයයි” වදාළසේක.

**(තුන්වෙනි පිණ්ඩ සූත්‍රය නිමි.)**

---

## 4. නිච්ඡවි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරතෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරතෙම, පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර, සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ

ස්ථවිරතෙම යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු, රජගහ නුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබ වහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයේදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේද, රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු, (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුණාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක වැඩ හුන්නාහුය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය.

4. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?

5. 'ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම අහසින් ගමන් කරන්නාවූ, නිච්ඡවි (සම නැති) ප්‍රේතයෙකු දැක්කෙමි. යක්ෂ ගිජුලිහිණියෝද, යක්ෂ කවුඩෝද, යක්ෂ උකුස්සෝද එළව, එළවා ඒ මොහුගේ (සම නැති මස්) උදුරා දමති. විනාශ කරති. ඒ නිච්ඡම්ම (සම නැති) ප්‍රේතයා බැගෑපත් හඬ නගයි.

6. "ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්ම භාවයක් ලැබීමකුදු වන්නේය' කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක.

7. "මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේද ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ, ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නාලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නො අදහන්නාහුය. යම් අය මා නො අදහන්නාහු නම් එය ඔවුන් හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

8. "මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම ඕරබ්භිකයෙක් (එළුවන් මරා ජීවත් වන්නෙක් විය.) හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලැබෙයියි" වදාළසේක.

**(සතරවෙනි නිච්ඡවි සූත්‍රය නිමි.)**

---

## 5. අසි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එ සමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරතෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ)

කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් යම් තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබ වහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේද, රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ, මම අහසින් ගමන් කරන්නාවූ, අසිලෝම (කඩු වැනි ලොම් ඇති) ප්‍රේතයෙකු දැක්කෙමි. ඔහුගේ ඒ කඩු අහසට නැගි නැඟී, ඒ අසිලෝම ප්‍රේතයාගේ කයෙහිම වැටේ. ඒ අසිලෝම ප්‍රේතයා බැගෑපත්

හඬ නඟයි. ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. ‘පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය, කියායි.” ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක.

5. “මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේවිය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නො අදහන්නාහුය. යම් අය මා නො අදහන්නාහු නම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

6. “මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම සූකරිකයෙක් (හූරන් මරා ජීවත්වන්නෙක්) විය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලැබෙයි” වදාළසේක.

**(පස්වෙනි අසි සූත්‍රය නිමි.)**

---

## 6. සත්ති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එ සමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති

ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර, සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් යම් තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහ නුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබ වහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙමේද, රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක වැඩ හුන්නාහුය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. 'ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ, මම අහසින් ගමන් කරන්නාවූ, සත්තිලෝම (ආයුධ වැනි ලොම් ඇති) ප්‍රේතයෙකු දැක්කෙමි. ඔහුගේ ඒ ආයුධ අහසට නැගි නැගී, ඒ

සත්තිලෝම ප්‍රේතයාගේ කයෙහිම වැටේ. ඒ සත්තිලෝම ප්‍රේතයා බැගෑපත් හඬනගයි. ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය' කියායි. "ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක.

5. "මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ, ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නාලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහු නම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

6. "මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම ද්වාගවිකයෙක් (මුවන් මරා ජීවත් වන්නෙක්) විය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලැබේයයි" වදාළසේක.

**(හයවෙනි සත්ති සූත්‍රය නිමි.)**

---

## 7. උසු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි වාසයකරනසේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙමේද

ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම, පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය, වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් හට මෙය කීයේය. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬුපිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය.

2. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී, සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර හට මෙය කීයේය. "ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබ වහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?" "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි." කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙමේද රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක වැඩ හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම, ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම උසුලෝම (ඊතලවැනි ලොම් ඇති) ප්‍රේතයෙකු දැක්කෙමි. ඔහුගේ ඒ ඊතල නැගි නැගී ඒ උසුලෝම ප්‍රේතයාගේ කයෙහි වැටේ, ඒ

උසුලෝම ප්‍රේතයා බැගෑපත්ව හඬ නගයි. ඇවැත ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි, මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය, කියායි." ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථාකළසේක.

4. "මහණෙනි, යම්හෙයකින් වනාහි ශ්‍රාවකයෙක් තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ, ශ්‍රාවකයෝ වාසය කෙරෙති, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහු නම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

5. "මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම කාරණිකයෙක් (රාජාපරාධකාරයන් විද මරන්නෙක්) විය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලැබේයයි" වදාළසේක.

**(සත්වෙනි උසු සූත්‍රය නිමි.)**

---

## 8. සූචි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම්ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරණසේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි

වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම, පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍රසිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන්හට මෙය කීයේය. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය.

2. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී, සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් හට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබවහන්සේ) සිනා පහළකිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?" "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි." කීයේය.

3. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙමේද රජගහනුවර පිඬුපිණිස හැසිර, බතින්පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුණාහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නාහුය, එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම අහසින් ගමන්කරන්නාවූ, සූචිලෝම (ඉදිකටුවැනි ලොම් ඇති) ප්‍රේතයකු දැක්කෙමි. ඔහුගේ ඒ ඉදිකටු අහසට නැගී නැගී ඔහුගේම කයෙහි වැටේ, ඒ සූචිලෝම ප්‍රේතයා බැගෑපත් හඬ නගයි. ඇවැත, ඒ

මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය' කියායි." ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක.

5. "මහණෙනි, යම්හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂාත් හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ, ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහු නම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස දුක් පිණිස වන්නේය."

6. "මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම සූතයෙක් (අසුන් හික්මවන්නෙක්) විය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශේෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලැබෙයයි" වදාළසේක.

**(අටවෙනි සූචි සූත්‍රය නිමි.)**

---

## 9. සබ්බියති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම, පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍රසිවුරුගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම

යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් හට මෙය කීයේය. “ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඩුපිණිස පිවිසෙමුයයි” කියායි. “ඇවැත, එසේයයි” කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය.

2. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී, සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. “ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්වහන්ස, (ඔබවහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? ‘ඇවැත්, ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි” කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙමේද රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක වැඩ හුන්නාහුය, එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. “ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?”

3. “ඇවැත, ගිජ්ඣකූටපර්වතයෙන් බසින්නාවූ මම අහසින් ගමන්කරන්නාවූ, සූචිලෝම (ඉදිකටු වැනි ලොම් ඇති) ප්‍රේතයෙකු දැක්කෙමි. ඔහුගේ ඒ ඉදිකටු හිසින් ඇතුල්ව මුඛයෙන් නික්මෙයි. මුඛයෙන් ඇතුල්ව පපුවෙන් නික්මෙයි. පපුවෙන් ඇතුල්ව බඩින් නික්මෙයි. බඩින් ඇතුල්ව කළවෙන් නික්මෙයි. කළවෙන් ඇතුල්ව කෙණ්ඩයෙන් නික්මෙයි. කෙණ්ඩයෙන්

ඇතුල්ව පතුලෙන් නික්මෙයි. ඒ සුචිලෝම ප්‍රේතයා බැගෑපත්ව හඬ නගයි. ඇවැත්නි ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි, මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය.' කියායි." ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක.

4. "මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නො අදහන්නාහුය. යම් අය මා නො අදහන්නාහු නම් එය ඔවුන් හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

5. "මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම සූචකයෙක් (කේලාම් කියන්නෙක්) විය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්ම භාවයක් ලැබීම විඳිනු ලැබේයයි" වදාළසේක.

**(නවවෙනි සිබ්බියති සූත්‍රය නිමි.)**

---

## 10. අණ්ඩභාරී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති

ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරුගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන්හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬුපිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබ වහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?

3. "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේද රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක වැඩ හුන්නාහුය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. 'ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ, මම අහසින් ගමන් කරන්නාවූ, කුම්භණ්ඩ (කලයක් පමණ අණ්ඩය ඇති) ප්‍රේතයෙකු දැක්කෙමි. හෙතෙම යන කල්හිත් ඒ අණ්ඩය කරෙහි

තබාගෙනම යෙයි. හිඳින්නේත් ඒ අණ්ඩයෙහිම හිඳියි. යක්ෂ ගිජුලිහිණියෝද, යක්ෂ කවුඩෝද, යක්ෂ උකුස්සෝද එළව, එළවා ඒ මොහුගේ (කලයක් පමණ අණ්ඩය) උදුරා දමති. විනාශ කෙරෙති. ඒ කුම්භණ්ඩ ප්‍රේතයා බැගෑපත් හඬ නඟයි.”

5. “ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. ‘පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය’ කියායි.” ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක. “මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති.”

6 “මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නො අදහන්නාහුය. යම් අය මා නො අදහන්නාහු නම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

7. “මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම ගාමකූටයෙක් (කූට විනිශ්චයකාරයෙක්) විය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක් බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලැබෙයයි” වදාළසේක.

**(දසවෙනි අණ්ඩභාරී සූත්‍රය නිමි.)**

---

(අට්ඨී, පේසි යන ප්‍රේතයන් දෙදෙන ගෝඝාතකයෝ වූහ. මංස පිණ්ඩ (මස් පිඩු) ප්‍රේතයා සාකුණිකයෙක් (පක්ෂීන් මරා

ජීවත් වන්නෙක්) විය. නිච්ඡවි (සම නැති) ප්‍රේතයා එළුවන් මරා ජීවත් වන්නෙක් විය. අසිලෝම ප්‍රේතයා සූකරිකයෙක් (හූරන් මරා ජීවත් වන්නෙක්) විය. සත්ති ලෝම ප්‍රේතයා (මුවන් මරා ජීවත් වන්නෙක්) විය. උසුලෝම ප්‍රේතයා (රාජාපරාධකාරයන් විද මරන්නෙක්) විය. සූචිලෝම ප්‍රේතයා (අසුන් හික්මවන්නෙක්) විය. සූචිලෝම නම් යම් ප්‍රේතයෙකු වසනු ලැබේද හේ කේලාම් කියන්නෙක් විය. අණ්ඩභාරී ප්‍රේතයා කූට (හොර) විනිශ්චයකාරයෙක් විය. සිබ්බියති යයි කියා මේ වර්ගයෙහි සූත්‍ර දශයෙකි)

**පළමුවෙනි වර්ගය නිමි.**

---

## 2. වර්ගය.

### 1. කූප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම්ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසයකරනසේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙමේද, ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම, පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් හට මෙය කීයේය. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬුපිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය.

2. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී, සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම

ආයුෂ්මත් මහාමොග්ගල්ලාන තෙරුන් හට මෙය කීයේය. "ආයුෂ්මත් මොග්ගගල්ලානයෙනි, (ඔබවහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?" "ඇවැත්, ලක්ඛණය, මේ ප්‍රශ්නයට (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි' කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙමේද රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින්පසු (සවස) පිණ්ඩපාතයෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි වැඩියාහුය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නාහුය, එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙසේ කීයේය. "ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්වහන්සේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඇවැත් මොග්ගල්ලානයෙනි, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත්නි, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම අසූචි වලක හිස සහිතව ගිලුනාවූ, පුරුෂයෙකු (ප්‍රේතයෙකු) දැක්කෙමි. ඒ ගූථ ප්‍රේතයා බැගෑපත් හඬ නගයි. ඇවැත්නි ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. 'පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද මෙබඳුවූ ආත්ම භාවයක් ලැබීමකුදු වන්නේද,' කියායි." ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක.

4. "මහණෙනි, යම්හෙයකින් වනාහි ශ්‍රාවකයෙක් තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේවේද, ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ, ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥානය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ

මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහුනම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය. මහණෙනි, මේ සත්වතෙම මේ රජගහ නුවරම අන් අඹුවන් කරා යන්නෙක් විය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳින්නේයයි" වදාළසේක.

**(පළමුවෙනි කූප සූත්‍රය නිමි.)**

---

## 2. ගූථඛාදී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසයකරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාසිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන්හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් හට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබවහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රත්‍යය කවරේද?” “ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි” කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙමේද රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු, භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක වැඩහුන්නාහුය. එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. “ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ, එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?”

3. “ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම අසූචි වලක ගිලුනාවූ, දැතින් අසූචි කන්නාවූ, පුරුෂයෙකු (ප්‍රේතයෙකු) දැක්කෙමි. ඒ ගූථප්‍රේතයා බැගෑපත් හඬ නඟයි. ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. ‘පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය’ කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක.”

4. “මහණෙනි, යම්හෙයකින් වනාහි ශ්‍රාවකයෙක් තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂාත් හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ, ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහු නම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

5. "මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම දුෂ්ට බ්‍රාහ්මණයෙක් විය. හෙතෙම කස්සප සම්මාසම්බුදුන්ගේ සාසනයෙහිදී, භික්ෂුසංඝයාහට බතින් නිමන්ත්‍රණය කොට, ඔරු අසූචියෙන් පුරවා, කාලය දන්වා, මෙය කීයේය. 'පින්වත්නි, මෙයින් ඇතිතාක් වැළඳීමද, ගෙනයාමද, කෙරෙත්වායි' කියායි. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලැබේයයි" වදාළසේක.

**(දෙවෙනි ගූථඛාදී සූත්‍රය නිමි.)**

---

## 3. නිච්ඡවිත්ථී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර, සිවුරුගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන්හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි.

"ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය.

ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම "ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් හට මෙය කීයේය.

ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබවහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

"ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය.

3. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙමේද රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු, භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක වැඩහුන්නාහුය. එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම සිවිය නැති ස්ත්‍රියක (ප්‍රෙතියක) දැක්කෙමි. යක්ෂ ගිජුලිහිණියෝද, යක්ෂ කවුඩෝද, යක්ෂ උකුස්සෝද එළව, එළවා ඒ ඇගේ මස් උදුරා දමති. විනාශකරති. ඈ බැගෑපත් හඬ නැගුවාය.

"ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්ම භාවයක් ලැබීමකුදු වන්නේය කියායි.' ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් හට කථාකළ සේක."

5. "මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂාත් හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති.

"මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නො අදහන්නාහුය. යම් අය මා නො අදහන්නාහු නම් එය ඔවුන් හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

**6.** "මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම ඈ පර පුරුෂ සේවනය කරන්නියක් වූවාය. ඈ ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක් බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්ම භාවයක් ලැබීම විඳිනු ලැබේයයි" වදාළසේක.

**(තුන්වෙනි නිච්ඡවිත්ථි සූත්‍රය නිමි.)**

---

## 4. මංකුළිත්ථි සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරතෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර, සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් හට මෙය කීයේය.

**2.** "ඇවැත් ලක්ඛණය, යමු. රජගහ නුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබ වහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයේදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේද, රජගහ නුවර පිඬු පිණිස හැසිර, බතින් පසු, (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුණාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක වැඩ හුන්නාහුය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය.

4. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?

5. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම අහසින් ගමන්කරන්නාවූ, දුගඳවූ, පිළිකුල් කටයුතුවූ, ස්ත්‍රියක (ප්‍රේතියක) දැක්කෙමි." යක්ෂ ගිජුලිහිණියෝද, යක්ෂ කවුඩෝද, යක්ෂ උකුස්සෝද, එළව, එළවා ඒ ඇගේ මස් උදුරාදමති, විනාශ කෙරෙති. ඇය බැගෑපත්ව හඬ නගයි."

6. "ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්ම භාවයක් ලැබීමකුදු වන්නේය' කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් හට කථාකළ සේක.

7. "මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂාත් හෝ කරන්නේද ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ, ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥානය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ ස්ත්‍රිය මුලදීම මා විසින් දක්නාලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නො අදහන්නාහුය. යම් අය මා නො අදහන්නාහු නම් එය ඔවුන් හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

8. "මහණෙනි, මේ ස්ත්‍රිය මේ රජගහ නුවරම නිමිති (පේන) කියන්නියක් වූවාය. ඈය ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්ම භාවයක් ලැබීම විඳිනු ලබන්නීයයි" වදාළ සේක.

**(සතරවෙනි මඞ්කුළිත්ථී සූත්‍රය නිමි.)**

---

## 5. ඕකිලිනී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එ සමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙමේද, ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන් හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬුපිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත්

ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, ඔබ වහන්සේ සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේද, රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ, මම අහසින් ගමන් කරන්නාවූ, උණුසුමින් පැසුනාවූ, කුණුවූ ඩහදිය ගලන්නාවූ ස්ත්‍රියක (ප්‍රේතියක) දැක්කෙමි. ඇය බැගෑපත් හඬ නැගුවාය. 'ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය' 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්යයියෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි.' මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය, කියායි." ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක.

5. "මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ ස්ත්‍රිය මුලදීම මා විසින් දක්නා ලද්දේවිය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නො අදහන්නාහුය. යම් අය මා නො අදහන්නාහු නම් එය ඔවුන් හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

6. "මහණෙනි, මේ ස්ත්‍රිය කළිඟු රජුගේ අගමෙහෙසිය වූවාය. ඕ ඊර්ෂ්‍යාවෙන් සතුරු ස්ත්‍රියකට අඟුරුකබලෙන් (ගැසීය.) ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලබන්නියයි" වදාළසේක.

**(පස්වෙනි ඕකිළිනි සූත්‍රය නිමි.)**

---

## 6. සීසච්ඡින්න සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එ සමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර, සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණස්ථවිරයන්හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහ නුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබ වහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙමේද, රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක වැඩ හුන්නාහුය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ, මම අහසින් ගමන් කරන්නාවූ, හිස නැත්තාවූ ශරීරයක් (ප්‍රේතයෙක්) දැක්කෙමි. ඔහුගේ ඇස් සහ කටද පපුවෙහි වෙති. යක්ෂ ගිජුලිහිණියෝද යක්ෂ කවුඩෝද යක්ෂ උකුස්සෝද එළව එළවා ඒ මොහුගේ හිස නැත්තාවූ ශරීරය උදුරා දමති. විනාශ කරති. හෙතෙම බැගෑපත් හඬ නගයි. ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත

ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය' කියායි." ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක.

5. "මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ, ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නාලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහු නම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය."

6. "මහණෙනි, මේ සත්වතෙම මේ රජගහනුවරම භාරිත නම් චෝරඝාතකයෙක් විය. හෙතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලැබේයයි" වදාළසේක."

**(හයවෙනි සීසච්ඡින්න සූත්‍රය නිමි.)**

---

## 7. භික්ඛු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙමේද ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම, පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම

යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණස්ථවිරයන් හට මෙය කීයේය. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬුපිණිස පිවිසෙමුයයි" කියායි "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය.

2. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී, සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර හට මෙය කීයේය. "ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබ වහන්සේ) සිනා පහළකිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?" "ඇවැත්, ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි." කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙමේද රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක වැඩ හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම, ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම අහසින් ගමන් කරන්නාවූ මහණ ප්‍රේතයෙකු දැක්කෙමි. ඒ මහණහුගේ දෙපොට සිවුරද ගින්නෙන් ඇවිළුණේය. දිලිසුනේය, දැල්වුනේය, පාත්‍රයද ගින්නෙන් ඇවිළුණේය. දිළිසුනේය, දැල්වුනේය, පටියද ඇවිලුනේය, දිලිසුනේය, දැල්වුනේය, කයද ඇවිලුනේය දිළිසුනේය. දැල්වුනේය. හෙතෙම බැගෑපත් හඬ නගයි."

'ඇවැත ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ, අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය' කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථා කළ සේක.

4. "මහණෙනි, යම්හෙයකින් වනාහි ශ්‍රාවකයෙක් තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ, ශ්‍රාවකයෝ වාසය කෙරෙයි. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සත්වතෙම මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙම්. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහු නම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

5. "මහණෙනි, මේ මහණතෙම කස්සප සම්මාසම්බුදුන්ගේ ශාසනයෙහි පාප භික්ෂුවක් විය. ඒ මහණතෙම ඒ කර්මයාගේම විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක් බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේ ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලැබේයයි" වදාළසේක.

**(සත්වෙනි භික්ඛු සූත්‍රය නිමි.)**

---

## 8. භික්ඛුණී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දකනිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිර තෙමේද, ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති

ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන්හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු රජගහනුවරට පිඬුපිණිස පිවිසෙමුයයි කියායි. ඇවැත, එසේයයි කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබවහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?'

3. "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේද, රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු. භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක වැඩහුන්නාහුය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ, එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කෙළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම, අහසින් ගමන් කරන්නාවූ මෙහෙණ (ප්‍රේතියක්) දැක්කෙමි. ඒ මෙහෙණිගේ දෙපොට සිවුරද ඇවිළුණේය දිළිසුණේය, දැල්

වුණේය. පාත්‍රයද ඇවිළුණේය, දිළිසුණේය, දැල්වුණේය, පටියද ඇවිළුණේය, දිළිසුණේය, දැල්වුණේය කයද ඇවිළුණේය, දිළිසුණේය, දැල්වුණේය. ඈ බැගෑපත් හඬ නැගුවාය. ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. ‘පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය’ කියායි.”

5. “ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථාකළසේක. මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක් තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ මෙහෙණිය මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහු නම් එය ඔවුන් හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.”

6. “මහණෙනි, ඇය කස්සප සම්මා සම්බුදුන්ගේ ශාසනයෙහි පාප භික්ෂූණියක් වූවාය. ඕතොමෝ ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලබන්නීයයි” වදාළසේක.

**(අටවෙනි භික්ඛුණී සූත්‍රය නිමි.)**

---

## 9. සික්ඛමානා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් ලත් වේළුවනයෙහි

(හුණුවනයෙහි) වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙමේද, ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍රසිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම්තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන්හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. 'ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, ඔබවහන්සේ සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේද, රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුණාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක වැඩහුන්නාහුය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ, එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කෙළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම, අහසින් ගමන් කරන්නාවූ සික්ඛමානා (ප්‍රේතියක්) දැක්කෙමි. ඒ සික්ඛමානාවගේ දෙපොට සිවුරද ඇවිළුණේය, දිළිසුණේය, දැල්වුණේය, පාත්‍රයද ඇවිළුණේය, දිළිසුණේය දැල්වුණේය. පටියද ඇවිළුණේය, දිළිසුණේය දැල්වුණේය. කයද ඇවිළුණේය, දිළිසුණේය, දැල්වුණේය. ඒ සික්ඛමානාව බැගෑපත් හඬ නැගුවාය. ඇවත ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ, අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳු ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය.'

5. ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකළ සේක. මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක් තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඕ තොමෝ මුලදීම මා විසින් දක්නාලද්දේවිය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහු නම්, එය ඔවුන් හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

"මහණෙනි, ඕතොමෝ කස්සප සම්මා සම්බුදුන්ගේ ශාසනයෙහි පාප සික්ඛමානාවක් වූවාය. ඕතොමෝ ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලබන්නීයයි" වදාළසේක.

**(නවවෙනි සික්ඛමානා සූත්‍රය නිමි.)**

---

## 10. සාමණේර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙමේද, ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම යම් තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන්හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු. රජගහනුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබවහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේද, රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පහු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුණාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක වැඩහුන්නාහුය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිර තෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ, එක්තරා ප්‍රදේශයකදී

සිනා පහළ කෙළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම, අහසින් ගමන් කරන්නාවූ සාමණේර (ප්‍රේතයෙකු) දැක්කෙමි. ඔහුගේ දෙපොට සිවුරද ඇවිළුණේය, දිළිසුණේය, දැල්වුණේය. පාත්‍රයද ඇවිළුණේය, දිළිසුණේය, දැල්වුණේය. පටියද ඇවිළුණේය, දැල්වුණේය. කයද ඇවිළුණේය, දැල්වුණේය. හෙතෙම බැගෑපත් හඬ නගයි. ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍යයයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්මභාවයක් ලැබීමකුදු වන්නේය' කියායි."

5. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්හට කථාකළ සේක. "මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක් තෙම මෙසේ දනියිද, මෙසේ දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සාමණේරතෙම මුලදීම මාවිසින් දක්නාලද්දේ විය. එහෙත් මම එය ප්‍රකාශ නොකෙළෙමි. ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නොඅදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහු නම් එය ඔවුන් හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස වන්නේය.

"මහණෙනි, මේ සාමණේරතෙම කස්සප සම්මා සම්බුදුන්ගේ ශාසනයෙහි පාප සාමණේරයෙක් විය. ඒ සාමණේරතෙම ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන් (විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්මභාවයක් ලැබීම විඳිනු ලැබේයයි" වදාළසේක.

**(දසවෙනි සාමණේර සූත්‍රය නිමි.)**

---

## 11. සාමණේරී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරතෙමේද, ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කෙරෙති. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම පෙරවරු (උදේ) කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැන්හි වැඩියේය. වැඩ, ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන්හට මෙය කීයේය.

2. "ඇවැත් ලක්ඛණය, යමු රජගහනුවරට පිඬු පිණිස පිවිසෙමුයයි" කියායි. "ඇවැත, එසේයයි" කියා ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට පිළිතුරු දුන්නේය. ඉක්බිති ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. "ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, (ඔබවහන්සේ) සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

3. "ඇවැත් ලක්ඛණය, මේ ප්‍රශ්නයට වනාහි (දැන්) සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිදී මේ ප්‍රශ්නය මාගෙන් අසවයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරයන්තෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙමේද, රජගහනුවර පිඬු පිණිස හැසිර, බතින් පසු (සවස) පිණ්ඩපාතයේ යාමෙන් වැළකුනාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි වැඩියෝය. වැඩ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නාහුය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් ලක්ඛණ ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්වහන්සේට මෙය කීයේය.

"ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නේ එක්තරා ප්‍රදේශයකදී සිනා පහළ කළේය. ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස, සිනා පහළ කිරීමට හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?"

4. "ඇවැත, ගිජ්ඣකූට පර්වතයෙන් බසින්නාවූ මම අහසින් ගමන් කරන්නාවූ, සාමණේරී ප්‍රේතියක් දැක්කෙමි. ඇයගේ දෙපොට සිවුරද ඇවිළුණේය, දිළිසුණේය, දැල්වුණේය, පාත්‍රයද ඇවිළුණේය, දිළිසුණේය, දැල්වුණේය, පටියද ඇවිළුණේය, දිළිසුණේය, දැල්වුණේය, කයද ඇවිළුණේය, දිළිසුණේය. දැල්වුණේය. ඕතොමෝ බැගෑපත් හඬ නැගුවාය. ඇවැත, ඒ මට මේ අදහස ඇතිවිය. 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍යයෙකි. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මෙබඳුවූ සත්වයෙකුත් වන්නේද, මෙබඳුවූ අමනුෂ්‍යයෙකුත් වන්නේද, මෙබඳුවූ ආත්ම භාවයක් ලැබීමකුදු වන්නේය' කියායි." ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකළ සේක.

5. "මහණෙනි, යම් හෙයකින් වනාහි ශ්‍රාවකයෙක්තෙම මෙසේ දනියිද, දකියිද, මෙසේ සාක්ෂ්‍ය හෝ කරන්නේ ඒකාන්තයෙන් (එවැනි) ඇස් ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒකාන්තයෙන් (එවැනි) ඥාණය ඇතිවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මහණෙනි, ඒ සාමණේරිය මුලදීම මා විසින් දක්නා ලද්දේ විය. එහෙත් මම ප්‍රකාශ නොකෙළෙමි ඉදින් මම එය ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මා නො අදහන්නාහුය. යම් අය මා නොඅදහන්නාහු නම් එය ඔවුන්හට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස දුක් පිණිස වන්නේය."

6. "මහණෙනි, ඕතොමෝ කස්සප සම්මා සම්බුදුන්ගේ ශාසනයෙහි පාප සාමණේරියක් වූවාය. ඕතොමෝ ඒ කර්මයාගේ විපාකයෙන් වර්ෂ බොහෝ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ ලක්ෂ ගණනක් නිරයෙහි පැසී, ඒ කර්මයාගේම ඉතිරිවූ විපාකයෙන්

(විපාකාවශෙෂයෙන්) මෙවැනි ආත්ම භාවයක් ලැබීම විඳිනු ලබන්නීයයි” වදාළසේක.

(එකොළොස්වෙනි සාමණෙරී සූත්‍රය නිමි.)

---

(දෙවෙනි වර්ගය නිමි.)

---

(අසූචි වලෙහි ගිලුනාවූ ඒ ප්‍රේතතෙම වනාහි අන් අඹුවන් කරා යන්නෙක් විය. එසේම ගූථඛාදී ප්‍රේතතෙම දුෂ්ඨ බ්‍රාහ්මණයෙක් විය. සිවිය නැති ස්ත්‍රිය (ප්‍රේතිය) අතිචාරිණියක් (සිය සැමියා ඉක්මවා හැසිරෙන්නියක්) වූවාය. පිළිකුල් කටයුතුවූ ස්ත්‍රිය පේන කියන්නියක් වූවාය. ඩහදිය වැගිරෙන්නාවූ ස්ත්‍රිය අන් ස්ත්‍රියකට අඟුරු කබලෙන් ගැසුවාය. කවන්ධ ප්‍රේතතෙම චෝරඝාතකයෙක් විය. භික්ඛු, භික්ඛුණී, සික්ඛමානා, සාමණේර, සාමණේරී, ප්‍රේත, ප්‍රේතියෝ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි මහණව ඒ කාලයෙහි පව්කම් කළාහුය.)

(ලක්ඛණ සංයුත්තය නිමි.)

---

# 8. ඕපම්ම සංයුත්තය.

## 1. කූට සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූහ. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, යම්සේ වනාහි කූටාගාරයක (කුළුගෙයක) යම්කිසි ගොනැසි (පරාල) වෙත්ද, ඒ සියල්ල මුදුනට ගමන්

කළාහු, මුදුන හා එක්වූවාහු වෙත්ද, මුදුන බිඳීයාමෙන් ඒ සියල්ල විනාශයට යෙත්ද, මහණෙනි, එසේම වනාහි යම්කිසි අකුශල මූලයෝ වෙත්ද, ඒ සියල්ලම අවිද්‍යාවට ගමන් කරන්නාහු, අවිද්‍යාවට එක්වන්නාහු, අවිද්‍යාවට සම්බන්ධ වන්නාහු වෙත්. අවිද්‍යාව නැසීම හේතුකොටගෙන ඒ සියල්ලද විනාශයට යෙත්. මහණෙනි, එහෙයින් මෙහිදී තොප විසින් මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) 'අප්‍රමාදව වාසය කරමු' කියායි. මහණෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි."

(පළමුවෙනි කූට සූත්‍රය නිමි.)

---

## 2. නඛ සිඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ නියපිට පස් ස්වල්පයක් තබාගෙන භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, ඒ කුමැයි සිතන්නහුද? මා විසින් යම් මේ නියපිට තබනලද පස් ස්වල්පයද, මේ මහපොළොවද යන දෙකින් කුමක් වනාහි වඩා ලොකු වෙයිද?" "ස්වාමීනි, යම් මේ මහපොළොවක්වේද, එයම වඩා ලොකුවෙයි. භාග්‍යවතුන්වහන්සේ විසින් නියපිටට ගන්නාලද මේ පස් ස්වල්පය ඉතා සුළුය. භාග්‍යවතුන්වහන්සේ විසින් නියපිටට ගන්නාලද පස් ස්වල්පය මහපොළොව හා සසඳා බලන කල්හි සියයෙන් කොටසකටද නොපැමිණෙයි. දහසින් කොටසකටද නොපැමිණෙයි."

3. "මහණෙනි, එසේම වනාහි (මිනිසත් බැවින් චුතව) මිනිසුන් කෙරෙහි නැවත උපදින යම් සත්වයෝ වෙත්ද, ඔවුහු ස්වල්ප වෙත්. එහෙත් මිනිස් ලොවින් අන්‍යවූ සතර අපායයෙහි නැවත උපදින යම් සත්වයෝ වෙත්ද, ඔවුහුම ඉතා අධික වෙති. මහණෙනි, එනිසා මෙහිදී මෙසේ හික්මිය යුතුයි (කෙසේද?)

'අප්‍රමාදව වාසය කරමු' කියායි. මහණෙනි; තොප මෙසේ වනාහි හික්මිය යුතුයි."

(දෙවෙනි නඛ සිඛ සූත්‍රය නිමි.)

---

## 3. කුල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම්සේ වනාහි බොහෝ ස්ත්‍රීන් ඇත්තාවූ, ස්වල්ප පුරුෂයන් ඇත්තාවූ, යම්කිසි කුලයෝ වෙත්ද, ඒ කුලයෝ කුම්භත්ථේනක (කළයක පහන් දල්වාගෙන ගොස් සොරකම් කරන) සොරුන් විසින් පහසුවෙන් පෙළිය හැක්කාහු වෙති. මහණෙනි, එසේම වනාහි යම්කිසි භික්ෂුවක් විසින් මෛත්‍රී භාවනා සමාධිය නොවඩන ලද්දේ, නැවත නැවත භාවිතා නොකරන ලද්දේ වේද, ඒ මහණතෙම අමනුෂ්‍යයන් විසින් පහසුවෙන් පෙළිය හැක්කේ වෙයි.

3. "මහණෙනි, යම්සේ වනාහි ස්වල්ප ස්ත්‍රීන් ඇත්තාවූ, බොහෝ පුරුෂයන් ඇත්තාවූ, යම්කිසි කුලයෝ වෙත්ද, ඒ කුලයෝ කුම්භත්ථේනක සොරුන් විසින් පහසුවෙන් නොපෙළිය හැක්කාහු වෙති. මහණෙනි, එසේම වනාහි යම්කිසි භික්ෂුවක් විසින් මෛත්‍රී භාවනා සමාධිය වඩන ලද්දේ, නැවත නැවත භාවිතා කරන ලද්දේ වේද, ඒ මහණතෙම අමනුෂ්‍යයන් විසින් පහසුවෙන් නොපෙළිය හැක්කේ වෙයි. මහණෙනි, එනිසා මෙහිදී, මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) 'අප විසින් මෛත්‍රී භාවනා සමාධිය වඩන ලද්දේ, නැවත නැවත භාවිතා කරන

ලද්දේ, යානාවක් මෙන් කරන ලද්දේ, වස්තුවක් මෙන් කරන ලද්දේ, එළඹ සිටින ලද්දේ, පුරුදු කරන ලද්දේ, මනාකොට පටන්ගන්නා ලද්දේ වන්නේය.' කියායි. මහණෙනි, තොප මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(තුන්වෙනි කුල සූත්‍රය නිමි.)**

---

## 4. ඔක්ඛා සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**2.** "මහණෙනි, යමෙක් පෙරවරු (උදේ) කාලයෙහි (ප්‍රණීත භෝජනයන්ගෙන් පිරවූ) මහා සැළි සියයක් දන් දෙන්නේ වේද, යමෙක් මැදියම් කාලයෙහි (ප්‍රණීත භෝජනයන් ගෙන් පිරවූ) මහ සැළි සියයක් දන් දෙන්නේ වේද, යමෙක් සවස් කාලයෙහි (ප්‍රණීත භෝජනයන්ගෙන් පිරවූ) මහ සැළි සියයක් දන්දෙන්නේ වේද, යමෙක් පෙරවරු (උදේ) කාලයෙහි යටත්පිරිසෙයින් දෙනගේ තනයෙන් කිරි පීරක් දොවින පමණ කාලයකුදු 'මෙත් සිත' වඩන්නේ වේද, යමෙක් මැදියම් කාලයෙහි යටත්පිරිසෙයින් දෙනගෙන් කිරි පීරක් දොවින පමණ කාලයකුදු 'මෙත්සිත' වඩන්නේ හෝ වේද, යමෙක් සවස් කාලයෙහි යටත් පිරිසෙයින් දෙනගෙන් කිරි පීරක් දොවින පමණ කාලයකුදු 'මෙත්සිත' වඩන්නේ හෝ වේද, මෙය මුලින් කී දානයට වඩා මහත්ඵල ඇත්තේ වෙයි. මහණෙනි, එනිසා මෙහිදී මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) 'අපගේ මෛත්‍රී සහගත සමාධිය වඩන ලද්දේ, නැවත නැවත භාවිතා කරන ලද්දේ යානාවක් මෙන් කරන ලද්දේ, වස්තුවක් මෙන් කරන ලද්දේ, එළඹ සිටින ලද්දේ, මනාකොට

පටන්ගන්නා ලද්දේ වන්නේය' කියායි. මහණෙනි, තොප මෙසේ වනාහි හික්මිය යුතුයි."

(සතරවෙනි ඔක්ඛා සූත්‍රය නිමි.)

## 5. සත්ති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, යම්සේ වනාහි තියුණු තලයකින් යුක්තවූ ආයුධයක් වේද, ඉක්බිති පුරුෂයෙක් එන්නේය. (අවුත්) 'මම මේ ආයුධය අතින් හෝ මිටින් හෝ අගින් (අල්ලා) දෙකට නමන්නෙමි. මැදින් දෙකට නමන්නෙමි. නැවත දිග හරින්නෙමියි කියයි' නම් මහණෙනි, ඒ කිමැයි සිතන්නහුද? ඒ පුරුෂතෙම මේ තියුණු තලයෙකින් යුක්තවූ ආයුධය අතින් හෝ මිටින් හෝ ගසා, අගින් (අල්ලා) දෙකට නැමීමට හෝ මැදින් දෙකට නැමීමට හෝ නැවත දිගහැරීමට හෝ සුදුසු (හැකි) වන්නේද?"

"ස්වාමීනි, එය නොවේමය."

"ඊට හේතුව කවරේද?"

3. "ස්වාමීනි, මේ ආයුධය වනාහි තියුණු තලයකින් යුක්ත වූයේය. අතින් හෝ මිටින් හෝ ගසා අගින් (ගෙන) දෙකට නැමීමට හෝ මැදින් දෙකට නැමීමට හෝ නැවත දිගහැරීමට හෝ පහසු නොවේ. යම්තාක් (ඒ සඳහා උත්සාහ කරයිද) ඒතාක් ඒ පුරුෂතෙම වෙහෙසීමේ, විපතට පත්වීමේ කොටස්කාරයෙක් වන්නේය."

4. "මහණෙනි, එසේම වනාහි යම්කිසි භික්ෂුවක් විසින් මෛත්‍රී සහගත සමාධිය වඩනලද්දේ, නැවත නැවත භාවිතා කරන ලද්දේ, යානාවක් මෙන් කරන ලද්දේ, වස්තුවක් මෙන් කරන ලද්දේ, එළඹසිටින ලද්දේ, මනාකොට පටන් ගන්නා ලද්දේ වේ. ඉදින් ඒ මහණහුගේ සිත කැලඹීමට යම් අමනුෂ්‍යයෙක් සිතන්නේ නම්, ඉක්බිති ඒ අමනුෂ්‍යයා තෙමේම වෙහෙසීමේ විපතට පත්වීමේ කොටස්කාරයෙක් වන්නේය.'

5. "මහණෙනි, එනිසා මෙහිදී, මෙසේ හික්මිය යුතු යි (කෙසේද?) 'අපගේ මෛත්‍රී සහගත සමාධිය වඩන ලද්දේ, නැවත නැවත භාවිතා කරන ලද්දේ, යානාවක් මෙන් කරන ලද්දේ, වස්තුවක් මෙන් කරන ලද්දේ, එළඹසිටින ලද්දේ, මනාකොට පටන් ගන්නා ලද්දේ වන්නේය' කියායි. මහණෙනි, තොප මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(පස්වෙනි සත්ති සූත්‍රය නිමි.)**

---

## 6. ධනුග්ගහ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම්සේ වනාහි (දස දොළොස් වර්ෂයක්, ආචාර්‍ය්‍ය කුලයෙහි ඉගෙනගන්නාලද ශිල්ප ඇත්තාවූ) බොහෝ කාලයක් මුළුල්ලෙහි පුහුණු කරන ලද්දාවූ, රාජ කුලාදියෙහිදී දක්වනලද ශිල්ප ඇත්තාවූ, (පුරුෂයින් දෙදහසක) ශක්තියෙන් යුක්තවූ, දුනු දරන්නාවූ සතර දෙනෙක් සතර දිසාවෙහි සිටියාහු වෙත්ද, ඉක්බිති පුරුෂයෙක් එන්නේය. (අවුත්)

'ඉගෙණගන්නාලද, ශිල්ප ඇත්තාවූ බොහෝ කාලයක් මුළුල්ලෙහි පුහුණු කරන ලද්දාවූ, රාජ කුලාදියෙහිදී දක්වනලද ශිල්ප ඇත්තාවූ, (පුරුෂයින් දෙදහසක) ශක්තියෙන් යුක්තවූ, දුනු දරන්නාවූ සතර දෙනෙක් සතර දිගින් විදිනලද හී පොළොවෙහි නොපිහිටි කල්හිම අල්ලාගෙන එන්නෙමියි' කියන්නේ නම්, මහණෙනි, කෙසේ සිතන්නහුද? ජව වේගයෙන් යුක්තවූ, ඒ පුරුෂතෙම කෙළ පැමිණි ජවවේගයෙන් යුක්තවූයේයයි කීමට සුදුසු වෙයිද?"

3. "ස්වාමීනි, (දස දොළොස් වර්ෂයක් මුළුල්ලෙහි) ඉගෙන ගන්නාලද ශිල්ප ඇත්තාවූ, බොහෝ කාලයක් මුළුල්ලෙහි පුහුණු කරන ලද්දාවූ, රාජකුලාදියෙහිදී දක්වනලද ශිල්ප ඇත්තාවූ, (පුරුෂයින් දෙදහසක) ශක්තියෙන් යුක්තවූ, දුනු දරන්නාවූ එකකු විසින් විදිනලද හීය පොළොවෙහි නොපිහිටි කල්හි අල්ලාගෙන එන්නේ නම්, ජවවේගයෙන් යුක්තවූ ඒ පුරුෂ තෙමේය කෙළපැමිණි ජවවේගයෙන් යුක්තවූයේයයි කීමට සුදුසුය. (දස දොළොස් වර්ෂයක් මුළුල්ලෙහි) ඉගෙන ගන්නාලද ශිල්ප ඇත්තාවූ, බොහෝ කාලයක් මුළුල්ලෙහි පුහුණු කරන ලද්දාවූ, රාජකුලාදියෙහිදී දක්වනලද ශිල්ප ඇත්තාවූ, (පුරුෂයින් දෙදහසක) ශක්තියෙන් යුක්තවූ දුනු දරන්නාවූ, සතරදෙනෙකු විසින් විදිනලද හී අල්ලාගෙන එන්නේනම් ඔහුගේ ජවවේගය ගැන කියනුම කවරේද?"

4. "මහණෙනි, ඒ පුරුෂයාගේ ජවය (වේගය) යම්සේද, ඊට වඩා චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ ජවය (වේගය) අතිශයින් ශීඝ්‍රය. මහණෙනි, ඒ පුරුෂයාගේ ජවය යම්සේද, චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ ජවය යම්සේද, ඊට වඩා චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ ඉදිරියෙහි දුවන්නාවූ යම් දෙවියෝ වෙත්ද, ඒ දෙවියන්ගේ ජවය ඉතා සීඝ්‍රය. මහණෙනි, ඒ පුරුෂයාගේ ජවය යම්සේද, චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ ජවය යම්සේද, චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ ඉදිරියෙහි දුවන්නාවූ, යම් දෙවියෝ වෙත්ද, ඒ දෙවියන්ගේ ජවය යම්සේද, ඊට වඩා සීඝ්‍රව ආයුසංස්කාරයෝ ක්ෂය වෙත්."

"මහණෙනි, එනිසා, මෙහිදී මෙසේ හික්මිය යුතුයි, (කෙසේද?) 'අප්‍රමාදව වාසය කරමු' කියායි. මහණෙනි, තොප මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(හයවෙනි ධනුග්ගහ සූත්‍රය නිමි.)**

---

## 7. ආණි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, පෙර වූ දෙයක් කියමි. (දස භාගයක් අයබදු ගන්නා හෙයින්) 'දසාරහ' නම් ක්ෂත්‍රිය රජදරුවන්ගේ 'ආණක' නම් මිහිඟු බෙරයක් විය. 'දසාරහ' නම් මිහිඟු බෙරය පැළුණු කල්හි අන්‍යවූ ඇණයක් දැමූහ. මහණෙනි, මේ 'ආණක' නම් මිහිඟු බෙරයේ පුරාණ බෙරකඳ අතුරුදහන් විය. ඇණ සමූහයම ඉතිරිවිය යන ඒ කාලය වනාහි වූයේය.

3. "මහණෙනි, එසේම (පාළිවශයෙන්) ගැඹුරුවූ, ගැඹුරු අර්ථ ඇත්තාවූ, ලෝකෝත්තර අර්ථ දක්වන්නාවූ, සත්වැදෑරුම් ශූන්‍යතා ධර්මය ප්‍රකාශකරන්නාවූ, තථාගතයන් වහන්සේ විසින් වදාරන ලද්දාවූ, යම් ඒ සූත්‍රාන්තයෝ වෙත්ද, ඒ සූත්‍රාන්තයන් කියන කල්හි ඇහුම්කන් නොදෙත්. කන් නොනමත්ද, දැනගැනීම පිණිස සිත නොපිහිටුවත්ද, ඒ ධර්මයන් උගතයුතුයයි, පුහුණු කළයුතුයයි, නොසිතත්ද, කිවියන් විසින් කරන ලද්දාවූ, කිවියන් විසින් රචනා කරන ලද්දාවූ, විසිතුරු අකුරු ඇත්තාවූ, විසිතුරු ව්‍යඤ්ජන ඇත්තාවූ, බුද්ධ ශාසනයෙන් පිටස්තරවූ, ඒ ඒ ශ්‍රාවකයන් විසින් කියන ලද්දාවූ, යම් ඒ සූත්‍රාන්තයෝ වෙත්ද, ඒ සූත්‍රාන්තයන් කියන කල්හි ඇහුම්කන් දෙත්ද, කන් නමත්ද,

දැනගැනීම පිණිස සිත පිහිටුවත්ද, ඒ ධර්මයන්ද උගතයුතුයයි පුහුණු කළයුතුයයි සිතත්ද, එවැනි භික්ෂූහු අනාගත කාලයෙහි වන්නාහුය."

4. "මහණෙනි, මෙසේ (පාළිවශයෙන්) ගැඹුරුවූ, ගැඹුරු අර්ථ ඇත්තාවූ, ලෝකෝත්තර අර්ථ දක්වන්නාවූ, සත් වැදෑරුම් ශූන්‍යතා ධර්මය ප්‍රකාශ කරන්නාවූ, තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද්දාවූ, යම් ඒ සූත්‍රාන්තයෝ වෙත්ද, මේ සූත්‍රාන්තයන්ගේ අතුරුදන්වීම වන්නේය. මහණෙනි, එනිසා මෙහිදී මෙසේ හික්මිය යුතුයි. (පාළිවශයෙන්) 'ගැඹුරුවූ ගැඹුරු අර්ථ ඇත්තාවූ, ලෝකෝත්තර අර්ථ දක්වන්නාවූ, සත්වැදෑරුම් ශූන්‍යතා ධර්මය ප්‍රකාශ කරන්නාවූ, තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද්දාවූ, යම් ඒ සූත්‍රාන්තයෝ වෙත්ද, ඒ සූත්‍රාන්තයන් කියන කල්හි ඇහුම්කන් දෙන්නෙමු. කන් නමන්නෙමු. දැනගැනීම පිණිස සිත පිහිටුවන්නෙමු. ඒ ධර්මයන් උගතයුතුයයි පුහුණු කළ යුතුයයි කල්පනා කරන්නෙමුය' කියායි. මහණෙනි, තොප මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(හත්වෙනි ආණි සූත්‍රය නිමි.)**

---

## 8. කලිඞ්ගර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලාමහනුවර මහා වනයෙහිවූ කූටාගාර ශාලාවෙහි වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන්ට කථා කළ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක.

2. "මහණෙනි, දැන් වනාහි ලිච්ඡවි රජදරුවෝ ලීකොට්ටවල හිස තබමින් සහ පා තබමින් අප්‍රමාදව ශිල්ප ඉගෙනීමට සහ ආචාර්‍ය්‍යයන් ඇසුරු කිරීමෙහි අප්‍රමාදව උට්ඨාන වීර්‍ය්‍යයෙන් යුක්තව, වාසය කෙරෙති. මගධ දෙශයෙහිවූ, වේදේහි

පුත්‍රවූ, අජාසත් රජතෙම ඒ ලිච්ඡවීන්ගේ සිදුරක් නොලබන්නේය. අවසරයක් නොලබන්නේය. මහණෙනි, අනාගත කාලයෙහි ලිච්ඡවි රජදරුවෝ සිවිමැළි වූවාහු, මෘදු මොළොක් අත් පා ඇත්තාහු, පුළුන්කොට්ට ආදියෙන් සැදුම්ලත් මෘදු යහනාවන්හි ඉර පායනතුරු සයනය කරන්නාහුය. මගධ දේශයෙහිවූ, වේදේහ පුත්‍රවූ අජාසත් රජතෙම ඒ ලිච්ඡවීන්ගේ සිදුරක් ලබන්නේය. අවසරයක් ලබන්නේය.

3. "මහණෙනි, (දැන්) වර්තමාන කාලයෙහි මහණහු ලීකොට්ටවල හිස තබමින්, පා තබමින් භාවනායෙහි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව වාසය කෙරෙති. පවිටුවූ මාරතෙම ඒ මහණහුන්ගේ සිදුරක් නොලබන්නේය. අවසරයක් නොලබන්නේය. මහණෙනි, අනාගත කාලයෙහි මහණහු සිවිමැළි වූවාහු, මෘදු මොළොක් අත් පා ඇත්තාහු, පුළුන් කොට්ට ආදියෙන් සැදුම්ලත් මෘදු යහනාවන්හි ඉර පායන තෙක් සයනය කරන්නාහුය. පවිටු මාරතෙම ඒ මහණුන්ගේ සිදුරක් ලබන්නේය. අවසරයක් ලබන්නේය.

4. "මහණෙනි, එනිසා මෙහිදී මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) 'ලීකොට්ටවල හිස තබමින්, පා තබමින් භාවනායෙහි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, වාසය කරන්නෙමුයි' කියායි. මහණෙනි, තොප මෙසේ වනාහි හික්මිය යුතුයි."

(අටවෙනි කලිඞ්ගර සූත්‍රය නිමි.)

---

## 9. නාග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරණ සේක.

එකල්හි වනාහි එක්තරා නවක (අලුත මහණවූ) භික්ෂුවක් බොහෝ වේලා කුලයන් කරා පැමිණ වාසය කරයි. ඒ මේ නවක මහණහට සෙසු මහණහු මෙසේ කීවාහුය. "ඇවැත්තෙම, බොහෝ වේලා කුලයන් කරා පැමිණ වාසය නොකරවයි" කියායි. සෙසු මහණහුන් විසින් කියනු ලබන්නාවූ, ඒ නවක මහණතෙම මෙසේ කීයේය. "මේ ස්ථවිර භික්ෂූහුද කුලයන් කරා පැමිණිය යුතුයයි හඟින්නහුය. මම වනාහි කිනම් කාරණයක් නිසා නොපැමිණෙන්නෙම්ද?" කියායි.

2. ඉක්බිති බොහෝ භික්ෂූහු වනාහි භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය.

"ස්වාමීනි, මේ ශාසනයෙහි එක්තරා අලුත් භික්ෂුවක් බොහෝ වේලා කුලයන් කරා පැමිණෙයි. ඒ මොහුට භික්ෂූහු මෙසේ කීවාහුය. 'ආයුෂ්මත්තෙම කුලයන් කරා බොහෝ වේලා නොපැමිණෙව' කියායි. ඒ මහණතෙම භික්ෂූන් විසින් කියනු ලබන්නේ මෙසේ කීයේය. 'මේ ස්ථවිර භික්ෂූහුද කුලයන් කරා පැමිණිය යුතුයයි හඟින්නාහුය. මම වනාහි කිනම් කාරණයක් නිසා නොපැමිණෙම්ද?' කියායි.

3. "මහණෙනි, පෙර වූ දෙයක් කියමි. වන ප්‍රදේශයෙහි මහ විලක් විය. ඇත්තු ඒ මහ විල ආශ්‍රයකොට වාසය කෙරෙති. ඒ ඇත්තු ඒ මහ විලට බැස, සොඬින් නෙලුම් අල සහ මුල් යටින් ගෙන ඉතා පිරිසිදු වන සේ මනාකොට සෝදා, මඩ රහිතව මනාකොට කා, ගිලිති. ඒ ඇතුන්හට ඒ කෑම වර්ණය ඇතිවීම පිණිසද, බලය ඇතිවීම පිණිසද, හේතුවෙයි. ඒ හේතුවෙන් මරණයට හෝ මරණය සමාන දුකකට හෝ නොපැමිණෙත්. මහණෙනි, ඒ මහ ඇතුන් අනුවම හික්මෙන්නාවූ, ළදරුවූ, ඇත්පැටව් වෙත්ද, ඔවුහුද ඒ විලට බැස, සොඬින් නෙලුම් අල සහ මුල් යටින් ගෙන ඉතා පිරිසිදු වෙනසේ මනාකොට නොසෝදා, මඩ සහිතව නොමනා කොට

කා ගිලිත්. ඒ පැටවුන්හට ඒ කෑම වර්ණය ඇතිවීම පිණිසද බලය ඇතිවීම පිණිසද හේතු නොවෙයි. ඒ හේතුවෙන් මරණයට හෝ මරණය සමාන දුකකට හෝ පැමිණෙත්.

4. "මහණෙනි එසේම වනාහි මේ ශාසනයෙහි ස්ථවිර භික්ෂූහු පෙරවරු (උදේ) කාලයෙහි (අඳනය) හැඳ පාත්‍ර සිවුරු ගෙන, ගමකට හෝ නියම්ගමකට හෝ පිඬුපිණිස වඩිත්. ඒ භික්ෂූහු එහිදී දහම් දෙසත්. ඔවුන්හට ගිහියෝ ප්‍රසන්නාකාර කෙරෙත්. (සිව්පස දෙත්.) ඒ භික්ෂූහු ඒ සිව්පස ලාභයෙහි නොඇලුනාහු, මුළා නොවූවාහු, ගැති නොවූවාහු, ආදීනව දකින්නාහු, සසරින් ගැලවෙන නුවණ ඇත්තාහු, පරිභෝග කෙරෙත්. එය ඒ මහණුන්ගේ වර්ණය පිණිසද, බලය පිණිසද හේතුවෙයි. ඒ හේතුවෙන් මරණයට හෝ මරණය සමාන දුකකට හෝ නොපැමිණෙත්.

5. "මහණෙනි, ඒ ස්ථවිර භික්ෂූන් අනුවම හික්මෙන්නාවූ නවක (අලුත්) භික්ෂූහු පෙරවරු (උදේ) කාලයෙහි (අඳනය) හැඳ, පාත්‍ර, සිවුරු ගෙන, ගමකට හෝ නියම්ගමකට හෝ පිඬු පිණිස පිවිසෙත්. ඒ භික්ෂූහු එහිදී දහම් දෙසත්. ඔවුන්හට ගිහියෝ ප්‍රසන්නාකාර කෙරෙත්. (සිව්පස දෙත්) ඒ භික්ෂූහු ඒ සිව්පස ලාභයෙහි ඇලුනාහු, මුළාවූවාහු, ගැතිවූවාහු, ආදීනව නොදක්නාහු, සසරින් ගැලවෙන නුවණ නැත්තාහු, පරිභෝග කෙරෙත්. එය ඒ මහණහුගේ වර්ණය පිණිසද, බලය පිණිසද හේතු නොවෙයි. ඒ හේතුවෙන් මරණයට හෝ මරණය සමාන දුකකට හෝ පැමිණෙත්."

6. "මහණෙනි, එනිසා මෙහිදී මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) 'නොඇලී, මුළානොවී, ගැතිනොවී, ආදීනව (දොස්) දකින්නාහු, සසරින් ගැලවෙන නුවණ ඇත්තාහු, සිව්පස ලාභය පරිභෝග කරන්නෙමුයි' කියායි. මහණෙනි, තොප මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(නවවෙනි නාග සූත්‍රය නිමි.)**

---

# 10. බිළාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් බොහෝ වේලා කුලයන්හි හැසිරීමට පැමිණෙයි. ඒ මොහුට සෙසු භික්ෂූහු මෙසේ කීවාහුය. "ඇවැත්තෙම බොහෝ වේලා කුලයන්හි නොපැමිණෙව" කියායි. සෙසු භික්ෂූන් විසින් කියනු ලබන්නාවූ ඒ මහණතෙම නොසතුටු වෙයි. ඉක්බිති බොහෝ භික්ෂූහු වනාහි භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේට වැඳ, එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

2. "ස්වාමීනි, මේ ශාසනයෙහි එක්තරා අලුත් භික්ෂුවක් බොහෝ වේලා කුලයන් කරා පැමිණෙයි. ඒ මොහුට භික්ෂූහු මෙසේ කීවාහුය. 'ආයුෂ්මත්තෙම කුලයන් කරා බොහෝවේලා නොපැමිණෙව' කියායි. ඒ මහණතෙම භික්ෂූන් විසින් කියනු ලබන්නේ නොසතුටුවෙයි,' කියායි.

3. "මහණෙනි, පෙර වූ දෙයක් කියමි. බළලෙක් ගෙවල් දෙකක් අතරෙහිවූ, (ගමේ කසල සෝදාහරින) කාණුවක් සමීපයෙහිවූ, කුණු ගොඩේ යම් වේලාවක 'මේ 'මුදු' නමැති මීයෙක් ගොදුරු පිණිස යන්නේවේද, එහිදීම ඌ අල්ලාගෙන කන්නෙමියි' 'මුදු' නම් මීයෙකු සොයමින් සිටියේ විය. මහණෙනි, ඉක්බිති ඒ 'මුදු' නම් මීයා ගොදුරු පිණිස ගියේය. ඒ මීයා බළලා අල්ලාගෙන වහා කා ගිල්ලේය. ඒ 'මුදු' නම් මීයා ඒ බළලාගේ බඩවැලද කෑවේය. කුඩා බඩවැලද කෑවේය ඒ බළලා ඒ හේතුකොටගෙන මරණයට හෝ මරණය සමාන දුකකට හෝ පැමිණියේය."

4. "මහණෙනි, මෙසේම වනාහි මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් පෙරවරු කාලයෙහි හැඳ, පාත්‍රසිවුරුගෙන, ගමකට හෝ නියම්ගමකට හෝ නොරක්නා ලද්දාවූ කයින්, නො රක්නා ලද්දාවූ වචනයෙන් නොරක්නා ලද්දාවූ සිතින් එළඹ නොසිටි සිහියෙන් සංවර නොකරනලද්දාවූ ඉන්ද්‍රියයන්ගෙන් යුක්තව පිඬු පිණිස පිවිසෙයිද. ඒ මහණතෙම ඒ ගමෙහිදී හෝ නියම්ගමෙහිදී හෝ නපුරුකොට හඳිනලද හෝ නපුරුකොට පොරවනලද හෝ ස්ත්‍රියක් දකියි. නපුරුකොට අඳිනලද හෝ නපුරුකොට පොරොවනලද හෝ ස්ත්‍රියක් දැක, ඒ මහණහුගේ සිත රාගය කලඹයි. රාගයෙන් කලඹනලද සිතින් යුක්තවූ ඒ මහණතෙම මරණයට හෝ මරණය සමාන දුකකට හෝ පැමිණෙයි.

5. "මහණෙනි, යමෙක් ශික්ෂාව ප්‍රතික්ෂෙපකොට, ගිහි වේද, මේ ගිහිවීම ආය්‍ය්‍ය විනයෙහි වනාහි මරණයයි කියනු ලැබේ. මහණෙනි, යම් ආකාරවූ ඇවතකින් නැගීම පෙනේද, එවැනිවූ යම් මේ එක්තරා කිළිටිවූ ඇවතකට පැමිණේද, මේ පැමිණීම වනාහි මරණය හා සමාන දුකයයි කියනු ලැබේ. මහණෙනි, එනිසා මෙහිදී මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) 'රක්නා ලද්දාවූම කයින්, රක්නාලද වචනයෙන්, රක්නාලද සිතින්, එළඹසිටි සිහියෙන්, සංවර කරනලද ඉන්ද්‍රියයන්ගෙන් යුක්තව ගමට හෝ නියම්ගමට හෝ පිඬු පිණිස පිවිසෙන්නෙමුය' කියායි. තොප මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(දසවෙනි බිළාර සූත්‍රය නිමි.)**

---

## 11. සිගාල සූත්‍රය 1.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන් ඇමතූහ.

'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, තෙපි රෑ එළිවෙන ජාමෙහි හඬන්නාවූ ජර සිගාලයෙකුගේ (නරියෙකුගේ හඬක්) ඇසුවාහුද?" "ස්වාමීනි, එසේය." "මහණෙනි, මේ ජරසිගාලතෙම 'උක්කණ්ණ' නම් රෝග විශෙෂයෙන් ස්පර්ශකරන ලද්දේය. ඒ ජරසිගාලතෙම යම් යම් තැනක යන්න කැමති වෙයිද, ඒ ඒ තැනට යෙයි. යම් යම් තැනක සිටිනු කැමැති වෙයිද, ඒ ඒ තැන සිටියි. යම් යම් තැනක හිඳිනු කැමැති වෙයිද, ඒ ඒතැන හිඳියි. යම් යම් තැනක නිදනු කැමති වෙයිද, ඒ ඒ තැන හොවියි. සිහිල් වාතයද උඟ වෙත හමයි. මහණෙනි, මේ ශාසනයෙහි ශාක්‍ය පුත්‍රභාවය ප්‍රතිඥා කරන්නාවූ, ඇතැම් මහණෙක්තෙම මෙවැනි ආත්මභාවයක් ලබන්නේ නම් යහපත් වන්නේය. මහණෙනි, එනිසා මෙහිදී මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) 'අප්‍රමාදව වාසය කරමු' කියායි. මහණෙනි, තොප මෙසේ වනාහි හික්මිය යුතුයි."

**(එකොළොස් වෙනි සිගාල සූත්‍රය නිමි.)**

---

## 12. සිගාල සූත්‍රය 2.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, තෙපි රෑ එළිවෙන යාමෙහි හඬන්නාවූ, ජරසිගාලයෙකුගේ (නරියෙකුගේ) හඬක් ඇසුවහුද?" "ස්වාමීනි, එසේය."

"මහණෙනි, ඒ ජරසිගාලයා කෙරෙහි වනාහි යම්කිසි කෘතඥතාවයක්, කෙළෙහිගුණ දැනීමක් වන්නේය. මේ ශාසනයෙහි ශාක්‍ය පුත්‍රභාවය ප්‍රතිඥා කරන්නාවූ, ඇතැම් මහණෙකු කෙරෙහි කිසියම් කෘතඥතාවයක්, කෙළෙහිගුණ සැලකීමක් නොවන්නේමය."

"මහණෙනි, එනිසා මෙහිදී මෙසේ හික්මිය යුතුයි. (කෙසේද?) 'අප කෙරෙහි කළ සුළු දෙය පවා නොනසින්නේ යයි කෘතඥයෝ, කෙළෙහිගුණ සලකන්නෝ වන්නෙමුයි කියායි. මහණෙනි, තොප මෙසේ වනාහි හික්මිය යුතුයි."

(දොළොස් වෙනි සිගාල සූත්‍රය නිමි.)

---

(කූට සූත්‍රය, නඛ සිඛ සූත්‍රය, කුල සූත්‍රය, ඔක්ඛා සූත්‍රය, සත්ති සූත්‍රය, ධනුග්ගහ සූත්‍රය, ආණි සූත්‍රය, කලිඞ්ගර සූත්‍රය, නාග සූත්‍රය, බිළාර සූත්‍රය සහ සිගාල සූත්‍ර දෙකදැයි මේ ඕපම්ම සංයුත්තයෙහි සූත්‍ර දොළොසකි.)

(ඕපම්ම (උපමා) සංයුත්තය නිමි.)

---

# 9. භික්ඛු සංයුත්තය.

## 1. කෝලිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී වනාහි ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙමේ 'ඇවැත් මහණෙනි'යි කියා භික්ෂූන්ට කථා කළේය. 'ඇවැත්නියි' කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන්ට උත්තර දුන්හ. ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරතෙමේ මෙය කීයේය.

2. "ඇවැත්නි, මෙහි රහසිගතව විවේකව සිටි මට මෙවැනි කල්පනාවක් පහළවිය. (එනම්:-) 'ආයුෂ්මතුන්ගේ තුෂ්ණීම්භාවය, ආයුෂ්මතුන්ගේ තුෂ්ණීම්භාවයයි කියනු ලැබේ. ආයුෂ්මතුන්ගේ තුෂ්ණීම්භාවය වනාහි කවරක්ද?' කියායි. ඇවැත්නි, ඒ මට මෙසේ අදහස්විය. 'මේ ශාසනයෙහි මහණතෙම විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් සිතේ පැහැදීම ඇතිකරන්නාවූ, සිතේ එකඟ බව ඇතිකරන්නාවූ, විතර්ක රහිතවූ, විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනිවූ ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, මෙය ආයුෂ්මතුන්ගේ තුෂ්ණීම්භාවයයි' කියනු ලැබේ."

3. "ඇවැත්නි, ඒ මම වනාහි විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් සිතේ පැහැදීම ඇති කරන්නාවූ, සිතේ එකඟ බව ඇති කරන්නාවූ, විතර්ක රහිතවූ, විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනිවූ ධ්‍යානයට පැමිණ, වාසය කෙරෙමි. ඇවැත්නි, මේ ද්විතීයද්ධ්‍යාන විහරණයෙන් යුක්තව වාසය කරන්නාවූ, ඒ මට විතර්කය අරමුණු කොට ඇති සංඥාවද මනසිකාරයද උපදියි. ඇවැත්නි, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් වැඩ, මට මෙය වදාළසේක. 'මොග්ගල්ලානය, මොග්ගල්ලානය, ශ්‍රේෂ්ඨවූ ආයුෂ්මතුන්ගේ තුෂ්ණීම්භාවයෙහි ප්‍රමාද නොවෙව. ආයුෂ්මතුන්ගේ තුෂ්ණීම්භාවයෙහි සිත මනාකොට තබව. ආයුෂ්මතුන්ගේ තුෂ්ණීම්භාවයෙහි සිත එකඟ කරව. ආයුෂ්මතුන්ගේ තුෂ්ණීම්භාවයෙහි සිත තැන්පත් කරව.' (යනුයි.)"

4. "ඇවැත්නි, ඒ මම ඉන්පසු විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් සිතේ පැහැදීම ඇති කරන්නාවූ, සිතේ එකඟ බව ඇති කරන්නාවූ, විතර්ක රහිතවූ, විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනිවූ ධ්‍යානයට පැමිණ, වාසය කෙළෙමි. ඇවැත්නි, ශාස්තෲන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද්දාවූ, ශ්‍රාවකයෙක්තෙම ෂට් අභිඥාවන්ට පැමිණියේය. කියන්නෙක් යමෙකු උදෙසා කියන්නේ නම් ශාස්තෲන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද්දාවූ, ශ්‍රාවකයෙක්තෙම ෂට් අභිඥාවන්ට

පැමිණියේය' යන එය මනාකොට කියන්නාහු විසින් මා උදෙසාම කියයුතු වන්නේය."

**(පළමුවෙනි කෝලිත සූත්‍රය නිමි.)**

---

## 2. සාරිපුත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එහිදී වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරතෙමේ "ඇවැත් මහණෙනි"යි කියා භික්ෂූන්ට කථාකළසේක. 'ඇවැත්නි' කියා ඒ භික්ෂූහු වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්හට උත්තර දුන්හ. "ඇවැත, මෙහි රහසිගතව, විවේකව සිටි මට මෙවැනි අදහසක් පහළවිය.' 'යමක්හුගේ නැතිවීම වෙනස්වීම හේතු කොට ගෙන, මා හට සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ උපදින්නාහුද, එවැනිවූ කිසිවක් ලෝකයෙහි ඇත්තේදෝ හෝයි කියාය.' ඇවැත්නි, ඒ මට මේ අදහස ඇතිවිය. 'යමක්හුගේ නැතිවීම වෙනස්වීම හේතුකොටගෙන සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ උපදින්නාහුද, එවැනිවූ, කිසිවක් ලෝකයෙහි නැත' කියායි.

3. "මෙසේ කීකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "ඇවැත්, ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, ශාස්තෲන් වහන්සේගේ නැතිවීමෙන්ද වෙනස් වීමෙන්ද ඔබ වහන්සේට සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නූපදින්නාහුද?"

4. "ඇවත, ශාස්තෲන් වහන්සේගේ නැතිවීමෙන්ද වෙනස්වීමෙන්ද, මාහට සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නූපදින්නාහුය. එහෙත් මට මේ අදහස ඇති වන්නේය. 'පින්වත, ඒකාන්තයෙන් මහත් ඍද්ධි ඇත්තාවූ, මහත්

ආනුභාව ඇත්තාවූ, මහේශාක්‍යවූ සත්වයෙක් අතුරුදන් විය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ බොහෝ කාලයක් මුළුල්ලෙහි වැඩ සිටින සේක් නම්, එය බොහෝ දෙනාට හිත පිණිස, බොහෝදෙනාට සැප පිණිස, ලෝකයාට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ට අර්ථය පිණිස, හිත පිණිස, සැප පිණිස වන්නේය" කියායි.

5. "එය එසේමය, ආයුෂ්මත් ශාරිපුත්‍රයන් විසින් බොහෝ කලකට පෙර මමය, මගේය ගන්නා දෘෂ්ටිමානානුසයෝ නසන ලදහ. එහෙයින් ආයුෂ්මත් ශාරිපුත්‍රයන්හට ශාස්තෲන් වහන්සේගේ නැතිවීමෙන්ද වෙනස් වීමෙන්ද, සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නූපදින්නාහුය."

**(දෙවෙනි සාරිපුත්ත සූත්‍රය නිමි.)**

---

## 3 ඝට සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

එකල්හි වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙමේද, රජගහනුවර සමීපයෙහිවූ, කලන්දකනිවාප නම් ලත් වේළුවනාරාමයෙහි එකම කාමරයක වාසය කෙරෙති.

2. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ සවස් කාලයෙහි විවේකස්ථානයෙන් නැගී සිටියේ, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් හා සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත් සිහිකටයුතුවූත් කථාව නිමවා එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්හට මෙය කීයේය. "ඇවැත් මොග්ගල්ලානය ඔබගේ

ඉන්ද්‍රියෝ අතිශයින් ප්‍රසන්නවූවාහුය. මුහුණේ වර්ණය පිරිසිදු වූයේය. අතිශයින් පිරිසිදු වූයේය. ආයුෂ්මත් මහා මොග්ගල්ලානතෙම ඒකාන්තයෙන් අද ශාන්තවූ විහරණයකින් වාසය කළේය” කියායි.

3. “ඇවැත්නි, මම වනාහි අද ඕලාරිකවූ විහරණයකින් වාසය කෙළෙමි. මාගේ ධර්ම කථාවක් විය. ආයුෂ්මත් මහා මොග්ගල්ලානයන්ගේ ධර්ම කථාව කා සමග වූයේද?”

“ඇවැත්නි, මාගේ ධර්ම කථාව භාග්‍යවතුන් වහන්සේ හා සමග වූයේය. ඇවැත්නි, දැන් වනාහි භාග්‍යවතුන් වහන්සේ දුරවූ, සැවැත් නුවර ජේතවනයෙහිවූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක.”

4. ‘කිමෙක්ද? ආයුෂ්මත් මහා මොග්ගල්ලානතෙම ඍද්ධියෙන් භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේද? නැතහොත් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහාමොග්ගල්ලානයන් වෙත ඍද්ධියෙන් වැඩිසේක්ද?”

“ඇවැත්නි, මම වනාහි ඍද්ධියෙන් භාග්‍යවතුන් වහන්සේ කරා නොපැමිණියෙමි. භාග්‍යවතුන් වහන්සේ හෝ මා කරා ඍද්ධියෙන් නොවැඩිසේක. එහෙත් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද ඒතාක් මාගේ දිව්‍ය ඇසද, දිව්‍ය කණද පිරිසිදු විය. මා යම් තැනෙක්හිද ඒතාක් භාග්‍යවතුන් වහන්සේ ගේත් දිව්‍ය ඇසද, දිව්‍ය කණද පිරිසිදු විය.”

5. “ආයුෂ්මත් මහා මොග්ගල්ලානයන්ගේ භාග්‍යවතුන් වහන්සේ හා කෙබඳු ධර්ම කථාවක් වීද?”

“ඇවැත්නි, මෙහිදී මම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයෙමි. ‘ස්වාමීනි, පටන්ගන්නා ලද වීය්‍ය්‍යීය ඇත්තේය. පටන් ගන්නා ලද වීය්‍ය්‍යීය ඇත්තේයයි කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි පටන් ගන්නා ලද වීය්‍ය්‍යීය ඇත්තෙක් වන්නේද?” කියායි.

“ඇවැත්නි, මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ මට ‘මොග්ගල්ලානය, ශරීරයෙහි සමද, නහරද, ඇටද ඉතිරි වේවා.

මස්, ලේ වියලේවා, පුරිසථාමයෙන්, පුරුෂ වීය්‍ය්‍යීයෙන්, පුරුෂ පරාක්‍රමයෙන් පැමිණිය යුතු යමක් වේද, එයට නො පැමිණ වීය්‍ය්‍යීයාගේ බහා තැබීමක් නොවන්නේයයි මේ ශාසනයෙහි මහණතෙම පටන් ගන්නා ලද වීය්‍ය්‍යී ඇතිව වාසය කෙරේ. මොග්ගල්ලානය, මෙසේ වනාහි පටන් ගන්නා ලද වීය්‍ය්‍යීය ඇත්තේ වේයයි' වදාළේය. ඇවැත්නි, මෙසේ වනාහි භාග්‍යවතුන් වහන්සේ හා සමග මාගේ ධර්ම කථාව විය."

**6.** "ඇවැත්නි, යම්සේ වනාහි කුඩාවූ කැටකැබිලිති හිමාලය පර්වත රාජයා හා සම නොවන බව දැක්වීම සඳහා උපමාවට පමණක් ගන්නේද, එසේම අපි ආයුෂ්මත් මහා මොග්ගල්ලානයන් හා උපමා කිරීමට පමණක් සෑහෙන්නෙමු. ආයුෂ්මත් මහා මොග්ගල්ලානතෙමේ වනාහි මහත් ඍද්ධි ඇත්තේය. මහත් ආනුභාව ඇත්තේය. (ඉදින්) කැමැත්තේ නම් ආයුෂ කල්පයක් සිටින්නේය"යි කීය.

**7.** "ඇවැත්නි, යම්සේ ලුනු කැටයක් මහත්වූ ලුනු සැළියකට උපමා කිරීම පිණිස පමණක් ගන්නේවේද එසේම වනාහි අපි ආයුෂ්මත් ශාරිපුත්‍රයන් හා උපමා පිණිස පමණක් සෑහෙන්නෙමු. ආයුෂ්මත් ශාරිපුත්‍රතෙමේ වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ස්තුතිකරන ලද්දේය. වර්ණනා කරන ලද්දේය. ප්‍රශංසා කරන ලද්දේය." (කෙසේද?)

> 'ශීලයෙන්, සමාධියෙන් සහ ප්‍රඥාවෙන් පරතෙරට ගියාවූ යම් මහණෙක් වනාහි වෙයිද, මේ සාරිපුත්ත තෙමේ (එයින්) ශ්‍රෙෂ්ඨ වන්නේය' කියායි.

"මෙසේ මේ මහානාගයෝ (අනුශ්‍රාවක) දෙදෙන ඔවුනොවුන්ගේ සුභාසිතය, මනාකොට කියන ලද්ද මනාකොට අනුමෝදන් වූහ."

**(තුන්වෙනි සට සූත්‍රය නිමි.)**

## 4. නව සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

එසමයෙහි වනාහි එක්තරා නවක (අලුත්) භික්ෂුවක් සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකුනේ විහාරයට පැමිණ ස්වල්ප උත්සාහ ඇත්තේ තූෂ්ණීම්භූතවූයේ, වාසය කෙරෙයි. සිවුරු කරන සමයෙහි මහණුන්හට වතාවත් නොකෙරෙයි.

2. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පැත්තක හුන්නාහුය. එක් පැත්තක හුන්නාවූ, ඒ භික්ෂූහු වනාහි භාග්‍යවතුන්වහන්සේට මෙය කීවාහුය.

"ස්වාමීනි, මේ ශාසනයෙහි එක්තරා නවක (අලුත්) භික්ෂුවක් සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකුනේ වෙහෙරට පැමිණ, ස්වල්ප උත්සාහ ඇත්තේ, තූෂ්ණීම්භූත වූයේ, වාසය කෙරෙයි. සිවුරු කරන සමයෙහි මහණුන්හට වතාවත් නොකෙරෙයි" කියායි.

3 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වනාහි එක්තරා භික්ෂුවක්හට කථාකළසේක. "මහණ, නුඹ (මෙහි) එව. මාගේ වචනයෙන් ඒ මහණහට කථා කරව. 'ඇවැත, ශාස්තෲන් වහන්සේ නුඹට කථා කරනසේකැයි' කියායි."

"එසේය, ස්වාමීනි"යි කියා ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී, ඒ අලුත් භික්ෂුව යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, ඒ මහණහට මෙය කීයේය. 'ඇවැත, ශාස්තෲන් වහන්සේ නුඹට කථා කරන සේකැයි' කියායි. 'ඇවත, එසේය'යි ඒ මහණතෙම වනාහි ඒ මහණහට පිළිතුරු දී, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ, ඒ මහණහට වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

4. "මහණ, නුඹ සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ වෙහෙරට පිවිස, ස්වල්ප උත්සාහ ඇත්තේ, තුෂ්ණීම්භූත වූයේ, වාසය කෙරෙහිය. සිවුරු කරන සමයෙහි මහණුන්හට වතාවත් නොකෙරෙහිය යනු සැබෑද?"

"ස්වාමීනි, මම වනාහි තමාගේ කෘත්‍යය කරමි"යි කීයේය.

5. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඒ නවක මහණහුගේ සිත තමන්වහන්සේගේ සිතින් දැන, භික්ෂූන්හට කථා කළ සේක. 'මහණෙනි, තෙපි මේ නවක මහණහට නුගුණ නොකියව් මහණෙනි, මේ මහණතෙම වනාහි උසස් සිත ඇසුරු කළාවූ, ඉහාත්මයෙහි සැප විහරණයවූ, සතර ධ්‍යානයන් කැමැති පරිදි ලබන්නෙක්, නිදුකින් ලබන්නෙක්, පහසුවෙන් ලබන්නෙක් වන්නේය. යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවෙත්ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව අවසානකොට ඇති ඒ අනුත්තර අර්ථය මේ ආත්මයේදීම තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කෙරේයයි" වදාළසේක.

6. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක. දේශනාකොට, ඊට අනතුරුව මේ ගාථා දේශනා කළසේක.

(1) "ලිහිල්වූ වීර්‍ය්‍යය කොට, ස්වල්ප උත්සාහයකින් සියලු කෙලෙස් ගැට මුදන්නාවූ, මේ නිර්වාණයට පැමිණිය නොහැක්කේය."

(2) "මේ නවක මහණතෙම, මේ උත්තම පුරුෂ තෙම, සේනාව සහිතවූ මාරයා දිනා, අන්තිම දේහය (ශරීරය) දරායයි වදාළසේක."

**(සතරවෙනි නව සූත්‍රය නිමි.)**

---

## 5. සුජාත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. ඉක්බිති ආයුෂ්මත් සුජාත ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය.

2. භාග්‍යවතුන් වහන්සේ, එන්නාවූ ආයුෂ්මත් සුජාත තෙරුන් දුරදීම දුටුසේක. දැක, භික්ෂූන්හට කථා කළසේක. "මහණෙනි, මේ කුලපුත්‍රතෙම අංග දෙකකින් හොබනේය. (එනම්:-) විශිෂ්ට රූප ඇත්තේය. දැකුමට ප්‍රියවූ රූප ඇත්තේය. ප්‍රසාද එළවන්නේය. උතුම් වර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්ත වූයේය යන යමක් වේද, යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව අවසානකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය කෙරෙයිද යන මේ අංග දෙකිනි."

3. "භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක. මෙය දේශනා කොට, ඊට අනතුරුව මේ ගාථාව දේශනා කළසේක."

(1) "මේ මහණතෙම ඍජුවූ සිතින් ඒකාන්තයෙන් හොබනේය. (කෙලෙසුන්ගෙන්) මිදුනාවූ, (ආශ්‍රවයන්ගෙන්) වෙන්වූ, අනුපදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවියාවූ, (මේ සුජාත මහණතෙම) පිරිවර සහිත මාරයා දිනා, අන්තිම දේහය (ශරීරය) දරායයි වදාළ සේක."

**(පස්වෙනි සුජාත සූත්‍රය නිමි.)**

---

## 6. භද්දිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති ආයුෂ්මත් ලකුණ්ඨක භද්දිය ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය.

2. භාග්‍යවතුන් වහන්සේ එන්නාවූ ආයුෂ්මත් ලකුණ්ඨක භද්දිය ස්ථවිරයන් දුරදීම දුටුසේක. දැක, මහණුන්හට කථා කළසේක. "මහණෙනි, තෙපි වනාහි එන්නාවූ, දුර්වර්ණවූ, විරූපීවූ, මිටිවූ, භික්ෂූන්ගේ හෙළාදැක්මට භාජනවූ, මේ මහණතෙම දකිව්ද?"

"එසේය, ස්වාමීනි."

3. "මහණෙනි, මේ මහණතෙම වනාහි මහත්වූ ඍද්ධි ඇත්තේය. මහත්වූ ආනුභාව ඇත්තේය. ඒ මහණහු විසින් සමනොවැදුනු විරූ යම් සමාපත්තියක් වේද, එවැනි සමාපත්තියක් සුලභ නොවේ. යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවෙත්ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව අවසානකොට ඇත්තාවූ ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය කෙරෙයි" කියායි.

4. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක. දේශනාකොට, ඊට අනතුරුව මේ ගාථාවන් දේශනා කළ සේක.

> (1) "කයෙහි සමානත්වයක් නැත්තාවූ, හංසයෝද, කොස්වා ලිහිණියෝද, මොනරුද, ඇත්තුද, 'පසද' නම් මුවෝද යන සියල්ලෝම සිංහයාහට බිය වෙති."
>
> (2) "එසේම වනාහි මිනිසුන් අතුරෙහි නුවණ ඇත්තාවූ තැනැත්තේ වනාහි ළදරු වූයේ නුමුත් ඒ කාරණයෙන් මහත් වෙයි. ශරීරය ඇත්තේවී නමුත් බාලතෙම මහත් නොවේයයි" වදාළසේක.

**(හයවෙනි භද්දිය සූත්‍රය නිමි.)**

---

## 7. විසාඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි

වාසය කරන සේක. එසමයෙහි වනාහි පඤ්චාලිපුත්‍ර ආයුෂ්මත් විශාඛ ස්ථවිරතෙම උපස්ථාන ශාලාවෙහිදී ගැමිනොවූ, පැහැදිළිවූ, කෙළතොළු නොවූ, අර්ථය හැඟවීමට පොහොසත්වූ, චතුරායර්‍ය සත්‍යයෙන් යුක්තවූ, ලෞකික දේ ඇසුරු නොකළාවූ, වචනයෙන් ධර්ම කථාවෙන් භික්ෂූන්හට කරුණු දක්වයි. (ඔවුන් එහි) සමාදන් කරවයි' තියුණු කරවයි, සතුටු කරවයි.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි විවේක ස්ථානයෙන් නැගීසිටියේ උපස්ථාන ශාලාව යම් තැනෙක්හිද, එතැන්හි වැඩිසේක. වැඩ, පණවනලද ආසනයෙහි වැඩහුන්සේක. වැඩහුන්නාවූ භාග්‍යවතුන් වහන්සේ වනාහි භික්ෂූන්ට කථාකළ සේක.

"මහණෙනි, කවරෙක් වනාහි උපස්ථාන ශාලාවෙහිදී ගැමිනොවූ, පැහැදිළිවූ, කෙළතොළු නොවූ, අර්ථය හැඟවීමට පොහොසත්වූ, චතුරායර්‍යසත්‍යයෙන් යුක්තවූ, ලෞකික දේ ඇසුරු නොකළාවූ, වචනයෙන් ධර්මකථාවෙන් භික්ෂූන්හට කරුණු දක්වයිද, (ඔවුන් එහි) සමාදන් කරවයිද, තියුණු කරවයිද, සතුටු කරවයිද කියායි."

3. "ස්වාමීනි, පඤ්චාලිපුත්‍රවූ ආයුෂ්මත් විසාඛ ස්ථවිර තෙම උපස්ථාන ශාලාවෙහිදී, ගැමි නොවූ, පැහැදිළිවූ, කෙළතොළු නොවූ, අර්ථය හැඟවීමට පොහොසත්වූ, චතුරායර්‍ය සත්‍යයෙන් යුක්තවූ, ලෞකික දේ ඇසුරු නොකළාවූ වචනයෙන් ධර්ම කථාවෙන් භික්ෂූන්හට කරුණු දක්වයි. (ඔවුන් එහි) සමාදන් කරවයි, තියුණු කරවයි, සතුටු කරවයි" කියා කීයේය.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පඤ්චාලිපුත්‍රවූ ඇවැත් විසාඛහට ඇමතූසේක. "සාධු! සාධු!! විසාඛය, විසාඛය, නුඹ වනාහි මැනවි. ගැමිනොවූ, පැහැදිළිවූ, කෙළතොළු නොවූ, අර්ථය හැඟවීමට පොහොසත්වූ, චතුරායර්‍ය සත්‍යයෙන් යුක්තවූ, ලෞකික දේ ඇසුරු නොකළාවූ, වචනයෙන් ධර්ම කථාවෙන් භික්ෂූන්හට කරුණු දක්වහි. (ඔවුන් එහි) සමාදන් කරහි, තියුණු කරහි, සතුටු කරහියි" වදාළ සේක.

5. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක. මෙය දේශනාකොට, ඊට අනතුරුව මේ ගාථාවන් දේශනා කළසේක.

(1) "බාලයන් හා සමග මිශ්‍රවූ, පණ්ඩිතයා කථා නොකරනතාක් නොදනිත්. අමෘත පදය දෙශනා කළ කල්හිම දනිත්."

(2) "ධර්මය කියන්නේය. පතුරුවන්නේය. ඍෂීන් ගේ ධජය (අරිහත් ධජය) ඔසවන්නේය. ඍෂීහු සුභාෂිතය ධජය (කොඩිය) කොට ඇත්තෝය. ඍෂීන්ගේ ධජය වනාහි ධර්මයයි."

**(හත්වෙනි විසාඛ සූත්‍රය නිමි.)**

---

## 8. නන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේගේ මවගේ සහෝදරියගේ පුත්‍රවූ ආයුෂ්මත් නන්ද ස්ථවිරතෙම පඬුපොවනලද, නැවත නැවත පඬු පොවනලද, සිවුරු පොරවා, ඇස් අඳුන් ගා, පැහැපත් පාත්‍රයක් ගෙන භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේට වැඳ, එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ ආයුෂ්මත් නන්ද ස්ථවිරයන්හට වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙය කීසේක.

2. "නන්දය, නුඹ යම් පඬු පොවනලද, නැවත නැවත පඬු පොවනලද සිවුරු පොරවන්නේ වෙහිද, ඇස් අඳුන් ගානා ලද්දේ වෙහිද, පැහැපත් පාත්‍රයක් දරන්නේ වෙහිද, තාගේ එය වනාහි ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම, ශාසනයෙහි පැවිදිවූ, කුලපුත්‍රයෙකුහට සුදුසු නොවේ. නන්දය, මෙසේ වනාහි නුඹ යම් ආරණ්‍යකයෙක් වන්නේ වෙහිද, පිණ්ඩපාතිකයෙක් වන්නේ වෙහිද, පංසුකූලිකයෙක් වන්නේ වෙහිද, කාමයන්හි අපෙක්ෂා රහිතව වාසය කරන්නේ වේද, තාගේ (එය වනාහි) ශ්‍රද්ධාවෙන්

ගිහිගෙයින් නික්ම, ශාසනයෙහි පැවිදිවූ කුලපුත්‍රයෙකුහට සුදුසුවේයයි” වදාළසේක.

3. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක. මෙය දේශනාකොට, ඊට අනතුරුව මේ ගාථාව දේශනා කළසේක.

(1) “ආරණ්‍යකවූ, පංසුකූලිකවූ, පිණ්ඩපාතයෙන් යැපෙන්නාවූ කාමයන්හි අපේක්ෂාවක් නැත්තාවූ නන්දයන් මම කවදා දකින්නෙම්ද?”

ඉක්බිති ආයුෂ්මත් නන්ද පසුකලක ආරණ්‍යකයෙක්ද පංසුකූලිකයෙක්ද, පිණ්ඩපාතිකයෙක්ද වූයේය. කාමයන්හිද අපේක්ෂා නැත්තේ වාසය කළේය.

**(අටවෙනි නන්ද සූත්‍රය නිමි.)**

## 9. තිස්ස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක.

ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේගේ පියාගේ සහෝදරියගේ පුත්‍රවූ, ආයුෂ්මත් තිස්ස ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, දුක්වෙමින් නොසතුටුවූ සිත් ඇතිව කඳුලු වගුරුවමින්, එක් පැත්තක හුන්නේය.

2. ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් තිස්ස මහණහට මෙය වදාළේය. “තිස්සය, කිමෙක්ද?” නුඹ දුක්ව නොසතුටුවූ, සිත් ඇතිව කඳුලු වගුරුවමින් එක්පැත්තක හුන්නෙහිද?”

“ස්වාමීනි, භික්ෂූහු මට හාත්පසින්, වචන නමැති කෙවිටින් නිතර අනින්නාහුය”යි කීය.

"තිස්සය, එය එසේමය. නුඹ වනාහි කියන්නෙහිය. කියන වචන නො ඉවසන්නෙහිය. නුඹ යම් හෙයකින් කියන්නේ වෙහිද, කියන වචන නො ඉවසන්නේ වෙහිද, තිස්සය, මෙය වනාහි ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම, ශාසනයෙහි පැවිදිවූ, කුලපුත්‍රයන් හට සුදුසු නොවේ. නුඹ යම් හෙයකින් කියන්නේ වෙහිද, කියන වචන ඉවසන්නේ වෙහිද, තිස්සය, මෙය වනාහි ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම, ශාසනයෙහි පැවිදිවූ, කුලපුත්‍රයන් හට සුදුසුය."

3 "භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක. මෙය දේශනාකොට ඊට අනතුරුව මේ ගාථාව දේශනාකළ සේක.

"කවර හෙයින් කිපෙන්නෙහිද? නොකිපෙව. තිස්සය, නුඹට ක්‍රොධ නොකිරීම ශ්‍රෙෂ්ඨය. තිස්සය, ක්‍රොධය, මානය සහ ගුණමකු බව නැති කරනු සඳහා බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරේයයි" වදාළසේක.

**(නවවෙනි තිස්ස සූත්‍රය නිමි.)**

---

## 10. ථෙරනාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම්වූ වේළුවනයෙහි (හුණ වනයෙහි) වාසයකරන සේක. එසමයෙහි වනාහි ථෙරනම් එක්තරා භික්ෂුවක්තෙම තනියම වාසය කරන්නේද, තනියම වාසය කිරීමෙහි ගුණ කියන්නේද වෙයි. ඒ මහණතෙම තනියම ගමට පිණ්ඩපාතයේ යයි. තනියම ආපසු එයි. තනියම, රහසිගතව හිඳියි. තනියම සක්මන් කෙරෙයි.

2. ඉක්බිති බොහෝ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නාහුය. එක් පැත්තක

හුන්නාවූ, ඒ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය. "ස්වාමීනි, මෙහි ථෙර නම් එක්තරා භික්ෂුවක් තනියම හැසිරෙන්නේ, තනියම හැසිරීමේ ගුණද කියන්නේය" කියායි.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වනාහි එක්තරා භික්ෂුවක්හට කථාකළ සේක. "මහණ, නුඹ (මෙහි) එව, මාගේ වචනයෙන් ඒ මහණහට කථාකරව. 'ඇවැත, භාග්‍යවතුන් වහන්සේ නුඹට කථාකරන සේකැයි' කියායි." "එසේය ස්වාමීනියි" කියා ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තරදී, ඒ ථෙරනම් භික්ෂුව යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, ඒ මහණ හට මෙය කීයේය. "ඇවැත, භාග්‍යවතුන් වහන්සේ නුඹට කථාකරන සේකැයි" කියායි.

"ඇවැත, එසේයයි" ඒ ථෙරනම් මහණතෙම වනාහි ඒ මහණහට පිළිතුරුදී, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ, ඒ ථෙර නම් මහණහට වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක.

4. "ථෙරය, නුඹ තනියම වාසය කරන්නේ, තනියම වාසය කිරීමෙහි ගුණ කියන්නේය යනු සැබෑද?"

"එසේය ස්වාමීනි."

"ථෙරය, නුඹ කෙසේ වනාහි තනියම වාසය කරන්නේ, තනියම වාසය කිරීමෙහි ගුණ කියන්නේද?"

"ස්වාමීනි, මම මෙහි තනියම ගමට පිණ්ඩපාතයේ යමි. තනියම ආපසු එමි. තනියම, රහසිගතව හිඳිමි. තනියම සක්මන් කරමි. ස්වාමීනි, මෙසේ වනාහි මම තනියම වාසය කරන්නේද, තනියම වාසය කිරීමෙහි ගුණ කියන්නේද වෙමියි" කීයේය.

5. "ථෙරය, මේ ශාසනයෙහි මේ තනිව වාසය කිරීම ඇත්තේය එය නැත්තේයයි නොකියමි. එහෙත් ථෙරය. යම්සේ වනාහි තනිව වාසය කිරීම විස්තර වශයෙන් සම්පූර්ණ වූයේ වේද, එය අසව. මනාකොට මෙනෙහි කරව. කියන්නෙමියි"

වදාළ සේක. "ස්වාමීනි, එසේයයි" කියා ඒ ථෙරනම් භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය.

**6.** භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක. "ථෙරය, කෙසේ වනාහි තනිව වාසය කිරීම විස්තර වශයෙන් සම්පූර්ණ වූයේ වේද? ථෙරය, මෙහි අතීත කාලයෙහිවූ පඤ්චස්කන්ධයෙහි යම් ඡන්ද රාගයක් වූයේද එය ප්‍රහීණ කරන ලද්දේද, අනාගතයෙහි වන්නාවූ පඤ්චස්කන්ධයෙහි යම් ඡන්ද රාගයක් වූයේද, එය බැහැර කරන ලද්දේද, වර්තමාන ආත්මභාව ප්‍රතිලාභයෙහිවූ ඡන්දරාගය මනාකොට හික්මවන (නසන) ලද්දේවේද, ථෙරය, මෙසේ වනාහි තනිව වාසය කිරීම විස්තර වශයෙන් සම්පූර්ණවූයේ වේයයි" වදාළ සේක.

**7.** භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක. දේශනාකොට ඊට අනතුරුව භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

(ස්කන්ධ, ආයතන, ධාතු සහ ත්‍රිවිධ භවය යන) සියල්ල යටකොට සිටියාවූ, ස්කන්ධාදී සියලු ධර්මයන් දත්තාවූ, ස්කන්ධාදී සියලු ධර්මයන්හි තණ්හා දෘෂ්ටි වශයෙන් නො ඇලුනාවූ, ඒ සියලු ධර්මයන් දුරුකළාවූ, තණ්හාව ක්ෂය කිරීමෙන් නිවන් අවබෝධ කළාවූ, ඒ පණ්ඩිත මනුෂ්‍යතෙම තනිව වාසය කරන්නේයයි, මම කියමියි" වදාළ සේක.

**(දසවෙනි ථෙරනාම සූත්‍රය නිමි.)**

---

## 11 කප්පින සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක.

ඉක්බිති ආයුෂ්මත් මහා කප්පිණ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේ එන්නාවූ ආයුෂ්මත් මහාකප්පිණ තෙරුන් දුරදීම දුටුසේක. දැක, භික්ෂූන්හට කථාකළ සේක.

2. "මහණෙනි, තෙපි එන්නාවූ සුදුපැහැයෙන් යුක්තවූ සිහින්වූ, උස්වූ නැහැයකින් යුක්තවූ, ඒ මහණ දක්නහුද?" "එසේය, ස්වාමීනි."

"මහණෙනි, ඒ මහණතෙම වනාහි මහත්වූ ඍද්ධි ඇත්තේය. මහත්වූ ආනුභාව ඇත්තේය. ඒ භික්ෂුව විසින් සමනොවදිනලද විරූ යම් සමාපත්තියක් වේද, එවැනි සමාපත්තියක් සුලබ නොවේ. යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව අවසානකොට ඇත්තාවූ ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කෙරෙයි කියායි."

3. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක දේශනාකොට, ඊට අනතුරුව මේ ගාථාවන් දේශනා කළසේක.

> (1) "ගෝත්‍ර සොයන්නාවූ යම් සත්වයෝ වෙත්ද, (ඔවුන් කෙරෙහි) ක්ෂත්‍රියතෙම ශ්‍රේෂ්ඨ වෙයි. දෙවි මිනිසුන් කෙරෙහි අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්ත තැනැත්තේ ශ්‍රේෂ්ඨ වෙයි."
>
> (2) "සූර්‍ය්‍යයා දවල් බබලයි. චන්ද්‍රයා රෑ බබලයි. ක්ෂත්‍රියතෙම සන්නාහසන්නද්ධ වූයේ බබලයි. ක්ෂීණාශ්‍රව තෙම ධ්‍යානයෙන් යුක්ත වූයේ බබලයි. එහෙත් බුදු රජාණන් වහන්සේ දිවා රෑ දෙක්හිම තේජසින් බබලන සේක."

**(එකොළොස්වෙනි කප්පින සූත්‍රය නිමි.)**

---

## 12. සහාය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක.

ඉක්බිති ආයුෂ්මත් මහා කප්පින තෙරුන්ගේ සද්ධි විහාරිකවූ, මිත්‍ර භික්ෂූන් දෙනමක් වනාහි භාග්‍යවතුන් වහන්සේ

යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියාහුය. භාග්‍යවතුන් වහන්සේ එන්නාවූ, ඒ භික්ෂූන් දුරදීම දුටු සේක. දැක, භික්ෂූන් ඇමතූ සේක.

2. "මහණෙනි, තෙපි එන්නාවූ, මහා කප්පින තෙරුන්ගේ සද්ධිවිහාරිකයන්වූ, ඒ මිත්‍ර මහණුන් දෙනම දක්නහුද?" "එසේය, ස්වාමීනි."

"මහණෙනි, ඒ මහණුන් දෙනම වනාහි මහත්වූ ඍද්ධියෙන් යුක්ත වූවෝය. මහත්වූ ආනුභාවයෙන් යුක්තවූවෝය. ඒ මහණුන් විසින් සමනොවදිනලද විරූ යම් සමාපත්තියක් වේද, එවැනි සමාපත්තියක් සුලබ නොවේ. යමක් සඳහා කුල පුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවෙත්ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව අවසාන කොට ඇත්තාවූ ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිදී තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කෙරෙත්යයි" වදාළ සේක.

3. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක. දේශනාකොට, ඊට අනතුරුව මේ ගාථාවන් දේශනා කළ සේක.

(1) "මේ මිත්‍ර භික්ෂූන් දෙනම වනාහි බොහෝ කාලයක් මුළුල්ලෙහි එක්වූවාහුය. මොවුන්හට බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනලද මේ සද්ධර්මය ඒකාන්තයෙන් ගැලපෙයි.

(2) "භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද සද්ධර්මයෙහි (මේ මහණුන් දෙනම) මහාකප්පින තෙරුන් විසින් මනාකොට හික්මවනලදහ. සේනාව සහිතවූ මාරයා දිනා අන්තිම දේහය (ශරීරය) දරත්යයි" වදාළසේක.

**(දොළොස්වෙනි සහාය සූත්‍රය නිමි.)**

---

(කෝලිත සූත්‍රය, සාරිපුත්ත සූත්‍රය, ඝට සූත්‍රය, නව සූත්‍රය, සුජාත සූත්‍රය, භද්දිය සූත්‍රය, විසාඛ සූත්‍රය, නන්ද සූත්‍රය, තිස්ස සූත්‍රය, ථෙර සූත්‍රය, කප්පින සූත්‍රය සහ සහාය සූත්‍රයදැයි මේ සංයුත්තයෙහි සූත්‍ර දොළොසකි.)

**(භික්ඛු සංයුත්තය නිමි.)**

---

(මේ නිදාන වර්ගයෙහි අභිසමය, ධාතු, අනමතග්ග, කස්සප, ලාභ සත්කාර, රාහුල, ලක්ඛණ, ඕපම්ම සහ භික්ඛු සංයුත්තයයි කියා සංයුත්ත නවයක් වේ.)

(නිදාන වර්ගය නිමි.)

---

# 3. ඛන්ධක වර්ගය.

## ඛන්ධක සංයුත්තය.

### මූලපණ්ණාසකය.

### 1. නකුල පිතු වර්ගය.

#### 1. නකුල පිතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ භග්ග නම් දනව්වෙහි සුංසුමාරගිරි නම් නුවර භෙසකලාවන නම්වූ මිගදායෙහි වැඩ වාසය කරන සේක.

එකල්හි වනාහි නකුලපිතු ගහපතිතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ නකුලපිතු ගෘහපතිතෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැල කෙළේය.

2. "ස්වාමීනි, මම ජරාවෙන් ජීර්ණ වූයේ වෙමි. වයසින් වෘද්ධවූයේ වෙමි. ජාතියෙන් මහළුවූයේ වෙමි. තුන්කල් ඉක්මගියේ වෙමි. පශ්චිම වයසට පැමිණියේ වෙමි. නිතර රෝගීවූ ගිලන්වූ සිරුරක් ඇත්තේ වෙමි. ස්වාමීනි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේ හා සිතේ දියුණුව ඇතිවන්නාවූ, භික්ෂූන්ද නිතර දක්නේ නොවෙමි. මට යමක් බොහෝ කාලයක් මුළුල්ලෙහි

හිත පිණිස, සැප පිණිස වන්නේද?' 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට එයින් අවවාද කරන සේක්වා!' ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට එයින් අනුශාසනා කරන සේක්වා!"

3. "ගහපතිය, ඒ කාරණය එසේය, ගහපතිය, ඒ කාරණය එසේය. ගහපතිය, මේ කය ආතුරවූයේ වෙයි. බිජු වටක් මෙන් දුබල වූයේ වෙයි. සියුම්වූ සිවියකින් දැවටුනේ වෙයි. ගහපතිය, යමෙක් යම් කය පරිහරණය කරන්නේ මොහොතක් නමුත් ආරෝග්‍යය (නිරෝගී බව) ප්‍රතිඥා කරන්නේ නම් (එය ඔහුගේ) අඥාන බව හැර වෙන කුමක්ද? ගහපතිය, එහෙයින් තොප විසින් මෙහි මෙසේ හික්මිය යුතු 'ආතුරවූ කයක් ඇත්තාවූ මාගේ සිත අනාතුර වන්නේය' කියායි. ගහපතිය, තොප විසින් මෙසේ හික්මිය යුතුයි."

4. ඉක්බිති, නකුලපිතු ගහපතිතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව එය අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ, පැදකුණු කොට ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි එළඹියේය. එළඹ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ නකුලපිතු ගහපතියාට ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළේය.

'ගහපතිය, ඔබගේ ඉන්ද්‍රියයෝ විප්‍රසන්නයහ. (විශෙෂයෙන් පැහැදුනහ) මුඛවර්ණය (මුණෙහි පාට) පිරිසිදුය. නිර්මලය. අද (ඔබ) භාග්‍යවතුන් වහන්සේගේ හමුවෙන් දැහැමි කථාවක් ඇසීමට ලැබුයේ වෙහිද?"

5. "ස්වාමීනි, කිමද නැත්තේ." "ස්වාමීනි, මේ දැන් මම භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්ම කථාවවූ අමෘතයෙන් අභිෂෙක කරන ලද්දේ වෙමියි" කීය. "ගහපතිය ඔබ කෙසේ නම් භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්ම කථාවවූ අමෘතයෙන් "අභිෂේක කරන ලද්දේද?" "ස්වාමීනි, මෙහි මම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි එළඹුනෙමි. එළඹ

භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක උන්නෙමි. ස්වාමීනි, එකත්පසෙක හුන්නාවූ මම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවෙමි.

**6.** "ස්වාමීනි, මම ජරාවෙන් ජීර්ණවූයේ වෙමි. වයසින් වෘද්ධවූයේ වෙමි. ජාතියෙන් මහළුවූයේ වෙමි. තුන්කල් ඉක්මගියේ වෙමි. අන්තිම වයසට පැමිණියේ වෙමි. නිතර රෝගීවූ ආතුර (ලෙඩ) වූ සිරුරක් ඇත්තේ වෙමි. ස්වාමීනි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේ හා සිතේ දියුණුව උපදින භික්ෂූන්ද නිතර දක්නේ නොවෙමි. යමක් මට බොහෝ කලක් හිත පිණිස, සැප පිණිස වන්නේද? "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට එයින් අවවාද කරන සේක්වා!" ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට එයින් අනුශාසනා කරන සේක්වා යනුයි.

**7.** "ස්වාමීනි, මෙසේ කීකල්හි මට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක. 'ගහපතිය, ඒ කාරණය එසේය. ගහපතිය, ඒ කාරණය එසේය. ගහපතිය, මේ කය ආතුරවූයේ වෙයි. බිජුවටක් මෙන් දුබලවූයේ වෙයි. (සියුම් සිවියකින් පමණක්) දැවටුනේවෙයි. ගහපතිය, යමෙක් වනාහි මේ කය පරිහරණය කරන්නේද (හෙතෙම) මොහොතක් නමුත් ආරෝග්‍යය (නිරෝගි බව) ප්‍රතිඥා කරන්නේ නම් (එය ඔහුගේ) අඥාන භාවය හැර වෙන කුමක්ද? එහෙයින් තොප විසින් මෙහි මෙසේ හික්මිය යුතු 'ආතුරවූ කයක් ඇත්තාවූ මාගේ සිත අනාතුර වන්නේය' කියායි. ගහපතිය, තොප විසින් මෙසේ හික්මිය යුතුය කියායි. ස්වාමීනි, මම මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්ම කථාවවූ අමෘතයෙන් අභිෂෙක කරන ලද්දේ වෙමි.

**8.** 'ස්වාමීනි, කොපමණකින් වනාහි ලෙඩවූ කය ඇත්තෙක් සහ ලෙඩවූ සිත ඇත්තෙක් වන්නේද, කොපමණකින් වනාහි ලෙඩවූ කය ඇත්තෙක්ව ලෙඩ නොවූ සිත ඇත්තෙක් වන්නේ දැයි' මත්තෙහි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසීමට නොවැටහුණෙහිද?"

**9.** "ස්වාමීනි, අපි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ සමීපයෙහිදී මේ දේශනාවේ අර්ථය දැන ගැනීමට දුර සිට

එන්නෙමු.” මේ දේශනාවේ අර්ථය ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේටම වැටහෙන්නේ නම් මැනවි.”

10. “එසේනම් ගහපතිය, අසව, මනාකොට මෙනෙහි කරව, කියන්නෙමි”යි වදාළේය. “ස්වාමීනි, එසේයයි.” නකුල පිතු ගහපතිතෙමේ ආයුෂ්මත්වූ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්නේය.

11. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළේය. “ගහපතිය, කෙසේනම් ලෙඩවූ කය ඇත්තෙක්ව ලෙඩවූ සිත ඇත්තෙක් වන්නේද?”

12. “ගහපතිය, මේ ලොකයෙහි ආයර්‍ය්‍යයන් නොදක්නාවූ ආයර්‍ය්‍යධර්මයෙහි අදක්ෂවූ ආයර්‍ය්‍යධර්මයෙහි නොහික්මුනාවූ සත් පුරුෂයන් නොදක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ, සත් පුරුෂ ධර්මයෙහි නොහික්මුණාවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ රූපය ආත්මය (තමා) වශයෙන් දකියිද? රූපවත්හු (රූපය ඇත්තාහු) තමා කොට හෝ දකියිද? රූපය තමා කෙරෙහි ඇතැයි කියා හෝ දකියිද? රූපයෙහි ආත්මය (තමා) හෝ ඇත කියා හෝ දකියිද? රූපය මම වෙමි. මගේ රූපය වේයයි තණ්හා දිට්ඨි දෙකින් මඩනා ලද්දේ වෙයිද, රූපය මම වෙමි. මගේ රූපයයි තණ්හා දිට්ඨි දෙකින් මඩනා ලද, ඔහුගේ ඒ රූපය වෙනස් වෙයිද, අන් ආකාරයකට පෙරළෙයිද, රූපයාගේ වෙනස්වීම අන් ආකාරයකට පෙරලීම හේතුකොට ගෙන ඔහුට ශොකය, පරිදේවය, දුක්ය, දොමනස්සය, උපායාසය යන මොවුහු උපදිත්.”

13. “වේදනාව ආත්මය වශයෙන් දකියිද, වේදනාව ඇත්තහු ආත්මයකොට හෝ දකියිද, ආත්මය (තමා) කෙරෙහි වේදනාව ඇතැයි කියා හෝ වේදනාව කෙරෙහි ආත්මය ඇතැයි කියා හෝ දකියිද, මම වේදනාව වෙමි. මගේ වේදනාවයයි තණ්හා දිට්ඨි දෙකින් මඩනා ලද්දේ වෙයිද, මම වේදනාව වෙමි, මගේ වේදනාවයයි මඩනා ලද්දාවූ ඔහුගේ ඒ වේදනාව වෙනසට පැමිණෙයිද, අන් ආකාරයකට පැමිණෙයිද වේදනාවගේ

වෙනස්වීම අන් ආකාරයකට පැමිණීම යන මෙය හේතුකොටගෙන ඔහුට ශොකය, පරිදෙවය, දුක්ය, දොම්නසය, උපායාසය යන මොවුහු උපදිත්.

14. "සංඥාව ආත්මය වශයෙන් දකියිද, සංඥාවත්හු ආත්මය කොට හෝ දකියිද, සංඥාව ආත්මය කෙරෙහි ඇතැයි කියා හෝ දකියිද, සංඥාවෙහි ආත්මය ඇතැයි කියා හෝ දකියිද, මම සංඥාව වෙමි. සංඥාව මගේයයි මඩනා ලද්දේ හෝ වෙයිද, මම සංඥාව වෙමි. මගේ සංඥාවයයි මඩනා ලද්දාවූ ඔහුගේ ඒ සංඥාව වෙනසට පැමිණෙයිද, අන් ආකාරයකට පැමිණෙයිද, සංඥාවගේ වෙනස්වීම අන් ආකාරයකට පෙරළීම හේතුකොටගෙන ඕහට ශොකය, පරිදෙවය, දුක්ඛය, දොම්නසය, උපායාසය යන මොවුහු උපදිත්.

15. "සංස්කාරයන් ආත්මය වශයෙන් හෝ දකියිද, සංස්කාරවත්හු ආත්මයකොට හෝ දකියිද, ආත්මය කෙරෙහි සංස්කාරයන් ඇත කියා හෝ දකියිද, සංස්කාරයන්හි ආත්මය ඇතැයි කියා හෝ දකියිද, සංස්කාරයෝ මම වෙමි මාගේ සංස්කාරයෝයයි මඩනාලද්දේ වෙයිද, සංස්කාර මම වෙමි. මගේ සංස්කාරයෝයයි මඩනා ලද්දාවූ ඔහුගේ ඒ සංස්කාරයෝ වෙනසට පැමිණෙත්ද, අන් ආකාරයකට පෙරළෙත්ද, සංස්කාරයන්ගේ වෙනස්වීම අන් ආකාරයකට පෙරළීම හේතුකොටගෙන ඔහුට ශොකය, පරිදෙවය, දුක්ය, දොම්නසය, උපායාසය යන මොවුහු උපදිත්.

16. "විඤ්ඤාණය ආත්මය වශයෙන් හෝ දකියිද, විඤ්ඤාණවත්හු ආත්මයකොට හෝ දකියිද, ආත්මය කෙරෙහි විඤ්ඤාණය ඇත කියා හෝ දකියිද, විඤ්ඤාණය කෙරෙහි ආත්මය ඇත කියා හෝ දකියිද, විඤ්ඤාණය මම වෙමි. මගේ විඤ්ඤාණයයි මඩනා ලද්දේ වෙයිද, මම විඤ්ඤාණය වෙමි. මගේ විඤ්ඤාණයයි මඩනා ලද්දාවූ ඔහුගේ ඒ විඤ්ඤාණය වෙනසට පැමිණෙයිද, අන් ආකාරයකට පෙරළෙයිද, විඤ්ඤාණයාගේ වෙනස්වීම අන් ආකාරයකට පෙරළීම හේතු

කොටගෙන, ඔහුට ශෝකය, පරිදෙවය, දුක්ඛය, දොම්නසය, උපායාසය යන මොවුහු උපදිත්.

"ගෘහපතිය, මෙසේ වනාහි ලෙඩවූ කය ඇත්තේද, ලෙඩවූ සිත ඇත්තේද වෙයි."

17. "ගහපතිය, කෙසේ නම් ලෙඩවූ කය ඇත්තේ ලෙඩ නොවූ සිත් ඇත්තෙක් වන්නේද, ගහපතිය, මේ ලෝකයෙහි ආර්‍ය්‍යයන් දක්නාවූ ආර්‍ය්‍යධර්මයෙහි දක්ෂවූ, ආර්‍ය්‍යධර්මයෙහි හික්මුනාවූ, සත්පුරුෂයන් දක්නාවූ. සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි හික්මුනාවූ, ශ්‍රැතවත් (ඇසූ පිරූ තැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙම රූපය ආත්මය වශයෙන් නොමදකියිද, රූපවත්හු ආත්මය කොට හෝ නොමදකියිද, ආත්මය කෙරෙහි රූපය ඇතැයි හෝ නොමදකියිද, රූපය කෙරෙහි ආත්මය ඇතැයි හෝ නොමදකියිද, "රූපය මම වෙමි. මගේ රූපය"යි මඩනා ලද්දේ නොවේද, රූපය මම වෙමි මාගේ රූපයයි නොමඩනා ලද්දාවූ ඔහුගේ ඒ රූපය වෙනසට පැමිණෙයිද, අන් ආකාරයකට පෙරළෙයිද, රූපයාගේ වෙනස්වීමෙන් අන් ආකාරයකට පෙරළීමෙන් ඔහුට ශෝකය, පරිදෙවය, දුක්ය, දොම්නසය, උපායාසය යන මොවුහු නූපදිත්.

18. "වේදනාව ආත්මය වශයෙන් හෝ නොමදකියිද, වේදනාවත්හු ආත්මය කොට හෝ නොමදකියිද, ආත්මය කෙරෙහි හෝ වේදනාව ඇතැයි හෝ නොමදකියිද, වේදනාව කෙරෙහි ආත්මය ඇතැයි හෝ නොමදකියිද, වේදනාව මම වෙමි. මගේ වේදනාවයයි නොමඩනා ලද්දේ වෙයිද, වේදනාව මම වෙමි, මගේ වේදනාවයයි නොමඩනා ලද්දාවූ ඔහුගේ ඒ වේදනාව වෙනසට පැමිණෙයිද, අන් ආකාරයට පෙරළෙයිද, වේදනාවගේ වෙනසට පැමිණීමෙන් හා අන් ආකාරයට පෙරළීමෙන් ඔහුට ශෝකය, පරිදෙවය, දුක්ය, දොම්නසය, උපායාසය යන මොවුහු නූපදිත්.

19. "සංඥාව ආත්මය වශයෙන් නොමදකියිද, සංඥාවත්හු ආත්මය කොට හෝ නොමදකියිද, ආත්මය කෙරෙහි සංඥාව

ඇතැයි හෝ නොමදකියිද, සංඥාව කෙරෙහි ආත්මය ඇතැයි හෝ නොමදකියිද, "සංඥාව මම වෙමි මගේ සංඥාවය"යි නොමඩනා ලද්දේ වෙයිද, සංඥාව මම වෙමියි මගේ සංඥාවයයි නොමඩනා ලද්දාවූ ඔහුගේ ඒ සංඥාව වෙනසට පැමිණෙයිද, අන් ආකාරයට පෙරළෙයිද, සංඥාවගේ වෙනස්වීම අන් ආකාරයකට පෙරළීම හේතුකොටගෙන ශොකය, පරිදෙවය, දුක්ඛය, දොම්නසය, උපායාසය යන මොවුහු නූපදිත්.

**20.** "සංස්කාරයන් ආත්මය වශයෙන් නොමදකියිද, සංස්කාරවත්හු ආත්මය කොට හෝ නොමදකියිද, ආත්මය කෙරෙහි සංස්කාරයන් ඇතැයි හෝ දකියිද, සංස්කාරයන් කෙරෙහි ආත්මය ඇතැයි හෝ නොමදකියිද, "සංස්කාරයෝ මම වෙමි, මගේ සංස්කාරයෝයයි මඩනා ලද්දේ නොවෙයිද, සංස්කාරයෝ මම වෙමි, මගේ සංස්කාරයෝයයි නොමඩනා ලද්දාවූ ඔහුගේ ඒ සංස්කාරයෝ වෙනසට පැමිණෙත්ද, අන් ආකාරයට පෙරළෙත්ද, සංස්කාරයන්ගේ වෙනස්වීම අන් ආකාරයකට පෙරළීම යන මෙයින් ඔහුට ශොකය, පරිදෙවය, දුක්ඛය, දොම්නසය, උපායාසය යන මොවුහු නූපදිත්.

**21.** 'විඤ්ඤාණය ආත්මය වශයෙන් නොමදකියිද, විඤ්ඤාණවත්හු ආත්මය කොට හෝ නොමදකියිද, ආත්මය කෙරෙහි විඤ්ඤාණය ඇතැයි හෝ නොමදකියිද, විඤ්ඤාණය කෙරෙහි ආත්මය ඇතැයි හෝ නොමදකියිද, විඤ්ඤාණය මම වෙමි. මගේ විඤ්ඤාණයයි මඩනා ලද්දේ නොවේද, විඤ්ඤාණය මම වෙමි. මගේ විඤ්ඤාණයයි නොමඩනා ලද්දාවූ ඔහුගේ ඒ විඤ්ඤාණය වෙනසට පැමිණෙයිද, අන් ආකාරයට පෙරළෙයිද විඤ්ඤාණයාගේ වෙනස්වීම අන් ආකාරයට පෙරළීම හේතු කොටගෙන ඔහුට ශොකය, පරිදෙවය, දුක්ය, දොම්නසය, උපායාසය යන මොවුහු නූපදිත්.

**22.** "ගහපතිය, මෙසේ වනාහි ලෙඩවූ කය ඇත්තේද, ලෙඩවූ සිත නැත්තේද වෙයි. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළේය. සතුටු සිත් ඇත්තාවූ නකුල පිතු

ගහපති තෙමේ ආයුෂ්මත්වූ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනයට සතුටු වූයේය.

**(පළමුවෙනි නකුල පිතු සූත්‍රය නිමි.)**

---

## 2. දේවදහ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි දෙව්දහ නම්වූ ශාක්‍යයන්ගේ නියම්ගමෙහි වැඩවාසය කරනසේක. එකල්හි පච්ඡාභූමි නම් ජනපදයට යනු කැමැතිවූ බොහෝ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක උන්නාහුය. එකත්පසෙක උන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ.

2. "ස්වාමීනි, අපි පච්ඡාභූමි නම් ජනපදයට යාමට කැමැත්තෙමු. පච්ඡාභූමි නම් ජනපදයෙහි වාසය කිරීමට කැමැත්තෙමු යනුයි."

"මහණෙනි, තොප විසින් සාරිපුත්තට දන්වන ලද්දේද?" ස්වාමීනි, අප විසින් ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට නොදන්වන ලද්දේය." "මහණෙනි, සාරිපුත්තට දන්වව්. සබ්‍රහ්මචාරී භික්ෂූන්ට අනුග්‍රහ කරන පණ්ඩිත භික්ෂුවකැයි වදාළේය."

"එසේය. ස්වාමීනි" යයි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ.

3. එකල්හි වනාහි ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට නුදුරු තන්හි එක්තරා ගසකින් සෙවෙනවූ මණ්ඩපයෙක්හි හුන්නේ වෙයි.

ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුවී එය අනුමෝදන්වී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන්

වහන්සේට වැඳ, පැදකුණු කොට ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියාහුය. පැමිණ, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා, එක් පසෙක උන්නාහුය. එක්පසෙක උන්නාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙසේ සැලකළාහුය. "ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයාණෙනි, අපි පච්ඡාභූමි නම් ජනපදයට යෑමට හා පච්ඡාභූම ජනපදයෙහි වාසය කිරීමටද කැමැත්තෙමු" යනුයි. "අප විසින් භාග්‍යවතුන් වහන්සේ විචාරණ ලද්දේයයිද කීහ."

4. "ඇවැත්නි, නොයෙක් රාජ්‍යයන්ගෙන් පැමිණියාවූ භික්ෂූන්ගෙන් ප්‍රශ්න විචාරන්නාවූ ක්ෂත්‍රිය පණ්ඩිතයෝද, බ්‍රාහ්මණ පණ්ඩිතයෝද, ගෘහපති පණ්ඩිතයෝද, ශ්‍රමණ පණ්ඩිතයෝද ඇත්තාහ. ඇවැත්නි, මනුෂ්‍ය පණ්ඩිතයෝ 'ආයුෂ්මත්වරුන්ගේ ශාස්තෲන් වහන්සේ කිනම් වාද ඇත්තෙක්ද කුමක්කියන්නෙක්දැයි' විමසන්නෝය 'ආයුෂ්මත්වූ ඔබවහන්සේලා විසින් කිනම් ධර්මය මනාව අසන ලද්දාහුද? මනාව ඉගෙනගන්නා ලද්දාහුද? මනාව මෙනෙහි කරන ලද්දාහුද? මනාව සිතින් දරා ගන්නා ලද්දාහුද? යම්සේ ප්‍රකාශ කරනු ලබන්නාවූ ආයුෂ්මත්හු භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක් කියන්නෝ වන්නහුද? භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් දොස් නොකියන්නෝ වන්නහුද? ලෝකෝත්තර ධර්මයට අනුකූල ධර්මයක් ප්‍රකාශ කරන්නහුද? කරුණු සහිතවූ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට අනුකූලවූ කීමක් ගැරහිය යුතු තැනකට නොපැමිණේදැයි' ඇසූහ."

5. "ඇවැත්නි, අපි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ සමීපයෙහිදී මේ වචනයාගේ අර්ථය දැනගැනීමට දුර සිටම එන්නෙමු. මේ වචනයාගේ අර්ථය ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට වැටහෙනසේක් නම් ඉතා යෙහෙක."

"ඇවැත්නි, එසේවී නම් අසව්, මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමි" "ඇවැත්නි, එසේය"යි ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර

ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළහ.

"ඇවැත්නි, නොයෙක් රාජ්‍යවලින් පැමිණියාවූ භික්ෂූන්ගෙන් ප්‍රශ්න විචාරන්නාවූ ක්ෂත්‍රිය පණ්ඩිතයෝද, බ්‍රාහ්මණ පණ්ඩිතයෝද, ගෘහපති පණ්ඩිතයෝද ශ්‍රමණ පණ්ඩිතයෝද ඇත්තාහුය. ඇවැත්නි, මනුෂ්‍ය පණ්ඩිතයෝ ආයුෂ්මත්වරුන්ගේ ශාස්තෘන් වහන්සේ කිනම් වාද ඇත්තෝද, කුමක් ප්‍රකාශ කරන්නේදැයි විමසන්නෝය. ඇවැත්නි, මෙසේ විචාරණ ලද්දාවූ තෙපි මෙසේ ප්‍රකාශ කරව්."

**6.** "ඇවැත්නි, අපගේ ශාස්තෘන් වහන්සේ ඡන්දරාගය දුරු කිරීම ප්‍රකාශ කරනසේකැ"යි ඇවැත්නි, මෙසේ ප්‍රකාශ කළ කල්හිද මත්තෙහි ප්‍රශ්න විචාරන්නාවූ අන්‍යවූ ක්ෂත්‍රිය පණ්ඩිතයෝද, බ්‍රාහ්මණ පණ්ඩිතයෝද, ගෘහපති පණ්ඩිතයෝද, ශ්‍රමණ පණ්ඩිතයෝද ඇත්තාහුය. ඇවැත්නි, මනුෂ්‍ය පණ්ඩිතයෝ අර්ථ විමසන්නෝය. 'ආයුෂ්මත්වරුන්ගේ ශාස්තෘන් වහන්සේ කවර දෙයක ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරනසේක්ද?' ඇවැත්නි, මෙසේ විචාරන ලද්දාවූ තොපි මෙසේ ප්‍රකාශ කරව්.

**7.** "ඇවැත්නි, ශාස්තෘන්වහන්සේ රූපයෙහි ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරන සේක. ශාස්තෘන් වහන්සේ වේදනාවෙහි ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරනසේක. ශාස්තෘන් වහන්සේ සංඥාවෙහි ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරනසේක. ශාස්තෘන් වහන්සේ සංස්කාරයන්හි ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරන සේක. ශාස්තෘන් වහන්සේ විඥානයෙහි ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරන සේක" යනුවෙනි.

"ඇවැත්නි, මෙසේ ප්‍රකාශ කළ කල්හි මත්තෙහි ප්‍රශ්න විචාරන්නාවූ අන්‍ය ක්ෂත්‍රිය පණ්ඩිතයෝද, බ්‍රාහ්මණ පණ්ඩිතයෝද, ගෘහපති පණ්ඩිතයෝද, ශ්‍රමණ පණ්ඩිතයෝද ඇත්තාහුය.

"ඇවැත්නි, මනුෂ්‍ය පණ්ඩිතයෝ අර්ථ විමසන්නෝය. 'ආයුෂ්මත්වරුන්ගේ ශාස්තෘතෙමේ කිනම් ආදීනවයක් දැක,

රූපයෙහි ඡන්දරාගය දුරු කිරීම ප්‍රකාශ කරන්නේද? ශාස්තෘතෙමේ වේදනාවෙහි ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරන්නේද? ශාස්තෘතෙමේ සංඥාවෙහි ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරන්නේද? ශාස්තෘතෙමේ සංස්කාරයන්හි ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරන්නේද? ශාස්තෘතෙමේ විඥානයෙහි ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරන්නේද?' ඇවැත්නි, මෙසේ විචාරන ලද්දාවූ තෙපි මෙසේ ප්‍රකාශ කරව්.

8. "ඇවැත්නි, රූපයෙහි දුරු නොවූ රාගය ඇත්තහුට, දුරු නොවූ ඡන්දය ඇත්තහුට, දුරු නොවූ ප්‍රේමය ඇත්තහුට, දුරු නොවූ පිපාසය ඇත්තහුට, දුරු නොවූ දාහය ඇත්තහුට, දුරු නොවූ තණ්හාව ඇත්තහුට ඒ රූපයාගේ පෙරලීමකට වෙනස් බවකට පැමිණීම හේතුකොට ගෙන ශෝක, පරිදේව, දුක් දොම්නස් සහ උපායාසයෝ උපදිත්.

9. "වේදනාවෙහි දුරු නොවූ රාගය ඇත්තහුට, දුරු නොවූ ඡන්දය ඇත්තහුට, දුරු නොවූ ප්‍රේමය ඇත්තහුට, දුරු නොවූ පිපාසය ඇත්තහුට, දුරු නොවූ දාහය ඇත්තහුට, දුරු නොවූ තණ්හාව ඇත්තහුට, ඒ වේදනාවගේ පෙරලීමකට, වෙනස් බවකට පැමිණීම හේතුකොටගෙන, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ උපදිත්.

10 "සංඥාවෙහි දුරුනොවූ රාගය ඇත්තහුට, දුරු නොවූ ඡන්දය ඇත්තහුට, දුරු නොවූ ප්‍රේමය ඇත්තහුට, දුරු නොවූ පිපාසය ඇත්තහුට, දුරු නොවූ දාහය ඇත්තහුට, දුරු නොවූ තණ්හාව ඇත්තහුට ඒ සංඥාවගේ පෙරලීමකට වෙනස් බවකට පැමිණීම හේතුකොටගෙන ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ උපදිත්.

11. "සංස්කාරයන්හි දුරු නොවූ රාගය ඇත්තහුට, දුරු නොවූ ඡන්දය ඇත්තහුට, දුරු නොවූ ප්‍රේමය ඇත්තහුට, දුරුනොවූ පිපාසය ඇත්තහුට, දුරු නොවූ දාහය ඇත්තහුට, දුරුනොවූ තෘෂ්ණාව ඇත්තහුට ඒ සංස්කාරයන්ගේ වෙනස් වීමක් පෙරලීමක් හේතුකොටගෙන ශෝක, පරිදෙව, දුක්, දොම්නස් සහ උපායාසයෝ උපදිත්.

12. "විඥානයෙහි දුරුනොවූ රාගය ඇත්තහුට දුරුනොවූ ඡන්දය ඇත්තහුට, දුරුනොවූ ප්‍රේමය ඇත්තහුට, දුරුනොවූ පිපාසය ඇත්තහුට, දුරුනොවූ දාහය ඇත්තහුට, දුරුනොවූ තෘෂ්ණාව ඇත්තහුට, විඥානයාගේ වෙනස්වීම, පෙරළීම හේතුකොටගෙන ශෝක, පරිදේව, දුක්, දොම්නස්, සහ උපායාසයෝ උපදිත්.

13. "ඇවැත්නි, ශාස්තෘන් වහන්සේ මේ ආදීනවය දැක, රූපයෙහිද, වේදනාවෙහිද, සංඥාවෙහිද, සංස්කාරයන්හිද, ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරන සුළුසේක්ය යනුයි.

"ඇවැත්නි, මෙසේ කී කල්හිද මත්තෙහි ප්‍රශ්න විචාරන්නාවූ අන්‍යවූ ක්ෂත්‍රිය පණ්ඩිතයෝද, බ්‍රාහ්මණ පණ්ඩිතයෝද, ගෘහපති පණ්ඩිතයෝද, ශ්‍රමණ පණ්ඩිතයෝද ඇත්තාහුය.

"ඇවැත්නි, මනුෂ්‍ය පණ්ඩිතයෝ අර්ථ විමසන්නෝය. 'ආයුෂ්මතුන්ගේ ශාස්තෘතෙම රූපය කිනම් ආනිසංසයක් දැක, ඡන්දරාගය දුරුකිරීම ප්‍රකාශ කරන්නේද, ශාස්තෘ තෙම වේදනාවෙහි, සංඥාවෙහි, සංස්කාරයන්හි, විඥානයෙහි, ඡන්දරාගය, දුරුකිරීම, ප්‍රකාශ කරන්නේ දැයි' අසන්නාහුය. ඇවැත්නි, මෙසේ අසන ලද්දාවූ තොපි මෙසේ ප්‍රකාශ කරව්, 'ඇවැත්නි, රූපයෙහි වනාහි දුරුවූ රාගය ඇති, දුරුවූ ඡන්දය ඇති, දුරුවූ ප්‍රේමය ඇති' දුරුවූ පිපාසය ඇති, දුරුවූ දාහය ඇති, දුරුවූ තණ්හාව ඇති, ඕහට රූපයාගේ වෙනස්වීමෙන් හා පෙරළීමෙන් සෝක, පරිදේව, දුක්, දොම්නස් හා උපායාසයෝ නූපදිත්.'

14. "වේදනාවෙහි දුරුවූ රාග ඇති, දුරුවූ ඡන්දය ඇති, දුරුවූ ප්‍රේමය ඇති දුරුවූ පිපාසය ඇති, දුරුවූ දාහය ඇති, දුරුවූ තණ්හාව ඇති ඕහට ඒ වේදනාවන්ගේ පෙරළීමෙන් වෙනස්වීමෙන් ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නූපදිත්.

15. "සංඥාවෙහි දුරුවූ රාගය ඇති, දුරුවූ ඡන්දය ඇති, දුරුවූ ප්‍රේමය ඇති, දුරුවූ පිපාසය ඇති, දුරුවූ දාහය ඇති,

දුරුවූ තණ්හාව ඇති, ඔහට ඒ සංඥාවේ පෙරලීමෙන්, වෙනස්වීමෙන් ශෝක, පරිදේව, දුක් දොම්නස් සහ උපායාසයෝ නූපදිත්.

16 "සංස්කාරයන්හි දුරුවූ රාගය ඇති, දුරුවූ ඡන්දය ඇති, දුරුවූ ප්‍රේමය ඇති, දුරුවූ පිපාසය ඇති, දුරුවූ දාහය ඇති, දුරුවූ තණ්හාව ඇති ඔහට ඒ සංස්කාරයන්ගේ පෙරලීමෙන් වෙනස් වීමෙන් සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නූපදිත්.

17. "විඥානයෙහි දුරුවූ රාගය ඇති, දුරුවූ ඡන්දය ඇති, දුරුවූ ප්‍රේමය ඇති, දුරුවූ පිපාසය ඇති, දුරුවූ දාහය ඇති, දුරුවූ තෘෂ්ණාව ඇති ඔහට විඥානයාගේ පෙරළීමෙන් වෙනස් වීමෙන් සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නූපදිත්.

18. "ඇවැත්නි, අපගේ ශාස්තෲන්වහන්සේ මේ ආනිසංස දැක, රූපයෙහි ඡන්දරාග දුරුකිරීම දේශනාකරන සේක. ශාස්තෲන්වහන්සේ වේදනාවෙහි ඡන්දරාගය දුරුකිරීම දේශනා කරන සේක. ශාස්තෲන්වහන්සේ සංඥාවෙහි ඡන්දරාගය දුරුකිරීම දේශනා කරන සේක. ශාස්තෲන්වහන්සේ සංස්කාරයන්හි ඡන්දරාගය දුරුකිරීම දේශනා කරන සේක. ශාස්තෲන් වහන්සේ විඥානයෙහි ඡන්දරාගය දුරුකිරීම දේශනා කරන සේක.' යනුවෙනි."

19. "ඇවැත්නි, අකුශල ධර්මයන්ට පැමිණ වාසය කරන්නහුට මේ ආත්මයෙහි දුක් නැත්තාවූ, තැවීම් නැත්තාවූ, සැප විහරණයක් වන්නේනම් ශරීර භෙදයෙන් මරණින් මත්තෙහි සුගතියක් කැමතිවිය යුත්තී නම් භාග්‍යවතුන් වහන්සේ මේ අකුශල ධර්මයන්ගේ දුරුකිරීම වර්ණනා නොකරන සේක."

"ඇවැත්නි, යම්හෙයකින් වනාහි අකුසල ධර්මයන්ට පැමිණ වාසය කරන්නාහට දුක් සහිතවූ, තැවීම් සහිතවූ, දැවීම් සහිතවූ, දුක්ඛ විහරණයක් වන්නේද, කායයාගේ භේදයෙන් මරණින්

මත්තෙහි දුර්ගතිය කැමතිවිය යුත්තීද? එහෙයින් භාග්‍යවතුන් වහන්සේ අකුශල ධර්මයන්ගේ දුරු කිරීම වර්ණනා කරන සේක.”

**20.** “ඇවැත්නි, කුශල ධර්මයන්ට පැමිණ වාසය කරන්නහුට මේ ආත්මයෙහිම දුක් සහිතවූ, තැවීම් සහිතවූ, දැවීම් සහිතවූ දුක්ඛ විහරණයක් වන්නේ නම් කායයාගේ භේදයෙන් මරණින් මත්තෙහි දුර්ගතියක් කැමැතිවිය යුත්තී නම් භාග්‍යවතුන් වහන්සේ කුසල ධර්මයන්ට පැමිණීම වර්ණනා නොකරන සේක.

**21.** “ඇවැත්නි, යම්හෙයකින් කුසලධර්මයන්ට පැමිණ වාසය කරන්නාහට මේ ආත්මයෙහිම දුක් රහිතවූ, තැවීම් රහිතවූ, දැවීම් රහිතවූ, සුඛවිහරණයක් වන්නේ ද, කායයාගේ භේදයෙන් මරණින් මත්තෙහි සුගතියක් කැමතිවිය යුත්තීද? එහෙයින් භාග්‍යවතුන් වහන්සේ කුසල ධර්මයන්ට පැමිණීම වර්ණනා කරන සේකැයි” ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් කාරණය වදාළසේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනයට සතුටු වූහ.

**(දෙවෙනි දේවදහ සූත්‍රය නිමි.)**

---

## 3. හාලිද්දකානි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක ආයුෂ්මත්වූ මහාකච්චායන ස්ථවිරයන් වහන්සේ අවන්ති ජනපදයෙහි කුරරඝරනම් නගරයෙහි පවත්ත නම් පර්වතයෙහි වාසය කරන සේක.

2. ඉක්බිති හාලිද්දකානි නම් ගෘහපතිතෙමේ ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරයන් වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් මහාකාච්චායන ස්ථවිරයන් වහන්සේට වැඳ, එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ හාලිද්දකානි ගෘහපතිතෙම ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරයන් වහන්සේට මේ කාරණය සැලකළේය. එනම්: “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් අෂ්ටක වර්ගයෙහි මාගන්දිය ප්‍රශ්නයෙහි මෙසේ වදාරන ලදි.

'ගෙය අත්හැර ගෙයි වාසය නොකරන්නාවූ ගම හා එක්ව නොවසන්නාවූ, කාමයන් කෙරෙන් මිදුණාවූ, සසර පෙරටුකොට නැත්තාවූ මහණතෙමේ කෙසේනම් ජනයා සමග විරුද්ධව කථා නොකරන්නේද?'

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරණ ලද මේ දේශනාවේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දත යුතුද යනුයි.

3. "ගෘහපතිය, රූපස්කන්ධය වනාහි විඥානයාගේ 'ඔක' (ගෙය) නමි. විඥානය රූපස්කන්ධයෙහි ඇලෙන රාගයෙන් බැඳුණ විඤ්ඤාණය ඔක සාරීයයි' කියනු ලැබේ. ගෘහපතිය, වේදනා ස්කන්ධය විඥානයාගේ 'ඔක' (ගෙය) නමි. වේදනාවෙහි ඇලෙන රාගයෙන් බැඳුණු විඥානය 'ඔක සාරීයයි' කියනු ලැබේ.

"ගෘහපතිය, සංඥා ස්කන්ධය විඥානයාගේ 'ඔක' (ගෙය) නමි. සංඥා ස්කන්ධයෙහි ඇලෙන රාගයෙන් බැඳුණු විඥානය 'ඔකසාරීයයි' කියනු ලැබේ.

"ගෘහපතිය, සංස්කාර ස්කන්ධ විඥානයාගේ 'ඔක' (ගෙය) නමි. සංස්කාර ස්කන්ධයෙහි ඇලෙන රාගයෙන් බැඳුණු විඥානය 'ඔකසාරීයයි' කියනු ලැබේ. ගෘහපතිය, මෙසේ වනාහි ඔකසාරී නම් වෙයි.

4. "ගෘහපතිය, කෙසේනම් අනොකසාරී නම් වේද? ගෘහපතිය, රූප ස්කන්ධයෙහි ඇලෙන යම් ඡන්දයක් වේද, යම් රාගයක් වේද, යම් නන්දියක් වේද, යම් තෘෂ්ණාවක් වේද, තෘෂ්ණා දෘෂ්ටි යන උපාසයන් සහ සතර උපාදානයෝ වෙත්ද, අකුසල් සිතට ස්ථානවූ, අනුසය ධර්මයෝ වෙත්ද ඔවුහු තථාගතයන් වහන්සේ විසින් පහකරන ලදහ. උදුරා දමන ලද මුල් ඇත්තාහුය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහු. නැවත හට නොගන්නා ස්වභාවයක් කරන ලද්දාහුය. විනාශ කරන ලදහ. නැවත නූපදින ස්වභාවයට පමුණුවන ලදහ. එහෙයින් තථාගතයන් වහන්සේ 'අනොකසාරීයයි' කියනු ලැබේ.

**5.** "ගෘහපතිය වේදනා ස්කන්ධයෙහි, ගෘහපතිය, සංඥා ස්කන්ධයෙහි, ගෘහපතිය, සංස්කාර ස්කන්ධයෙහි යම් ඡන්දයක් වේද, යම් රාගයක් වේද, යම් නන්දියක් වේද, යම් තෘෂ්ණාවක් වේද, යම් තෘෂ්ණා දෘෂ්ටි යන උපාය සහ සතර උපාදානයෝ අකුසල් සිතට වාසස්ථානවූ අනුසයයෝ වෙත්ද, ඔවුහු තථාගතයන් වහන්සේ විසින් පහකරන ලද උදුරා දමන ලද මුල් ඇත්තාහුය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහුය. විනාශ කරන ලද්දාහ. මත්තෙහි නූපදනා බවට පමුණුවන ලද්දාහ. එහෙයින් තථාගතයන් වහන්සේ අනොකසාරී යයි කියනු ලැබේ.

**6.** "ගෘහපතිය, විඥාන ධාතුවෙහි යම් ඡන්දයක් වේද, යම් රාගයක් වේද, යම් නන්දියක් වේද, යම් තෘෂ්ණාවක් වේද, යම් උපාය උපාදානයෝ වෙත්ද, අකුසල් සිතට වාසස්ථානවූ අනුසයයෝ වෙත්ද, ඔවුහු තථාගතයන් වහන්සේ විසින් පහකරන ලදහ. උදුරා දමන ලද මුල් ඇත්තාහුය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහුය. විනාශ කරන ලද්දාහුය. මත්තෙහි නූපදින බවට පමුණුවන ලද්දාහුය. එහෙයින් තථාගතයන් වහන්සේ අනොකසාරීයයි කියනු ලැබේ. ගෘහපතිය, මෙසේ වනාහි අනොකසාරී නම් වෙයි.

**7.** "ගෘහපතිය, කෙසේනම් නිකෙතසාරී (ගෙයි හැසිරෙන්නේ නම්) වේද, රූපාරම්මණය නමැති ගෘහයෙහි බැඳෙන්නාවූ ක්ලෙශ ධර්ම නිකෙතසාරීයයි කියනු ලැබේ. ගෘහපතිය, ශබ්දාරම්මණය නමැති ගෘහයෙහි බැඳෙන්නාවූ, ක්ලෙශ ධර්ම නිකෙතසාරීයයි කියනු ලැබේ. ගන්ධාරම්මණය නමැති ගෘහයෙහි බැඳෙන්නාවූ ක්ලෙශ ධර්ම නිකෙතසාරීයයි කියනු ලැබේ. රසාරම්මණය නමැති ගෘහයෙහි බැඳෙන්නාවූ ක්ලෙශ ධර්ම නිකෙතසාරීයයි කියනු ලැබේ. පොට්ඨබ්බාරම්මණය නමැති ගෘහයෙහි බැඳෙන්නාවූ ක්ලෙශ ධර්ම නිකේතසාරීයයි කියනු ලැබේ. ධර්මාරම්මණය නමැති ගෘහයෙහි බැඳෙන්නාවූ ක්ලෙශ ධර්ම නිකෙතසාරීයයි කියනු ලැබේ. ගෘහපතිය මෙසේ වනාහි නිකෙතසාරී නම් වෙයි.

8. "ගෘහපතිය, කෙසේ නම් අනිකෙතසාරී නම් වේද? ගෘහපතිය, රූපාරම්මණය නැමති ගෘහයෙහි බැඳෙන්නාවූ ක්ලෙශ ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් පහකරන ලද්දාහුය. උදුරා දමන ලද මුල් ඇත්තාහුය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහුය. විනාශ කරන ලද්දාහුය. මත්තෙහි නූපදින බවට පමුණුවන ලද්දාහුය. එහෙයින් තථාගතයන් වහන්සේ අනිකෙතසාරීයයි කියනු ලැබේ. ගෘහපතිය, මෙසේ වනාහි අනිකෙතසාරී නම් වෙයි.

9. "ගෘහපතිය, ශබ්දාරම්මණ නමැති ගෘහයෙහි බැඳෙන්නාවූ, ක්ලෙශ ධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් පහකරන ලද්දාහුය. උදුරා දමන ලද මුල් ඇත්තාහුය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහුය. විනාශ කරන ලද්දාහුය. මත්තෙහි නූපදින බවට පමුණුවන ලද්දාහුය. එහෙයින් තථාගතයන් වහන්සේ අනිකෙතසාරීයයි කියනු ලැබේ. ගෘහපතිය, මෙසේ වනාහි අනිකෙතසාරී නම් වෙයි.

10. "ගෘහපතිය, ගන්ධාරම්මණ නමැති ගෘහයෙහි බැඳෙන්නාවූ, ක්ලෙශධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් පහකරන ලද්දාහුය. උදුරා දමන ලද මුල් ඇත්තාහුය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහුය. විනාශ කරන ලද්දාහුය. මත්තෙහි නූපදින බවට පමුණුවන ලද්දාහුය. එහෙයින් තථාගතයන් වහන්සේ අනිකෙතසාරීයයි කියනු ලැබේ. ගෘහපතිය, මෙසේ වනාහි අනිකෙතසාරී නම් වෙයි.

11. "ගෘහපතිය, රසාරම්මණ නමැති ගෘහයෙහි බැඳෙන්නාවූ ක්ලෙශධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් පහකරන ලද්දාහුය. උදුරා දමන ලද මුල් ඇත්තාහුය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහුය. විනාශකරන ලද්දාහුය. මත්තෙහි නූපදින බවට පමුණුවන ලද්දාහුය. එහෙයින් තථාගතයන් වහන්සේ අනිකෙතසාරීයයි කියනු ලැබේ. ගෘහපතිය, මෙසේ වනාහි අනිකෙතසාරීනම් වෙයි.

12. "ගෘහපතිය, ස්පර්ශාරම්මණ නමැති ගෘහයෙහි බැඳෙන්නාවූ, ක්ලෙශධර්මයෝ තථාගතයන් වහන්සේ විසින්

පහකරන ලද්දාහුය. උදුරා දමන ලද මුල් ඇත්තාහුය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහුය. විනාශ කරන ලද්දාහුය. මත්තෙහි නූපදින බවට පමුණුවන ලද්දාහුය. එහෙයින් තථාගතයන් වහන්සේ අනිකෙතසාරීයයි කියනු ලැබේ. ගෘහපතිය, මෙසේ වනාහි අනිකෙතසාරීනම් වෙයි.

13. "ගෘහපතිය, ධර්මාරම්මණ නමැති ගෘහයෙහි බැඳෙන්නාවූ, ක්ලෙශධර්මයෝ තථාගතයන් වහන්සේ විසින් පහකරන ලද්දාහුය. උදුරා දමන ලද මුල් ඇත්තාහුය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහුය. විනාශ කරන ලද්දාහුය. මත්තෙහි නූපදින බවට පමුණුවන ලද්දාහුය. එහෙයින් තථාගතයන් වහන්සේ අනිකෙතසාරීයයි කියනු ලැබේ. ගෘහපතිය, මෙසේ වනාහි අනිකෙත සාරීනම් වෙයි.

14. 'ගෘහපතිය, කෙසේ නම් ගම හා එක්වන ස්වභාවය ඇත්තේද? ගෘහපතිය, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් ගිහියන් හා එක්ව වාසය කරයි. එක්ව සතුටු වෙමින්, එක්ව ශෝකවෙමින් ගිහියන් හා සැපවත්වූ කල්හි තමාත් සැප සහිත වෙමින්, ගිහියන් දුක් සහිතවූ කල්හි තමාත් දුක් සහිත වෙමින්, ගිහියන්ගේ නොයෙක් කටයුතු උපන් කල්හි තමාත් ඔවුන් හා එක්වීමට පැමිණෙයි. ගෘහපතිය, මෙසේ වනාහි ගම හා එක්ව වාසය කරන්නේ නම් වේ.

15. "ගෘහපතිය, කෙසේනම් ගම හා එක්ව වාසය නොකරන්නේද? ගෘහපතිය, මේ ශාසනයෙහි මහණතෙම ගිහියන් හා මිශ්‍රව වාසය නොකරයි. ගිහියන් හා එක්ව සතුටු නොවන්නේ ශෝක නොවන්නේ ගිහියන් සැප සහිතවූ කල්හි තමාත් සැප සහිත නොවන්නේ ගිහියන් දුක් සහිතවූ කල්හි තමාත් දුක් සහිත නොවන්නේ ගිහියන්ගේ කටයුතු උපන් කල්හි ඒ කටයුතුවලට එක්වීමට නොපැමිණෙන්නේ වෙයි. ගෘහපතිය, මෙසේ වනාහි ගම හා එක් නොවන්නේ නම් වේ.

16. 'ගෘහපතිය, කෙසේ නම් කාමයන්ගෙන් නොමිදුණේ නම් වේද? ගෘහපතිය, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක්

කාමයන්හි දුරු නොකළ රාගය ඇත්තේ වේද, දුරු නොකළ ඡන්දය ඇත්තේවේද, දුරු නොකළ ප්‍රේමය ඇත්තේ වේද, දුරු නොකළ පිපාසය ඇත්තේ වේද, දුරු නොකළ දාහය ඇත්තේ වේද, දුරු නොකළ තෘෂ්ණාව ඇත්තේ වේද, ගෘහපතිය, මෙසේ වනාහි කාමයන්ගෙන් නොමිදුණේ නම් වෙයි.

17. "ගෘහපතිය, කෙසේ නම් කාමයන්ගෙන් මිදුණේ නම් වේද? මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් කාමයන්හි දුරු කළ රාගය ඇත්තේවේද, දුරුකළ ඡන්දය ඇත්තේ වේද, දුරුකළ ප්‍රේමය ඇත්තේ වේද, දුරුකළ පිපාසය ඇත්තේ වේද, දුරුකළ දාහය ඇත්තේ වේද, දුරුකළ තෘෂ්ණාව ඇත්තේ වේද, ගෘහපතිය, මෙසේ වනාහි කාමයන්ගෙන් මිදුණේ නම් වෙයි.

18. "ගෘහපතිය, කෙසේ නම් සසර පෙරටුකොට ඇත්තේ නම් වේද, ගෘහපතිය, මේ ශාසනයෙහි ඇතැමෙකුට අනාගත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වන්නෙම්වා, මෙබඳු වේදනා ඇත්තෙක් වන්නෙම්වා, මෙබඳු සංඥා ඇත්තෙක් වන්නෙම්වා. මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙම්වා, මෙබඳුවූ විඥාන ඇත්තෙක් වන්නෙම්වායි මෙසේ අදහස් වෙයි. ගෘහපතිය, මෙසේ වනාහි සසර පෙරටුකොට ඇත්තේ නම් වෙයි.

19 "ගෘහපතිය, කෙසේ නම් සසර පෙරටුකොට නැත්තේ නම් වේද, ගෘහපතිය මේ ශාසනයෙහි ඇතැම් කෙනෙකුට අනාගත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වන්නෙම්වා, මෙබඳු වේදනා ඇත්තෙක් වන්නෙම්වා, මෙබඳු සංඥා ඇත්තෙක් වන්නෙම්වා, මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙම්වා, මෙබඳු විඤ්ඤාණ ඇත්තෙක් වන්නෙම්වායි. මෙසේ අදහස් නොවේද, ගෘහපතිය, මෙසේ වනාහි සසර පෙරටුකොට නැත්තේ නම් වෙයි.

20. "ගෘහපතිය, කෙසේනම් ජනයා සමග විරුද්ධ කථා කරන්නේ නම් වේද? ගෘහපතිය, මේ ශාසනයෙහි ඇතැමෙක් මෙවැනි කථා කරන්නේ වෙයි කෙසේද? 'නුඹ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දන්නෙමි. කිමෙක්ද නුඹ මේ ධර්ම විනය දන්නෙහිද, නුඹ වරදවා පිළිපන්නෙක් වෙහිය. මම මනාකොට පිළිපන්නෙක් වෙමි. පළමුව කියයුත්ත පසුව

කීයෙහිය. පසුව කියයුත්ත පළමුව කීයෙහිය. මාගේ වචනය සිළුටුය (මධුරය.) තාගේ වචනය අසිළුටුය (අමධුරය) තා විසින් බොහෝ කලක් පුරුදු කරනලද වාදය මාගේ වාදයට පැමිණ, ක්ෂණයකින් නවතින්නේය. මා විසින් තොපගේ දෝෂය නංවනලදී. මේ වාදයෙන් මිදෙනු පිණිස ගුරුන් සොයා යව. ඉදින් නිග්‍රහ කරන ලද්දේවෙහි, හැකි නම් ප්‍රශ්නය විසඳව' කියායි.

**21.** "ගෘහපතිය, මෙසේ වනාහි ජනයා සමග විරුද්ධ කථා කරන්නේ නම් වෙයි. ගෘහපතිය, කෙසේ නම් ජනයා සමග විරුද්ධ කථා නොකරන්නේ නම් වෙයිද?

"ගෘහපතිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම මෙසේ කථා නොකරන්නේ වෙයි කෙසේද? 'නුඹ මේ ධර්ම විනය නොදන්නෙහිය, මම මේ ධර්ම විනය දන්නෙමි. කිම, නුඹ මේ ධර්මවිනය දන්නෙහිද? නුඹ වරදවා පිළිපන්නේ වෙහිය. මම මනාකොට පිළිපන්නේ වෙමි. පළමුව කියයුත්ත පසුව කීවෙහිය. පසුව කියයුත්ත පළමුව කීවෙහිය. මාගේ වචනය සිළුටුය. තාගේ වචනය අසිළුටුය. තා විසින් බොහෝ කලක් පුරුදු කරන ලද්ද මාගේ වාදයට පැමිණ නවතියි. මා විසින් වාදය ආරොපනය කරනලදී. වාදයෙන් මිදෙනු පිණිස ගුරුන් කරා යව. නිග්‍රහ කරන ලද්දෙහි ඉදින් සමර්ථවෙහි නම් විසඳවයි' මෙබඳු කථා නොකරන්නේ වෙයි.

**22.** "ගෘහපතිය, මෙසේ වනාහි ජනයා සමග විරුද්ධ කථා නොකරන්නේ වෙයි. ගෘහපතිය, මෙසේ වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් අෂ්ටක වර්ගයෙහි මාගන්දිය ප්‍රශ්නයෙහි "ගෙය අත්හැර ගෙයි වාසය නොකරන්නාවූ, ගම හා එක්ව නොවසන්නාවූ, කාමයන් කෙරෙන් මිදුණාවූ, සසර පෙරටු කොට නැත්තාවූ, මහණ තෙමේ කෙසේ ජනයා සමග විරුද්ධ කථා නොකරන්නේද?" යන යම් වචනය වදාරන ලද්දේද, ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාළ මේ වචනයාගේ අර්ථය විස්තර වශයෙන් මෙසේ දතයුතු."

**(තුන්වෙනි හාලිද්දකානි සූත්‍රය නිමි.)**

---

## 4. හාලිද්දකානි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරයන් වහන්සේ අවන්ති ජනපදයෙහි කුරරඝර නගරයෙහි පවත්ත නම් පර්වතයෙහි වාසය කරති. එකල්හි හාලිද්දකානි නම් ගෘහපතිතෙම ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරයන් වහන්සේට වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක උන්නාවූ හාලිද්දකානි ගෘහපතිතෙම ආයුෂ්මත් මහාකච්චායන ස්ථවිරයන් වහන්සේට මේ කාරණය සැලකෙළේය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ශක්‍ර ප්‍රශ්නයේදී 'යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් මිදුණාහුද, ඔව්හු ඒකාන්ත නිෂ්ඨාවට පැමිණියාහු ඒකාන්තයෙන් යොගයන් ක්ෂය කළාහු, ඒකාන්ත බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තාහු, ඒකාන්ත කෙළවරට පැමිණියාහු, දිව්‍ය මනුෂ්‍යයන්ට ශ්‍රේෂ්ඨයෝ වෙත්' යන මෙය වදාරනලදී.

"ස්වාමීනි, භාග්‍යවත්හු විසින් සැකෙවින් වදාරණලද මේ වචනයාගේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දතයුතුදැයි" ඇසීය.

3. "ගෘහපතිය, රූප ස්කන්ධයෙහි වනාහි යම් ඡන්දයක් වේද, යම් රාගයක් වේද, යම් නන්දියක් වේද, යම් තණ්හාවක් වේද, යම් උපාය සහ උපාදානයෝ වෙද්ද, අකුසල් සිතට ස්ථානවූ අනුසයයෝ වෙත්ද, ඔවුන්ගේ ක්ෂයවීමෙන්ද, විරාගයෙන්ද, නිරෝධයෙන්ද, දුරු කිරීමෙන්ද, සිත මොනවට මිදුනේයයි කියනු ලැබේද?

4. "ගෘහපතිය, වේදනා ස්කන්ධයෙහි වනාහි යම් ඡන්දයක් වේද, යම් රාගයක් වේද, යම් නන්දියක් වේද, යම් තණ්හාවක් වේද, යම් උපාය සහ උපාදානයෝ වෙත්ද, අකුසල් සිතට ස්ථානවූ අනුසයයෝ වෙත්ද, ඔවුන්ගේ ක්ෂයවීමෙන්, විරාගයෙන්, නැතිකිරීමෙන්, අත්හැරීමෙන්, දුරු කිරීමෙන්, සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

**5.** "ගෘහපතිය, සංඥා ස්කන්ධයෙහි වනාහි යම් ඡන්දයක් වේද, යම් රාගයක් වේද, යම් නන්දියක් වේද, යම් තණ්හාවක් වේද, යම් උපාය සහ උපාදානයෝ වෙත්ද, අකුසල් සිතට ස්ථානවූ අනුසයයෝ වෙත්ද, ඔවුන්ගේ ක්ෂයවීමෙන්, විරාගයෙන්, නැති කිරීමෙන්, අත්හැරීමෙන්, දුරු කිරීමෙන්, සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

**6.** "ගෘහපතිය, සංස්කාර ස්කන්ධයෙහි වනාහි යම් ඡන්දයක් වේද, යම් රාගයක් වේද, යම් නන්දියක් වේද, යම් තණ්හාවක් වේද, යම් උපාය සහ උපාදානයෝ වෙත්ද, අකුසල් සිතට ස්ථානවූ අනුසයයෝ වෙත්ද, ඔවුන්ගේ ක්ෂයවීමෙන්, විරාගයෙන්, නැති කිරීමෙන්, අත්හැරීමෙන්, දුරු කිරීමෙන්, සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

**7.** 'ගෘහපතිය, විඥාන ස්කන්ධයෙහි යම් ඡන්දයක් වේද, යම් රාගයක් වේද, යම් නන්දියක් වේද, යම් තණ්හාවක් වේද, යම් උපාය සහ උපාදානයෝ වෙත්ද, අකුසල් සිතට ස්ථානවූ අනුසයයෝ වෙත්ද, ඔවුන්ගේ ක්ෂයවීමෙන්, විරාගයෙන්, නිරොධයෙන්, අත්හැරීමෙන්, දුරු කිරීමෙන්, සිත මොනවට මිදුනේයයි කියනු ලැබේ.

8. "යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තණ්හාව නැතිකිරීමෙන් මිදුණාහු වෙත්ද, ඔවුහු ඒකාන්ත නිෂ්ටාවට පැමිණියාහු, ඒකාන්තයෙන් යොගයන් ක්ෂය කළාහු, ඒකාන්ත බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තාහු, දෙව් මිනිසුන්ට ශ්‍රෙෂ්ඨයෝ වෙත් යන යම් වචනයක් භාග්‍යවතුන් වහන්සේ විසින් ශක්‍ර ප්‍රශ්නයේදී වදාළේද, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාළ මේ වචනයාගේ අර්ථ විස්තර වශයෙන් මෙසේ දතයුතු."

**(හතරවෙනි හාලිද්දකානි සූත්‍රය නිමි.)**

---

## 5. සමාධි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'ස්වාමීනි'යි කියා භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "මහණෙනි, සමාධිය වඩව්. මහණෙනි, වඩනලද සමාධිය ඇති භික්ෂුතෙමේ තත්වූ පරිද්දෙන් දැනගනියි. තත්වූ පරිද්දෙන් කුමක් දනීද? රූපයාගේ හටගැනීමද, විනාශයද; වේදනාවගේ හටගැනීමද, විනාශයද; සංඥාවගේ හටගැනීමද, විනාශයද; සංස්කාරයන්ගේ හටගැනීමද, විනාශයද, විඥානයාගේ හටගැනීමද, විනාශයද දනියි.

3. "මහණෙනි, රූපයාගේ හටගැනීම කුමක්ද? වේදනාවගේ හටගැනීම කුමක්ද? සංඥාවගේ හටගැනීම කුමක්ද? සංස්කාරයන්ගේ හටගැනීම කුමක්ද? විඥානයාගේ හටගැනීම කුමක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඇලෙයි, ප්‍රියයයි, මනාපයයි ප්‍රකාශ කරයි, ගැලී සිටියි. කුමක ඇලෙයිද? කුමක් ප්‍රියයයි, මනාපයයි කියයිද? කුමක ගැලී සිටියිද? රූපයෙහි ඇලෙයි. රූපය ප්‍රිය මනාපයයි කියයි. රූපයෙහි ගැලී සිටියි. රූපයෙහි ඇලෙන්නාවූ, රූපය ප්‍රියයයි මනාපයයි රූපයෙහි ගැලීසිටින්නාවූ ඔහුට බලවත් තෘෂ්ණාව උපදියි. රූපයෙහි යම් බලවත් තෘෂ්ණාවක් වේද, එය උපාදානය (තෘෂ්ණාවෙන් දැඩිකොට අල්වාගැනීම) වෙයි. ඔහුගේ උපාදානය හේතුකොටගෙන භවය වේ. භවය හේතුකොටගෙන ජාතිය ඇතිවේ. ජාතිය හේතුකොට ඇති ජරාව හා මරණයද, ශොක පරිදෙව, දුක්, දොම්නස් සහ උපායාසයෝ හටගනිත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක සමූහයාගේ හටගැනීම වේ.

4. "වේදනාවෙහි ඇලෙයි, වේදනාව ප්‍රියයයි මනාපයයි කියයි. වේදනාවෙහි ගැලී සිටියි. වේදනාවෙහි ඇලෙන්නාවූ,

වේදනාව ප්‍රියයයි මනාපයයි කියන්නාවූ, වේදනාවෙහි ගැලී සිටින්නාවූ, ඔහුට බලවත් තෘෂ්ණාව උපදියි. වේදනාවෙහි යම් බලවත් ඇලීමක් වේද, එය උපාදානයයි ඒ උපාදානය හේතුකොටගෙන භවය ඇතිවේ. භවය හේතුකොටගෙන ජාතිය ඇතිවේ. ජාතිය හේතුකොටගෙන ජරා මරණ දෙකද, ශොක, පරිදෙව, දුක්, දොම්නස් යන උපායාසයෝද හටගනිත්.

**5.** "සංඥාවෙහි ඇලෙයි. සංඥාව ප්‍රියයයි මනාපයයි කියයි. සංඥාවෙහි ගැලී සිටියි. සංඥාවෙහි ඇලෙන්නාවූ සංඥාව ප්‍රියයයි මනාපයයි කියන්නාවූ, සංඥාවෙහි ගැලී සිටින්නාවූ ඔහුට බලවත් තණ්හාව උපදියි. සංඥාවෙහි යම් බලවත් ඇලීමක් වේද, එය උපාදානයයි (තදින් අල්ලා ගැනීමයි.) ඒ උපාදානය හේතුකොටගෙන භවය ඇතිවේ. භවය හේතු කොටගෙන ජාතිය ඇතිවේ. මේ ජාතිය හේතුකොටගෙන ජරා මරණ දෙකද, සෝක, පරිදේව, දුක්, දොම්නස් යන උපායාසයෝ හටගනිත්.

**6.** "සංස්කාරයන්හි ඇලෙයි. සංස්කාරයන් ප්‍රියයයි මනාපයයි කියයි. සංස්කාරයන්හි ගැලී සිටියි. සංස්කාරයන්හි ඇලෙන, සංස්කාරයන් ප්‍රියයයි මනාපයයි කියන්නාවූ, සංස්කාරයන්හි ගැලී සිටින්නාවූ, ඔහුට බලවත් තෘෂ්ණාව උපදියි. සංස්කාරයන්හි යම් බලවත් තෘෂ්ණාවක් වේද? එය උපාදානයයි. උපාදානය හේතුකොටගෙන භවය වේ. භවය හේතුකොටගෙන ජාතිය වේ. ජාතිය හේතුකොටගෙන ජරා මරණ දෙකද, ශෝක, පරිදෙව, දුක්, දොම්නස් සහ උපායාසයෝ හටගනිත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුඃඛ සමූහයාගේ පහළවීම වේ.

**7.** "විඤ්ඤාණයෙහි ඇලෙයි. විඤ්ඤාණය ප්‍රියයයි මනාපයයි කියයි. විඤ්ඤාණයෙහි ගැලීසිටියි. විඤ්ඤාණයෙහි ඇලෙන්නාවූ, විඤ්ඤාණය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ, විඤ්ඤාණයෙහි ගැලී සිටින්නාවූ, ඔහුට බලවත් තෘෂ්ණාව උපදියි. විඤ්ඤාණයෙහි යම් බලවත් තෘෂ්ණාවක් වේද? එය උපාදානයයි. ඔහුට උපාදානය හේතුකොටගෙන භවය වේ. භවය හේතුකොටගෙන ජාතිය වේ. ජාතිය හේතුකොටගෙන ජරා මරණ දෙකද, ශෝක, පරිදෙව, දුක්, දොම්නස් සහ

උපායාසයෝද හටගනිත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුඃඛ රාශියගේ හටගැනීම වෙයි.

"මහණෙනි, මේ වනාහි රූපයාගේ හටගැනීම වෙයි. මේ වේදනාවගේ හටගැනීම වෙයි. මේ සංඥාවගේ හටගැනීම වෙයි. මේ විඥානයාගේ හටගැනීම වෙයි.

8. "මහණෙනි, රූපයාගේ නැතිවීම කවරේද? වේදනාවගේ නැතිවීම කවරේද? සංඥාවගේ නැතිවීම කවරේද? සංස්කාරයන්ගේ නැතිවීම කවරේද? විඤ්ඤාණයාගේ නැතිවීම කවරේද?

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නොඇලෙයි. ප්‍රියයයි මනාපයයි නොකියයි. ගැලී නොසිටියි. කුමක නො ඇලෙයිද, කුමක් ප්‍රියයයි මනාපයයි නොකියයිද, කුමක ගැලී නොසිටීද? රූපයෙහි නොඇලෙයි. රූපය ප්‍රියයයි මනාපයයි නොකියයි. රූපයෙහි ගැලී නොසිටියි. රූපයෙහි නොඇලෙන්නාවූ, රූපය ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ, රූපයෙහි ගැලී නොසිටින්නාවූ, ඔහුට රූපයෙහි යම් බලවත් තෘෂ්ණාවක් වේද, එය නැති වෙයි. ඔහුගේ බලවත් තණ්හාව නැතිවීම හේතුකොටගෙන උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීම හේතුකොට ගෙන භවය නැතිවේ. භවය නැතිවීම හේතුකොටගෙන ජාතිය නැතිවේ. ජාතිය නැතිවීම හේතුකොටගෙන ජරා මරණ දෙකද, ශෝක, පරිදෙව, දුක්, දොම්නස් සහ උපායාසයෝද නිරුද්ධ වෙති. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක්ඛ සමූහයාගේ නිරොධය වේ.

9. "වේදනාවෙහි නොඇලෙයි. වේදනාව ප්‍රියයයි මනාපයයි නොකියයි. වේදනාවෙහි ගැලී නොසිටියි. වේදනාවෙහි නො ඇලෙන්නාවූ, වේදනාව ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ, වේදනාවෙහි ගැලී නොසිටින්නාවූ, ඔහුගේ වේදනාව කෙරෙහි යම් බලවත් තණ්හාවක් වේද, එය නැති වෙයි. ඔහුගේ ඒ බලවත් තණ්හාව නැතිවීමෙන් උපාදානය (තදින් අල්ලාගැනීම) නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය

නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා මරණ දෙකද, සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහයාගේ නැතිවීම වෙයි.

10. "සංඥාවෙහි නොඇලෙයි. සංඥාව ප්‍රියයයි මනාපයයි නොකියයි. සංඥාවෙහි ගැලී නොසිටියි. සංඥාවෙහි නොඇලෙන්නාවූ, සංඥාව ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ, සංඥාවෙහි ගැලී නොසිටින්නාවූ, ඔහුගේ සංඥාව කෙරෙහි යම් බලවත් තණ්හාවක් වේද, එය නැතිවෙයි. ඔහුගේ ඒ බලවත් තණ්හාව නැතිවීමෙන් උපාදානය (තදින් අල්ලාගැනීම) නැති වෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවේ ඉපදීම නැතිවීමෙන් ජරා මරණ දෙකද, සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහයාගේ නැතිවීම වෙයි.

11. "සංස්කාරයන්හි නොඇලෙයි. සංස්කාර ප්‍රියයයි මනාපයයි නොකියයි. සංස්කාරයන්හි ගැලී නොසිටියි. සංස්කාරයෙහි නොඇලෙන්නාවූ, සංස්කාර ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ, සංස්කාරයෙහි ගැලී නොසිටින්නාවූ, ඔහුගේ සංස්කාර කෙරෙහි යම් බලවත් තණ්හාවක් වේද, එය නැති වෙයි. ඔහුගේ ඒ බලවත් තණ්හාව නැතිවීමෙන් උපාදානය (තදින් අල්ලාගැනීම) නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා මරණ දෙකද, සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහයාගේ නැතිවීම වෙයි.

12. "විඤ්ඤාණයෙහි නොඇලෙයි. විඤ්ඤාණය ප්‍රියයයි මනාපයයි නොකියයි. විඤ්ඤාණයෙහි ගැලී නොසිටියි. විඤ්ඤාණයෙහි නොඇලෙන්නාවූ, විඤ්ඤාණය ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ, විඤ්ඤාණයෙහි ගැලී නොසිටින්නාවූ, ඔහුගේ විඤ්ඤාණය කෙරෙහි යම් බලවත් තෘෂ්ණාවක් වේද, එය නිරුද්ධ වෙයි. ඔහුගේ ඒ බලවත් තෘෂ්ණාව

නිරුද්ධවීමෙන් උපාදානය නිරුද්ධ වේ. උපාදානය නිරුද්ධවීමෙන් භවය නිරුද්ධ වේ. භවය නිරුද්ධ වීමෙන් ජාතිය නිරුද්ධ වේ. ජාතිය නිරුද්ධ වීමෙන් ජරා මරණ දෙකද, සෝක, පරිදෙව, දුක්, දොම්නස් සහ උපායාසයෝද නිරුද්ධ වෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුඃඛ සමූහයාගේ නිරොධය වෙයි.

"මහණෙනි, මේ රූපයාගේ විනාශය වෙයි. මේ වේදනාවගේ විනාශය වෙයි. මේ සංඥාවගේ විනාශය වෙයි. මේ සංස්කාරයන්ගේ විනාශය වෙයි. මේ විඥ්ඥාණයාගේ විනාශය වෙයි.

**(පස්වෙනි සමාධි සූත්‍රය නිමි.)**

---

## 6 පටිසල්ලාණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. ඒ භික්ෂූහු 'ස්වාමීනි'යි කියා භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

"මහණෙනි, විවේකව සිටීමට උත්සාහ කරව්. මහණෙනි, විවේකීව සිටින මහණතෙම තත්වාකාරයෙන් දනියි.

2. "මහණෙනි, විවේකීව සිටීමට උත්සාහ කරව්. මහණෙනි, විවේකව සිටින භික්ෂුතෙමේ තත්වූ පරිද්දෙන් දැනගනියි. තත්වූ පරිද්දෙන් කුමක් දනීද? රූපයාගේ හටගැනීමද, විනාශයද, වේදනාවගේ හටගැනීමද, විනාශයද, සංඥාවගේ හටගැනීමද, විනාශයද, සංස්කාරයන්ගේ හටගැනීමද, විනාශයද, විඥානයාගේ හටගැනීමටද, විනාශයද දනියි.

3. "මහණෙනි, රූපයාගේ හටගැනීම කුමක්ද? වේදනාවගේ හටගැනීම කුමක්ද? සංඥාවගේ හටගැනීම කුමක්ද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

සංස්කාරයන්ගේ හටගැනීම කුමක්ද? විඥානයාගේ හටගැනීම කුමක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඇලෙයි ප්‍රියයයි, මනාපයයි ප්‍රකාශ කරයි, ගැලී සිටියි. කුමක ඇලෙයිද? කුමක් ප්‍රියයයි, මනාපයයි කියයිද? කුමක ගැලී සිටියිද? රූපයෙහි ඇලෙයි. රූපය ප්‍රිය මනාපයයි කියයි. රූපයෙහි ගැලී සිටියි. රූපයෙහි ඇලෙන්නාවූ, රූපය ප්‍රියයයි, මනාප යයි රූපයෙහි ගැලීසිටින්නාවූ ඔහුට බලවත් තෘෂ්ණාව උපදියි. රූපයෙහි යම් බලවත් තෘෂ්ණාවක් වේද, එය උපාදානය (තෘෂ්ණාවෙන් දැඩිකොට අල්වාගැනීම) වෙයි. ඔහුගේ උපාදානය හේතුකොටගෙන භවය ඇතිවේ. භවය හේතුකොටගෙන ජාතිය ඇතිවේ. ජාතිය හේතුකොට ජරාව හා මරණයද, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ හටගනිත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහයා ගේ හටගැනීමවේ.

4. "වේදනාවෙහි ඇලෙයි, වේදනාව ප්‍රියයයි, මනාපයයි කියයි. වේදනාවෙහි ගැලී සිටියි. වේදනාවෙහි ඇලෙන්නාවූ, වේදනාව ප්‍රියයයි. මනාපයයි කියන්නාවූ, වේදනාවෙහි ගැලී සිටින්නාවූ, ඔහුට බලවත් තෘෂ්ණාව උපදියි. වේදනාවෙහි යම් බලවත් ඇලීමක් වේද, එය උපාදානයයි. ඒ උපාදානය හේතුකොටගෙන භවය ඇතිවේ භවය හේතුකොට ගෙන ජාතිය ඇතිවේ. ජාතිය හේතුකොට ගෙන ජරා, මරණ, දෙකද, ශොක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝද හටගනිත්.

5. "සංඥාවෙහි ඇලෙයි. සංඥාව ප්‍රියයයි, මනාපයයි කියයි. සංඥාවෙහි ගැලී සිටියි. සංඥාවෙහි ඇලෙන්නාවූ, සංඥාව ප්‍රියයයි, මනාපයයි කියන්නාවූ, සංඥාවෙහි ගැලී සිටින්නාවූ ඔහුට බලවත් තණ්හාව උපදියි. සංඥාවෙහි යම් බලවත් ඇලීමක් වේද, එය උපාදානයයි (තදින් අල්ලා ගැනීමයි.) ඒ උපාදානය හේතුකොටගෙන භවය ඇතිවේ. භවය හේතුකොටගෙන ජාතිය ඇතිවේ මේ ජාතිය හේතුකොට ගෙන ජරා මරණ දෙකද සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ හටගනිත්.

6. "සංස්කාරයන්හි ඇලෙයි. සංස්කාරයන් ප්‍රියයයි, මනාපයයි කියයි. සංස්කාරයන්හි ගැලී සිටියි. සංස්කාරයන්හි

ඇලෙන, සංස්කාරයන් ප්‍රියයයි මනාපයයි කියන්නාවූ, සංස්කාරයන්හි ගැලී සිටින්නාවූ, ඔහුට බලවත් තෘෂ්ණාව උපදියි. සංස්කාරයන්හි යම් බලවත් තෘෂ්ණාවක් වේද? එය උපාදානයයි. උපාදානය හේතුකොටගෙන භවය ඇතිවේ. භවය හේතුකොටගෙන ජාතිය ඇතිවේ. ජාතිය හේතුකොට ගෙන ජරා මරණ දෙකද, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ හටගනිත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුඃඛ සමූහයාගේ පහළවීම වේ.

7. "විඤ්ඤාණයෙහි ඇලෙයි. විඤ්ඤාණය ප්‍රියයයි මනාපයයි කියයි. විඤ්ඤාණයෙහි ගැලීසිටියි. විඤ්ඤාණයෙහි ඇලෙන්නාවූ, විඤ්ඤාණය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ, විඤ්ඤාණයෙහි ගැලී සිටින්නාවූ, ඔහුට බලවත් තෘෂ්ණාව උපදියි. විඤ්ඤාණයෙහි යම් බලවත් තෘෂ්ණාවක් වේද? එය උපාදානයයි. ඔහුට උපාදානය හේතුකොටගෙන භවය ඇතිවේ. භවය හේතුකොටගෙන ජාතිය ඇතිවේ. ජාතිය හේතුකොටගෙන ජරා මරණ දෙකද, ශෝක, පරිදෙව, දුක් දොම්නස් සහ උපායාසයෝද හටගනිත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුඃඛ රාශියාගේ හටගැනීම වෙයි.

"මහණෙනි, මේ වනාහි රූපයාගේ හටගැනීම වෙයි. මේ වේදනාවගේ හටගැනීම වෙයි. මේ සංඥාවගේ හටගැනීම වෙයි. මේ විඥානයාගේ හටගැනීම වෙයි.

8. "මහණෙනි, රූපයාගේ නැතිවීම කවරේද? වේදනාවගේ නැතිවීම කවරේද? සංඥාවගේ නැතිවීම කවරේද? සංස්කාරයන්ගේ නැතිවීම කවරේද? විඤ්ඤාණයාගේ නැතිවීම කවරේද?

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නොඇලෙයි. ප්‍රියයයි මනාපයයි නොකියයි. ගැලී නොසිටියි. කුමක නොඇලෙයිද, කුමක් ප්‍රියයයි මනාපයයි නොකියයිද, කුමක ගැලී නොසිටීද? රූපයෙහි නොඇලෙයි. රූපය ප්‍රියයයි මනාපයයි නොකියයි. රූපයෙහි ගැලී නොසිටියි. රූපයෙහි

නොඇලෙන්නාවූ රූපය ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ, රූපයෙහි ගැලී නොසිටින්නාවූ, ඔහුට රූපයෙහි යම් බලවත් තෘෂ්ණාවක් වේද, එය නැති වෙයි. ඔහුගේ බලවත් තණ්හාව නැතිවීම හේතුකොටගෙන උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීම හේතුකොටගෙන භවය නැතිවේ. භවය නැතිවීම හේතුකොටගෙන ජාතිය නැතිවේ. ජාතිය නැතිවීම හේතුකොටගෙන ජරාමරණ දෙකද, ශෝක, පරිදෙව, දුක්, දොම්නස් සහ උපායාසයෝද නිරුද්ධ වෙති. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක්ඛ සමූහයාගේ නිරොධය වේ.

9. "වේදනාවෙහි නොඇලෙයි. වේදනාව ප්‍රියයයි මනාපයයි නොකියයි. වේදනාවෙහි ගැලී නොසිටියි. වේදනාවෙහි නොඇලෙන්නාවූ, වේදනාව ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ, වේදනාවෙහි ගැලී නොසිටින්නාවූ, ඔහුගේ වේදනාව කෙරෙහි යම් බලවත් තණ්හාවක් වේද, එය නැති වෙයි. ඔහුගේ ඒ බලවත් තණ්හාව නැතිවීමෙන් උපාදානය (තදින් අල්ලාගැනීම) නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා මරණ දෙකද, සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහයාගේ නැතිවීම වෙයි.

10. "සංඥාවෙහි නොඇලෙයි. සංඥාව ප්‍රියයයි මනාපයයි නොකියයි. සංඥාවෙහි ගැලී නොසිටියි. සංඥාවෙහි නොඇලෙන්නාවූ, සංඥාව ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ, සංඥාවෙහි ගැලී නොසිටින්නාවූ, ඔහුගේ සංඥාව කෙරෙහි යම් බලවත් තණ්හාවක් වේද, එය නැතිවෙයි. ඔහුගේ ඒ බලවත් තණ්හාව නැතිවීමෙන් උපාදානය (තදින් අල්ලාගැනීම) නැති වෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැති වීමෙන් ජාතිය (ඉපදීම) නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා මරණ දෙකද, සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහයාගේ නැතිවීම වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

11. "සංස්කාරයන්හි නොඇලෙයි. සංස්කාර ප්‍රියයයි මනාපයයි නොකියයි. සංස්කාරයන්හි ගැලී නොසිටියි. සංස්කාරයෙහි නොඇලෙන්නාවූ, සංස්කාර ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ, සංස්කාරයෙහි ගැලී නොසිටින්නාවූ, ඔහුගේ සංස්කාර කෙරෙහි යම් බලවත් තණ්හාවක් වේද, එය නැති වෙයි. ඔහුගේ ඒ බලවත් තණ්හාව නැතිවීමෙන් උපාදානය (තදින් අල්ලාගැනීම) නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවේ. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම) නැතිවේ. ඉපදීම නැතිවීමෙන් ජරා මරණ දෙකද, සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුක් සමූහයාගේ නැතිවීම වෙයි.

12. "විඤ්ඤාණයෙහි නොඇලෙයි. විඤ්ඤාණය ප්‍රියයයි මනාපයයි නොකියයි. විඤ්ඤාණයෙහි ගැලී නොසිටියි. විඤ්ඤාණයෙහි නොඇලෙන්නාවූ, විඤ්ඤාණය ප්‍රියයයි මනාප යයි නොකියන්නාවූ, විඤ්ඤාණයෙහි ගැලී නොසිටින්නාවූ, ඔහුගේ විඤ්ඤාණය කෙරෙහි යම් බලවත් තෘෂ්ණාවක් වේද, එය නිරුද්ධවෙයි. ඔහුගේ ඒ බලවත් තෘෂ්ණාව නිරුද්ධවීමෙන් උපාදානය නිරුද්ධ වේ. උපාදානය නිරුද්ධවීමෙන් භවය නිරුද්ධ වේ. භවය නිරුද්ධ වීමෙන් ජාතිය නිරුද්ධ වේ. ජාතිය නිරුද්ධ වීමෙන් ජරා මරණ දෙකද, සොක, පරිදෙව, දුක්, දොම්නස් සහ උපායාසයෝද නිරුද්ධ වෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුඃඛ සමූහයාගේ නිරොධය වෙයි.

"මහණෙනි, මේ රූපයාගේ විනාශය වෙයි. මේ වේදනාවගේ විනාශය වෙයි. මේ සංඥාවගේ විනාශය වෙයි. මේ සංස්කාරයන්ගේ විනාශය වෙයි මේ විඤ්ඤාණයාගේ විනාශය වෙයි.

**(හයවෙනි පටිසල්ලාණ සූත්‍රය නිමි.)**

---

## 7. උපාදාපරිතස්සන සූත්‍රය 1.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, තොපට මමය මාගේයයි ගැනීමෙන් වන භයද මමය මාගේයයි නොගැනීමෙන් වන භය දුරුවීමද දෙශනා කරන්නෙමි. එය මනාකොට අසව්, මෙනෙහි කරව්, කියන්නෙමි." ඒ භික්ෂූහු "එසේය, ස්වාමීනි" භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. "මහණෙනි, කෙසේ නම් මමය මාගේයයි ගැනීමෙන් වන භය ඇතිවේද?

3. "මහණෙනි, මේ ලොකයෙහි ආර්‍ය්‍යයන් නොදක්නාවූ, ආර්‍ය්‍යධර්මයෙහි අදක්ෂවූ ආර්‍ය්‍යධර්මයෙහි නොහික්මුනාවූ, සත්පුරුෂයන් නොදක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම රූපස්කන්ධය මමයයි දකී. රූපසහිතවූවක් හෝ මම යයි දකී. මා කෙරෙහි හෝ රූපස්කන්ධය ඇතැයි දකී. රූපස්කන්ධය කෙරෙහි හෝ මා ඇතැයි දකී. ඔහුගේ ඒ රූපස්කන්ධය වෙනස්වෙයි. අන් අයුරකට පෙරළෙයි. ඔහුගේ රූපය වෙනස්වීම අන් ආකාරයකට පෙරළීම හෙතුකොට ගෙන රූපය පෙරළීමට අනුව පෙරලුණු විඥ්ඥාණයක් වෙයි. ඔහුගේ රූපස්කන්ධය වෙනස්වීම නිසා වෙනස්වූ විඥ්ඥාණයයෙන් උපන් තෘෂ්ණා භය වන අකුශල ධර්මයෝ කුසල් සිත මැඩගෙන සිටිත්. කුසල් සිත මැඩපැවැත්වීම හෙතුකොට ගෙන භය සහිත වූයේද වෙයි. ආලය සහිත වූයේද වෙයි. තෘෂ්ණාවෙන් ගැනීම නිසා භයට පැමිණෙයි. අල්ලාගෙන සිටිති. වේදනාව මමයයි දකියි. වේදනා සහිතවූවක් හෝ මමයයි දකියි. මා කෙරෙහි හෝ වේදනාව ඇතැයි දකියි. වේදනාවෙහි හෝ මම ඇතැයි දකියි. ඔහුගේ ඒ

වේදනාව වෙනස්වෙයි. අන් අයුරකට පැමිණෙයි. වේදනාව වෙනස්වීම අන්අයුරකට පැමිණීම හෙතුකොටගෙන ඔහුගේ සිතද වේදනා පරිවර්තනයට අනුව පරිවර්තනයවෙයි. වේදනාවට අනුව පරිවර්තනයවූ සිතින් හට ගත් තෘෂ්ණා භයවන අකුශල ධර්මයෝ ඔහුගේ කුසල් සිත මැඩගෙන සිටිත්. කුශල චිත්තයාගේ මැඩපැවැත්වීම හෙතු කොටගෙන භය සහිත වූයේද වෙයි. දුක්සහිත වූයේද වෙයි. ආලය සහිත වූයේද වෙයි. තෘෂ්ණාවෙන් ගැනීම නිසා භය වන්නේය."

4. "සංඥාව මමයයි දකියි. සංඥා සහිතවූවක් හෝ මමයයි දකියි මා කෙරෙහි හෝ සංඥාව ඇතැයි දකියි. සංඥාවෙහි හෝ මම ඇතැයි දකියි. ඔහුගේ ඒ සංඥාව වෙනස්වෙයි. අන් අයුරකට පැමිණෙයි. සංඥාව වෙනස්වීම අන්අයුරකට පැමිණීම අනුව විඥ්ඥාණයද වෙනස්වේ. සංඥාවට අනුව පරිවර්තනයවූ, විඥ්ඥාණයෙන් හටගත් තණ්හා සහ භය යන අකුසලධර්මයෝ ඔහුගේ කුසල් සිත මැඩගෙන සිටිත්. කුසල චිත්තයාගේ මැඩ පැවැත්වීම හේතුකොටගෙන භය සහිතවූයේද වෙයි. දුක්සහිතවූයේද වෙයි. ආලය සහිතවූයේද වෙයි. තණ්හාවෙන් ගැනීම හේතුකොටගෙන භයට පැමිණෙන්නේද වෙයි.

5. "සංස්කාරයන් මමයයි දකියි සංස්කාර ඇත්තක්හු හෝ මමයයි දකියි. සංස්කාර මාකෙරෙහි ඇතැයි හෝ දකියි. සංස්කාරයන්හි මම ඇතැයි හෝ දකියි. ඔහුගේ ඒ සංස්කාරයෝ වෙනස්වෙත්. අන් අයුරකට පැමිණෙත් සංස්කාරයන්ගේ වෙනස්වීම අන් අයුරකට පැමිණීම හෙතු කොටගෙන සංස්කාරයන්ගේ වෙනස්වීම අනුව විඥ්ඥාණයද වෙනස්වේ. සංස්කාරයන්ගේ වෙනස්වීමට අනුව වෙනස්වූ විඥ්ඥාණයෙන් උපන් තෘෂ්ණා භයවන අකුශල ධර්මයෝ කුසල් සිත මැඩගෙන සිටිත්. කුසල් සිත මැඩපැවැත්වීම හෙතුකොටගෙන භය සහිත වූයේද වෙයි. දුක් සහිත වූයේද වෙයි. ආලය සහිත වූයේද වෙයි. තෘෂ්ණාවෙන් ගැනීම හෙතුකොටගෙන භයට පැමිණෙන්නේද වෙයි.

6. "විඥානය මමයයි දකියි. විඥානය ඇත්තහු හෝ මමයයි දකියි. මා කෙරෙහි හෝ විඥානය ඇතැයි දකියි. විඥානයෙහි හෝ මම ඇතැයි දකියි. ඔහුගේ ඒ විඥානය වෙනස්වෙයි. අන් අයුරකට පැමිණෙයි. විඥානයාගේ වෙනස්වීම පෙරළීම නිසා ඔහුගේ සිතද විඥානය අනුව පෙරළෙන්නේ වෙයි. විඤ්ඤාණයාගේ පෙරලීමට අනුව පෙරලුණු සිතින් උපන් තෘෂ්ණා භයවන අකුශල ධර්මයෝ ඔහුගේ කුසල් සිත මැඩගෙන සිටිත්. කුසල් සිත මැඩපැවැත්වීම හෙතුකොටගෙන භය සහිත වූයේද වෙයි. දුක් සහිත වූයේද වෙයි ආලය සහිතවූයේද වෙයි. තෘෂ්ණාවෙන් ගැනීම නිසා භයට පැමිණෙන්නේද වෙයි.

7. "මහණෙනි, මෙසේ වනාහි තෘෂ්ණාවෙන් ගැනීම නිසා වන භය ඇතිවෙයි. මහණෙනි, කෙසේ නම් තෘෂ්ණාවෙන් නොගැනීම නිසා භය ඇති නොවන්නේද? මහණෙනි, මේ ලොකයෙහි ආර්‍ය්‍යයන් දක්නාවූ ආර්‍ය්‍යධර්මයෙහි දක්ෂවූ ආර්‍ය්‍ය ධර්මයෙහි හික්මුනාවූ සත්පුරුෂයන් දක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි හික්මුනාවූ බහුශ්‍රැතවූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ රූපස්කන්ධය මමයයි නොදකියි. රූපස්කන්ධය ඇත්තහු හෝ මමයයි නොදකියි. මා කෙරෙහි හෝ රූපස්කන්ධය ඇතැයි නොදකියි. රූපස්කන්ධය කෙරෙහි හෝ මම ඇතැයි නොදකියි. ඔහුගේ ඒ රූපය විනාශවෙයි. අන්අයුරකට පැමිණෙයි. ඔහුගේ රූපය වෙනස්වීම හෙතුකොට ඔහුගේ විඤ්ඤාණයද රූපය වෙනස් වීමට අනුව වෙනස් නොවන්නේ වෙයි. ඔහුගේ රූපය වෙනස් වීමට අනුව වෙනස්වීමෙන් උපදනා තෘෂ්ණා භයවන අකුශල ධර්මයෝ කුසල් සිත මැඩගෙන නොසිටිත්. කුසල් සිත මැඩ නොපැවැත්වීම නිසා භය සහිත වන්නේ නොවෙයි. දුක් සහිත වන්නේ නොවෙයි. ආලය සහිත වන්නේ නොවෙයි. තෘෂ්ණාවෙන් නොගැනීම නිසා භයට නොපැමිණෙන්නේය.

8. "වේදනාව මමයයි නොදකියි. වේදනා ඇත්තහු හෝ මමයයි නොදකියි. මා කෙරෙහි හෝ වේදනාව ඇතැයි නොදකියි. වේදනාව කෙරෙහි හෝ මම ඇතැයි නොදකියි.

ඔහුගේ ඒ වේදනාව වෙනස්වෙයි. පෙරලෙයි. ඔහුගේ වේදනාව වෙනස්වීම පෙරලීම හෙතුකොටගෙන විඤ්ඤාණයද වේදනාවට අනුව වෙනස් නොවෙයි. වේදනාව වෙනස්වීමට අනුව වෙනස්වීමෙන් උපදනා තෘෂ්ණා භයවන අකුශල ධර්මයෝ කුසල් සිත නොමැඩ පවත්වයි. කුසල් සිත නොමැඩ පැවැත්වීම නිසා භය සහිත වන්නේද නොවෙයි. දුක්සහිත වන්නේද නොවෙයි. ආලය සහිත වන්නේද නොවෙයි. තෘෂ්ණාවෙන් නොගැනීම නිසා භය නැත්තේද වෙයි.

**9.** "සංඥාව ඇත්තහු හෝ මමයයි නොදකියි. සංඥාව ඇත්තහු හෝ මමයයි නොදකියි. මා කෙරෙහි හෝ සංඥාව ඇතැයි නොදකියි. සංඥාව කෙරෙහි හෝ මම ඇතැයි නොදකියි. ඔහුගේ ඒ සංඥාව වෙනස්වෙයි පෙරලෙයි. ඔහුගේ සංඥාව වෙනස්වීම, පෙරලීම හේතුකොටගෙන විඤ්ඤාණයද සංඥාව අනුව වෙනස් නොවෙයි. ඔහුගේ සංඥාව වෙනස්වීමට අනුව වෙනස්වීමෙන් උපදනා තණ්හා භය වන අකුසල ධර්මයෝ කුසල් සිත නොමැඩ පවත්වයි. කුසල් සිත නොමැඩ පැවැත්වීම නිසා භය සහිත වන්නේද නොවෙයි. දුක් සහිත වන්නේද නොවෙයි. ආලය සහිත වන්නේද නොවෙයි. තණ්හාවෙන් නොගැනීම නිසා භය නැත්තේද වෙයි.

**10.** "සංස්කාරයන් මමයයි නොදකියි. සංස්කාර ඇත්තහු හෝ මමයයි නොදකියි. මා කෙරෙහි හෝ සංස්කාර ඇතැයි නොදකියි. සංස්කාරයන් කෙරෙහි හෝ මම ඇතැයි නොදකියි. ඔහුගේ ඒ සංස්කාරයෝ වෙනස්වෙයි. අන් අයුරකට පැමිණෙයි. ඔහුගේ ඒ සංස්කාර වෙනස්වීම් අන් ආකාරයකට පෙරලීම හෙතුකොටගෙන විඤ්ඤාණයද සංස්කාරයන්ගේ පෙරලීමට අනුව පෙරලෙන්නේ නොවේ. සංස්කාරයන් පෙරලීමට අනුව වෙනස් වීමෙන් හටගත් තෘෂ්ණා භය වන අකුශල ධර්මයෝ ඔහුගේ කුසල් සිත මැඩගෙන නොසිටිත්. කුසල් සිත නොමැඩ පැවැත්වීම හෙතුකොටගෙන භය සහිත වූයේද නොවෙයි. දුක් සහිතවූයේද නොවෙයි. ආලය සහිත වූයේද නොවෙයි. තෘෂ්ණාවෙන් නොගැනීම නිසා භයට නොපැමිණෙන්නේද වෙයි.

11. "විඥානය මමයයි නොගනියි. මා කෙරෙහි හෝ විඥානය නොවේයයි නොදකියි. විඥානයෙහි හෝ මම ඇතැයි නොදනියි. ඔහුගේ ඒ විඥානය වෙනස්වෙයි. අන්අයුරකට පැමිණෙයි. ඔහුගේ විඥානය වෙනස්වීම අන්අයුරකට පැමිණීම හෙතුකොටගෙන විඤ්ඤාණය වෙනස්වීමට අනුව සිත වෙනස් නොවෙයි. විඤ්ඤාණය වෙනස්වීමට අනුව වෙනස්වීමෙන් උපදනා තෘෂ්ණාව භය අකුශල ධර්මයෝ ඔහුගේ කුසල් සිත මැඩගෙන නොසිටිත්. කුසල් සිත නොමැඩ පැවැත්වීම හෙතුකොටගෙන භය සහිතවූයේද නොවෙයි. දුක් සහිතවූයේද නොවෙයි. ආලය සහිතවූයේද නොවෙයි. තෘෂ්ණාවෙන් නොගැනීම නිසා භයට පැමිණෙන්නේද නොවෙයි. මහණෙනි, මෙසේ වනාහි තෘෂ්ණාවෙන් නොගැනීම නිසා භය ඇතිවන්නේ නොවෙයි."

**(සත්වෙනි උපාදාපරිතස්සන සූත්‍රය 1. නිමි.)**

---

## 8. උපාදාපරිතස්සන සූත්‍රය. 2.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, තොපට දැඩිසේ ගැනීමෙන් තණ්හාවෙන් වෙන භයද, දැඩිසේ නොගැනීමෙන් වන නිර්භයද දේශනා කරන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමි.

"මහණෙනි, කෙසේනම් දැඩිසේ ගැනීමෙන් වන භයවේද? මහණෙනි, මේ ලෝකයෙහි අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ මේ රූපය මගේය මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයයි රූපය දකියිද ඔහුගේ ඒ රූපය වෙනස්වෙයි. අන් ආකාරයකට

පෙරළෙයි. ඕහට රූපයාගේ වෙනස්වීම අන් ආකාරයකට පෙරලීම නිසා සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ උපදිත්.

3. "මේ වේදනාව මගේය. මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයයි වේදනාව දකියිද, ඔහුගේ ඒ වේදනාව වෙනස් වෙයි. පෙරලෙයි. ඕහට වේදනාව වෙනස්වීම පෙරලීම හෙතුකොට ගෙන ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ උපදිත්.

4 "මේ සංඥාව මගේය. මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයයි. සංඥාව දකියිද, ඔහුගේ ඒ සංඥාව වෙනස් වෙයි. පෙරළෙයි. ඔහුට සංඥාවේ වෙනස්වීම, පෙරලීම හේතු කොට ගෙන සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ උපදිත්.

5. "මේ සංස්කාරයෝ මගේය. මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයයි සංස්කාරයන් දකියිද, ඔහුගේ ඒ සංස්කාරයෝ වෙනස් වෙත්. පෙරළෙත්. ඕහට සංස්කාරයන්ගේ වෙනස්වීමෙන් පෙරළීමෙන් ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ උපදිත්.

6. "මේ විඥානයෝ මගේය මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයයි විඥානය දකියිද, ඒ විඥානය වෙනස් වෙයි. පෙරළෙයි. ඕහට විඥානයාගේ වෙනස්වීමෙන් පෙරළීමෙන් ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ උපදිත්.

7. "මහණෙනි, මෙසේ වනාහි ගැනීම හේතුකොටගෙන භය ඇතිවෙයි, මහණෙනි, කෙසේනම් දැඩිව නොගැනීම හේතු කොට ගෙන නිර්භය වේද, මහණෙනි, මේ ලෝකයෙහි ශ්‍රැතවත් ආයර්‍ය්‍යශ්‍රාවකතෙමේ මෙය මාගේ නොවේය. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේ යයි රූපය දකියි ඔහුගේ ඒ රූපය වෙනස්වෙයි. පෙරළෙයි. ඕහට රූපයාගේ වෙනස්වීමෙන් පෙරලීමෙන් සෝක, පරිදේව, දුක් දොම්නස් සහ උපායාසයෝ නූපදිත්.

8. "මෙය මගේ නොවේය මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි වේදනාව දකියිද ඔහුගේ ඒ වේදනාව

වෙනස්වෙයි. පෙරළෙයි. ඔහුට වේදනාවගේ වෙනස්වීමෙන්, පෙරළීමෙන් ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නූපදිත්.

9. "මෙය මගේ නොවේය. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි සංඥාව දකියිද, ඔහුගේ ඒ සංඥාව වෙනස්වෙයි පෙරළෙයි. ඔහුට සංඥාවේ වෙනස්වීමෙන් පෙරළීමෙන් ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නූපදිත්.

10. "මෙය මගේ නොවේය. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි සංස්කාරයන් දකියිද? ඔහුගේ ඒ සංස්කාරයෝ වෙනස්වෙත්. පෙරළෙත්. ඕහට සංස්කාරයන්ගේ වෙනස්වීමෙන්, පෙරළීමෙන් සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නූපදිත්.

11. "මෙය මගේ නොවෙයි මෙය මම නොවෙමි මෙය මාගේ ආත්මය නොවේයයි විඥානය දකියිද ඔහුගේ ඒ විඥානය වෙනස් වෙයි. පෙරළෙයි. ඕහට විඥානයාගේ වෙනස්වීමෙන්, පෙරළීමෙන් සෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නූපදිත්. මහණෙනි, මෙසේ වනාහි දැඩිව නොගැනීමෙන් නිර්භය ඇතිවේයයි" වදාළ සේක.

**(අටවෙනි උපාදාපරිතස්සන සූත්‍රය 2 නිමි.)**

---

## 9. අතීතානාගත සූත්‍රය. 1.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, අතීත අනාගත රූපය අනිත්‍යයයි. දැන් පවත්නා රූපය ගැන කියනුම කවරේද? මහණෙනි, දැන් පවත්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ අතීතවූ රූපයෙහි අපේක්ෂා රහිතවේ. අනාගත රූපය නොපතන්නේ වෙයි. දැන් පවත්නා රූපය පිළිබඳ කලකිරීම පිණිසද නො ඇලීම පිණිසද, නිරෝධය පිණිසද, පිළිපන්නේ වෙයි.

3. "අතීත, අනාගතවූ වේදනාව අනිත්‍යයයි දැන් පවත්නා වේදනාව ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ අතීතවූ වේදනාවෙහි අපේක්ෂා රහිතවෙයි. අනාගත වේදනාව ප්‍රාර්ථනා නොකරයි. දැන් පවත්නා වේදනාව පිළිබඳ කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිරොධය පිණිසද, පිළිපන්නේ වෙයි

4. "අතීතඅනාගතවූ සංඥාව අනිත්‍යයි. දැන් පවත්නා සංඥාව ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ අතීත සංඥාවෙහි බලාපොරොත්තු නැත්තේ වෙයි. අනාගත සංඥාව ප්‍රාර්ථනා නොකරන්නේ වෙයි. දැන් පවත්නා සංඥාව පිළිබඳ කලකිරීම පිණිසද, නො ඇලීම පිණිසද, නිරෝධය පිණිසද, පිළිපන්නේ වෙයි.

5. අතීත අනාගත සංස්කාරයෝ අනිත්‍යයහ. දැන් පවත්නා සංස්කාරයන් පිළිබඳ කියනුම කවරේද? මහණෙනි, මෙසේ දකින්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ අතීතවූ සංස්කාරයන් කෙරෙහි අපේක්ෂා රහිත වෙයි. අනාගත සංස්කාරයන් ප්‍රාර්ථනා නොකරයි. දැන් පවත්නා සංස්කාරයන් පිළිබඳ කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිරෝධය පිණිසද පිළිපන්නේ වෙයි.

6. අතීත අනාගත විඥානය අනිත්‍යයි. දැන් පවත්නා විඥානය ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ අතීතවූ විඥානයෙහි අපේක්ෂා රහිතවෙයි. අනාගත විඥානය ප්‍රාර්ථනා නොකරයි. දැන් පවත්නා

විඥානය පිළිබඳ කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිරෝධය පිණිසද පිළිපන්නේවේයයි" වදාළසේක.

**(නවවෙනි අතීතානාගත සූත්‍රය 1 නිමි.)**

---

## 10. අතීතානාගත සූත්‍රය. 2.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි' යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, අතීත අනාගත රූපය දුකයි. දැන් පවත්නා රූපය ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දකින්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ අතීතවූ රූපයෙහි අපෙක්ෂා රහිතවෙයි. අනාගත රූපය ප්‍රාර්ථනා නොකරයි. දැන් පවත්නා රූපයාගේ කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිරෝධය පිණිසද, පිළිපන්නේ වෙයි.

3. "මහණෙනි, අතීත අනාගතවූ, වේදනාව, දුකයි. දැන් පවත්නා වේදනාව ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ අතීත වේදනාවෙහි බලාපොරොත්තු නැත්තේ වෙයි. අනාගත වේදනාව ප්‍රාර්ථනා නොකරන්නේ වෙයි දැන් පවත්නා වේදනා පිළිබඳ කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිරෝධය පිණිසද පිළිපන්නේවෙයි.

4. "මහණෙනි, අතීත අනාගතවූ සංඥාව දුකයි. දැන් පවත්නා සංඥාව ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති)

ආයර්‍ය්‍යශ්‍රාවකතෙමේ අතීත සංඥාව බලාපොරොත්තු නැත්තේ වෙයි. අනාගත සංඥාව ප්‍රාර්ථනා නොකරන්නේ වෙයි. වර්තමාන සංඥාව පිළිබඳ කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිරෝධය පිණිසද පිළිපන්නේ වෙයි.

5. මහණෙනි, අතීත අනාගතවූ සංස්කාර දුකයි. දැන් පවත්නා සංස්කාර ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආයර්‍ය්‍යශ්‍රාවක තෙමේ අතීත සංස්කාර බලාපොරොත්තු නැත්තේවෙයි. අනාගත සංස්කාර ප්‍රාර්ථනා නොකරන්නේවෙයි. දැන් පවත්නා සංස්කාර පිළිබඳ කලකිරීම පිණිසද, නො ඇලීම පිණිසද, නිරෝධය පිණිසද පිළිපන්නේ වෙයි.

6. අතීත අනාගත විඥානය දුකයි දැන් පවත්නා විඥානය ගැන කියනුම කවරේද? මහණෙනි මෙසේ දකින්නාවූ ශ්‍රැතවත් ආයර්‍ය්‍යශ්‍රාවක තෙම අතීත විඥානයෙහි අපේක්ෂා රහිත වෙයි. අනාගත විඥානය ප්‍රාර්ථනා නොකරයි. විඥානයාගේ කලකිරීම පිණිසද, නො ඇලීම පිණිසද, නිරෝධය පිණිසද පිළිපන්නේ වේයයි" වදාළසේක.

**(දහවෙනි අතීතානාගත සූත්‍රය 2 නිමි.)**

---

## 11. අතීතානාගත සූත්‍රය. 3.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, අතීත, අනාගත රූපය අනාත්මයි. දැන් පවත්නා රූපය ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ

දකින්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ අතීත වූ රූපයෙහි අපෙක්ෂා රහිත වෙයි. අනාගත රූපය ප්‍රාර්ථනා නොකරයි. දැන් පවත්නා රූපයාගේ කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිරොධය පිණිසද පිළිපන්නේ වෙයි.

3. "අතීත අනාගතවූ සංඥාව දුකයි. දැන් පවත්නා සංඥාව ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ අතීත සංඥාවෙහි බලාපොරොත්තු නැත්තේ වෙයි. අනාගත සංඥාව ප්‍රාර්ථනා නොකරන්නේ වෙයි. දැන් පවත්නා සංඥාව පිළිබඳ කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද පිළිපන්නේ වෙයි.

4 "අතීත අනාගතවූ වේදනාව දුකයි. දැන් පවත්නා වේදනාව ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ අතීත වේදනාවෙහි බලාපොරොත්තු නැත්තේ වෙයි. අනාගත වේදනාව ප්‍රාර්ථනා නොකරන්නේවෙයි දැන් පවත්නා වේදනාව පිළිබඳ කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිරෝධය පිණිසද, පිළිපන්නේ වෙයි

5. "අතීත අනාගතවූ සංස්කාර දුකයි. දැන්පවත්නා සංස්කාරගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූතැන් ඇති) ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ අතීත සංස්කාරයෙහි බලාපොරොත්තු නැත්තේ වෙයි. අනාගත සංස්කාර ප්‍රාර්ථනා නොකරන්නේ වෙයි. දැන් පවත්නා සංස්කාර පිළිබඳ කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද නිරෝධය පිණිසද පිළිපන්නේ වෙයි.

6. "අතීත අනාගත විඤ්ඤාණය අනාත්මයි. දැන්පවත්නා විඤ්ඤාණය ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ විඤ්ඤාණයෙහි අපේක්ෂා රහිත වෙයි. අනාගත විඤ්ඤාණය ප්‍රාර්ථනා නොකරයි. දැන් පවත්නා

විඤ්ඤාණයාගේ කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, නිරොධය පිණිසද පිළිපන්නේවේයයි” වදාළසේක.

**(එකොළොස්වෙනි අතීතානාගත සූත්‍රය 3 නිමි.)**

---

(නකුල පිතු සූත්‍රය, දේවදහ සූත්‍රය, හාලිද්දකානි සූත්‍ර දෙකය, සමාධි සූත්‍රය, පටිසල්ලාණ සූත්‍රය, උපාදාපරිතස්සන සූත්‍ර දෙක සහ අතීතානාගත සූත්‍ර තුන දැයි යන සූත්‍ර එකොළොසින් මේ නකුල පිතු වර්ගය නිමවෙයි.)

**(පළමුවෙනි නකුල පිතු වර්ගය නිමි.)**

---

# 2 අනිත්‍ය වර්ගය

## 1. අනිත්‍ය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූසේක. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තරදුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, රූපය අනිත්‍යයි, වේදනාව අනිත්‍යයි, සඤ්ඤාව අනිත්‍යයි, සංස්කාර අනිත්‍යයි, විඤ්ඤාණය අනිත්‍යයි, මහණෙනි, මෙසේ දක්නාවූ බොහෝ ඇසූපිරූ තැන් ඇති ආය්‍ර්‍යශ්‍රාවකතෙමේ රූපයෙහිද කළකිරෙයි. වේදනාවෙහිද කළකිරෙයි. සඤ්ඤාවෙහිද කළකිරෙයි. සංස්කාරයන්හිද කළකිරෙයි. විඤ්ඤාණයෙහිද කළකිරෙයි. කළකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනුකල්හි මිදුනේය යන ඥානය ඇතිවෙයි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචය්‍ර්‍යාවෙහි වැස

නිමවන ලදී. කළයුත්ත කරණලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි."

(පළමුවෙනි අනිත්‍ය සූත්‍රය නිමි.)

---

## 2. දුක්ඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, රූපය දුකයි, වේදනාව දුකයි, සඤ්ඤාව දුකයි, සංස්කාර දුකයි, විඤ්ඤාණය දුකයි, මහණෙනි, මෙසේ දකින්නාවූ බොහෝ ඇසූපිරූ තැන් ඇති ආර්‍යයශ්‍රාවක තෙමේ රූපයෙහිද කළකිරෙයි. වේදනාවෙහිද කළකිරෙයි. සඤ්ඤාවෙහිද කළකිරෙයි. සංස්කාරයන්හිද කළකිරෙයි. විඤ්ඤාණයෙහිද කළකිරෙයි. කළකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනුකල්හි මිදුනේ යන ඥානය ඇතිවෙයි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍යයාවෙහි වැස නිමවන ලදී. කළයුත්ත කරණලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි."

(දෙවෙනි දුක්ඛ සූත්‍රය නිමි.)

---

## 3. අනත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක.

'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, රූපය අනාත්මයි, වේදනාව අනාත්මයි, සඤ්ඤාව අනාත්මයි, සංස්කාර අනාත්මයි. විඤ්ඤාණය අනාත්මයි, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කළකිරෙයි. සංඥාවෙහිද කළකිරෙයි. සංස්කාරයන්හිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම ඇතිවෙයි. ජාතිය (ඉපදීම) ක්ෂයවිය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි."

**(තුන්වෙනි අනත්ත සූත්‍රය නිමි.)**

---

## 4. යදනිච්ච සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, රූපය අනිත්‍යයි. යමක් අනිත්‍යනම් එය දුකය. යමක් දුක නම් එය අනාත්මය. යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි." මෙසේ එය තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි. වේදනාව අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුකය, යමක් දුකනම් එය අනාත්මය, යමක් අනාත්ම නම් "එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේය. මෙසේ එය තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

3. සඤ්ඤාව අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුක නම් එය අනාත්මය. යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. මෙසේ එය තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි. සංස්කාර අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුකනම් එය අනාත්මය. යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙසේ එය තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි. විඤ්ඤාණය අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුකනම් එය අනාත්මය. යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙසේ එය තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

4. "මහණෙනි, මෙසේ දක්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආය්‍යීශ්‍රාවකතෙමේ රූපයෙහිද කළකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි, සංස්කාරයෙහිද කලකිරෙයි, විඤ්ඤාණයෙහිද කලකිරෙයි, කලකිරීමෙන් නොඇලෙයි, නොඇලීමෙන් මිදෙයි, මිදුනු කල්හි මිදුනේය යන දැනීම ඇතිවෙයි. ජාතිය (ඉපදීම) ක්ෂය විය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරනලදී. මේ ආත්ම භාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි.

**(හතරවෙනි යදනිච්ච සූත්‍රය නිමි.)**

---

## 5. යංදුක්ඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, රූපය දුකය. යමක් දුක නම් එය අනාත්මය, යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි.

මේ මාගේ ආත්මය නොවෙයි. යන මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි. වේදනාව දුකය යමක් දුක නම් එය අනාත්මය. යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි. සඤ්ඤාව දුකය. යමක් දුක නම් එය අනාත්මය. යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

3. සංස්කාර දුකය. යමක් දුකනම් එය අනාත්මය, යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුය. විඤ්ඤාණය දුකය යමක් දුකනම් එය අනාත්මය, යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි මෙසේ එය ඇතිසැටියෙන් යහපත් නුවණින් දතයුතුයි.

4. "මහණෙනි, මෙසේ දකින්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍යශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයන්හිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනුකල්හි මිදුනේය යන දැනීම ඇතිවෙයි. ජාතිය (ඉපදීම) ක්ෂයවිය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ ආත්ම භාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි.

**(පස්වෙනි යංදුක්ඛ සූත්‍රය නිමි.)**

---

## 6. යදනත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**2.** "මහණෙනි, රූපය අනාත්මය. යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි එය මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දතයුතුය.

"වේදනාව අනාත්මය, යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි එය මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දතයුතුයි.

"සඤ්ඤාව අනාත්මය. යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි එය මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දතයුතුය.

"සංස්කාර අනාත්මය. යමක් අනාත්ම නම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි එය මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දතයුතුයි.

"විඤ්ඤාණය අනාත්මය, යමක් අනාත්මනම් එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි එය මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දතයුතුයි.

**3.** "මහණෙනි, මෙසේ දකින්නාවූ ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයන්හිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම ඇති වෙයි. ජාතිය (ඉපදීම) ක්ෂය විය. බ්‍රහ්ම චාරියාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරනලදී. මේ ආත්ම භාවය පිණිස කළ යුතු අනිකක් නැතැයි දැනගනියි.

**(හයවෙනි යදනත්ත සූත්‍රය නිමි.)**

---

## 7. හේතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි'යි කියා භික්ෂූන්හට කථාකළ සේක. 'ස්වාමීනි'යි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, රූපය අනිත්‍යයි. රූපයේ ඉපදීම පිණිස යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, එයද අනිත්‍යයි. මහණෙනි, අනිත්‍ය හෙතුවෙන් හටගත් රූපය කෙසේ නිත්‍ය වන්නේද?

3. "වේදනාව අනිත්‍යයි. වේදනාව ඉපදීම පිණිස යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, එයද අනිත්‍යයි. මහණෙනි, අනිත්‍ය හෙතුවෙන් හටගත් වේදනාව කෙසේ නිත්‍ය වන්නේද?

4. "සඤ්ඤාව අනිත්‍යයි සංඥාවේ ඉපදීම පිණිස යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, එයද අනිත්‍යයි. මහණෙනි, අනිත්‍ය හේතුවෙන් හටගත් සංඥාව කෙසේ නිත්‍ය වන්නේද?

5. "සංස්කාර අනිත්‍යයි. සංස්කාරයන්ගේ ඉපදීම පිණිස යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, එයද අනිත්‍යයි. මහණෙනි, අනිත්‍ය හේතුවෙන් හටගත් සංස්කාර කෙසේ නිත්‍යවන්නේද?

6. "විඤ්ඤාණය අනිත්‍යයි. විඤ්ඤාණයේ ඉපදීම පිණිස යමක්හේතුවේද යමක් ප්‍රත්‍යයවේද?' එයද අනිත්‍යයි. මහණෙනි, අනිත්‍ය හේතුවෙන් හටගත් විඤ්ඤාණය කෙසේ නිත්‍ය වන්නේද?"

7. "මහණෙනි, මෙසේ දකින්නාවූ, බොහෝ ඇසූපිරූ තැන් ඇති ආර්‍යශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයන්හිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම ඇතිවෙයි. ජාතිය (ඉපදීම) ක්ෂයවිය. බ්‍රහ්මචරියාවෙහි

හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි.

(සත්වෙනි හේතු සූත්‍රය 1 නිමි.)

---

## 8. හේතු සූත්‍රය. 2.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, රූපය දුකය. රූපයේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, එයද දුකය. දුක්වූ හේතුවෙන් හටගත් රූපය කෙසේ සැපවත් වන්නේද?

3. "වේදනාව දුකය. වේදනාවේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, එයද දුකය. දුක්වූ හේතුවෙන් හටගත් වේදනාව කෙසේ සැපවත් වන්නේද?

4. "සඤ්ඤාව දුකය. සංඥාවේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, එයද දුකය. දුක්වූ හේතුවෙන් හටගත් සංඥාව කෙසේ සැපවත් වන්නේද?

5. "සංස්කාර දුකය. සංස්කාරයන්ගේ ඉපදීම පිණිස යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, එයද දුකය. දුක්වූ හේතුවෙන් හටගත් සංස්කාර කෙසේ සැපවත් වන්නේද?

6. "විඤ්ඤාණය දුකය, විඤ්ඤාණයාගේ ඉපදීම පිණිස යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, එයද දුකය, දුක්වූ හේතුවෙන් හටගත් විඤ්ඤාණය කෙසේ සැපවත් වන්නේද?"

7. "මහණෙනි, මෙසේ දකින්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍යශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද

කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයන්හිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම ඇති වෙයි. ජාතිය (ඉපදීම) ක්ෂය විය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන ලදී. කළ යුත්ත කරනලදී. මේ ආත්ම භාවය පිණිස කළ යුතු අනිකක් නැතැයි දැනගනියි.

**(අටවෙනි හේතු සූත්‍රය 2 නිමි.)**

---

## 9. හේතු සූත්‍රය 3.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූ සේක. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, රූපය අනාත්මය. රූපයේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, එයද අනාත්මය. මහණෙනි, අනාත්මවූ හේතුවෙන් හටගත් රූපය කෙසේ ආත්මය වන්නේද?

3. “වේදනාව අනාත්මය. වේදනාවේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, එයද අනාත්මය. මහණෙනි, අනාත්මවූ හේතුවෙන් හටගත් වේදනාව කෙසේ ආත්මය වන්නේද?

4. “සඤ්ඤාව අනාත්මය, සංඥාවේ ඉපදීම පිණිස යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, එයද අනාත්මය. මහණෙනි අනාත්මවූ හේතුවෙන් හටගත් සංඥාව කෙසේ ආත්මය වන්නේද?

5. “සංස්කාර අනාත්මය, සංස්කාරයන්ගේ ඉපදීම පිණිස යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, එයද අනාත්මය. මහණෙනි,

අනාත්මවූ හේතුවෙන් හටගත් සංස්කාර කෙසේ ආත්මය වන්නේද?

**6.** "විඤ්ඤාණය අනාත්මය, විඤ්ඤාණයේ ඉපදීම පිණිස යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යය වේද, එයද අනාත්මය. මහණෙනි, අනාත්මවූ හේතුවෙන් හටගත් විඤ්ඤාණය කෙසේ ආත්මය වන්නේද?

**7.** "මහණෙනි, බොහෝ ඇසූ පිරූතැන් ඇති ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ රූපයෙහිද කළකිරෙයි. වේදනාවෙහිද කළකිරෙයි. සඤ්ඤාවෙහිද කළකිරෙයි. සංස්කාරයන්හිද කළකිරෙයි. විඤ්ඤාණයෙහිද කළකිරෙයි. කළකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන ඥානය ඇතිවෙයි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වැස නිමවන ලදී. කළයුත්ත කරණලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි."

**(නවවෙනි හේතු සූත්‍රය 3. නිමි)**

---

## 10. ආනන්ද සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එක්පසෙක හුන් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, නිරොධය නිරොධයයි කියයි. කවර ධර්මයන්ගේ නිරොධයෝ නිරොධයයි කියනු ලැබේද?" යනුයි.

**2.** "ආනන්දය, රූපය අනිත්‍යය, හේතු ප්‍රත්‍යයන් විසින් ඇතිකරනලදී. හේතුප්‍රත්‍ය ධර්මයන් නිසා හටගත්තේය. නැසීම

ස්වභාවකොට ඇත්තේය. විනාශවීම ස්වභාවකොට ඇත්තේය. නොඇලීම ස්වභාවකොට ඇත්තේය. නිරුද්ධවීම ස්වභාවකොට ඇත්තේය. ඒ රූපයාගේ නිරොධයෙන් නිරොධයයි කියනු ලැබේ.

3. "වේදනාව අනිත්‍යය. හේතුප්‍රත්‍යයන් විසින් ඇති කරනලදී. හේතුප්‍රත්‍ය ධර්මයන් නිසා හටගත්තේය. නැසීම ස්වභාවකොට ඇත්තේය. විනාශවීම ස්වභාවකොට ඇත්තේය. නොඇලීම ස්වභාවකොට ඇත්තේය. නිරුද්ධවීම ස්වභාව කොට ඇත්තේය. ඒ වේදනාවගේ නිරොධයෙන් නිරොධයයි කියනු ලැබේ.

4. "සඤ්ඤාව අනිත්‍යය හේතුප්‍රත්‍යයන් විසින් ඇතිකරන ලදී. හේතු ප්‍රත්‍ය ධර්මයන් නිසා හටගත්තේය. නැසීම ස්වභාව කොට ඇත්තේය. විනාශ වීම ස්වභාවකොට ඇත්තේය නොඇලීම ස්වභාව කොට ඇත්තේය. නිරුද්ධවීම ස්වභාව කොට ඇත්තේය. ඒ සංඥාවේ නිරෝධයෙන් නිරෝධයයි කියනු ලැබේ.

5. "සංස්කාරය අනිත්‍යය. හේතුප්‍රත්‍යයන් විසින් ඇති කරනලදී. හේතුප්‍රත්‍යය ධර්මයන් නිසා හටගත්තේය. නැසීම ස්වභාව කොට ඇත්තේය. විනාශවීම ස්වභාවකොට ඇත්තේය. නොඇලීම ස්වභාවකොට ඇත්තේය. නිරුද්ධවීම ස්වභාව කොට ඇත්තේය. ඒ සංස්කාරයාගේ නිරොධයෙන් නිරොධයයි කියනු ලැබේ.

6. "විඤ්ඤාණය අනිත්‍යය, හේතු ප්‍රත්‍යයන් විසින් ඇති කරන ලදී. හේතුප්‍රත්‍ය ධර්මයන් නිසා හටගත්තේය. නැසීම ස්වභාවකොට ඇත්තේය. විනාශවීම ස්වභාවකොට ඇත්තේය. නොඇලීම ස්වභාවකොට ඇත්තේය. නිරුද්ධවීම ස්වභාවකොට ඇත්තේය. ඒ විඤ්ඤාණයාගේ නිරොධයෙන් නිරොධයයි කියනු ලැබේ. "ආනන්දය, මෙසේ මේ ධර්මයන්ගේ නිරොධය නිරොධයයි කියනු ලැබේ."

**(දහවෙනි ආනන්ද සූත්‍රය නිමි.)**

---

(අනිච්ච දුක්ඛ අනත්ත යන සූත්‍ර තුනද, අනාවූ යදනිච්ච යංදුක්ඛ යදනත්ත යන සූත්‍ර තුනද, හේතු සූත්‍ර තුනද වදාළහ. ආනන්ද සූත්‍රයෙන් වර්ගය සම්පූර්ණ විය.)

දෙවෙනිවූ අනිත්‍ය වර්ගයයි.

---

## 3. භාර වර්ගය.

### 1. භාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි තොපට බරද, බර ගෙනයන්නාද, බර ඉසිලීමද, බර බහා තැබීමද, දේශනා කරන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව්. දේශනා කරන්නෙමි"යි වදාළසේක. "එසේය, ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

3. "මහණෙනි, බර නම් කවරේද? ඊට උපාදානස්කන්ධ පසයයි කියයුතුය. කවර පසක්ද? එනම්:- රූප උපාදානස්කන්ධය, වේදනාඋපාදානස්කන්ධය, සඤ්ඤාඋපාදානස්කන්ධය, සංස්කාරඋපාදානස්කන්ධය, විඤ්ඤාණඋපාදානස්කන්ධය යනුයි. මහණෙනි, මේ බරයයි කියනු ලැබේ.

4 "මහණෙනි, බර ගෙන යන්නා නම් කවරෙක්ද? ඔහුට පුද්ගලයායයි කිය යුතුය. මෙබඳු නමක් ඇත්තාවූ හෝ මෙබඳු ගොත්‍ර ඇත්තාවූ හෝ යම් ඒ ආයුෂ්මතෙක් වෙයිද, මහණෙනි, මේ තැනැත්තා බර ගෙනයන්නායයි කියනු ලැබේ.

5. "මහණෙනි, බර ඉසිලීම නම් කවරේද? නැවත නැවත ඉපදීම ඇති කරන්නාවූ, ඇලීමෙන් යුක්තවූ, ඒ ඒ භවයෙහි ඇලෙන්නාවූ, යම් ඒ තෘෂ්ණාවක් වේද? එනම්:- කාම තණ්හාවය, භව තණ්හාවය, විභව තණ්හාවය යන මොහුයි. මහණෙනි, මේ බර ඉසිලීමයයි කියනු ලැබේ.

6. "මහණෙනි, බර බහා තැබීම කවරේද? ඒ තණ්හාවගේ යම් මුළුමනින්ම නිරුද්ධ කිරීමක්, අත්හැරීමක්, දුරලීමක් මිදීමක්, නොඇල්මක් වේද? මහණෙනි, මේ බර බහාතැබීමයයි කියනු ලැබේ." භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. මෙය මෙසේ වදාරා, සුගත නම්වූ ශාස්තෘන් වහන්සේ නැවත මෙසේ වදාළ සේක.

"ලෝකයෙහි බර නම් ඒකාන්තයෙන්ම පඤ්චස්කන්ධයෝය, බර ගෙන යන්නා නම් පුද්ගලයාය. බර ඉසිලීම නම් දුකය. බර බහා තැබීම සැපය නම් වේ.

"මහත්වූ බර බහා තබා, අන් බරක් නොගෙන, මුල් සහිතවූ, තෘෂ්ණාව උදුරා, තෘෂ්ණා රහිතවූයේ පිරිනිවියේය."

**(පළමුවෙනි භාර සූත්‍රය නිමි.)**

---

## 2. පරිඤ්ඤා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, පිරිසිඳ දැනගත යුතුවූ, ධර්මයන්ද, පිරිසිඳ දැනගැනීමද, දේශනා කරමි. එය අසව්. මහණෙනි, පිරිසිඳ දැනගත යුතු ධර්මයෝ කවරහුද? මහණෙනි, රූපය පිරිසිඳ

දැනගතයුතු ධර්මයකි. වේදනාව පිරිසිඳ දැනගත යුතු ධර්මයකි. සඤ්ඤාව පිරිසිඳ දැනගතයුතු ධර්මයකි. සංස්කාරයෝ පිරිසිඳ දැනගතයුතු ධර්මයකි. විඤ්ඤාණය පිරිසිඳ දැනගතයුතු ධර්මයකි. මහණෙනි, මේ පිරිසිඳ දැනගතයුතු ධර්මයෝයයි කියනු ලැබේ.

3. "මහණෙනි, පිරිසිඳ දැනගැනීම කවරේද? මහණෙනි, රාගය ක්ෂය කිරීමද, ද්වෙෂය ක්ෂය කිරීමද, මෝහය ක්ෂය කිරීමද, මෙය පිරිසිඳ දැනීමයයි කියනු ලැබේ."

**(දෙවෙනි පරිඤ්ඤා සූත්‍රය නිමි.**

---

## 3. අභිජාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතුසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, රූපස්කන්ධය බෙදා වෙන්කර ගැනීමට නොදන්නා අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් නොදන්නාවූ මාර්ගයෙන් ප්‍රහාණ කිරීම් වශයෙන් නොදන්නාවූ පුද්ගල තෙමේ දුක් කෙළවර කිරීමට නුසුදුස්සෙකි.

3. "වේදනාස්කන්ධය බෙදා වෙන්කර ගැනීමට නොදන්නාවූ අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් නොදන්නාවූ මාර්ගයෙන් ප්‍රහාණ කිරීම් වශයෙන් නොදන්නාවූ පුද්ගල තෙමේ දුක් කෙළවර කිරීමට නුසුදුස්සෙකි.

4. "සංඥාස්කන්ධය බෙදා වෙන් කර ගැනීමට නොදන්නාවූ අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් නොදන්නාවූ, මාර්ගයෙන් ප්‍රහාණ කිරීම් වශයෙන් නොදන්නාවූ පුද්ගලතෙම දුක් කෙළවර කිරීමට නුසුදුස්සෙකි.

5. "සංස්කාරස්කන්ධය බෙදා වෙන්කර ගැනීමට නොදන්නාවූ අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් නොදන්නාවූ මාර්ගයෙන් ප්‍රහාණ කිරීම් වශයෙන් නොදන්නාවූ පුද්ගලතෙමේ දුක් කෙළවර කිරීමට නුසුදුස්සෙකි.

6. "විඥානස්කන්ධය බෙදා වෙන්කර ගැනීමට නොදන්නාවූ අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් නොදන්නාවූ, මාර්ගයෙන් ප්‍රහාණ කිරීම් වශයෙන් නොදන්නාවූ, පුද්ගලතෙමේ දුක් කෙළවර කිරීමට නුසුදුස්සෙකි.

7. "මහණෙනි, රූපස්කන්ධය බෙදා වෙන්කර ගැනීමට දන්නාවූ, අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දන්නාවූ, මාර්ගයෙන් ප්‍රහාණ කිරීම් වශයෙන් දන්නාවූ, පුද්ගලතෙමේ දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් වන්නේය.

8. "වේදනාස්කන්ධය බෙදා වෙන්කර ගැනීමට දන්නාවූ, අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දන්නාවූ, මාර්ගයෙන් ප්‍රහාණ කිරීම් වශයෙන් දන්නාවූ, පුද්ගලතෙමේ දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් වන්නේය.

9. "සංඥාස්කන්ධය බෙදා වෙන්කර ගැනීමට දන්නාවූ, අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දන්නාවූ, මාර්ගයෙන් ප්‍රහාණ කිරීම් වශයෙන් දන්නාවූ, පුද්ගලතෙමේ දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් වන්නේය.

10. "සංස්කාරස්කන්ධය බෙදා වෙන්කර ගැනීමට දන්නාවූ, අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දන්නාවූ, මාර්ගයෙන් ප්‍රහාණ කිරීම් වශයෙන් දන්නාවූ, පුද්ගලතෙමේ දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් වන්නේය.

11. "විඥානස්කන්ධය බෙදා වෙන්කර ගැනීමට දන්නාවූ අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දන්නාවූ, මාර්ගයෙන් ප්‍රහාණ කිරීම් වශයෙන් දන්නාවූ පුද්ගල තෙමේ දුක් කෙළවර කිරීමට සුදුස්සෙක් වන්නේය.

(තුන්වෙනි අභිජාන සූත්‍රය නිමි.

---

## 4. ඡන්දරාග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, රූපස්කන්ධයෙහි යම් (ඡන්ද රාගයක්) ආලයක් ඇද්ද, එය දුරු කරව්. එසේ කිරීමෙන් ඒ රූපය පහ කරන ලද්දේ, මුල් සිඳින ලද්දේ, සිඳිනලද තල් ගසක් මෙන් කරන ලද්දේ, නැතිකරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවකොට ඇතියක් වන්නේය.

3. "වේදනාවේ යම් ආලයක් ඇද්ද එය දුරු කරව්. එසේ කිරීමෙන් ඒ වේදනාව පහකරන ලද්දේ, මුල් සිඳින ලද්දේ, සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ නැතිකරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවකොට ඇතියක් වන්නේය.

4. "සංඥාවේ යම් ආලයක් ඇද්ද එය දුරු කරව්. එසේ කිරීමෙන් ඒ සංඥාව පහකරනලද්දේ, මුල් සිඳිනලද්දේ, සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දේ, නැති කරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාව කොට ඇතියක් වන්නේය.

5. "සංස්කාරයන්හි යම් ඇලීමක් වේද, එය දුරු කරව්. එසේ කිරීමෙන් සංස්කාරයෝ පහ කරන ලද්දාහු. මුල් සිඳින ලද්දාහු. සිඳින ලද තල්ගසක් මෙන් කරණ ලද්දාහු. නැතිකරන ලද්දාහු, නැවත නොඉපදීම ස්වභාවකොට ඇත්තාහු වන්නාහුය.

6. "විඤ්ඤාණයාගේ යම් ආලයක් ඇද්ද, එය දුරු කරව්. එසේ කිරීමෙන් විඤ්ඤාණය පහකරන ලද්දේ, මුල් සිඳින ලද්දේ, සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ, නැතිකරන ලද්දේ, නැවත නොඉපදීම ස්වභාවකොට ඇතියක් වන්නේය."

(හතරවෙනි ඡන්දරාග සූත්‍රය නිමි.)

## 5. අස්සාද සූත්‍රය. 1.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, චතුස්සත්‍යය අවබොධ කිරීමට පළමු බුදුනොවූ බොධිසත්වවූම මට මෙබඳු සිතක් ඇතිවිය. 'රූපයාගේ ආශ්වාදය (රසවිඳීම) කුමක්ද? ආදීනවය (දොෂය) කුමක්ද? නිස්සරණය (නිදහස්වීම) කුමක්ද? වේදනාවගේ ආශ්වාදය කුමක්ද? ආදීනවය කුමක්ද? නිස්සරණය කුමක්ද? සඤ්ඤාවගේ ආශ්වාදය කුමක්ද? ආදීනවය කුමක්ද? නිස්සරණය කුමක්ද? සංස්කාරයන්ගේ ආශ්වාදය කුමක්ද? ආදීනවය කුමක්ද? නිස්සරණය කුමක්ද? විඤ්ඤාණයගේ ආශ්වාදය කුමක්ද? ආදීනවය කුමක්ද? නිස්සරණය කුමක්ද? කියායි. මහණෙනි, ඒ මට මෙසේ අදහස් විය.

3. 'රූපය නිසා යම්කිසි සැපයක්, සොම්නසක් ඇතිවේද මේ රූපයාගේ ආශ්වාදයයි. යම් රූපයක් අනිත්‍යයද, දුකද පෙරලෙන සුළුද, මේ රූපයගේ ආදීනවයයි. රූපයෙහි යම් ආශාව දුරුකිරීමක්, නැතිකිරීමක් වේද, මේ රූපයාගේ නිස්සරණයයි.

4. "වේදනාව නිසා යම්කිසි සැපයක්, සොම්නසක් ඇති වේද, මේ වේදනාවේ ආශ්වාදයයි. යම් වේදනාවක් අනිත්‍යද දුකද, පෙරළෙන සුළුද, මේ වේදනාවේ ආදීනවයයි. වේදනාවෙහි යම් ආශාව දුරු කිරීමක්, නැතිකිරීමක් වේද, මේ වේදනාවේ නිස්සරණයයි.

5. 'සංඥාව නිසා යම්කිසි සැපයක්, සොම්නසක් ඇතිවේද, මේ සංඥාවේ ආශ්වාදයයි. යම් සංඥාවක් අනිත්‍යද, දුකද, පෙරලෙන සුළුද, මේ සංඥාවේ ආදීනවයයි. සංඥාවේ යම්

ආශාව දුරු කිරීමක්, නැති කිරීමක් වේද, මේ සංඥාවේ නිස්සරණයයි.

6. 'සංස්කාරය නිසා යම් කිසි සැපයක්, සොම්නසක් ඇතිවේද, මේ සංස්කාරයන්ගේ ආශ්වාදයයි. යම් සංස්කාරයක් අනිත්‍යද, දුකද පෙරලෙන සුළුද, මේ සංස්කාරයාගේ ආදීනවයයි. සංස්කාරයන්හි යම් ආශාව දුරු කිරීමක්, නැති කිරීමක් වේද, ඒ සංස්කාරයන්ගේ නිස්සරණයයි.

7. "විඤ්ඤාණය නිසා යම් කිසි සැපයක් සොම්නසක් ඇති වේද, ඒ විඤ්ඤාණයාගේ ආශ්වාදයයි. යම් විඤ්ඤාණයක් අනිත්‍යද, දුකද, පෙරළෙන සුළුද, මේ විඤ්ඤාණයාගේ ආදීනවයයි. විඤ්ඤාණයෙහි යම් ආශාව දුරු කිරීමක්, නැති කිරීමක් වේද, මේ විඤ්ඤාණයාගේ නිස්සරණයයි.'

8. 'මහණෙනි, යම්තාක් කල් මම මේ පඤ්ච උපාදානස්කන්ධයන්ගේ මෙසේ ආශ්වාදය ආශ්වාදය වශයෙන්ද, ආදීනවය ආදීනවය වශයෙන්ද, නිස්සරණය නිස්සරණය වශයෙන්ද, තත්වාකාරයෙන් අවබෝධ නොකෙළෙම්ද, මහණෙනි, මම ඒතාක් දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත සත්ව ලෝකයෙහිද, මහණ බමුණන් සහිත දෙවි මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහිද, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබෝධ කළෙම්යයි ප්‍රතිඥා නොකෙළෙමි.

9. "මහණෙනි, යම් කලෙක මම මේ පඤ්ච උපාදානස්කන්ධයන්ගේ ආශ්වාදය, ආශ්වාදය වශයෙන්ද, ආදීනවය, ආදීනවය වශයෙන්ද, නිස්සරණය, නිස්සරණය වශයෙන්ද, තත්වාකාරයෙන් අවබෝධ කෙළෙම්ද? එකල්හි මම දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත සත්ව ලොකයෙහිද මහණ බමුණන් සහිත දෙවි මිනිසුන් සහිත, ප්‍රජාව අතරෙහිද උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබෝධ කෙළෙම්යයි ප්‍රතිඥා කෙළෙමි. මාගේ අර්හත්ඵල විමුක්තිය ස්ථිරය. මේ අන්තිම ජාතියයි. නැවත ඉපදීමක් නැත යන ඥාන දර්ශනය මට පහළ විය."

**(පස්වෙනි අස්සාද සූත්‍රය 1. නිමි.)**

---

## 6. අස්සාද සූත්‍රය. 2

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, මම රූපයේ ආශ්වාදය සොයමින් හැසුරුනෙමි. රූපයේ යම් ආශ්වාදයක් වේනම් ඊට පැමිණියෙමි. යම්තාක් රූපයාගේ ආශ්වාදයක්වේද, මා විසින් එය නුවණින් මනාකොට දක්නා ලදී.

"මහණෙනි, මම රූපයේ ආදීනව සොයමින් හැසුරුණෙමි රූපයේ යම් ආදීනවයක් වේද, ඊට පැමිණියෙමි. රූපයාගේ යම්තාක් ආදීනව වෙයිද, මා විසින් එය නුවණින් මනා කොට දක්නා ලදී.

"මහණෙනි, මම රූපයේ නිස්සරණය සොයමින් හැසුරුණෙමි. රූපයේ යම් නිස්සරණයක් වේද, එයට පැමිණියෙමි. රූපයාගේ නිස්සරණය යම්තාක්ද, මා විසින් එය නුවණින් මනාකොට දක්නා ලදී.

3. "මහණෙනි, මම වේදනාවේ ආශ්වාදය සොයමින් හැසුරුණෙමි. වේදනාවේ යම් ආශ්වාදයක් වේද එයට පැමිණියෙමි. වේදනාවේ ආශ්වාදය යම්තාක්ද මා විසින් නුවණින් එය මනාකොට දක්නාලදී.

"මහණෙනි, මම වේදනාවේ ආදීනවය සොයමින් හැසුරුණෙමි. වේදනාවේ යම් දෝෂයක් වේද, එයට පැමිණියෙමි. වේදනාවේ ආදීනවය යම්තාක්ද, මා විසින් එය නුවණින් මනාකොට දක්නා ලදී.

"මහණෙනි, මම වේදනාවේ නිස්සරණය සොයමින් හැසුරුණෙමි. වේදනාවේ යම් නිස්සරණයක් වේද, එයට

පැමිණියෙමි. වේදනාවේ නිස්සරණය යම්තාක්ද, මා විසින් එය නුවණින් මනාකොට දක්නා ලදී.

4. "මහණෙනි, මම සඤ්ඤාවෙහි ආශ්වාදය සොයමින් හැසුරුණෙමි. සංඥාවෙහි යම් ආශ්වාදයක් වේද, එයට පැමිණියෙමි. සංඥාවෙහි ආශ්වාදය යම්තාක්ද, මා විසින් එය නුවණින් මනාකොට දක්නා ලදී.

"මහණෙනි, මම සංඥාවේ ආදීනව සොයමින් හැසුරුනෙමි. සංඥාවේ යම් ආදීනවයක් වේද, එයට පැමිණියෙමි. සංඥාවේ ආදීනවය යම්තාක්ද, මා විසින් එය මනාකොට දක්නා ලදී.

"මහණෙනි, මම සංඥාවේ නිස්සරණය සොයමින් හැසුරුණෙමි. සංඥාවේ යම් නිස්සරණයක් වේද, එයට පැමිණියෙමි. සංඥාවේ නිස්සරණය යම් තාක්ද, මා විසින් එය නුවණින් මනාකොට දක්නා ලදී.

5. "මහණෙනි, මම සංස්කාරයන්ගේ ආශ්වාදය සොයමින් හැසුරුණෙමි. සංස්කාරයන්ගේ යම් ආශ්වාදයක් වේද, එයට පැමිණියෙමි. සංස්කාරයන්ගේ ආශ්වාදය යම්තාක්ද, මා විසින් එය නුවණින් මනාකොට දක්නාලදී.

"මහණෙනි, මම සංස්කාරයන්ගේ ආදීනව සොයමින් හැසුරුණෙමි. සංස්කාරයන්ගේ යම් ආදීනවයක් වේද, එයට පැමිණියෙමි. සංස්කාරයන්ගේ ආදීනවය යම්තාක්ද, මා විසින් එය නුවණින් මනාකොට දක්නා ලදී.

"මහණෙනි, මම සංස්කාරයන්ගේ නිස්සරණය සොයමින් හැසුරුණෙමි. සංස්කාරයන්ගේ යම් නිස්සරණයක් වේද, එයට පැමිණියෙමි. සංස්කාරයන්ගේ නිස්සරණය යම්තාක්ද මා විසින් එය නුවණින් මනාකොට දක්නා ලදී.

6. "මහණෙනි, මම විඤ්ඤාණයේ ආශ්වාදය සොයමින් හැසුරුණෙමි. විඤ්ඤාණයේ යම් ආශ්වාදයක් වේද, එයට පැමිණියෙමි. විඤ්ඤාණයේ ආශ්වාදය යම්තාක්ද, මා විසින් එය නුවණින් මනාකොට දක්නා ලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, මම විඤ්ඤාණයේ ආදීනව සොයමින් හැසුරුණෙමි. විඤ්ඤාණයේ යම් ආදීනවයක් වේද, එයට පැමිණියෙමි. විඤ්ඤාණයේ ආදීනව යම්තාක්ද, මා විසින් එය නුවණින් මනාකොට දක්නා ලදී.

"මහණෙනි, මම විඤ්ඤාණයේ නිස්සරණය සොයමින් හැසුරුණෙමි. විඤ්ඤාණයේ යම් නිස්සරණයක් වේද, එයට පැමිණියෙමි. විඤ්ඤාණයේ නිස්සරණය යම්තාක්ද, මා විසින් එය නුවණින් මනාකොට දක්නා ලදී.

7. "මහණෙනි, මම යම් කලෙක මේ පඤ්ච උපාදානස්කන්ධයන්ගේ ආශ්වාදය ආශ්වාදය වශයෙන්ද, ආදීනවය ආදීනවය වශයෙන්ද, නිස්සරණය නිස්සරණය වශයෙන්ද, තත්වාකාරයෙන් අවබෝධ නොකෙළෙම්ද, මහණෙනි, මම ඒතාක් දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත සත්ව ලෝකයෙහිද, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහිද, උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළෙම්යයි ප්‍රතිඥා නොකෙළෙමි.

"මහණෙනි, මම යම් කලෙක පඤ්ච උපාදානස්කන්ධයන්ගේ ආශ්වාදය ආශ්වාදය වශයෙන්ද, ආදීනව ආදීනව වශයෙන්ද නිස්සරණය නිස්සරණය වශයෙන්ද, තත්වාකාරයෙන් අවබෝධ කළෙම්ද, එකල්හි මම දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත සත්ව ලෝකයෙහිද, මහණ, බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහිද උතුම්වූ සම්‍යක් සම්බොධිය අවබෝධ කෙළෙම්යයි ප්‍රතිඥා කළෙමි. මගේ අර්හත් ඵල විමුක්තිය ස්ථිරය. මේ අන්තිම ජාතියයි. නැවත ඉපදීමක් නැත යන ඥාන දර්ශනය මට පහළ විය."

**(හයවෙනි අස්සාද සූත්‍රය 2 නිමි.)**

---

## 7. අස්සාද සූත්‍රය. 3

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන්වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූසේක. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, ඉදින් රූපස්කන්ධයේ ආශ්වාදයක් නො වන්නේනම් සත්වයෝ රූපස්කන්ධයෙහි නො ඇලෙන්නාහුය. යම්හෙයකින් රූපස්කන්ධයේ ආශ්වාදය ඇද්ද? එහෙයින් සත්වයෝ රූපස්කන්ධයෙහි ඇලෙත්.

“මහණෙනි, ඉදින් රූපස්කන්ධයේ ආදීනව නොවන්නේ නම් සත්වයෝ රූපයෙහි නොකළකිරෙන්නාහුය. යම්සේ රූපස්කන්ධයේ ආදීනව ඇද්ද? එහෙයින් සත්වයෝ රූපස්කන්ධයෙහි කළකිරෙත්.

“මහණෙනි, ඉදින් රූපස්කන්ධයේ නිස්සරණයක් නො වන්නේ නම් සත්වයෝ රූපස්කන්ධයෙන් නොනික් මෙන්නාහුය. යම් හෙයකින් රූපස්කන්ධයේ නිස්සරණයක් ඇද්ද? එහෙයින් සත්වයෝ රූපස්කන්ධයෙන් නිදහස් වෙති.

3. “මහණෙනි, ඉදින් වේදනාවේ ආශ්වාදයක් නොවන්නේ නම් සත්වයෝ වේදනාවෙහි නො ඇලෙන්නාහුය. යම් හෙයකින් වේදනාවේ ආශ්වාදයක් ඇද්ද? එහෙයින් සත්වයෝ වේදනාවෙහි ඇලෙත්.

“මහණෙනි, ඉදින් වේදනාවේ ආදීනවයක් නොවන්නේ නම් සත්වයෝ වේදනාවෙහි නොකල කිරෙන්නාහුය. යම් හෙයකින් වේදනාවේ ආදීනවයක් ඇද්ද? එහෙයින් සත්වයෝ වේදනාවෙහි කළකිරෙත්.

“මහණෙනි, ඉදින් වේදනාවේ නිස්සරණයක් නොවන්නේ නම් සත්වයෝ වේදනාවෙන් නොනික්මෙන්නාහුය. යම් හෙයකින් වේදනාවේ නිස්සරණයක් ඇද්ද? එහෙයින් සත්වයෝ වේදනාවෙන් නික්මෙන්නාහුය.

4. ‘මහණෙනි, ඉදින් සඤ්ඤාවෙහි ආශ්වාදයක් නොවන්නේ නම් සත්වයෝ සංඥාවෙහි නො ඇලෙන්නාහුය.

යම් හෙයකින් සංඥාවේ ආශ්වාදයක් ඇද්ද? එහෙයින් සත්වයන් සංස්කාරයන්හි ඇලෙත්.

"මහණෙනි, ඉදින් සංඥාවේ ආදීනවයක් නොවන්නේ නම් සත්වයෝ සංඥාවෙහි නොකළකිරෙන්නාහුය. යම් හෙයකින් සංඥාවෙහි ආදීනවයක් ඇද්ද? එහෙයින් සත්වයෝ සංඥාවෙහි කලකිරෙත්.

"මහණෙනි, ඉදින් සංඥාවෙහි නිස්සරණයක් නොවන්නේ නම් සත්වයෝ සංඥාවෙන් නොනික්මෙන්නාහුය. යම් හෙයකින් සංඥාවේ නිස්සරණයක් ඇද්ද? එහෙයින් සත්වයෝ සංඥාවෙන් නික්මෙන්නාහුය.

**5.** "මහණෙනි, ඉදින් සංස්කාරයන්ගේ ආශ්වාදයක් නොවන්නේ නම් සත්වයෝ සංස්කාරයන්හි නො ඇලෙන්නාහුය. යම්හෙයකින් සංස්කාරයන්ගේ ආශ්වාදයක් ඇද්ද? එහෙයින් සත්වයෝ සංස්කාරයන්හි ඇලෙත්.

"මහණෙනි, ඉදින් සංස්කාරයන්ගේ ආදීනවයක් නො වන්නේ නම් සත්වයෝ සංස්කාරයෙහි නොකළකිරෙන්නාහුය. යම්හෙයකින් සංස්කාරයන්ගේ ආදීනවයක් ඇද්ද? එහෙයින් සත්වයෝ සංස්කාරයන් කෙරෙහි කළකිරෙත්.

"මහණෙනි, ඉදින් සංස්කාරයන්ගේ නිස්සරණයක් නො වන්නේ නම් සත්වයෝ සංස්කාරයන් කෙරෙන් නොනික්මෙන්නාහුය. යම්සේ සංස්කාරයන්ගේ නිස්සරණයක් ඇද්ද? එහෙයින් සත්වයෝ සංස්කාරයන් කෙරෙන් නික්මෙන්නාහුය.

**6.** "මහණෙනි, ඉදින් විඤ්ඤාණයේ ආශ්වාදයක් නො වන්නේ නම් සත්වයෝ විඤ්ඤාණයෙහි නො ඇලෙන්නාහුය. යම්හෙයකින් විඤ්ඤාණයාගේ ආශ්වාදයක් ඇද්ද? එහෙයින් සත්වයෝ විඤ්ඤාණයෙහි ඇලෙත්.

"මහණෙනි, ඉදින් විඤ්ඤාණයේ ආදීනවයක් නොවන්නේ නම් සත්වයෝ විඤ්ඤාණයෙහි නොකළකිරෙන්නාහුය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

යම්හෙයකින් විඤ්ඤාණයේ ආදීනවයක් ඇද්ද එහෙයින් සත්වයෝ විඤ්ඤාණයෙහි කළකිරෙත්.

"මහණෙනි, ඉදින් විඤ්ඤාණයේ නිස්සරණයක් නො වන්නේ නම් සත්වයෝ විඤ්ඤාණය කෙරෙන් නොනික්මෙන්නාහුය. යම්හෙයකින් විඤ්ඤාණයේ නිස්සරණයක් ඇද්ද? එහෙයින් සත්වයෝ විඤ්ඤාණය කෙරෙන් නික්මෙන්නාහුය.

"මහණෙනි, සත්වයෝ යම්තාක් කල් මේ පඤ්ච උපාදාන ස්කන්ධයන්ගේ ආශ්වාදය ආශ්වාදය වශයෙන්ද, ආදීනවය ආදීනවය වශයෙන්ද, නිස්සරණය නිස්සරණය වශයෙන්ද, තත්වාකාරයෙන් නොදක්නාහුද?

'මහණෙනි, සත්වයෝ ඒතාක්කල් දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, සත්ව ලෝකයෙන්ද, මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත ප්‍රජාව කෙරෙන්ද, බැහැරව නොයෙදී මිදී සීමාව ඉක්මවූ සිත් ඇතිව වාසය නොකරන්නාහුය.

"මහණෙනි, යම්කලෙක සත්වයෝ මේ පඤ්ච උපාදාන ස්කන්ධයන්ගේ ආශ්වාදය ආශ්වාදය වශයෙන්ද, ආදීනවය ආදීනවය වශයෙන්ද, නිස්සරණය නිස්සරණය වශයෙන්ද තත්වාකාරයෙන් අවබෝධ කළාහු වෙත්ද,

'මහණෙනි, එකල්හි සත්වයෝ දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, සත්ව ලෝකයෙන්ද, මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත ප්‍රජාව කෙරෙන්ද, බැහැරව නොයෙදී මිදී සීමාව ඉක්මවූ සිත් ඇත්තන්ව වාසය කරන්නාහුය.

**(හත්වෙනි අස්සාද සූත්‍රය නිමි. 3)**

---

## 8. අභිනන්දන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින්

කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යමෙක් රූපස්කන්ධයෙහි ඇලෙයි නම් හෙතෙම දුකෙහි ඇලෙන්නේය. යමෙක් දුකෙහි ඇලෙයි නම් ඔහු දුකින් නොමිදුනේයයි කියමි. යමෙක් වේදනාවෙහි ඇලෙයිද හෙතෙම දුකෙහි ඇලෙයි. යමෙක් දුකෙහි ඇලෙයි නම් ඔහු දුකින් නොමිදුනේයයි කියමි. යමෙක් සංඥාවෙහි ඇලෙයි නම් හෙතෙම දුකෙහි ඇලෙයි යමෙක් දුකෙහි ඇලෙයි නම් හෙතෙම දුකින් නොමිදුනේයයි කියමි. යමෙක් සංස්කාරයන්හි ඇලෙයි නම්, හෙතෙම දුකෙහි ඇලෙයි. යමෙක් දුකෙහි ඇලෙයි නම් ඔහු දුකින් නොමිදුනේයයි කියමි. යමෙක් විඤ්ඤාණයෙහි ඇලෙයි නම් හෙතෙම දුකෙහි ඇලෙයි. යමෙක් දුකෙහි ඇලෙයි නම් ඔහු දුකින් නොමිදුනේයයි කියමි.

3. "මහණෙනි, යමෙක් රූපයෙහි නොඇලෙයි නම්, හෙතෙම දුකෙහි නොඇලෙයි. යමෙක් දුකෙහි නොඇලෙයි නම් ඔහු දුකින් මිදුනේයයි කියමි. යමෙක් වේදනාවෙහි නොඇලෙයි නම් හෙතෙම දුකෙහි නොඇලෙයි. යමෙක් දුකෙහි නොඇලෙයි නම් ඔහු දුකින් මිදුනේයයි කියමි. යමෙක් සංඥාවෙහි නොඇලෙයි නම් හෙතෙම දුකෙහි නොඇලෙයි. යමෙක් දුකෙහි නොඇලෙයි නම් හෙතෙම දුකින් මිදුනේයයි කියමි. යමෙක් සංස්කාරයන්හි නොඇලෙයි නම් හෙතෙම දුකෙහි නොඇලෙයි. යමෙක් දුකෙහි නොඇලෙයි නම් ඔහු දුකින් මිදුනේයයි කියමි. යමෙක් විඤ්ඤාණයෙහි නොඇලෙයි නම් හෙතෙම දුකෙහි නොඇලෙයි යමෙක් දුකෙහි නොඇලෙයි නම් ඔහු දුකින් මිදුනේයයි කියමි, යනුයි."

**(අටවෙනි අභිනන්දන සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 9. උප්පාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, රූපයේ ඉපදීම පැවැත්ම හටගැන්ම පහළවීම යමක්ද, එය දුකේ ඉපදීමය. රෝගයන්ගේ පැවැත්මය. ජරා මරණයේ පහළවීමය. වේදනාවේ ඉපදීම, පැවැත්ම, හටගැන්ම, පහළවීම යමක්ද, එය දුකේ ඉපදීමය. රෝගයන්ගේ පැවැත්මය. ජරා මරණයේ පහළවීමය. සංඥාවේ ඉපදීම, පැවැත්ම, හටගැන්ම සහ පහළවීම යමක්ද, එය දුකේ ඉපදීමය. රෝගයන්ගේ පැවැත්මය. ජරා මරණයේ පහළවීමය. සංස්කාරයන්ගේ ඉපදීම, පැවැත්ම, හටගැන්ම, පහළවීම යමක්ද, එය දුකේ ඉපදීමය, රෝගයන්ගේ පැවැත්මය. ජරා මරණයේ පහළවීමය. විඥ්ඥාණයේ ඉපදීම, පැවැත්ම, හටගැන්ම, පහළවීම යමක්ද, එය දුකේ ඉපදීමය. රෝගයන්ගේ පැවැත්මය. ජරා මරණයේ පහළවීමය.

3. "මහණෙනි, රූපයේ නිරොධය, සංසිඳීම, විනාශය, යමක්ද, එය දුකේ නිරොධය, රෝගයන්ගේ සංසිඳීමය, ජරා මරණයේ විනාශය වෙයි.

"වේදනාවේ නිරොධය, සංසිඳීම, විනාශය යමක්ද, එය දුකේ නිරොධය, රෝගයන්ගේ සංසිඳීමය සහ ජරා මරණයේ විනාශය වෙයි.

"සංඥාවේ නිරොධය, සංසිඳීම, විනාශය යමක්ද, එය දුකේ නිරොධය, රෝගයන්ගේ සංසිඳීමය සහ ජරා මරණයේ විනාශය වෙයි.

"සංස්කාරයන්ගේ නිරොධය, සංසිඳීම, විනාශය යමක්ද, එය දුකේ නිරෝධය, රෝගයන්ගේ සංසිඳීමය සහ ජරා මරණයේ විනාශය වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"විඤ්ඤාණයේ නිරොධය, සංසිඳීම, විනාශය යමක්ද, එය දුක්ඛයාගේ නිරොධය, රෝගයන්ගේ සංසිඳීම, ජරා මරණයන්ගේ විනාශය වන්නේය.

(නවවෙනි උප්පාද සූත්‍රය නිමි.)

---

## 10. අඝමූල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, තොපට දුකද, දුකට මුලද දේශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, දුක කවරේද? මහණෙනි, රූපය දුකකි. වේදනාව දුකකි. සංඥාව දුකකි. සංස්කාර දුකකි. විඤ්ඤාණය දුකකි. මහණෙනි, මේ දුකයයි කියනු ලැබේ.

3. "මහණෙනි, දුකට මුල කවරේද? යම් ඒ නැවත නැවත ඉපදීම ඇති කරන්නාවූ, නන්දිරාගය සහිතවූ ඒ ඒ භවයෙහි ඇලෙන්නාවූ යම් ඒ තෘෂ්ණාවක් වේද, එනම්:- කාම තණ්හාවය, භව තණ්හාවය, විභව තණ්හාවය යන මොහුයි. මහණෙනි, මේ දුකට මුලයි.

(දසවෙනි අඝමූල සූත්‍රය නිමි.)

---

## 11. පභඞ්ගු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන්

ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, තොපට බිඳෙන ස්වභාවය ඇති ධර්මයද, නොබිඳෙන ස්වභාවය ඇති ධර්මයද, දේශනා කරන්නෙමි. එය අසව්. බිඳෙන ස්වභාවය ඇති ධර්මය කුමක්ද? නොබිඳෙන ස්වභාවය ඇති ධර්මය කුමක්ද?

3. "මහණෙනි, රූපය බිඳෙන ස්වභාවය ඇත්තේය. ඒ රූපයාගේ යම් නිරොධයක්, විනාශයක්, සංසිඳීමක් ඇත්තේද? එය නොබිඳෙන ස්වභාවය ඇත්තේය.

"වේදනාව බිඳෙන ස්වභාවය ඇත්තේය. වේදනාවේ යම් නිරොධයක්, සංසිඳීමක්, විනාශයක් වේද, ඒ නොබිඳෙන ස්වභාවය ඇත්තේය.

"සංඥාව බිඳෙන ස්වභාවය ඇත්තේය. සංඥාවේ යම් නිරෝධයක්, සංසිඳීමක්, විනාශයක් වේද, ඒ නොබිඳෙන ස්වභාව ඇත්තේය.

'සංස්කාරයෝ බිඳෙන ස්වභාවය ඇත්තාහුය. සංස්කාරයන්ගේ යම් නිරෝධයක්, සංසිඳීමක්, විනාශයක් වේද, ඒ නොබිඳෙන ස්වභාව ඇත්තේය.

"විඤ්ඤාණය බිඳෙන ස්වභාවය ඇත්තේය. විඤ්ඤාණයේ යම් නිරෝධයක්, සංසිඳීමක්, විනාශවීමක් වේද, ඒ නොබිඳෙන ස්වභාව ඇත්තේය.

**(එකොළොස්වෙනි පභංගු සූත්‍රය.)**

---

**භාර වර්ගයෙහි සංග්‍රහය.**

(භාර සූත්‍රය, පරිඤ්ඤා සූත්‍රය, අභිජාන සූත්‍රය, ඡන්දරාග සූත්‍රය, අස්සාද සූත්‍ර තුනය, අභිනන්දන සූත්‍රය, උප්පාද සූත්‍රය, අඝමූල සූත්‍රය, පභඞ්ගු සූත්‍රය යන මොහුයි.)

**(තුන්වැනි භාර වර්ගයයි.)**

---

# 4. නතුම්හාක වග්ගය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යමක් තොපගේ නොවේ නම් එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය මහණෙනි, කුමක් තොපගේ නොවේද? මහණෙනි, රූපය තොපගේ නොවේ. එය දුරු කරව්. එය දුරු කිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය. වේදනාව තොපගේ නොවේ. එය දුරු කරව්. එය දුරු කිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. සඤ්ඤාව තොපගේ නොවේ. එය දුරු කරව්. එය දුරු කිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය. සංස්කාරයෝ තොපගේ නොවෙත්. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය. විඤ්ඤාණය තොපගේ නොවේ එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය.

3. "මහණෙනි, යම්සේ වනාහි මේ ජේතවනයෙහි තණ, දැව, අතු, කොළ යන යමක් වේද, ජනයා එය ගෙනයන්නේ හෝ වේද, දවන්නේ හෝ වේද, සුදුස්සක් කරන්නේ හෝ වේද, එකල්හි තොපට ජනයා අප ගෙනයන්නේය කියා හෝ, දවන්නේය කියා හෝ, සුදුස්සක් කරන්නේය කියා හෝ කල්පනා වන්නේද?

"ස්වාමීනි, එසේ නොවේමය.

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, එය අපගේ හෝ තමා හෝ තමාගේ දෙයක් හෝ නොවන හෙයිනි"

4. "මහණෙනි, එපරිද්දෙන්ම රූපය තොපගේ නොවේ එය දුරු කරව්. එය දුරු කිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය. වේදනාව තොපගේ නොවේ. එය දුරු කරව්. එය දුරු කිරීම හිත පිණිස, සැප පිණිස වන්නේය. සංඥාව තොපගේ නොවේ. එය දුරුකරව්. එය දුරු කිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය. සංස්කාරයෝ තොපගේ නොවේ. එය දුරුකරව් එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. විඤ්ඤාණය තොපගේ නොවේ. එය දුරු කරව්. එය දුරු කිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය.

**(පළමුවෙනි නතුම්හාක සූත්‍රය නිමි. 1.)**

---

## 2. නතුම්හාක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යමක් තොපගේ නොවේ නම් එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය. මහණෙනි, කුමක් තොපගේ නොවේද?

3. "මහණෙනි, රූපය තොපගේ නොවේ. එය දුරු කරව්. එය දුරු කිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය. වේදනාව තොපගේ නොවේ. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය. සංඥාව තොපගේ නොවේ. එය දුරුකරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය. සංස්කාර තොපගේ නොවේ. එය දුරුකරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය. විඤ්ඤාණය තොපගේ නොවේ. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය.

"මහණෙනි, යමක් තොපගේ නොවේ නම් එය දුරු කරව්. එය දුරු කිරීම තොපට හිත පිණිස, සැප පිණිස වන්නේය."

**(දෙවෙනි නතුම්හාක සූත්‍රය නිමි. 2.)**

---

## 3. භික්ඛු සූත්‍රය. 1.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැන්හි පැමිණියේය පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය.

2. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගෙන් යම් ධර්මයක් අසා තනිව, විවේකව අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙම්ද, (එබඳුවූ) ධර්මයක් භාග්‍යවතුන් වහන්සේ කොටින් දේශනා කරන සේක්වා" යනුයි.

3. "මහණ, යමක් (කාමරාගාදී කෙලෙස්) අත්නොහැර පවතියිද, එය (කාමරාගාදී කෙලෙස්) සංඛ්‍යාවට පැමිණෙයි. යමක් (කෙලෙස්) අත්නොහැර නොවතියි නම් එය (කෙලෙස්) සංඛ්‍යාවට නොපැමිණෙයි" කියා වදාළේය.

භික්ෂුතෙමේ "භාග්‍යවතුන් වහන්ස, දැනගන්නා ලදී. සුගතයන් වහන්ස, දැනගන්නාලදීයයි" කීය.

4. "මහණ, ඔබ කෙසේ නම් මා විසින් සංක්ෂෙපයෙන් කියනලද වචනයාගේ අර්ථය විස්තර වශයෙන් දැනගත්තෙහිද?"

"ස්වාමීනි, රූපය අත්නොහැර පවතියි නම්, එය ඒ (රාගයෙන් යුත් පුද්ගලයා යනාදි) සංඛ්‍යාවට පැමිණෙයි. ඉදින් වේදනාව අත්නොහැර පවතියි නම්, එය ඒ සංඛ්‍යාවට යයි. ඉදින් සංඥාව අත්නොහැර පවතියි නම් එය ඒ සංඛ්‍යාවට යයි.

ඉදින් සංස්කාරයන් අත්නොහැර පවතියි නම් එය ඒ සංඛ්‍යාවට යයි. ඉදින් විඤ්ඤාණය අත්නොහැර පවතියි නම් එය ඒ සංඛ්‍යාවට පැමිණෙයි.

**5.** "ස්වාමීනි, ඉදින් රූපය අත්නොහැර නොපවතියි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි. ඉදින් වේදනාව අත්නොහැර නොපවතියි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි. ඉදින් සංඥාව අත්නොහැර නොපවතියි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි. ඉදින් සංස්කාරයන් අත්නොහැර නොපවතියි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි. ඉදින් විඤ්ඤාණය අත්නොහැර නොපවතියි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි. ස්වාමීනි, මම මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරනලද වචනයාගේ අර්ථය විස්තර වශයෙන් දැනගනිමියි කීය."

"මහණ, යහපති! මහණ, යහපති!! ඔබ මා විසින් සංක්ෂෙපයෙන් කියනලද වචනයාගේ අර්ථය විස්තර වශයෙන් දැන ගත්තෙහිය.

**6.** "මහණ, ඉදින් රූපය අත්නොහැර පවතියි නම් එය ඒ සංඛ්‍යාවට යයි. ඉදින් වේදනාව අත්නොහැර පවතියි නම් එය ඒ සංඛ්‍යාවට යයි. ඉදින් සංඥාව අත්නොහැර පවතියි නම් එය ඒ සංඛ්‍යාවට යයි. ඉදින් සංස්කාර අත්නොහැර පවතියි නම් එය ඒ සංඛ්‍යාවට යයි. ඉදින් විඤ්ඤාණය අත් නොහැර පවතියි නම් එය ඒ සංඛ්‍යාවට යයි.

**7.** "මහණ, ඉදින් රූපය අත්නොහැර නොපවතියි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි. ඉදින් වේදනාව අත්නොහැර නොපවතියි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි. ඉදින් සංඥාව අත්නොහැර නොපවතියි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි. ඉදින් සංස්කාරයන් අත්නොහැර නොපවතියි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි. ඉදින් විඤ්ඤාණය අත්නොහැර නොපවතියි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි.

"මහණ, මා විසින් සංක්ෂෙපයෙන් කියනලද වචනයාගේ අර්ථය මෙසේ දතයුතුයයි" වදාළේය.

8. එකල්හි වනාහි ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ වචනයට විශෙෂයෙන් සතුටුවී අනුමෝදන්වී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ, පැදකුණුකොට ගියේය. එකල්හි ඒ මහණතෙමේ තනිව විවේකව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව ආත්මපරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වෙත්ද, නොබෝ කලකින්ම මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවරකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ඨ ඥානයෙන් අවබෝධ කොට ඊට පැමිණ, වාසය කෙළේය.

ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව සඳහා කළයුතු අනිකක් නැත්තේයයි දැන ගත්තේය. ඒ මහණතෙමේ රහතුන් අතුරෙන් එක්තරා රහත් භික්ෂුවක් විය.

**(තුන්වෙනි භික්ඛු සූත්‍රය 1 නිමි.)**

---

## 4. භික්ඛු සූත්‍රය. 2.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය, එක් පැත්තක හුන්නාවූ, ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන්. වහන්සේට මෙසේ සැළකෙළේය.

2. "ස්වාමීනි, යම්බඳුවූ මම භාග්‍යවතුන්වහන්සේගේ ධර්මය අසා තනිව විවේකව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව ආත්මපරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙම්ද, භාග්‍යවතුන් වහන්සේ මට (එබඳුවූ) ධර්මයක් කොටින් දේශනා කරන සේක්වා යනුවෙනි."

"මහණ යමක් අත්නොහැර පවතීද, එය ඒ සමග මැරෙයි. යමක් ඒ සමග මැරෙයිද, එය ඒ (රාගයෙන් යුත් පුද්ගලයෙක යනාදීන්) සංඛ්‍යාවට යයි. යමක් අත්නොහැර නොපවතියිද, එය ඒ සමග නොමැරෙයි. එය ඒ සංඛ්‍යාවට නොයයි" කියා භාග්‍යවතුන්වහන්සේ වදාළේය. "භාග්‍යවතුන් වහන්ස, මා විසින් දැනගන්නා ලදී. සුගතයන් වහන්ස, මා විසින් දැනගන්නා ලදැයි" භික්ෂුතෙම කීය.

3. "මහණ, මා විසින් කොටින් දෙසන ලද්දහුගේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දැන ගත්තෙහිදැ"යි? විචාළේය.

"ස්වාමීනි, ඉදින් රූපය අත්නොහැර පවතීද එය ඒ සමග මැරෙයි. යමක් ඒ සමග මැරෙයිද, එය ඒ සංඛ්‍යාවට යයි.

"ඉදින් වේදනාව අත්නොහැර පවතීද, එය ඒ සමග මැරෙයි. යමක් එය ඒ සමග මැරෙයිද, ඒ සංඛ්‍යාවට යයි.

"ඉදින් සංඥාව අත්නොහැර පවතීද, එය ඒ සමග මැරෙයි. යමක් ඒ සමග මැරෙයිද, එය ඒ සංඛ්‍යාවට යයි.

"ඉදින් සංස්කාරයන් අත්නොහැර පවතීද, එය එ සමග මැරෙයි. යමක් ඒ සමග මැරෙයිද, එය ඒ සංඛ්‍යාවට යයි

"ඉදින් විඤ්ඤාණය අත්නොහැර පවතීද, එය ඒ සමග මැරෙයි. යමක් ඒ සමග මැරෙයිද, එය ඒ සංඛ්‍යාවට යයි."

5. "මහණ, ඉදින් රූපය අත්නොහැර නොපවතියි නම් එය ඒ හා සමග නොමැරෙයි. යමක් ඒ හා සමග නොමැරෙයි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි.

"ඉදින් වේදනාව අත්නොහැර නොපවතියි නම් එය ඒ හා සමග නොමැරෙයි. යමක් ඒ හා සමග නොමැරෙයි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි.

"ඉදින් සංඥාව අත්නොහැර නොපවතියි නම් එය ඒ හා සමග නොමැරෙයි. යමක් ඒ හා සමග නොමැරෙයි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි.

'ඉදින් සංස්කාරයන් අත්නොහැර නොපවතියි නම් එය ඒ හා සමග නොමැරෙයි. යමක් ඒ හා සමග නොමැරෙයි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි.

"ඉදින් විඤ්ඤාණය අත්නොහැර නොපවතියි නම් එය ඒ අනුසය හා සමග නොමැරෙයි. යමක් ඒ හා සමග නොමැරෙයි නම් එය ඒ සංඛ්‍යාවට නොයයි.

"මහණ, මා විසින් කොටින් කියන ලද මේ දේශනයාගේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දත යුත්තේයයි" වදාළේය.

**6.** එකල්හි ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට සතුටුවී අනුමෝදන්වී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන්වහන්සේට වැඳ, පැදකුණුකොට ගියේය. ඉක්බිති ඒ භික්ෂුතෙම තනිව විවෙකව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ කුලපුත්‍රතෙම යම් අර්ථයක් උදෙසා මනාකොට ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවෙද්ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව අවසානකොට ඇති ඒ උතුම් අර්ථය නොබෝ කලකින් තෙමේ විශිෂ්ඨ ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මතු කළ යුත්තක් නැතැයි දැන ගත්තේය. ඒ මහණතෙම රහතුන් අතුරෙන් එක්තරා රහත් භික්ෂුවක් විය.

**(හතරවෙනි භික්ඛු සූත්‍රය 2 නිමි.)**

---

## 5. ආනන්ද සූත්‍රය. 1.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය.

පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "ආනන්දය, ඉදින් තොපගෙන් 'ඇවැත්වූ ආනන්දය, කවර නම් ධර්මයන්ගේ ඉපදීම පෙනේද, විනාශය පෙනේද, පවත්නාවුන්ගේ දිරීම පෙනේදැයි,' අසන්නාහු නම් ආනන්දය, මෙසේ අසන ලද්දාවූ තෙපි කුමකැයි ප්‍රකාශ කරන්නහුද?"

3 "ස්වාමීනි, මාගෙන් 'ඇවත්වූ ආනන්දය, කවර නම් ධර්මයන්ගේ ඉපදීම පෙනේද, විනාශය පෙනේද, පවත්නාවුන්ගේ දිරීම පෙනේදැයි' අසන්නාහු නම් ස්වාමීනි, මෙසේ අසන ලද්දාවූ මම මෙසේ ප්‍රකාශ කරන්නෙමි.

4. "ඇවැත්නි, රූපයාගේ ඉපදීම පෙනෙයි. නැසීම පෙනෙයි. පවත්නහුගේ දිරීම පෙනේ. වේදනාවගේ ඉපදීම පෙනේ. විනාශය පෙනේ. පවත්නාහුගේ දිරීම පෙනේ. සංඥාවගේ ඉපදීම පෙනේ. විනාශය පෙනේ. පවත්නාහුගේ දිරීම පෙනේ. සංස්කාරයන්ගේ ඉපදීම පෙනේ. විනාශය පෙනේ. පවත්නාහුගේ දිරීම පෙනේ. විඤ්ඤාණයාගේ ඉපදීම පෙනේ. විනාශය පෙනේ. පවත්නාහුගේ දිරීම පෙනේ.

6. 'ඇවැත්නි, මේ ධර්මයන්ගේ වනාහි ඉපදීම පෙනේ. විනාශය පෙනේ. පවත්නාහුගේ දිරීම පෙනෙයි කියායි. ස්වාමීනි, මෙසේ අසන ලද්දාවූ මම මෙසේ ප්‍රකාශ කරන්නෙමියි" (කීයේය.)

7. "ආනන්දය, යහපති, යහපති, ආනන්දය, රූපයාගේ ඉපදීම පෙනෙයි. විනාශය පෙනෙයි. පවත්නාහුගේ දිරීම පෙනෙයි. වේදනාවගේ ඉපදීම පෙනේ. විනාශය පෙනේ. පවත්නාහුගේ දිරීම පෙනේ. සංඥාවගේ ඉපදීම පෙනේ. විනාශය පෙනේ. පවත්නාහුගේ දිරීම පෙනේ. සංස්කාරයන්ගේ ඉපදීම පෙනේ. විනාශය පෙනේ. පවත්නාහුගේ දිරීම පෙනේ. සංස්කාරයන්ගේ ඉපදීම පෙනේ. විනාශය පෙනේ. පවත්නාහුගේ දිරීම පෙනේ. විඤ්ඤාණයාගේ ඉපදීම පෙනේ. විනාශය පෙනේ. පවත්නාහුගේ දිරීම පෙනේ.

7. "ආනන්දය, මේ ධර්මයන්ගේ වනාහි ඉපදීම පෙනෙයි. විනාශය පෙනෙයි. පවත්නහුගේ දිරීම පෙනෙයි. ආනන්දය, මෙසේ අසන ලද්දාවූ තොපි මෙසේ ප්‍රකාශ කරන්නාහුය."

**(පස්වෙනි ආනන්ද සූත්‍රය 1 නිමි.)**

---

## 6. ආනන්ද සූත්‍රය. 2

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. "ආනන්දය ඉදින් තොපගෙන් 'ඇවැත්වූ ආනන්දය, කවර ධර්මයන්ගේ ඉපදීම පෙනුණේද, විනාශය පෙනුණේද පවත්නාහුගේ දිරීම පෙනුණේද, කවර ධර්මයන්ගේ ඉපදීම පෙනෙන්නේද, විනාශය පෙනෙන්නේද, පවත්නහුගේ දිරීම පෙනෙන්නේද, කවර ධර්මයන්ගේ ඉපදීම පෙනේද, විනාශය පෙනේද පවත්නහුගේ දිරීම පෙනේදැයි' අසන්නහු නම් ආනන්දය මෙසේ අසනලද්දාවූ තෙපි කුමකැයි ප්‍රකාශකරන්නහුදැයි" විචාළේය.

3. "ස්වාමීනි, ඉදින් මාගෙන් 'ඇවැත්වූ ආනන්දය කවරනම් ධර්මයන්ගේ ඉපදීම පෙනුණේද, විනාශය පෙනුණේද පවත්නහුගේ දිරීම පෙනුණේද, කවර නම් ධර්මයන්ගේ ඉපදීම පෙනෙන්නේද, විනාශය පෙනෙන්නේද, පවත්නහුගේ දිරීම පෙනෙන්නේද, කවර ධර්මයන්ගේ ඉපදීම පෙනේද, විනාශය පෙනේද පවත්නහුගේ දිරීම පෙනේදැයි' අසන්නාහු නම්, ස්වාමීනි මෙසේ අසනලද්දාවූ මම මෙසේ ප්‍රකාශ කරන්නෙමි."

4 'ඇවැත්නි, යම් රූපයක් වනාහි ඉකුත්වූයේද, නිරුද්ධවූයේද වෙනස්වූයේද ඒ රූපයාගේ ඉපදීම පෙනුණේය.

විනාශය පෙනුණේය. පවත්නහුගේ දිරීම පෙනුණේය. යම් වේදනාවක් තොමෝ ඉකුත්වූවාද නිරුද්ධවූවාද වෙනස්වූවාද ඒ වේදනාවගේ ඉපදීම පෙනුණේය. විනාශය පෙනුණේය. පවත්නහුගේ දිරීම පෙනුණේය.

**5.** 'යම් සංඥාවක් තොමෝ ඉකුත්වූවාහුද, නිරුද්ධවූවාහුද, වෙනස්වූවාහුද, ඒ සංඥාවේ ඉපදීම පෙනුණේය. විනාශය පෙනුණේය. පවත්නහුගේ දිරීම පෙනුණේය.

'යම් සංස්කාරයෝ ඉකුත්වූවාහුද, නිරුද්ධවූවාහුද, වෙනස්වූවාහුද, ඔවුන්ගේ ඉපදීම පෙනුණේය. විනාශය පෙනුණේය. පවත්නහුගේ දිරීම පෙනුණේය.

'යම් විඥානයක් ඉකුත්වූයේද, නිරුද්ධවූයේද, වෙනස්වූයේද, ඒ විඥානයාගේ ඉපදීම පෙනුණේය. විනාශය පෙනුණේය. පවත්නාහුගේ දිරීම පෙනුණේය.

'ඇවැත්නි, මේ ධර්මයන්ගේ වනාහි ඉපදීම පෙනුණේය. විනාශය පෙනුණේය. පවත්නාහුගේ දිරීම පෙනුණේය.

**6.** "ඇවැත්නි, යම් රූපයක් වනාහි නූපන්නේද පහළ නුවූයේද, ඒ රූපයාගේ ඉපදීම පෙනෙන්නේය. විනාශය පෙනෙන්නේය. පවත්නාහුගේ දිරීම පෙනෙන්නේය.

'යම් වේදනාවක් වනාහි නූපන්නේද, පහළ නුවූයේද, ඒ වේදනාවේ ඉපදීම පෙනෙන්නේය. විනාශය පෙනෙන්නේය. පවත්නාහුගේ දිරීම පෙනෙන්නේය.

'යම් සංඥාවක් වනාහි නූපන්නේද, පහළ නොවූයේද, ඒ සංඥාවේ ඉපදීම පෙනෙන්නේය. විනාශය පෙනෙන්නේය. පවත්නාහුගේ දිරීම පෙනෙන්නේය.

'යම් සංස්කාරයක් වනාහි නූපන්නේද, පහළ නොවූයේද, ඒ සංස්කාරයන්ගේ ඉපදීම පෙනෙන්නේය. විනාශය පෙනෙන්නේය. පවත්නහුගේ දිරීම පෙනෙන්නේය. 'යම් විඥානයක්, නූපන්නේද, පහළ නොවූයේද, විඥානයාගේ ඉපදීම වනාහි පෙනෙන්නේය. විනාශය පෙනෙන්නේය. පවත්නහුගේ දිරීම පෙනෙන්නේය.

'ඇවැත්නි, මේ ධර්මයන්ගේ වනාහි ඉපදීම පෙනෙන්නේය. විනාශය පෙනෙන්නේය. පවත්නාහුගේ දිරීම පෙනෙන්නේය.

7. 'ඇවැත්නි, යම් රූපයක් වනාහි උපන්නේද, පහළ වූයේද, ඔහුගේ ඉපදීම පෙනෙයි. නැසීම පෙනෙයි. පවත්නහුගේ දිරීම පෙනෙයි.

'යම් වේදනාවක් උපන්නීද, පහළවූවාද, ඇයගේ ඉපදීම පෙනෙයි. නැසීම පෙනෙයි. පවත්නාහුගේ දිරීම පෙනෙයි.

'යම් සංඥාවක් උපන්නේද, පහළවූයේද, ඔහුගේ ඉපදීම පෙනෙයි නැසීම පෙනෙයි. පවත්නාහුගේ දිරීම පෙනෙයි.

"යම් සංස්කාරයක් උපන්නාහුද, පහළ වූවාහුද, ඔහුගේ ඉපදීම පෙනෙයි. නැසීම පෙනෙයි. පවත්නාහුගේ දිරීම පෙනෙයි

යම් විඥානයක් උපන්නේද, පහළවූයේද, ඔහුගේ ඉපදීම පෙනෙයි. නැසීම පෙනෙයි. පවත්නාහුගේ දිරීම පෙනෙයි.

ඇවැත්නි, මේ ධර්මයන්ගේ වනාහි ඉපදීම පෙනෙයි, නැසීම පෙනෙයි. පවත්නාහුගේ දිරීම පෙනෙයි. "ස්වාමීනි මෙසේ අසන ලද්දාවූ මම මෙසේ ප්‍රකාශ කරන්නෙමි"යි කීය.

8. "ආනන්දය යහපති යහපති! ආනන්දය, යම් රූපයක් ඉකුත් වූයේද, නිරුද්ධ වූයේද, වෙනස් වූයේද, මේ රූපයාගේ ඉපදීම පෙනුණේය. නැසීම පෙනුණේය. පවත්නහුගේ දිරීම පෙනුණේය.

'යම් වේදනාවක් ඉකුත් වූයේද, නිරුද්ධ වූයේද, වෙනස් වූයේද, මේ වේදනාවේ ඉපදීම පෙනුණේය. නැසීම පෙනුණේය. පවත්නහුගේ දිරීම පෙනුණේය.

"යම් සංඥාවක් ඉකුත් වූයේද, නිරුද්ධ වූයේද, වෙනස් වූයේද, මේ සංඥාවේ ඉපදීම පෙනුණේය. නැසීම පෙනුණේය. පවත්නහුගේ දිරීම පෙනුණේය.

"යම් සංස්කාරයක් ඉකුත් වූයේද, නිරුද්ධ වූයේද, වෙනස් වූයේද, මේ සංස්කාරයන්හි ඉපදීම පෙනුණේය. නැසීම පෙනුණේය. පවත්නහුගේ දිරීම පෙනුණේය.

"යම් විඥානයක් ඉකුත් වූයේද, නිරුද්ධ වූයේද, වෙනස් වූයේද, මේ විඥානයේ ඉපදීම පෙනුණේය. නැසීම පෙනුණේය. පවත්නහුගේ දිරීම පෙනුණේය.

"ආනන්දය, මේ ධර්මයන්ගේ වනාහි ඉපදීම පෙනුණේය. නැසීම පෙනුණේය. පවත්නාහුගේ දිරීම පෙනුණේය.

**9.** "ආනන්දය, යම් රූපයක් වනාහි නූපන්නේද, පහළ නොවූයේද ඒ රූපයාගේ ඉපදීම පෙනෙන්නේය. නැසීම පෙනෙන්නේය. පවත්නාහුගේ දිරීම පෙනෙන්නේය.

"යම් වේදනාවක් වනාහි නූපන්නේද, පහළ නොවූයේද, ඒ වේදනාවේ ඉපදීම පෙනෙන්නේය. නැසීම පෙනෙන්නේය. පවත්නාහුගේ දිරීම පෙනෙන්නේය.

"යම් සංඥාවක් වනාහි නූපන්නේද, පහළ නොවූයේද, ඒ සංඥාවේ ඉපදීම පෙනෙන්නේය. නැසීම පෙනෙන්නේය පවත්නහුගේ දිරීම පෙනෙන්නේය.

"යම් සංස්කාරයක් වනාහි නූපන්නේද, පහළ නොවූයේද, ඒ සංස්කාරයන්ගේ ඉපදීම පෙනෙන්නේය. නැසීම පෙනෙන්නේය. පවත්නහුගේ දිරීම පෙනෙන්නේය.

"යම් විඥානයක් නූපන්නේද, පහළ නොවූයේද ඒ විඥානයාගේ ඉපදීම පෙනෙන්නේය. නැසීම පෙනෙන්නේය. පවත්නාහුගේ දිරීම පෙනෙන්නේය.

"ආනන්දය මේ ධර්මයන්ගේ වනාහි ඉපදීම පෙනෙන්නේය. නැසීම පෙනෙන්නේය. පවත්නාහුගේ දිරීම පෙනෙන්නේය.

**10.** "ආනන්දය, යම් රූපයක් උපන්නේද, පහළ වූයේද, ඔහුගේ ඉපදීම පෙනේ. නැසීම පෙනේ. පවත්නහුගේ දිරීම පෙනේ.

"යම් වේදනාවක් උපන්නේද, පහළ වූයේද, ඔහුගේ ඉපදීම පෙනේ. නැසීම පෙනේ. පවත්නහුගේ දිරීම පෙනේ.

"යම් සංඥාවක් උපන්නේද, පහළ වූයේද, ඔහුගේ ඉපදීම පෙනේ. නැසීම පෙනේ. පවත්නහුගේ දිරීම පෙනේ.

"යම් සංස්කාරයක් උපන්නේද, පහළ වූයේද, ඔහුගේ ඉපදීම පෙනේ. නැසීම පෙනේ. පවත්නහුගේ දිරීම පෙනේ.

"යම් විඥානයක් උපන්නේද, පහළ වූයේද, ඔහුගේ ඉපදීම පෙනේ. නැසීම පෙනේ. පවත්නහුගේ දිරීම පෙනේ.

"ආනන්දය, මේ ධර්මයන්ගේ වනාහි ඉපදීම පෙනේ. නැසීම පෙනේ. පවත්නහුගේ දිරීම පෙනේ. ආනන්දය, මෙසේ අසනලද්දාවූ තෙපි මෙසේ ප්‍රකාශ කරන්නෙහියයි වදාළේය.

**(හයවෙනි ආනන්ද සූත්‍රය 2 නිමි.)**

---

## 7. අනුධර්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, නවලොකොත්තර ධර්මයට අනුකූලවූ ප්‍රතිපත්තියෙහි පිළිපන්නාවූ භික්ෂුවහට මේ අනුකූල ධර්මය වෙයි. රූපයෙහි කලකිරීම බහුලකොට ඇතියෙක්ව වාසය කරන්නේය යන යමක්වේද, වේදනාවෙහි කලකිරීම බහුලකොට වාසයකරන්නේය යන යමක්වේද, සංඥාවෙහි කලකිරීමට බහුලකොට ඇතිව වාසය කරන්නේය යන යමක් වේද, සංස්කාරයන්හි කලකිරීම බහුලකොට ඇතිව වාසය කරන්නේය යන යමක්වේද, විඥානයෙහි කලකිරීම බහුල කොට ඇතිව වාසයකරන්නේය යන යමක්වේද යන මේ අනුකූල ධර්මයයි.

3. "හෙතෙම රූපයෙහි කලකිරීම බහුලකොට ඇතිව වාසය කරන්නේ වේදනාවෙහි කලකිරීම බහුලකොට ඇතිව වාසයකරන්නේ සංඥාවෙහි කලකිරීම බහුලකොට ඇතිව

වාසයකරන්නේ සංස්කාරයන්හි කලකිරීම බහුලකොට ඇතිව වාසයකරන්නේ විඥානයෙහි කලකිරීම බහුලකොට ඇතිව වාසයකරන්නේ, රූපය පිරිසිඳ දනී. වේදනාව පිරිසිඳ දනී. සංඥාව පිරිසිඳ දනී. සංස්කාරයන් පිරිසිඳ දනී. විඥානය පිරිසිඳ දනී.

4. "හෙතෙම රූපය පිරිසිඳ දන්නේ වේදනාව පිරිසිඳ දන්නේ සංඥාව පිරිසිඳ දන්නේ, සංස්කාරයන් පිරිසිඳ දන්නේ විඥානය පිරිසිඳ දන්නේ රූපය කෙරෙන් මිදෙයි. වේදනාව කෙරෙන් මිදෙයි. සංඥාව කෙරෙන් මිදෙයි. සංස්කාරයන් කෙරෙන් මිදෙයි. විඥානය කෙරෙන් මිදෙයි. ජාතියෙන්ද ජරාමරණයන්ගෙන්ද ශෝකයන්ගෙන්ද පරිදෙවයන්ගෙන්ද දුක්වලින්ද දොම්නස්වලින්ද දැඩි වෙහෙසින්ද මිදෙයි. සියලු දුක්වලින් මිදේයයි" කියමි.

(හත්වෙනි අනුධර්ම සූත්‍රය 1. නිමි)

---

## 8. අනුධර්ම සූත්‍රය 2.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට මේ කාරණය වදාළසේක. "නවලොකොත්තර ධර්මයට අනුකූලවූ ප්‍රතිපත්තියෙහි පිළිගන්නාවූ භික්ෂුවහට මේ අනුකූල ධර්මයවේ. රූපයෙහි අනිත්‍ය දකිමින් වාසය කරන්නේය යන යමක්වේද වේදනාවෙහි අනිත්‍යය දකිමින් වාසය කරන්නේය යන යමක්වේද සංඥාවෙහි අනිත්‍ය දකිමින් වාසය කරන්නේය යන යමක් වේද සංස්කාරයෙහි අනිත්‍යය දකිමින් වාසය කරන්නේය

යන යමක්වේද, විඤ්ඤාණයෙහි අනිත්‍යය දකිමින් වාසය කරන්නේය යන යමක් වේද යනු අනුකූල ධර්මය වේ.

3. හෙතෙම රූපයෙහි අනිත්‍යය දකිමින් වාසය කරන්නේ වේදනාවෙහි අනිත්‍ය දකිමින් වාසය කරන්නේ සංඥාවෙහි අනිත්‍ය දකිමින් වාසය කරන්නේ සංස්කාරයන්හි අනිත්‍ය දකිමින් වාසය කරන්නේ විඤ්ඤාණයෙහි අනිත්‍ය දකිමින් වාසය කරන්නේ රූපය පිරිසිඳ දනී. වේදනාව පිරිසිඳ දනී. සංඥාව පිරිසිඳ දනී. සංස්කාරයන් පිරිසිඳ දනී. විඥානය පිරිසිඳ දනී.

4. "හෙතෙම රූපය පිරිසිඳ දන්නේ වේදනාව පිරිසිඳ දන්නේ සංඥාව පිරිසිඳ දන්නේ සංස්කාරයන් පිරිසිඳ දන්නේ රූපය කෙරෙන් මිදෙයි. වේදනාව කෙරෙන් මිදෙයි. සංඥාව කෙරෙන් මිදෙයි. සංස්කාරයන් කෙරෙන් මිදෙයි. විඥානය කෙරෙන් මිදෙයි. ජාතියෙන්ද ජරාමරණයෙන්ද සෝකයන්ගෙන්ද පරිදේවයන්ගෙන්ද දුක්වලින් දොම්නස්වලින්ද දැඩිවෙහෙසින්ද මිදෙයි. සියලු දුක්වලින් මිදේයයි කියමි."

**(8 වෙනි අනුධර්ම සූත්‍රය නිමි.)**

---

## 9. අනුධර්ම සූත්‍රය 3.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, නව ලොකොත්තර ධර්මයට අනුකූලවූ ප්‍රතිපත්තියෙහි පිළිපන්නාවූ භික්ෂුවහට මේ අනුකූල ධර්මයවේ. රූපය දුකයයි දකිමින් වාසය කරන්නේය යන යමක් වේද වේදනාව දුකයයි දකිමින් වාසය කරන්නේය යන යමක් වේද, සංඥාව දුකයයි දකිමින් වාසය කරන්නේය යන යමක් වේද,

සංස්කාර දුකයයි දකිමින් වාසය කරන්නේය යන යමක් වේද, විඤ්ඤාණය දුකයයි දකිමින් වාසය කරන්නේය යන යමක් වේද, යනු අනුකූල ධර්මයයි.

3 "හෙතෙම රූපය දුකයයි දකිමින් වාසය කරන්නේ වේදනාව දුකයයි දකිමින් වාසය කරන්නේ, සංඥාව දුකයයි දකිමින් වාසය කරන්නේ, සංස්කාරයන් දුකයයි දකිමින් වාසය කරන්නේ, විඤ්ඤාණය දුකයයි දකිමින් වාසය කරන්නේ, රූපය පිරිසිඳ දනී, වේදනාව පිරිසිඳ දනී, සංඥාව පිරසිඳ දනී, සංස්කාරය පිරිසිඳ දනී, විඤ්ඤාණය පිරිසිඳ දනී,

4. "හෙතෙමේ රූපය පිරිසිඳ දන්නේ වේදනාව පිරිසිඳ දන්නේ සංඥාව පිරිසිඳ දන්නේ සංස්කාරයන් පිරිසිඳ දන්නේ විඤ්ඤාණය පිරිසිඳ දන්නේ, රූපය කෙරෙන් මිදෙයි. වේදනාව කෙරෙන් මිදෙයි. සංඥාව කෙරෙන් මිදෙයි. සංස්කාරයන් කෙරෙන් මිදෙයි. විඥානය කෙරෙන් මිදෙයි. ජාතියෙන්ද, ජරාමරණයෙන්ද, සෝකයන්ගෙන්ද, පරිදේවයන්ගෙන්ද, දුක් දොම්නසවලින්ද, දැඩි වෙහෙසින්ද මිදෙයි. සියළු දුක්වලින් මිදේයයි කියමි.

(නවවෙනි අනුධර්ම සූත්‍රය 3 නිමි.)

---

## 10. අනුධර්ම සූත්‍රය. 4

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, නවලොකොත්තර ධර්මයට අනුකූල ප්‍රතිපත්තියෙහි පිළිගන්නාවූ භික්ෂුවහට මේ අනුකූල ධර්මයවේ. රූපය අනාත්ම වශයෙන් දකිමින් වාසයකරන්නේය යන

යමක්වේද, වේදනාව අනාත්ම වශයෙන් දකිමින් වාසය කරන්නේය යන යමක් වේද සංඥාව අනාත්ම වශයෙන් දකිමින් වාසයකරන්නේය යන යමක්වේද, සංස්කාරයන් අනාත්ම වශයෙන් දකිමින් වාසයකරන්නේය යන යමක්වේද, විඤ්ඤාණය අනාත්ම වශයෙන් දකිමින් වාසය කරන්නේය යන යමක් වේද, යන අනුකූල ධර්මයයි.

3. "මෙතෙම රූපය අනාත්ම වශයෙන් දකිමින් වාසය කරන්නේ, වේදනාව අනාත්ම වශයෙන් දකිමින් වාසය කරන්නේ, සංඥාව අනාත්ම වශයෙන් දකිමින් වාසය කරන්නේ, සංස්කාරයන් අනාත්ම වශයෙන් දකිමින් වාසය කරන්නේ, විඤ්ඤාණය අනාත්ම වශයෙන් දකිමින් වාසය කරන්නේ, රූපය පිරිසිඳ දනී. වේදනාව පිරිසිඳ දනී. සංඥාව පිරිසිඳ දනී. සංස්කාරයන් පිරිසිඳ දනී. විඤ්ඤාණය පිරිසිඳ දනී.

4. "මෙතෙමේ රූපය පිරිසිඳ දන්නේ වේදනාව පිරිසිඳ දන්නේ සංඥාව පිරිසිඳ දන්නේ සංස්කාරයන් පිරිසිඳ දන්නේ විඤ්ඤාණය පිරිසිඳ දන්නේ රූපය කෙරෙන් මිදෙයි. වේදනාව කෙරෙන් මිදෙයි. සංඥාව කෙරෙන් මිදෙයි. සංස්කාරයන් කෙරෙන් මිදෙයි. විඤ්ඤාණය කෙරෙන් මිදෙයි. ජාතියෙන්ද ජරාමරණයෙන්ද, සෝකයන්ගෙන්ද, පරිදෙවයන්ගෙන්ද, දුක් දොම්නස්වලින්ද, දැඩි වෙහෙසින්ද, මිදෙයි. සියළු දුක්වලින් මිදේයයි කියමි."

**(දහවෙනි අනුධර්ම සූත්‍රය 4. නිමි)**

---

(මේ වර්ගයේ නතුම්හාක සූත්‍ර දෙකක්ද, භික්ඛු යන අන්‍යසූත්‍ර දෙකක්ද, අනඳ තෙරුන් නිසා සූත්‍ර දෙකක්ද, අනුධර්ම සූත්‍ර සතරක්ද වෙත්.)

**(සතරවෙනි නතුම්හාක වර්ගය නිමි)**

---

# 5. අත්තදීප වර්ගය.

## 1. අත්තදීප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ධර්මය තමාට පහනක් කොට ගෙන ධර්මය තමාට පිහිට කොට ගෙන අන්‍ය පිහිටක් නැත්තෝව වාසය කරව්. ධර්මය පහනක් කොට ගෙන, ධර්මය පිහිට කොට ගෙන අන්‍ය පිහිටක් නැත්තෝව වාසය කරව්.

"මහණෙනි, තමා පහනක් කොට ගෙන, තමා පිහිට කොටගෙන අන් පිහිටක් නැත්තෝව ධර්මය පහනක් කොට ගෙන, ධර්මය පිහිටකොට ගෙන, අන් පිහිටක් නැතිව වාසය කරන්නවුන්ගේ හේතුව, කාරණය සෙවිය යුතුයි. කුමක් හේතුකොට ගෙන සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයෝ පවතිද්ද, කුමකින් හටගන්නාහුද යනුවෙනි.

"මහණෙනි, සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයෝ කුමක් හේතුකොට ගෙන උපදින්නාහුද, කුමකින් පහළවන්නාහුද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි බොහෝ ඇසූ පිරූ තැන් නැති ආර්‍ය්‍යයන් නොදක්නාවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂ නොවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි නොහික්මුනාවූ, සත්පුරුෂයන් නොදක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ නොවූ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ, පෘථග්ජනතෙමේ රූපය තමා වශයෙන් දකියි. තමා රූපවත්යයි හෝ දකියි. රූපය තමා කෙරෙහි හෝ ඇතැයි දකියි.

"ඔහුගේ ඒ රූපය වෙනස්වෙයි. අන් ආකාරයකට පැමිණෙයි. ඔහුගේ ඒ රූපය වෙනස්වීමෙන් හා අන් අයුරකට පැමිණීමෙන් සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයෝ උපදිත්.

"වේදනාව තමා වශයෙන් දකියි. තමා වේදනාවත්යයි හෝ දකියි වේදනාව තමා කෙරෙහි හෝ ඇතැයි දකියි. තමා වේදනාව කෙරෙහි හෝ ඇතැයි දකියි. ඔහුගේ ඒ වේදනාව වෙනස් වෙයි. අන් ආකාරයකට පැමිණෙයි. ඔහුගේ ඒ වේදනාව වෙනස්වීමෙන් හා අන් අයුරකට පැමිණීමෙන් සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයෝ උපදිත්.

"සඤ්ඤාව තමා වශයෙන් දකියි. තමා සඤ්ඤාවත්යයි හෝ දකියි. සඤ්ඤාව තමා කෙරෙහි හෝ ඇතැයි දකියි. තමා සඤ්ඤාව කෙරෙහි හෝ ඇතැයි දකියි. ඔහුගේ ඒ සඤ්ඤාව වෙනස්වෙයි. අන් ආකාරයකට පැමිණෙයි. ඔහුගේ ඒ සඤ්ඤාව වෙනස්වීමෙන් හා අන් ආකාරයකට පැමිණීමෙන් සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයෝ උපදිත්.

"සංස්කාරයන් තමා වශයෙන් දකියි. තමා සංස්කාරවත් යයි හෝ දකියි. සංස්කාර තමා කෙරෙහි හෝ ඇතැයි දකියි. තමා සංස්කාරයන් කෙරෙහි හෝ ඇතැයි දකියි. ඔහුගේ ඒ සංස්කාරයන් වෙනස්වෙයි. අන් ආකාරයකට පැමිණෙයි. වෙනස්වීමෙන් අන් ආකාරයකට පැමිණීමෙන් සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයෝ උපදිත්.

"විඤ්ඤාණය තමා වශයෙන් දකියි. තමා විඤ්ඤාණවත් යයි හෝ දකියි. විඤ්ඤාණය තමා කෙරෙහි හෝ ඇතැයි දකියි. තමා විඤ්ඤාණය කෙරෙහි හෝ ඇතැයි දකියි. ඔහුගේ ඒ විඤ්ඤාණය වෙනස්වෙයි. අන් ආකාරයකට පැමිණෙයි. ඔහුගේ ඒ විඤ්ඤාණය වෙනස්වීමෙන් හා අන් ආකාරයකට පැමිණීමෙන් සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයෝ උපදිත්.

4. "මහණෙනි, රූපයේ අනිත්‍ය බව දැන, පෙරද රූපය අනිත්‍යහ, පෙරලෙන නොඇලිය යුතු නැතිවන ස්වභාවය ඇති

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ධර්මයකි. දැනුදු සියලු රූපය අනිත්‍යය. දුකය. පෙරලෙන සුළුයයි. මෙසේ මේ කාරණය තත්වූ පරිදි නුවණින් දකින්නාට යම් සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාස කෙනෙක් වෙත්ද, ඔවුහු ප්‍රහීණවෙත්. ඔවුන්ගේ ප්‍රහාණයෙන් තැති නොගනී. තැති නොගන්නේ සැපසේ වාසය කරයි. සැපසේ වාසය කරන මහණතෙම තාවකාලිකව නිවුනේයයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, වේදනාවේ අනිත්‍ය බව දැන, පෙරද වේදනාව අනිත්‍ය පෙරලෙන නොඇලිය යුතු නැතිවන ස්වභාවය ඇති ධර්මයකි. දැනුදු සියලු වේදනාව අනිත්‍යය. දුකය. පෙරලෙන සුළුයයි මෙසේ මේ කාරණය තත්වූ පරිදි නුවණින් දකින්නාහට යම් සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයෝ වෙත්ද, ඔවුහු ප්‍රහීණවෙත්. ඔවුන්ගේ ප්‍රහාණයෙන් තැති නොගනී. තැති නොගන්නේ සැපසේ වාසය කරයි. සැපසේ වාසය කරන මහණතෙම තාවකාලිකව නිවුනේයයි කියනු ලැබේ.

**6.** "මහණෙනි, සඤ්ඤාවේ අනිත්‍ය බව දැන, පෙරද සඤ්ඤාව අනිත්‍යය. පෙරලෙන, නොඇලිය යුතු, නැතිවන ස්වභාවය ඇති ධර්මයකි. දැනුදු සඤ්ඤාව අනිත්‍යය, දුකය, පෙරලෙන සුළුයයි මෙය මෙසේ තත්වූ පරිදි නුවණින් දකින්නාහට යම් සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාස කෙනෙක් වෙත්ද ඔවුහු ප්‍රහීණවෙත්. ඔවුන්ගේ ප්‍රහාණයෙන් තැති නොගනී. තැති නොගන්නේ සැපසේ වාසය කරයි. සැපසේ වාසය කරන මහණතෙම තාවකාලිකව නිවුනේයයි කියනු ලැබේ.

7. "මහණෙනි, සංස්කාරයන්ගේ අනිත්‍ය බව දැන, පෙරද සංස්කාරයෝ අනිත්‍යය, පෙරලෙන නො ඇලිය යුතු නැති වන ස්වභාවය ඇති ධර්මයෝය. දැනුදු සංස්කාරයෝ අනිත්‍යය. දුකය. පෙරලෙන සුළුයයි මෙය මෙසේ තත්වූ පරිදි නුවණින් දකින්නාහට යම් සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාස කෙනෙක් වෙත්ද, ඔවුහු ප්‍රහීණවෙත්. ඔවුන්ගේ ප්‍රහාණයෙන් තැති නොගනී. තැති නොගන්නේ සැපසේ වාසය කරයි. සැපසේ

වාසය කරන මහණතෙම තාවකාලිකව නිවුනේයයි කියනු ලැබේ.

8. "මහණෙනි, විඤ්ඤාණයේ අනිත්‍ය බව දැන, පෙරද විඤ්ඤාණය අනිත්‍යය, පෙරලෙන, නොඇලිය යුතු, නැතිවන ස්වභාවය ඇති ධර්මයකි. දැනුදු විඤ්ඤාණ අනිත්‍යය. දුකය, පෙරලෙන සුළුයයි මෙය මෙසේ තත්වූ පරිදි නුවණින් දක්නාහට යම් සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාස කෙනෙක් වෙත්ද, ඔව්හු ප්‍රහීණවෙත්. ඔවුන්ගේ ප්‍රහාණයෙන් තැති නොගනී. තැති නොගන්නේ සැපසේ වාසය කරයි. සැපසේ වාසය කරන මහණතෙම තාවකාලිකව නිවුනේයයි කියනු ලැබේ."

**(පළමුවෙනි අත්තදීප සූත්‍රය නිමි.)**

---

## 2. පටිපදා සූත්‍රය. 1.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මමයයි ගන්නා පඤ්චස්කන්ධයේ හට ගැනීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාවද මමයයි ගන්නා පඤ්චස්කන්ධයේ නැතිවීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාවද දෙශනා කරමි. එය අසව්. මහණෙනි, පඤ්චස්කන්ධයේ හටගැනීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාව කවරේද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි බොහෝ ඇසූ පිරූ තැන් නැති ආර්‍ය්‍යයන් නොදක්නාවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂ නොවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි නොහික්මුනාවූ, සත්පුරුෂයන් නොදක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂනොවූ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ, පෘථග්ජනතෙමේ රූපය තමා වශයෙන් දකියි. තමා

රූපවත්යයි හෝ දකියි. රූපය තමා කෙරෙහි හෝ ඇතැයි දකියි. තමා රූපය කෙරෙහි හෝ ඇතැයි දකියි.

"වේදනාව තමා වශයෙන් දකියි තමා වේදනාවත්යයි හෝ දකියි. වේදනාව තමා කෙරෙහි හෝ ඇතැයි දකියි. තමා වේදනාව කෙරෙහි හෝ ඇතැයි දකියි.

"සඤ්ඤාව තමා වශයෙන් දකියි. තමා සඤ්ඤාවත්යයි හෝ දකියි, සඤ්ඤාව තමා කෙරෙහි හෝ ඇතැයි දකියි. තමා සඤ්ඤාව කෙරෙහි හෝ ඇතැයි දකියි.

"සංස්කාර තමා වශයෙන් දකියි. තමා සංස්කාරවත්යයි හෝ දකියි. සංස්කාර තමා කෙරෙහි හෝ ඇතැයි දකියි. තමා සංස්කාරයන් කෙරෙහි හෝ ඇතැයි දකියි.

"විඤ්ඤාණය තමා වශයෙන් දකියි. තමා විඤ්ඤාණවත්යයි හෝ දකියි. විඤ්ඤාණය තමා කෙරෙහි හෝ ඇතැයි දකියි. තමා විඤ්ඤාණය කෙරෙහි හෝ ඇතැයි දකියි.

**4.** "මහණෙනි, මේ පඤ්චස්කන්ධය හටගැනීම පිණිස පවත්නාවූ, ප්‍රතිපදාවයි. මීට පඤ්චස්කන්ධය හටගැනීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාවයි කියනු ලැබේ. දුක් හටගැනීම පිණිස පවත්නා වැරදි දැකීම යනුද මේ අර්ථය සඳහාම කියනු ලැබේ.

"මහණෙනි, පඤ්චස්කන්ධය නිරුද්ධ කිරීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාව නම් කවරේද?

**5.** "මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යයන් දක්නාවූ ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි හික්මුණාවූ, සත්පුරුෂයන් දක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි හික්මුණාවූ, බහුශ්‍රැත ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ රූපය තමා වශයෙන් නොදකියි. රූපය සහිතවූවක් හෝ තමා වශයෙන් නොදකියි. තමා කෙරෙහි රූපය ඇතැයි හෝ නොදකියි. රූපය කෙරෙහි හෝ තමා ඇතැයි නොදකියි.

"වේදනාව තමා වශයෙන් නොදකියි. තමා වේදනාව සහිතයයි හෝ නොදකියි. තමා කෙරෙහි හෝ වේදනාව ඇතැයි නොදකියි. වේදනාව කෙරෙහි හෝ තමා ඇතැයි නොදකියි.

"සංඥාව තමා වශයෙන් නොදකියි. තමා සංඥාව සහිත යයි හෝ නොදකියි. තමා කෙරෙහි හෝ සංඥාව ඇතැයි නො දකියි. සංඥාව කෙරෙහි හෝ තමා ඇතැයි නොදකියි.

"සංස්කාර තමා වශයෙන් නොදකියි. තමා සංස්කාර සහිතයයි හෝ නොදකියි. තමා කෙරෙහි හෝ සංස්කාර ඇතැයි නොදකියි. සංස්කාර කෙරෙහි හෝ තමා ඇතැයි නොදකියි.

"විඤ්ඤාණය තමා වශයෙන් නොදකියි. තමා විඤ්ඤාණ සහිතයයි හෝ නොදකියි. තමා කෙරෙහි හෝ විඤ්ඤාණය ඇතැයි නොදකියි. විඤ්ඤාණය කෙරෙහි හෝ තමා ඇතැයි නොදකියි.

"මහණෙනි, මේ වනාහි පඤ්චස්කන්ධය නිරුද්ධ කිරීම පිණිස පවත්නා ප්‍රතිපදාවයි. පඤ්චස්කන්ධය නිරුද්ධ කිරීම පිණිස පවත්නා ප්‍රතිපදාව යයි මීට කියනු ලැබේ. දුක් නිරුද්ධ කිරීම සඳහා පවත්නා ප්‍රතිපදාව යනුද මේ අර්ථය සඳහාම කියනු ලැබේ."

**(දෙවෙනි පටිපදා සූත්‍රය 1 නිමි.)**

---

## 3. පටිපදා සූත්‍රය. 2.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලදද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතුසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, රූපය අනිත්‍යයි. යමක් අනිත්‍යද එය දුකකි. යමක් දුකද එය අනාත්මය, යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ' යන මෙය මෙසේ තත්වාකාරයෙන්, යහපත් නුවණින් දත යුතුයි. එය මෙසේ තත්වාකාරයෙන් බලන්නහුගේ සිත නොඇලෙයි. දැඩිසේ අල්ලා නොගෙන ආශ්‍රවයන්ගෙන් මිදෙයි.

3. "මහණෙනි, වේදනාව අනිත්‍යයි. යමක් අනිත්‍යද එය දුකකි. යමක් දුකද එය අනාත්මයි. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ.' යන මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දත යුතුයි. එය මෙසේ තත්වාකාරයෙන් බලන්නහුගේ සිත නොඇලෙයි. දැඩිකොට අල්වා නොගෙන ආශ්‍රවයන්ගෙන් මිදෙයි.

4. "මහණෙනි, සංඥාව අනිත්‍යයි. යමක් අනිත්‍යද එය දුකකි. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේ' යන මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දත යුතුයි. එය මෙසේ තත්වාකාරයෙන් බලන්නහුගේ සිත නොඇලෙයි. දැඩිසේ අල්වා නොගෙන ආශ්‍රවයන් ගෙන් මිදෙයි.

5. "මහණෙනි, සංස්කාර අනිත්‍යයි. යමක් අනිත්‍යද එය දුකකි. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ' යන මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි. එය මෙසේ තත්වාකාරයෙන් බලන්නහුගේ සිත නොඇලෙයි. දැඩිකොට අල්ලා නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදෙයි.

6. "මහණෙනි, විඤ්ඤාණය අනිත්‍යයි. යමක් අනිත්‍යද, එය දුකකි. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ' යන මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දත යුතුයි. එය මෙසේ තත්වාකාරයෙන් බලන්නහුගේ සිත නොඇලෙයි. දැඩිකොට අල්වා නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදෙයි.

7. "මහණෙනි, ඉදින් භික්ෂුවක් හිත රූපධාතුවෙහි දැඩිකොට අල්වා නොගෙන ආශ්‍රවයන් කෙරෙන් නොඇලුණේ වෙයිද, මිදුනේ වෙයිද, මහණෙනි, ඉදින් වේදනා ධාතුයෙහි භික්ෂුවගේ හිත දැඩිකොට අල්වා නොගෙන ආශ්‍රවයන්ගෙන් නොඇලුණේ වෙයිද මිදුණේ වෙයිද,

"මහණෙනි, ඉදින් සංඥා ධාතුවෙහි භික්ෂුවගේ හිත දැඩිකොට අල්වා නොගෙන ආශ්‍රවයන්ගෙන් නොඇලුණේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

වෙයිද, මිදුනේ වෙයිද, මහණෙනි, ඉදින් සංස්කාර ධාතුවෙහි භික්ෂුවගේ හිත දැඩිකොට අල්වා නොගෙන ආශ්‍රවයන්ගෙන් නොඇලුණේ වෙයිද, මිදුනේ වෙයිද, මහණෙනි, ඉදින් විඤ්ඤාණ ධාතුවෙහි භික්ෂුවගේ සිත දැඩිකොට අල්වානොගෙන ආශ්‍රවයන්ගෙන් නොඇලුණේ වෙයිද, මිදුණේ වෙයිද,

"මිදුනු හෙයින් (මතු කළයුතු කිසක් නැති හෙයින්) සිටියේ වෙයි. සිටි හෙයින් සතුටු වෙයි. සතුටුවූ හෙයින් බිය නොවෙයි. බිය නොවන තැනැත්තේ මේ ආත්මයෙහිම පිරිනිවන් පායි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරන ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි."

**(තුන්වෙනි පටිපදා සූත්‍රය නිමි. 2.)**

## 4. අනිච්චතා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, රූපය අනිත්‍යය. යමක් අනිත්‍යද, එය දුකකි. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ' යන මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

3. "වේදනාව අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුකකි. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ' යන මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

4. "සංඥාව අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුකකි. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ

මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේ' යන මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

5. "සංස්කාර අනිත්‍යය. යමක් අනිත්‍යද, එය දුකකි. යමක් දුකද, එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ' යන මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

6. "විඤ්ඤාණය අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුකකි. යමක් දුකද, එය අනාත්මය. යමක් අනාත්මද 'එය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේ' යන මෙය මෙසේ තත්වාකාරයෙන් යහපත් නුවණින් දතයුතුයි.

7. "මෙය මෙසේයයි තත්වූ පරිදි මනා නුවණින් බලන්නහුට අතීත භව පිළිබඳ දෘෂ්ටීහු නොවෙත්. අතීත බව පිළිබඳ දෘෂ්ටි නැතිවූ කල්හි අනාගත භව පිළිබඳ දෘෂ්ටීහු නොවෙත්. අනාගත භව පිළිබඳ දෘෂ්ටි නැතිවූ කල්හි දැඩිසේ දෘෂ්ටියෙන් අල්වා ගැණීමක් නොවෙයි. දැඩිසේ දෘෂ්ටියෙන් අල්වා ගැනීමක් නැතිවූකල්හි රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ යන මොවුන් කෙරෙහි සිත නො ඇලෙයි. දැඩි කොට අල්වා නොගෙන ආශ්‍රවයන්ගෙන් මිදෙයි. මිදුනු හෙයින් (මතු කළයුතු කිසක් නැති හෙයින්) සිටියි. සිටි හෙයින් සතුටු වෙයි. සතුටු වූ හෙයින් හෙතෙමේ තැති නොගනියි. තැති නොගත්තේ නම් ආත්මයෙහිම පිරිනිවන් පායි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචය්‍ර්‍යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි."

**(හතරවෙනි අනිච්චතා සූත්‍රය නිමි.)**

---

## 5. සමනුපස්සනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී

භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම් ඒ ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ නොයෙක් ආත්මයන් දක්නාහු දකිත්ද, ඒ සියල්ලෝ උපාදානස්කන්ධ පසම හෝ එයින් එකක් හෝ දකිත්. ඒ කවර පසක්ද? මහණෙනි, මේ ශාසනයෙහි බොහෝ ඇසූ පිරූ තැන් නැති, ආර්‍ය්‍යයන් නොදක්නාවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂ නොවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි නොහික්මුනාවූ, සත්පුරුෂයන් නොදක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ නොවූ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ, පෘථග්ජනතෙම රූපය ආත්මය වශයෙන් දකියි. ආත්මය රූපවත්යයි හෝ දකියි. රූපය ආත්මය කෙරෙහි හෝ ඇතැයි දකියි. ආත්මය රූපය කෙරෙහි හෝ ඇතැයි දකියි.

"වේදනාව ආත්ම වශයෙන් දකියි. ආත්මය වේදනාවත් යයි හෝ දකියි. වේදනාව ආත්මය කෙරෙහි හෝ ඇතැයි දකියි. ආත්මය වේදනාව කෙරෙහි හෝ ඇතැයි දකියි.

"සංඥාව ආත්ම වශයෙන් දකියි. ආත්මය සංඥාවත්යයි හෝ දකියි. සංඥාව ආත්මය කෙරෙහි හෝ ඇතැයි දකියි. ආත්මය සංඥාව කෙරෙහි හෝ ඇතැයි දකියි.

"සංස්කාර ආත්ම වශයෙන් දකියි. ආත්මය සංස්කාරවත්යයි හෝ දකියි. සංස්කාර ආත්මය කෙරෙහි හෝ ඇතැයි දකියි. ආත්මය සංස්කාර කෙරෙහි හෝ ඇතැයි දකියි.

"විඤ්ඤාණය ආත්ම වශයෙන් හෝ දකියි. ආත්මය විඤ්ඤාණවත්යයි හෝ දකියි. විඤ්ඤාණය ආත්මය කෙරෙහි හෝ ඇතැයි දකියි. ආත්මය විඤ්ඤාණය කෙරෙහි හෝ ඇතැයි දකියි.

3. මෙසේ මේ දෘෂ්ටි වශයෙන් ඔහුට 'මම වෙමි' යන තණ්හා, මාන, දෘෂ්ටීන්ගෙන් ගැනීම ඇතිවෙයි. මහණෙනි, 'මම

වෙමි' යන ගැනීම ඇතිවූ කල්හි චක්ඛු ඉන්ද්‍රිය, සොත ඉන්ද්‍රිය, ඝාන ඉන්ද්‍රිය, ජිව්හා ඉන්ද්‍රිය, කාය ඉන්ද්‍රිය යන පඤ්චෙන්ද්‍රියයන්ගේ පහළවීම වෙයි. මහණෙනි, සිත ඇත. අරමුණ ඇත. අවිද්‍යා ධාතුව ඇත. මහණෙනි, අවිද්‍යාවෙන් යුක්ත ස්පර්ශයෙන් උපන් විඳීම ලැබූ ඇසූ පිරූ තැන් නැති පෘථග්ජනයාහට 'මම වෙමි'යි (තණ්හා මාන දෘෂ්ටි වශයෙන්) ඇති හැඟීම වෙයි.

4. "මේ 'මම වෙමි'යි (ආත්ම දෘෂ්ටි වශයෙන්) හැඟීම ඇති වෙයි. (මතු) වන්නේයයි (ශාස්වත දෘෂ්ටි වශයෙන්) හැඟීම ඇතිවෙයි. මතු නොවන්නේ යයි (උච්ඡේද දෘෂ්ටි වශයෙන්) හැඟීම් ඇති වෙයි. රූපවන්තයෙක් වන්නේයයි හැඟීම ඇති වෙයි. රූපය නැත්තෙක් වන්නේයයි හැඟීම ඇතිවෙයි සංඥාව ඇත්තෙක් වන්නේයයි හැඟීම ඇතිවෙයි. සංඥාව නැත්තෙක් වන්නේයයි හැඟීම ඇති වෙයි. සංඥාව ඇත්තෙක් නැත්තෙක් වන්නේයයි හැඟීම ඇති වෙයි. මහණෙනි, පඤ්චෙන්ද්‍රියයෝ එහිම සිටිත්. ඉක්බිති මෙහිදී බොහෝ ඇසූ පිරූ තැන් ඇති (ශ්‍රැතවත්) ආයඊශ්‍රාවකයාගේ අවිද්‍යාව ප්‍රහීණ වේ. (නැතිවේ). විද්‍යාව ඇතිවේ. අවිද්‍යාව නැතිවීමෙන්, විද්‍යාව ඇතිවීමෙන් ඒ ආයඊශ්‍රාවකයාහට 'මම වෙමි'යි (තණ්හා, මාන වශයෙන්) හැඟීම ඇති නොවෙයි. මේ මම වෙමියි (ආත්ම දෘෂ්ටි වශයෙන්) හැඟීම ඇති නොවෙයි. (මතු) වන්නේයයි (ශාස්වත දෘෂ්ටි වශයෙන්) හැඟීම ඇති නොවෙයි. (මතු) නොවන්නේයයි (උච්ඡේද දෘෂ්ටි වශයෙන්) හැඟීම ඇතිනොවෙයි. රූපවන්තයෙක් වන්නේයයි හැඟීම ඇතිනොවෙයි. රූපය නැත්තෙක් වන්නේයයි හැඟීම ඇති නොවෙයි. සංඥාව ඇත්තෙක් වන්නේයයි හැඟීම ඇති නොවෙයි. සංඥාව නැත්තෙක් වන්නේයයි හැඟීම ඇති නොවෙයි. සංඥාව ඇත්තෙක් නැත්තෙක් වන්නේයයි හැඟීම ඇති නොවෙයි කියයි."

**(පස්වෙනි සමනුපස්සනා සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 6. ස්කන්ධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, පඤ්චස්කන්ධයන් හා පඤ්ච උපාදාන ස්කන්ධයන්ද දේශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, පඤ්චස්කන්ධයෝ කවරහුද?

3. "මහණෙනි, අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ යම්කිසි රූපයක් වෙයිද, මේ රූපස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ යම්කිසි වේදනාවක් වෙයිද, මේ වේදනාස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ යම්කිසි සංඥාවක් වෙයිද, මෙය සංඥාස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ යම්කිසි සංස්කාරයක් වෙයිද, මෙය සංස්කාරස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ යම්කිසි විඤ්ඤාණයක් වෙයිද,

මෙය විඤ්ඤාණස්කන්ධයයි කියනු ලැබේ. මහණෙනි, මොව්හු පඤ්චස්කන්ධයයි කියනු ලැබේ.

4. "මහණෙනි, පඤ්චඋපාදානස්කන්ධයෝ කවරහුද?

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ ආශ්‍රව සහිතවූ උපාදානයන්ට අරමුණුවූ යම්කිසි රූපයක් වෙයිද, මහණෙනි, මේ රූප උපාදානස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ ආශ්‍රව සහිතවූ, උපාදානයන්ට අරමුණුවූ යම්කිසි වේදනාවක් වෙයිද, මෙය වේදනා උපාදානස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ ආශ්‍රව සහිතවූ උපාදානයන්ට අරමුණුවූ යම්කිසි සංඥාවක් වෙයිද, මෙය සංඥා උපාදානස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ ආශ්‍රව සහිතවූ උපාදානයන්ට අරමුණුවූ යම්කිසි සංස්කාරයෝ වෙත්ද, මෙය සංස්කාර උපාදානස්කන්ධයයි කියනු ලැබේ.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ ආශ්‍රව සහිතවූ, උපාදානයන්ට අරමුණුවූ යම්කිසි විඤ්ඤාණයක් වෙයිද, මෙය විඤ්ඤාණ උපාදානස්කන්ධයයි කියනු ලැබේ. මහණෙනි, මොවුහු වනාහි පඤ්ච උපාදානස්කන්ධයෝයි කියනු ලැබෙත්."

**(හයවෙනි ස්කන්ධ සූත්‍රය නිමි.)**

## 7. සොණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩවාසය කරණසේක.

එකල්හි "සොණ" නම් ගෘහපති පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ සොණ ගෘහපති පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "සොණයෙනි, යම් ඒ ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවවූ රූපය කරණකොටගෙන මම උසස් වූවෙක්මියි කියා හෝ දකිත්ද, සමානවූවෙක්මියි කියා හෝ දකිත්ද, හීන වූවෙක්මියි කියා හෝ දකිත්ද, එය තත්වූ පරිදි නොදැකීම හැර අන් කුමක්ද?

3. "අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවවූ, වේදනාව කරණකොටගෙන මම උසස් වූවෙක්මියි කියා හෝ දකිත්ද, සමාන වූවෙක්මියි කියා හෝ දකිත්ද, හීන වූවෙක්මියි කියා හෝ දකිත්ද, එය තත්වූ පරිදි නොදැනීම හැර අන් කුමක්ද?

4. "අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවවූ සංඥාව කරණකොටගෙන මම උසස් වූවෙක්මියි කියා හෝ දකිත්ද, සමාන වූවෙක්මියි කියා හෝ දකිත්ද, හීන වූවෙක්මියි කියා හෝ දකිත්ද, එය තත්වූ පරිදි නොදැකීම හැර අන් කුමක්ද?

5. "අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවවූ, සංස්කාර කරණකොටගෙන මම උසස් වූවෙක්මියි කියා හෝ දකිත්ද, සමාන වූවෙක්මියි කියා හෝ දකිත්ද, හීන වූවෙක්මියි කියා හෝ දකිත්ද, එය තත්වූ පරිදි නොදැකීම හැර අන් කුමක්ද?

6. "අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවවූ, විඤ්ඤාණය කරණකොටගෙන මම උසස් වූවෙක්මියි කියා හෝ දකිත්ද, සමාන වූවෙක්මියි කියා හෝ දකිත්ද, හීන වූවෙක්මියි කියා හෝ දකිත්ද, එය තත්වූ පරිදි නොදැකීම හැර අන් කුමක්ද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. "සොණයෙනි යම් ඒ ශ්‍රමණකෙනෙක් හෝ බ්‍රාහ්මණකෙනෙක් හෝ අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවවූ, රූපය කරණකොටගෙන මම උසස් වූවෙක්මියි කියා හෝ නොදකිත්ද, සමාන වූවෙක්මියි කියා හෝ නොදකිත්ද, හීන වූවෙක්මියි කියා හෝ නොදකිත්ද, එය තත්වූ පරිදි දැනීම මිස අන් කුමක්ද?

8. "අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවවූ, වේදනාව කරණකොටගෙන මම උසස් වූවෙක්මියි කියා හෝ නොදනිත්ද, සමාන වූවෙක්මියි කියා හෝ නොදනිත්ද, හීන වූවෙක්මියි කියා හෝ නොදනිත්ද, එය තත්වූ පරිදි දැනීම මිස අන් කුමක්ද?

9. "අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවවූ, සංඥාව කරණකොටගෙන මම උසස් වූවෙක්මියි කියා හෝ නොදනිත්ද, සමාන වූවෙක්මියි කියා හෝ නොදනිත්ද, හීන වූවෙක්මියි කියා හෝ නොදනිත්ද, එය තත්වූ පරිදි දැනීම මිස අන් කුමක්ද?

10. අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවවූ සංස්කාරයන් කරණකොටගෙන මම උසස් වූවෙක්මියි කියා හෝ නොදනිත්ද, සමාන වූවෙක්මියි කියා හෝ නොදනිත්ද, හීන වූවෙක්මියි කියා හෝ නොදනිත්ද, එය තත්වූ පරිදි දැනීම මිස අන් කුමක්ද?

11. "අනිත්‍යවූ, දුක්වූ, පෙරළෙන ස්වභාවවූ, විඤ්ඤාණය කරණකොටගෙන මම උසස් වූවෙක්මියි කියා හෝ නොදනිත්ද, සමාන වූවෙක්මියි කියා හෝ නොදකිත්ද, හීන වූවෙක්මියි කියා හෝ නොදනිත්ද, එය තත්වූ පරිදි දැනීම, මිස අන් කුමක්ද?

12. "සොණය, කුමක් සිතන්නෙහිද? රූපය නිත්‍යද? අනිත්‍යද?"-"ස්වාමීනි, අනිත්‍යයි."

"යමක් අනිත්‍ය නම් එය දුකද? සැපද?"-"ස්වාමීනි දුකය."

"යමක් අනිත්‍ය නම්, දුක නම්, පෙරළෙන ස්වභාව නම්, 'එය මාගේය. ඒ මම වෙමි. එය මාගේ ආත්මයයයි" දැකීම සුදුසුද?"-"ස්වාමීනි, එය එසේ නොවේය."

13. "වේදනාව නිත්‍යද? අනිත්‍යද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම්, එය දුකද? සැපද?"-'ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍ය නම්, දුක නම්, පෙරළෙන ස්වභාව නම්, 'එය මාගේය. ඒ මම වෙමි. ඒ මාගේ ආත්මයයයි" බැලීම සුදුසුද?"-"ස්වාමීනි, එය එසේ නොවේමය."

14. 'සංඥාව නිත්‍යද? අනිත්‍යද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම්, එය දුකද? සැපද?"-"ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍ය නම්, දුක නම්, පෙරළෙන ස්වභාව නම්, 'එය මාගේය. ඒ මම වෙමි. ඒ මාගේ ආත්මයයයි' බැලීම සුදුසුද?"-"ස්වාමීනි, එය එසේ නොවේමය."

15. "සංස්කාර නිත්‍යද? අනිත්‍යද?"-"ස්වාමීනි, අනිත්‍යය."

'යමක් අනිත්‍ය නම්, එය දුකද? සැපද?"-"ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍ය නම්, දුක නම්, පෙරළෙන ස්වභාව නම් 'එය මාගේය. ඒ මම වෙමි. ඒ මාගේ ආත්මයයි' බැලීම සුදුසුද?"-"ස්වාමීනි, එය එසේ නොවේමය."

16. "විඥ්ඤාණය නිත්‍යද? අනිත්‍යද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම්, එය දුකද? සැපද?"-"ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍ය නම්, දුක නම්, පෙරළෙන ස්වභාව නම්, 'එය මාගේය. ඒ මම වෙමි. ඒ මාගේ ආත්මයයයි' දැකීම සුදුසුද?"-"ස්වාමීනි, එසේ නොවේමය."

17. "සොණයෙනි, එහෙයින් මේ ශාසනයෙහි මහණ තෙම අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ සියලු රූපය 'මෙය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ යයි මෙය මෙසේ යහපත් නුවණින් දතයුතුය.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ සියලු වේදනා 'මෙය මාගේ නොවෙයි ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි' මෙය මෙසේ යහපත් නුවණින් දතයුතුයි.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ සියලු සංඥාව 'මෙය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ යයි' මෙය මෙසේ යහපත් නුවණින් දතයුතුයි.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සියලු සංස්කාර 'මෙය මාගේ නොවෙයි ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේයයි' මෙය මෙසේ යහපත් නුවණින් දතයුතුයි.

"අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ළඟවූ හෝ සියලු විඥ්ඥාණ 'මෙය මාගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවේ' යයි මෙය මෙසේ යහපත් නුවණින් දතයුතුයි.

18. "සොණයෙනි, මෙසේ බලන්නාවූ, බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයන්හිද කලකිරෙයි. විඥ්ඥාණයෙහිද කලකිරෙයි.

"කලකිරීමෙන් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනහුට මිදුනේය යන දැනීම ඇතිවෙයි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මත්තෙහි කළයුත්තක් නැතැයි දනියි."

**(හත්වෙනි සොණ සූත්‍රය නිමි.)**

---

## 8. සෝණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, 'කලන්දක නිවාප' නම් ලත් වේළුවනයෙහි (හුණවනයෙහි) වාසය කරන සේක. ඉක්බිති

'සෝණ' නම් ගෘහපති පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ, 'සෝණ' නම් ගෘහපති පුත්‍රයාහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2 "සෝණය, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ රූපය නොදනිත්ද, රූපයේ ඇතිවීම නොදනිත්ද, රූපයේ නැතිවීම නොදනිත්ද, රූපය නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය නොදනිත්ද, වේදනාව නොදනිත්ද, වේදනාවේ ඇතිවීම නොදනිත්ද, වේදනාවේ නැතිවීම නොදනිත්ද, වේදනාව නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය නොදනිත්ද, සංඥාව නොදනිත්ද, සංඥාවේ ඇතිවීම නොදනිත්ද, සංඥාවේ නැතිවීම නොදනිත්ද, සංඥාව නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය නොදනිත්ද, සංස්කාර නොදනිත්ද, සංස්කාරයන්හි ඇතිවීම නොදනිත්ද, සංස්කාරයන්හි නැතිවීම නොදනිත්ද, සංස්කාරයන් නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය නොදනිත්ද, විඥ්ඥාණය නොදනිත්ද, විඥ්ඥාණය ඇතිවීම නොදනිත්ද, විඥ්ඥාණය නැතිවීම නොදනිත්ද, විඥ්ඥාණය නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය නොදනිත්ද, සෝණය, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණ සම්මත හෝ බ්‍රාහ්මණයන් අතුරෙහි බ්‍රාහ්මණ සම්මත හෝ නොවෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණ භාවයේ ඵලය හෝ බ්‍රාහ්මණ භාවයේ ඵලය හෝ මේ ආත්මයෙහි තෙමේ දැන, අවබෝධ කොට ඊට පැමිණ, වාසය නොකෙරෙත්.

3. "සෝණය, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ රූපය දනිත්ද, රූපයේ ඇතිවීම දනිත්ද, රූපයේ නැතිවීම දනිත්ද, රූපය නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය දනිත්ද, වේදනාව දනිත්ද, වේදනාවේ ඇතිවීම දනිත්ද, වේදනාවේ නැතිවීම දනිත්ද, වේදනාව නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය දනිත්ද, සංඥාව දනිත්ද, සංඥාවේ ඇතිවීම දනිත්ද, සංඥාවේ නැතිවීම දනිත්ද, සංඥාව නැතිකිරීමට ගමන්කළ යුතු මාර්ගය දනිත්ද, සංස්කාර

දනිත්ද, සංස්කාරයන් ඇතිවීම දනිත්ද, සංස්කාරයන් නැතිවීම දනිත්ද, සංස්කාරයන් නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය දනිත්ද, විඥ්ඥාණය දනිත්ද, විඥ්ඥාණයේ ඇතිවීම දනිත්ද, විඥ්ඥාණයේ නැතිවීම දනිත්ද, විඥ්ඥාණය නැතිකිරීමට ගමන්කළයුතු මාර්ගය දනිත්ද, සෝණය, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් අතුරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙති. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණ භාවයේ ඵලයද, බ්‍රාහ්මණ භාවයේ ඵලයද මේ ආත්මයෙහි තෙමේ දැන, අවබෝධකොට, ඊට පැමිණ, වාසයකෙරෙත්.”

(අටවෙනි සෝණ සූත්‍රය නිමි.)

## 9. නන්දික්ඛය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන්හට කථාකළ සේක. ‘ස්වාමීනි’යි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, මහණතෙම අනිත්‍යමවූ, රූපය අනිත්‍ය යයි දකියිද, ඔහුගේ ඒ දැකීම මනාකොට දැකීම වෙයි. (සම්‍යක් දෘෂ්ටිය වෙයි.) මනාකොට දකින්නේ කලකිරෙයි. තණ්හාව නැතිකිරීමෙන් රාගය නැතිවේ. රාගය නැතිකිරීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාව නැතිකිරීමෙන් සිත (කෙලෙසුන්ගෙන්) මිදුණේය. මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

3. “මහණෙනි, මහණතෙම අනිත්‍යමවූ, වේදනාව අනිත්‍ය යයි දකියිද, ඔහුගේ ඒ දැකීම මනාකොට දැකීම වෙයි. (සම්‍යක් දෘෂ්ටිය වෙයි) මනාකොට දකින්නේ, කලකිරෙයි. තණ්හාව නැතිකිරීමෙන් රාගය නැතිවේ. රාගය නැතිකිරීමෙන් තණ්හාව

නැතිවේ. තණ්හාව නැතිකිරීමෙන් සිත (කෙලෙසුන්ගෙන්) මිදුණේය. මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

4. "මහණෙනි, මහණතෙම අනිත්‍යමවූ සංඥාව අනිත්‍යයයි දකියිද, ඔහුගේ ඒ දැකීම මනාකොට දැකීමවෙයි. (සම්‍යක් දෘෂ්ටිය වෙයි) මනාකොට දකින්නේ, කලකිරෙයි. තණ්හාව නැතිකිරීමෙන් රාගය නැතිවේ. රාගය නැතිකිරීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාව නැතිකිරීමෙන් සිත (කෙලෙසුන්ගෙන්) මිදුණේය. මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

5. "මහණෙනි, මහණතෙම අනිත්‍යමවූ, සංස්කාර අනිත්‍ය යයි දකියිද, ඔහුගේ ඒ දැකීම මනාකොට දැකීම වෙයි. (සම්‍යක් දෘෂ්ටිය වෙයි) මනාකොට දකින්නේ, කලකිරෙයි. තණ්හාව නැතිකිරීමෙන් රාගය නැතිවේ. රාගය නැතිකිරීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාව නැතිකිරීමෙන් සිත (කෙලෙසුන් ගෙන්) මිදුණේය. මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

6. "මහණෙනි, මහණතෙම අනිත්‍යමවූ, විඤ්ඤාණය අනිත්‍යයයි දකියිද, ඔහුගේ ඒ දැකීම මනාකොට දැකීම වෙයි. (සම්‍යක්දෘෂ්ටිය වෙයි) මනාකොට දකින්නේ, කලකිරෙයි. තණ්හාව නැතිකිරීමෙන් රාගය නැතිවේ. රාගය නැතිකිරීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාව නැතිකිරීමෙන් සිත (කෙලෙසුන්ගෙන්) මිදුණේය. මනාකොට මිදුණේයයි කියනු ලැබේ."

(නවවෙනි නන්දික්ඛය සූත්‍රය නිමි.)

---

## 10. නන්දික්ඛය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්

වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, රූපය නුවණින් මෙනෙහි කරව්. රූපයේ අනිත්‍ය ස්වභාවයද ඇතිතතු විමසා බලව්. මහණෙනි, රූපය නුවණින් මෙනෙහිකරන්නේ, රූපයේ අනිත්‍ය ස්වභාවය ඇතිතතු මෙනෙහි කරන්නේ, රූපයෙහි කලකිරෙයි. තණ්හාව නැතිකිරීමෙන් රාගය නැතිවේ. රාගය නැතිකිරීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාව නැතිකිරීමෙන් සිත (කෙලෙසුන්ගෙන්) මිදුනේය, මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

3. "මහණෙනි, වේදනාව නුවණින් මෙනෙහි කරව්. වේදනාවේ අනිත්‍ය ස්වභාවයද ඇති තතු විමසා බලව්. මහණෙනි, වේදනාව නුවණින් මෙනෙහි කරන්නේ, වේදනාවෙහි අනිත්‍ය ස්වභාවය ඇතිතතු මෙනෙහි කරන්නේ, වේදනාවෙහි කලකිරෙයි. තණ්හාව නැතිකිරීමෙන් රාගය නැතිවේ. රාගය නැතිකිරීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාව නැතිකිරීමෙන් සිත (කෙලෙසුන්ගෙන්) මිදුණේය. මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

4. "මහණෙනි, සංඥාව නුවණින් මෙනෙහිකරව්. සංඥාවේ අනිත්‍ය ස්වභාවයද ඇතිතතු විමසා බලව්. මහණෙනි, සංඥාව නුවණින් මෙනෙහි කරන්නේ, සංඥාවේ අනිත්‍ය ස්වභාවය ඇතිතතු මෙනෙහි කරන්නේ, සංඥාවෙහි කලකිරෙයි. තණ්හාව නැතිකිරීමෙන් රාගය නැතිවේ. රාගය නැතිකිරීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාව නැතිකිරීමෙන් සිත (කෙලෙසුන්ගෙන්) මිදුණේය. මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

5. "මහණෙනි, සංස්කාර නුවණින් මෙනෙහිකරව්. සංස්කාරයේ අනිත්‍ය ස්වභාවයද ඇතිතතු විමසා බලව්. මහණෙනි, සංස්කාර නුවණින් මෙනෙහි කරන්නේ, සංස්කාරයේ අනිත්‍ය ස්වභාවය ඇතිතතු මෙනෙහි කරන්නේ, සංස්කාරයෙහි කලකිරෙයි. තණ්හාව නැතිකිරීමෙන් රාගය නැතිවේ. රාගය නැතිකිරීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාව නැතිකිරීමෙන් සිත

(කෙලෙසුන්ගෙන්) මිදුණේය. මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

**6.** "මහණෙනි, විඤ්ඤාණය නුවණින් මෙනෙහි කරව්. විඤ්ඤාණයේ අනිත්‍ය ස්වභාවයද ඇතිතතු විමසා බලව්. මහණෙනි, විඤ්ඤාණය නුවණින් මෙනෙහි කරන්නේ, විඤ්ඤාණයේ අනිත්‍ය ස්වභාවය ඇතිතතු මෙනෙහි කරන්නේ, විඤ්ඤාණයෙහි කලකිරෙයි. තණ්හාව නැතිකිරීමෙන් රාගය නැතිවේ. රාගය නැතිකිරීමෙන් තණ්හාව නැතිවේ. තණ්හාව නැතිකිරීමෙන් සිත (කෙලෙසුන්ගෙන්) මිදුණේය. මනාකොට මිදුණේයයි කියනු ලැබේ."

**(දහවෙනි නන්දික්ඛය සූත්‍රය නිමි.)**

---

**පස්වෙනි අත්තදීප වර්ගයයි.**

(අත්තදීප සූත්‍රය, පටිපදාසූත්‍ර දෙකය, අනිච්චතා සූත්‍රය, සමනුපස්සනා සූත්‍රය, ඛන්ධසූත්‍රය, සෝණ සූත්‍ර දෙක සහ නන්දික්ඛය සූත්‍ර දෙකදැයි මේ අත්තදීප වර්ගයෙහි සූත්‍ර දහයකි.)

**මූලපණ්ණාසකය නිමි.**

---

(නකුල පිතු වර්ගය, අනිච්ච වර්ගය, භාර වර්ගය, නතුම්හාක වර්ගය සහ අත්තදීප වර්ගයයි මේ මුල් සූත්‍ර පණසෙහි වර්ග පසෙකි.

# මජ්ඣිම පණ්ණාසකය.

## 1. උපාය වර්ගය.

### 1. උපාය සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන

සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතුසේක. 'ස්වාමීනි'යි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, (තණ්හා, දිට්ඨි, මාන වශයෙන්) පඤ්චස්කන්ධය කරා පැමිණියේ නොමිදුණේය. (තණ්හා, දිට්ඨි, මාන වශයෙන්) පඤ්චස්කන්ධය කරා නොපැමිණියේ මිදුණේය.

"මහණෙනි, රූපය කරා හෝ පැමිණි කර්මවිඤ්ඤාණය (කුසල් අකුසල් සිත) පවත්නේය. රූපය අරමුණුකොට ඇති, රූපය ආධාරකොට ඇති තණ්හාවගෙන් ආ සේවනය ලැබූ කර්ම විඤ්ඤාණය වැඩීමට, දියුණුවට, මහත් බවට පැමිණෙන්නේය.

"මහණෙනි, වේදනාව කරා හෝ පැමිණි කර්මවිඥානය පවත්නේය. වේදනාව අරමුණුකොට ඇති, වේදනාව ආධාර කොට ඇති, තණ්හාවගෙන් ආ සේවනය ලැබූ කර්මවිඥානය දියුණුවට, වැඩීමට, මහත් බවට පැමිණෙන්නේය,

"මහණෙනි, සංඥාව කරා හෝ පැමිණි කර්මවිඥානය පවත්නේය. සංඥාව අරමුණුකොට ඇති, සංඥාව ආධාර කොට ඇති, තණ්හාවගෙන් ආ සේවනය ලැබූ කර්මවිඥානය වැඩීමට, දියුණුවට, මහත් බවට පැමිණෙන්නේය.

"මහණෙනි, සංස්කාරයන් කරා හෝ පැමිණි කර්මවිඥානය පවත්නේය. සංස්කාරයන් අරමුණුකොට ඇති, සංස්කාරයන් ආධාරකොට ඇති තණ්හාවෙන් ආ සේවනය ලැබූ කර්ම විඥානය වැඩීමට දියුණුවට, මහත් බවට පැමිණෙන්නේය.

3. "මහණෙනි, යමෙක් මෙසේ කියන්නේද "මම රූපයෙන් වෙන්වම, වේදනාවෙන් වෙන්වම, සංඥාවෙන් වෙන්වම, සංස්කාරයන්ගෙන් වෙන්වම, විඤ්ඤාණයාගේ ඊම හෝ යාම හෝ චුතිය හෝ උත්පත්තිය හෝ වැඩීම හෝ දියුණුව හෝ මහත් බව හෝ වන්නෙමි" යන මේ කාරණය විද්‍යාමාන නොවේ හෙවත් සිදු නොවේ.

4. "මහණෙනි, ඉදින් භික්ෂුවගේ රූප ධාතුවෙහි රාගය ප්‍රහීණ වූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනලද අරමුණ කර්මවිඥානයට පිහිට නොවේ.

"මහණෙනි, ඉදින් වේදනා ධාතුවෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනලද අරමුණ කර්මවිඥානයට පිහිට නොවේ.

"මහණෙනි, ඉදින් සංඥා ධාතුවෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනලද අරමුණ කර්මවිඥානයට පිහිට නොවේ.

"මහණෙනි, ඉදින් සංස්කාර ධාතුවේ භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනලද අරමුණ කර්මවිඥානයට පිහිට නොවේ.

"මහණෙනි, ඉදින් විඤ්ඤාණ ධාතුවෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනලද අරමුණ කර්මවිඥානයට පිහිට නොවේ.

5. "ඒ පිහිටක් නැත්තාවූ, නොවැඩුනාවූ, කර්මවිඥානය ප්‍රතිසන්ධිය ගෙන නොදී මිදුනේ වෙයි. මිදුනු බැවින් නැවතුණේ වෙයි. නැවතුණු බැවින් සතුටුවූයේ වෙයි. සතුටුවූ බැවින් තැති නොගනියි. තැති නොගන්නේ නම් ආත්මභාවයෙහිදීම පිරිනිවේ. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවන ලද්දේ කටයුතු කොට නිමවනලදී. මේ ආත්මභාවය සඳහා කළයුතු අනිකක් නැත්තේයයි දනියි."

**(පළමුවෙනි උපාය සූත්‍රය නිමි.)**

---

## 2. බීජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී

භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ බීජ වර්ග පසක් වෙති. ඒ පස කවරහුද? (මුලින් පැලවන) මූල බීජය, (කඳෙන් පැලවන) ඛන්ධ බීජය, (පුරුකෙන් පැලවන) ඵලු බීජය, (අගින් පැලවන) අග්ග බීජය, (ඇටයෙන් පැලවන) පස්වැනිවූ බීජබීජය යන පසය.

3. "මහණෙනි, නොබිඳුනාවූ, කුණු නොවූවාවූ, අව් සුළඟින් නොනැසුනාවූ, බොල් නොවූ, තුන් සතර මසක් මනාසේ තබන ලද්දාවූ, මේ බීජයෝ වෙත්ද, පොළොවක් නැත්තේද වතුරක් නැත්තේද, මහණෙනි, එසේ නම් පස්වැදෑරුම් බීජවර්ග වැඩීමට, දියුණුවට මහත් බවට පැමිණෙන්නාහුද?

"ස්වාමීනි, එය නොවන්නේමය."

"මහණෙනි, බිඳුනාවූ, කුණුවූ, අව් සුළඟින් නසනු ලැබූ, බොල්වූ, කලක් මනාසේ නොතබනලද මේ පස්වැදෑරුම් බීජවර්ග වෙත්ද, පොළොවද ඇත්තේය, ජලයද ඇත්තේය. මහණෙනි, එසේ නම් මේ බීජවර්ග පස වැඩීමට, දියුණුවට හා මහත් බවට පැමිණෙන්නාහුද?"

"ස්වාමීනි, එය නොවන්නේමය."

"මහණෙනි, නොබිඳුනාවූ, කුණු නොවූ, හරය ගන්නාවූ, මනාසේ මඳ කලක් තබනලද මේ බීජවර්ග පස වෙත්ද, පොළොවද ඇත්තේය. ජලයද ඇත්තේය. එසේ නම්, මහණෙනි, මේ බීජවර්ග පස වැඩීමට, දියුණුවට, මහත් බවට පැමිණෙන්නාහුද?"

"ස්වාමීනි, එසේය."

4. "මහණෙනි, පොළොව යම්සේද, එපරිද්දෙන් කර්ම විඤ්ඤාණයට ආරම්මණවූ රූපාදී ස්කන්ධ සතර දතයුත්තාහ. මහණෙනි, ජලය යම්සේද, එසේ ආශාව දතයුතුයි.

"මහණෙනි, බීජවර්ග පස යම්සේද, එසේ ප්‍රත්‍යය සහිතවූ කර්මවිඥානය දතයුතුයි.

**5.** "මහණෙනි, රූපය කරා පැමිණි කර්මවිඥානය පවත්නේය. රූපය අරමුණුකොට ඇති, රූපය ආධාරකොට ඇති, තෘෂ්ණා සේවනය ඇති, කර්මවිඥානය වැඩීමට, දියුණුවට, මහත් බවට පැමිණෙන්නේය.

"මහණෙනි, වේදනාව කරා පැමිණ, කර්මවිඥානය පවත්නේය. වේදනාව අරමුණුකොට ඇති, වේදනාව ආධාර කොට ඇති, තෘෂ්ණා සේවනය ඇති, කර්මවිඥානය වැඩීමට දියුණුවට මහත් බවට පැමිණෙන්නේය.

"මහණෙනි, සංඥාව කරා පැමිණ කර්මවිඥානය පවත්නේය. සංඥාව අරමුණුකොට ඇති, සංඥාව ආධාරකොට ඇති තෘෂ්ණා සේවනය ඇති කර්මවිඥානය වැඩීමට, දියුණුවට, මහත් බවට පැමිණෙන්නේය.

"මහණෙනි, සංස්කාර කරා පැමිණි කර්මවිඥානය පවත්නේය. සංස්කාර අරමුණුකොට ඇති, සංස්කාර ආධාර කොට ඇති, තෘෂ්ණා සේවනය ඇති, කර්මවිඥානය වැඩීමට, දියුණුවට මහත් බවට පැමිණෙන්නේය.

**6.** "මහණෙනි, යමෙක් මෙසේ කියන්නේද, 'මම රූප ස්කන්ධය හැර, වේදනාස්කන්ධය හැර, සංඥාස්කන්ධය හැර විඥානයාගේ ඊමක් හෝ යාමක් හෝ චුතියක් හෝ උත්පත්තියක් හෝ වැඩීමක් හෝ දියුණුවක් හෝ මහත් බවක් හෝ පණවන්නෙමි' යන මේ කාරණය සිදු නොවේ.

**7.** "මහණෙනි, ඉදින් රූපස්කන්ධයෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනාලද අරමුණ කර්මවිඥානයට පිහිට නොවෙයි.

"මහණෙනි, ඉදින් වේදනාස්කන්ධයෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනාලද අරමුණ කර්මවිඥානයට පිහිට නොවෙයි.

"මහණෙනි, ඉදින් සංඥාස්කන්ධයෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනාලද අරමුණ කර්මවිඥානයට පිහිට නොවෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"මහණෙනි, ඉදින් සංස්කාරස්කන්ධයෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනාලද අරමුණ කර්මවිඥානයට පිහිට නොවෙයි.

"මහණෙනි, ඉදින් විඤ්ඤාණස්කන්ධයෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනාලද අරමුණ කර්මවිඥානයට පිහිට නොවෙයි.

8. ඒ පිහිටීමක් නොලත් නොවැඩුනාවූ කර්මවිඥානය ප්‍රතිසන්ධි ගෙනදීමෙන් මිදුනේ වෙයි. මිදුනු බැවින් නැවත කළයුත්තක් නැති බවට පැමිණියේ වෙයි. ඊට පැමිණි බැවින් සතුටුවූයේ වෙයි. සතුටු බැවින් තැති නොගනියි. තැති නොගන්නේ එම ආත්මභාවයෙහිදීම පිරිනිවෙයි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවන ලදී. මේ ආත්ම භාවය සඳහා කළයුතු අනිකක් නැත්තේයයි දනියි."

**(දෙවෙනි බීජ සූත්‍රය නිමි.)**

---

## 3. උදාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ ප්‍රීති වාක්‍යයක් වදාළේය.

2. "ඉදින් මාගේ අතීත භවයන්හි කර්ම රැස්කිරීම නොවූයේ නම් දැන් (වර්තමාන) ස්කන්ධ පඤ්චකය නොවන්නේය. (දැන්) අනාගත ස්කන්ධ උපදවන්නාවූ කර්ම රැස් කිරීම නොවන්නේ නම් මාගේ අනාගත ස්කන්ධ පඤ්චකය නොවන්නේය. මෙසේ මිදෙන්නාවූ භික්ෂුතෙමේ ඕරම්භාගිය (කාම ලෝකය භජනය කරන්නාවූ) සංයෝජනයන් සිඳින්නේය" කියායි.

"මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්වූයේය. "ස්වාමීනි, කෙසේ නම් ඉදින් මාගේ අතීත භවයෙහි කර්ම රැස්කිරීම නොවූයේ නම් වර්තමාන ස්කන්ධ පඤ්චකය නොවන්නේද, දැන් අනාගත ස්කන්ධ උපදවන්නාවූ කර්ම රැස්කිරීම නොවන්නේ නම් මාගේ අනාගත ස්කන්ධ පඤ්චකය නොවන්නේයයි මෙසේ මිදෙන්නාවූ භික්ෂුතෙමේ පස්වැදෑරුම් ඔරම්භාගිය සංයෝජනයන් සිඳින්නේද?" කියායි.

3. 'මහණ මේ සස්නෙහි ආර්‍ය්‍යයන් නොදක්නාවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි අදක්ෂවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි නොහික්මුණාවූ, සත්පුරුෂයන් නොදක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණාවූ අශ්‍රැතවත් පෘථග්ජන තෙම රූපය තමා වශයෙන් දකී. රූපවත් වූවක් හෝ තමා වශයෙන් දකී. තමා කෙරෙහි හෝ රූපය ඇතැයි දකියි. රූපය කෙරෙහි හෝ තමා ඇතැයි දකී.

"වේදනාව තමා වශයෙන් දකී. වේදනා සහිත වූවක් හෝ තමා වශයෙන් දකී. තමා කෙරෙහි හෝ වේදනාව ඇතැයි දකියි. වේදනාව කෙරෙහි හෝ තමා ඇතැයි දකී.

"සංඥාව තමා වශයෙන් දකී. සංඥාව සහිත වූවක් හෝ තමා වශයෙන් දකී. තමා කෙරෙහි හෝ සංඥාව ඇතැයි දකියි. සංඥාව කෙරෙහි හෝ තමා ඇතැයි දකී.

"සංස්කාරයන් තමා වශයෙන් දකී. සංස්කාරයන් සහිත වූවක් හෝ තමා වශයෙන් දකී. තමා කෙරෙහි හෝ සංස්කාරයන් ඇතැයි දකියි. සංස්කාරයන් කෙරෙහි හෝ තමා ඇතැයි දකී.

"විඤ්ඤාණය තමා වශයෙන් දකී. විඤ්ඤාණ සහිත වූවක් හෝ තමායයි දකී. තමා කෙරෙහි හෝ විඤ්ඤාණය ඇතැයි දකියි. විඤ්ඤාණය කෙරෙහි හෝ තමා ඇතැයි දකියි.

4. "හෙතෙමේ අනිත්‍යයවූ, රූපය අනිත්‍යවූ රූපයයි තත්වූ පරිදි නොදනියි. අනිත්‍යයවූ වේදනාව අනිත්‍යයවූ වේදනාවයයි තත්වූ පරිදි නොදනියි. අනිත්‍යයවූ සංඥාව අනිත්‍යයවූ

සංඥාවයයි තත්වූ පරිදි නොදනියි. අනිත්‍යයවූ සංස්කාර අනිත්‍යයවූ සංස්කාරයයයි තත්වූ පරිදි නොදනියි. අනිත්‍යවූ විඥානය අනිත්‍යයවූ විඥානයයි තත්වූ පරිදි නොදනියි.

**5.** "දුක්වූ රූපය දුක්වූ රූපයයි තත්වූ පරිදි නොදනියි. දුක්වූ වේදනාව දුක්වූ වේදනාවයයි තත්වූ පරිදි නොදනියි. දුක්වූ සංඥාව දුක්වූ සංඥාවයයි තත්වූ පරිදි නොදනියි. දුක්වූ සංස්කාරයන් දුක්වූ සංස්කාරයෝයයි තත්වූ පරිදි නොදනියි. දුක්වූ විඥානය දුක්වූ විඥානයයි තත්වූ පරිදි නොදනියි.

**6.** "අනාත්මවූ රූපය අනාත්මවූ රූපයයි තත්වූ පරිදි නොදනියි. අනාත්මවූ වේදනාව අනාත්මවූ වේදනාවයයි තත්වූ පරිදි නොදනියි. අනාත්මවූ සංඥාව අනාත්මවූ සංඥාවයයි තත්වූ පරිදි නොදනියි. අනාත්මවූ සංස්කාරයන් අනාත්මවූ සංස්කාරයෝයයි තත්වූ පරිදි නොදනියි. අනාත්මවූ විඥානය අනාත්මවූ විඥානයයි තත්වූ පරිදි නොදනියි.

**7.** "සංඛතවූ (කර්මාදි ප්‍රත්‍යයෙන් හටගත්) රූපය සංඛතවූ රූපයයි තත්වූ පරිදි නොදනියි. සංඛතවූ වේදනාව සංඛතවූ වේදනාවයයි තත්වූ පරිදි නොදනියි. සංඛතවූ සංඥාව සංඛතවූ සංඥාවයයි තත්වූ පරිදි නොදනියි. සංඛතවූ සංස්කාරයන් සංඛතවූ සංස්කාරයයි තත්වූ පරිදි නොදනියි. සංඛතවූ විඥානය සංඛතවූ විඥානයයි තත්වූ පරිදි නොදනියි.

**8.** 'රූපය බිඳෙන්නේයයි තත්වූ පරිදි නොදනියි. වේදනාව බිඳෙන්නේයයි තත්වූ පරිදි නොදනියි. සංඥාව බිඳෙන්නේයයි තත්වූ පරිදි නොදනියි. සංස්කාරයන් බිඳෙන්නේයයි තත්වූ පරිදි නොදනියි. විඥානය බිඳෙන්නේයයි තත්වූ පරිදි නොදනියි.

**9.** "මහණෙනි, ආර්‍ය්‍යයන් දක්නාවූ ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂවූ ආර්‍ය්‍ය ධර්මයෙහි හික්මුණාවූ සත්පුරුෂයන් දක්නාවූ සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි හික්මුණාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම රූපය තමා වශයෙන් නොදකියි. රූප සහිත වූවක් හෝ තමායයි නොදකියි. තමා කෙරෙහි හෝ රූපය ඇතැයි නොදකියි. රූපය කෙරෙහි හෝ තමා ඇතැයි නොදකියි.

"වේදනාව තමාවශයෙන් නොදකියි. වේදනාවක් වූවක් හෝ තමායයි නොදකියි තමා කෙරෙහි හෝ වේදනාව ඇතැයි නොදකියි. වේදනාව කෙරෙහි හෝ තමා ඇතැයි නොදකියි. සංඥාව තමා වශයෙන් නොමදකියි. සංඥාව සහිතවූවක් හෝ තමායයි නොදකියි. තමා කෙරෙහි හෝ සංඥාව ඇතැයි නොදකියි. සංඥාව කෙරෙහි හෝ තමා ඇතැයි නොදනියි. සංස්කාරයන් තමා වශයෙන් නොමදකියි. සංස්කාර සහිත වූවක් හෝ තමායයි නොමදකියි. තමා කෙරෙහි හෝ සංස්කාර ඇතැයි නොමදකියි. සංස්කාරයන් කෙරෙහි හෝ තමා ඇතැයි නොමදකී. විඥානය තමා වශයෙන් නොමදකියි. විඥානය සහිතවූවක් හෝ තමායයි නොමදකියි. තමා කෙරෙහි හෝ විඥානය ඇතැයි නොමදකී. විඥානය කෙරෙහි හෝ තමා ඇතැයි නොමදකියි.

**10.** "හෙතෙමේ අනිත්‍යයවූ රූපය අනිත්‍යවූ රූපයයි තත්වූ පරිදි දනියි. අනිත්‍යයවූ වේදනාව අනිත්‍යවූ වේදනාවයයි තත්වූ පරිදි දනියි. අනිත්‍යයවූ සංඥාව අනිත්‍යවූ සංඥාවයයි තත්වූ පරිදි දනී. අනිත්‍යයවූ සංස්කාර අනිත්‍යවූ සංස්කාරයයි තත්වූ පරිදි දනියි. අනිත්‍යයවූ විඥානය අනිත්‍යවූ විඥානයයි තත්වූපරිදි දනී.

**11.** "දුක්වූ රූපය දුක්වූ රූපයයි තත්වූ පරිදි දනී. දුක්වූ වේදනාව දුක්වූ වේදනාවයයි තත්වූ පරිදි දනී. දුක්වූ සංඥාව දුක්වූ සංඥාවයයි තත්වූ පරිදි දනී. දුක්වූ සංස්කාරයන් දුක්වූ සංස්කාරයන්යයි තත්වූ පරිදි දනී. දුක්වූ විඥානය දුක්වූ විඥානයයි තත්වූ පරිදි දනී.

**12.** "අනාත්මවූ රූපය අනාත්මවූ රූපයයි තත්වූ පරිදි දනී. අනාත්මවූ වේදනාව අනාත්මවූ වේදනාවයයි තත්වූ පරිදි දනී. අනාත්මවූ සංඥාව අනාත්මවූ සංඥාවයයි තත්වූ පරිදි දනී. අනාත්මවූ සංස්කාරය අනාත්මවූ සංස්කාරයයි තත්වූ පරිදි දනී. අනාත්මවූ විඥානය අනාත්මවූ විඥානයයි තත්වූ පරිදි දනී.

**13.** "සංඛතවූ රූපය සංඛතවූ රූපයයි තත්වූ පරිදි දනී. සංඛතවූ වේදනාව සංඛතවූ වේදනාවයයි තත්වූ පරිදි දනී. සංඛතවූ සංඥාව සංඛතවූ සංඥාවයයි තත්වූ පරිදි දනී. සංඛතවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සංස්කාරයන් සංඛතවූ සංස්කාරයන්යයි තත්වූ පරිදි දනී. සංඛතවූ විඥානය සංඛතවූ විඥානයයි තත්වූ පරිදි දනී. රූපය විනාශ වන්නේයයි තත්වූ පරිදි දනී. වේදනාව විනාශ වන්නේයයි තත්වූ පරිදි දනී. සංඥාව විනාශ වන්නේයයි තත්වූ පරිදි දනී. සංස්කාර විනාශ වන්නේයයි තත්වූ පරිදි දනී. විඥානය විනාශ වන්නේයයි තත්වූ පරිදි දනියි.

14. "හෙතෙම රූපයාගේ විනාශය දැකීමෙන්, වේදනාවේ විනාශය දැකීමෙන්, සංඥාවේ විනාශය දැකීමෙන්, සංස්කාරයන් ගේ විනාශය දැකීමෙන්, විඤ්ඤාණයාගේ විනාශය දැකීමෙන් මහණෙනි මෙසේ ඒ භික්ෂුතෙමේ ඉදින් මාගේ අතීත භාවයෙහි කර්ම රැස් කිරීම නොවූයේ නම් දැන් වර්තමාන ස්කන්ධ පඤ්චකය නොවන්නේය. දැන් මාගේ අනාගත ස්කන්ධ උපදවන්නාවූ කර්ම රැස්කිරීම නොවන්නේ නම් අනාගත ස්කන්ධ පඤ්චකය නොවන්නේය. මෙසේ මිදෙන්නාවූ භික්ෂු තෙමේ ඕරම්භාගිය (කාම ලෝකය භජනය කරන්නාවූ) සංයෝජනයන් බිඳින්නේය.

15. "ස්වාමීනි, මෙසේ මිදෙන්නාවූ භික්ෂු තෙමේ ඕරම්භාගිය සංයෝජනයන් සිඳින්නේය. ස්වාමීනි, කෙසේ දන්නහුගේ වනාහි කෙසේ දක්නහුගේ වනාහි විදර්ශනාවට අනතුරුව කෙලෙසුන්ගේ ක්ෂයවීම වේදැයි?' විචාළේය.

16. "මහණ, මේ සාසනයෙහි අශ්‍රැතවත් පෘථජ්ජන තෙමේ තැති නොගතයුතු තැන තැතිගැන්මට පැමිණෙයි. 'මාගේ අතීත භවයෙහි කර්ම රැස්කිරීම නොවූයේ නම් දැන් (වර්තමාන) ස්කන්ධ පඤ්චකය නොවන්නේය. මාගේ වර්තමාන භවයෙහි අනාගත ස්කන්ධයන් උපදවන්නාවූ කර්ම රැස්කිරීම නොවන්නේ නම් අනාගත ස්කන්ධ පඤ්චකය නොවන්නේය', යන මෙය අශ්‍රැතවත් පෘථග්ජනයාහට තැතිගැන්මෙක්මය, මහණ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ වනාහි තැති නොගත යුතු තැන තැතිගැන්මට නොපැමිණෙයි. 'මාගේ අතීත භවයෙහි කර්ම රැස්කිරීම නොවූයේ නම් දැන් (වර්තමාන) ස්කන්ධ පඤ්චකය නොවන්නේය. වර්තමාන භවයෙහි මතු ස්කන්ධ උපදවන්නාවූ

කර්ම රැස්කිරීම නොවන්නේ නම් අනාගත ස්කන්ධ පඤ්චකය නොවන්නේය' යන මෙය ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාහට භයක් නොවේමය.

17. "මහණ රූපය කරා හෝ පැමිණි කර්ම විඥානය පවත්නේය. රූපය අරමුණුකොට ඇති, රූපය ආධාරකොට ඇති, තෘෂ්ණාවගේ නැවත නැවත සේවනය කිරීම ඇති කර්ම විඥානය වැඩීමට දියුණුවට මහත් බවට පැමිණෙන්නේය.

මහණ, "වේදනාව කරා හෝ පැමිණි කර්ම විඥානය පවත්නේය. වේදනාව අරමුණුකොට ඇති, වේදනාව ආධාර කොට ඇති, තෘෂ්ණාවගේ නැවත නැවත සේවනය කිරීම ඇති කර්මවිඤ්ඤාණය වැඩීමට දියුණුවට මහත් බවට පැමිණෙන්නේය.

"මහණ සංඥාව කරා හෝ පැමිණි කර්ම විඥානය පවත්නේය. සංඥාව අරමුණුකොට ඇති, සංඥාව ආධාරකොට ඇති, තෘෂ්ණාවගේ නැවත නැවත සේවනය කිරීම ඇති කර්ම විඤ්ඤාණය වැඩීමට දියුණුවට මහත් බවට පැමිණෙන්නේය.

"මහණ සංස්කාරයන් කරා හෝ පැමිණි කර්මවිඥාණය පවත්නේය. සංස්කාරයන් අරමුණුකොට ඇති, සංස්කාරය ආධාරකොට ඇති, තෘෂ්ණාවගේ නැවත නැවත සේවනය කිරීම ඇති, කර්මවිඥානය වැඩීමට දියුණුවට මහත් බවට පැමිණෙන්නේය.

"මහණ විඤ්ඤාණය කරා හෝ පැමිණි කර්ම විඤ්ඤාණය පවත්නේය. විඤ්ඤාණය අරමුණුකොට ඇති වේදනාව ආධාර කොට ඇති, තෘෂ්ණාවගේ නැවත නැවත සේවනය කිරීම ඇති, කර්ම විඤ්ඤාණය වැඩීමට දියුණුවට මහත් බවට පැමිණෙන්නේය.

"මහණ, හෙතෙමේ 'මම රූපය හැර වේදනාව හැර සඤ්ඤාව හැර සංස්කාර හැර විඥානයාගේ ඊමක් හෝ යාමක් හෝ චුතියක් හෝ උප්පත්තියක් හෝ වැඩීමක් හෝ දියුණුවක්

හෝ මහත් බවක් හෝ පනවන්නෙමි’යි කියන්නේ නම් මේ කාරණය සිදුනොවේ.

18. “මහණෙ ඉදින් රූපස්කන්ධයෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනලද අරමුණු කර්ම විඥානයාගේ පිහිටවන තැනක් නොවෙයි. මහණෙ ඉදින් වේදනාස්කන්ධයෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනලද අරමුණු කර්මවිඥානයාගේ පිහිටවන තැනක් නොවෙයි.

“මහණෙ ඉදින් සංඥා ස්කන්ධයෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනලද අරමුණු කර්ම විඥානයාගේ පිහිට වන තැනක් නොවෙයි.

“මහණෙ ඉදින් සංස්කාරස්කන්ධයෙහි භික්ෂුවගේ රාගය ප්‍රහීණවූයේ වෙයිද, රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනලද අරමුණු කර්මවිඥානයාගේ පිහිටවන තැනක් නොවෙයි.

“මහණෙ ඉදින් විඥානස්කන්ධයෙහි භික්ෂුවගේ රාගය ප්‍රහිණවූයේ වෙයිද රාගයාගේ ප්‍රහාණයෙන් සිඳිනලද අරමුණු කර්මවිඥානයාගේ පිහිටවන තැනක් නොවේ. ඒ පිහිටවන තැනක් නැති නොවැඩුනාවූ කර්මවිඥානය ප්‍රතිසන්ධිය ගෙන නොදී මිදුනේවෙයි. මිදුනු බැවින් සිටියේ වෙයි. සිටිබැවින් සතුටුවූයේ වෙයි. සතුටුවනලද බැවින් තැති (බිය) නොගනියි. නොතැතිගැනුනේ එම ආත්මභාවයෙහිදීම පිරිනිවේ.”

19. “ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවන ලදී. කටයුතුකොට නිමවනලදී. මේ ආත්මභාවය සඳහා කළයුතු අනිකක් නැත්තේයයි දනියි. මහණෙ, මෙසේ දන්නහුගේ මෙසේ දක්නාහුගේ විදර්ශනාවට අනතුරුව ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේයයි” වදාළේය.

**(තුන්වෙනි උදාන සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 4. උපාදාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ උපාදානස්කන්ධයන් පසෙකි, ඒ පස කවරහුද? එනම් රූපූපාදානස්ඛන්ධය, වේදනානූපාදානස්ඛන්ධය, සංඥානූපාදානස්කඛන්ධය, සංස්ඛාරානුපාදානස්ඛන්ධය විඤ්ඤාණුස්ඛන්ධය (යනුයි).

3. "මහණෙනි, මම යම්තාක්කල් සතර පරිවර්තනයක් ඇති මේ පඤ්චූපාදානස්ඛන්ධයන් තත්වූ පරිදි වෙසෙනින් දැන නොගත්තෙම්ද මහණෙනි, මම ඒතාක්කල් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත සත්වලෝකයෙහිද, මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාව අතරෙහිද, උතුම්වූ සම්‍යක් සම්බොධිය ප්‍රත්‍යක්ෂ කෙළෙම්යයි ප්‍රතිඥා නොකෙළෙමි.

4. "මහණෙනි, මම යම් අවස්ථාවක පටන් සතර පරිවර්තනයකින් යුත් මේ පඤ්චුපාදානස්ඛන්ධයන් තත්වූ පරිදි ප්‍රත්‍යක්ෂකෙළෙම්ද, මහණෙනි, මම එකල්හි දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත සත්වලෝකයෙහිද, මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාව අතරෙහිද උතුම්වූ සම්‍යක් සම්බෝධිය කෙළෙම්යයි ප්‍රතිඥා කෙළෙමි.

5. "ඒ සතර පරිවර්තනය කෙසේද? රූපය දුක්ඛායයි සත්‍යයයි දැනගතිමි. රූපසමුදය දුක්ඛසමුදයායයි සත්‍යයයි දැනගතිමි. රූපනිරෝධය දුක්ඛනිරෝධායයි සත්‍යයයි දැනගතිමි. රූපනිරෝධගාමිණී ප්‍රතිපදාව, දුක්ඛනිරොධ ගාමිණි ප්‍රතිපදායයි සත්‍යයයි දැනගතිමි.

6. "වේදනාව දුක්ඛායයි සත්‍යයයි දැනගතිමි. වේදනා සමුදය දුක්ඛ සමුදයායයි සත්‍යයයි දැනගතිමි. වේදනා නිරෝධය දුක්ඛ

නිරෝධායඃ සත්‍යයයි දැනගතිම්. වේදනා නිරෝධගාමිණී ප්‍රතිපදාව දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදායඃ සත්‍යයයි දැනගතිම්.

7. "සංඥාව දුක්ඛායඃ සත්‍යයයි දැනගතිම්. සංඥා සමුදය දුක්ඛ සමුදයායඃ සත්‍යයයි දැනගතිම්. සංඥා නිරෝධය දුක්ඛනිරෝධායඃ සත්‍යයයි දැනගතිම්. සංඥා නිරෝධ ගාමිණී ප්‍රතිපදාව දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදායඃ සත්‍යයයි දැනගතිම්.

8. "සංස්කාරයෝ දුක්ඛායඃ සත්‍යයයි දැනගතිම්. සංස්කාර සමුදය දුක්ඛ සමුදයායඃ සත්‍යයයි දැනගතිම්. සංස්කාර නිරෝධය දුක්ඛ නිරෝධායඃ සත්‍යයයි දැනගතිම්. සංස්කාර නිරෝධ ගාමිනී ප්‍රතිපදාව දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදායඃ සත්‍යයයි දැනගතිම්.

9. "විඥානය දුක්ඛායඃ සත්‍යයයි දැනගතිම්. විඥාන සමුදය දුක්ඛ සමුදයායඃ සත්‍යයයි දැනගතිම්. විඥාන නිරෝධය දුක්ඛ නිරෝධායඃ සත්‍යයයි දැනගතිම්. විඥාන නිරෝධ ගාමිණී ප්‍රතිපදාව දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදායඃ සත්‍යයයි දැනගතිම්.

10. "මහණෙනි, රූපය කවරේද? මහණෙනි, පඨවි ආදී සතර මහා භූත රූපයද, සතර මහා භූතයන් නිසා පවත්නා (චක්ෂුරාදී සූවිසි) උපාදාරූපයද, යන මෙය රූපයයි කියනු ලැබේ. කබලිංකාර ආහාරය හේතුකොට ගෙන රූපයන්ගේ පහළවීම වෙයි. ආහාර නිරෝධයෙන් රූප නිරෝධය වේ. මෙම ආයඃ අෂ්ටාංගික මාර්ගයම රූප නිරෝධ ගාමිණී ප්‍රතිපදාව වන්නීය. හේ කවරීද? සම්‍යක් දෘෂ්ටිය සම්‍යක් සංකල්පනාවය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය (යනුයි)

11. "මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මෙසේ රූපය දැන, මෙසේ රූප සමුදය දැන, මෙසේ රූප නිරෝධය දැන, මෙසේ රූප නිරෝධ ගාමිණී ප්‍රතිපදාව දැන, රූපයාගේ කලකිරීම පිණිස, නොඇලීම පිණිස, නිරෝධය පිණිස පිළිපන්නාහුද, ඔවුහු මනාකොට පිළිපන්නාහු වෙත්. යම් කෙනෙක් මනාකොට පිළිපන්නාහුද, ඔවුහු මේ ධර්මවිනයෙහි මනාකොට පිහිටියාහු වෙත්.

12. "මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ මෙසේ රූපය දැන, හෝ මෙසේ රූප සමුදය දැන, මෙසේ රූප නිරෝධය දැන, මෙසේ රූප නිරෝධ ගාමිණී ප්‍රතිපදාව දැන, රූපයෙහි කලකිරීමෙන් නොඇලීමෙන්, නිරෝධයෙන් දැඩිකොට නොගැනීමෙන් මිදුනාහුද, ඔවුහු මනාකොට මිදුනාහ. යම්කෙනෙක් මනාකොට මිදුනාහුද, ඔවුහු නිමවන ලද සියලු කටයුතු ඇත්තාහුය. යම්කෙනෙක් මනාකොට නිමවූ සියලු කටයුතු ඇත්තාහුද, ඔවුන්ට පැනවීම පිණිස සංසාර වෘත්තයක් නැත්තේය.

13. "මහණෙනි, වේදනාව කවරීද? මහණෙනි, මේ වේදනා සයක්වෙත්. චක්ෂුස්පර්ශයෙන් හටගත් වේදනාය, ශ්‍රොතස්පර්ශයෙන් හටගත් වේදනාය, ඝානස්පර්ශයෙන් හටගත් වේදනාවය, ජිහ්වාස්පර්ශයෙන් හටගත් වේදනාවය, කාය ස්පර්ශයෙන් හටගත් වේදනාය, මනස්පර්ශයෙන් හටගත් වේදනාය. මහණෙනි, මෙය වේදනායයි කියනු ලැබේ. ස්පර්ශ හේතුවෙන් වේදනාවන්ගේ උත්පත්තියවේ. ස්පර්ශ නිරෝධයෙන් වේදනා නිරෝධයවේ. මෙම ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම වේදනා නිරෝධ ගාමිණී ප්‍රතිපදාවයි. හේ කෙසේද? සම්‍යක්දෘෂ්ටිය සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යනුයි.

14. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ වේදනාව දැන, මෙසේ වේදනා සමුදය දැන, මෙසේ වේදනා නිරෝධය දැන, මෙසේ වේදනා නිරෝධ ගාමිණී ප්‍රතිපදාව දැන, වේදනාවගේ කලකිරීම පිණිස, නොඇලීම පිණිස, නිරෝධය පිණිස, පිළිපන්නාහු වෙත්ද, ඔවුහු මනාකොට පිළිපන්නාහුය. යම් කෙනෙක් මනාකොට පිළිපන්නාහුද ඔවුහු මේ ධර්මවිනයෙහි ස්ථිර ලෙස පිහිටියාහු වෙත්.

15. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ වේදනාව දැන, මෙසේ වේදනා සමුදය දැන මෙසේ වේදනා නිරෝධය දැන, මෙසේ වේදනා නිරෝධ ගාමිණී

ප්‍රතිපදාව දැන, වේදනාවෙහි කලකිරීමෙන්, නො ඇලීමෙන්, නිරෝධයෙන්, දැඩිකොට නොගැනීමෙන් මිදුනාහුද, ඔවුහු මනාකොට මිදුනාහුවෙත්. යම් කෙනෙක් මනාකොට මිදුනාහුද, ඔවුහු මනාකොට නිමවන ලද සියලු කටයුතු කෘත්‍ය ඇත්තාහු වෙති. යම් කෙනෙක් කරන ලද සියලු කටයුතු ඇත්තාහුද ඔවුන්ට පැනවීමට සංසාර වෘත්තයක් නැත.

16. "මහණෙනි, සංඥාතොමෝ කවරීද? මහණෙනි, මේ සංඥා සයකි. රූප සංඥාවය, ශබ්ද සංඥාවය, ගන්ධ සංඥාවය. රස සංඥාවය, ඵොට්ඨබ්බ සංඥාවය ධම්ම සංඥාවය (යනුයි.) මහණෙනි, මේ සංඥාවෝයයි කියනු ලැබේ. ඵස්සය හේතුකොට ගෙන සංඥාවන්ගේ උත්පත්තියවේ. ස්පර්ශ නිරෝධයෙන් සංඥා නිරෝධයවේ. මෙම ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම සංඥා නිරෝධ ගාමිණී ප්‍රතිපදාවය. හේ කවරීද? සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය (යනුයි.)

17. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ සංඥාව දැන මෙසේ සංඥා සමුදය දැන මෙසේ සංඥා නිරෝධය දැන මෙසේ සංඥා නිරෝධ ගාමිනී ප්‍රතිපදාව දැන සංඥාවගේ කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නාහු වෙත්ද, ඔව්හු මනාකොට පිළිපන්නාහුය. යම්කෙනෙක් මනාකොට පිළිපන්නාහුද ඔව්හු ධර්මවිනයෙහි ස්ථිර ලෙස පිහිටියාහු වෙත්.

18. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ සංඥාව දැන, මෙසේ සංඥා සමුදය දැන මෙසේ සංඥා නිරෝධය දැන, මෙසේ සංඥා නිරෝධ ගාමිනී ප්‍රතිපදාව දැන, ප්‍රතිපදාවෙහි කලකිරීමෙන් නොඇලීමෙන් නිරෝධයෙන් දැඩිකොට නොගැනීමෙන් මිදුනාහුද, ඔව්හු මනාකොට මිදුනාහු වෙත්. යම්කෙනෙක් මනාකොට මිදුනාහුද, ඔව්හු මනාකොට නිමවන ලද සියලු කටයුතු ඇත්තාහු වෙත්. යම් කෙනෙක්

කරනලද සියලු කටයුතු ඇත්තාහුද, ඔවුන්ට පැනවීමට සංසාරවෘත්තයක් නැත.

19. "මහණෙනි, සංස්කාරයෝ කවරහුද? මහණෙනි මේ චෙතනා සයකි. රූපසංචෙතනාය, ශබ්දසංචෙතනාය, ගන්ධසංචෙතනාය, රසසංචෙතනාය, ඵොට්ඨබ්බ සංචේතනාය, ධම්මසංචෙතනාය මහණෙනි, මේ සංස්කාරයෝයයි කියනු ලැබෙත්. ස්පර්ශය හෙතුකොටගෙන සංස්කාරයන්ගේ හටගැනීම වෙයි. ස්පර්ශ නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ. මහණෙනි මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම සංස්කාර නිරෝධ ගාමිනී ප්‍රතිපදාවයි.

හේ කවරහුද? සම්‍යක් දෘෂ්ටිය සම්‍යක් කල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය (යනුයි.)

20 "මහණෙනි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මෙසේ සංස්කාරයන් දැන මෙසේ සංස්කාර සමුදය දැන, මෙසේ සංස්කාර නිරෝධය දැන, මෙසේ සංස්කාර නිරෝධ ගාමිනී ප්‍රතිපදාව දැන, සංස්කාරයන්හි කලකිරීම පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නාහු වෙත්ද, ඔව්හු මනාකොට පිළිපන්නෝය. යම්කෙනෙක් මනාකොට පිළිපන්නාහුද, ඔව්හු මේ ධර්මවිනයෙහි ස්ථිරව පිහිටියාහුවෙත්. යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ සංස්කාරයන් දැන මෙසේ සංස්කාර සමුදය දැන මෙසේ සංස්කාර නිරෝධය දැන මෙසේ සංස්කාර නිරෝධ ගාමිනී ප්‍රතිපදාව දැන සංස්කාරයන්හි කලකිරීමෙන් නොඇලීමෙන් නිරෝධයෙන් දැඩිකොට නොගැනීමෙන් මිදුනාහුද, ඔව්හු මනාකොට මිදුනාහුය. යම් කෙනෙක් මනාකොට මිදුනාහුද, ඔව්හු කරනලද සියලු කටයුතු ඇත්තාහුය. යම්කෙනෙක් කරනලද සියලු කටයුතු ඇත්තාහුද, ඔවුනට සංසාරවෘත්තයක් පැනවීම නැත්තේය.

21. "මහණෙනි, විඥානය කවරේද? මහණෙනි මේ විඥාන කය සයක් වෙත්. චක්ෂුර්විඥානය ශ්‍රොතවිඥානය ඝ්‍රාණවිඥානය ජිව්හාවිඥානය කායවිඥානය මනොවිඥානයයි. මහණෙනි මේ

විඥානයයි කියනු ලැබේ. නාම රූප හෙතුකොට ගෙන විඥානයාගේ පහළවීම වෙයි. නාමරූප නිරෝධයෙන් විඥාන නිරෝධය වේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම විඥාන නිරෝධ ගාමිනී ප්‍රතිපදාවය.

හේ කවරීද? සම්‍යක් දෘෂ්ටිය සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධියයි.

22. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ විඥානය දැන මෙසේ විඥාන සමුදය දැන, මෙසේ විඥාන නිරෝධය දැන මෙසේ විඥාන නිරෝධ ගාමිනී ප්‍රතිපදාව දැන විඥානයෙහි කලකිරීම පිණිසද විරාගය පිණිසද නිරෝධය පිණිසද පිළිපන්නාහු වෙත්ද, ඔව්හු මනාකොට පිළිපන්නාහුය. යම්කෙනෙක් මනාකොට පිළිපන්නාහුද ඔව්හු මේ ධර්ම විනයෙහි ස්ථිරව පිහිටියාහුවෙත්. මහණෙනි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ විඥානය දැන විඥාන සමුදය දැන විඥාන නිරෝධය දැන විඥාන නිරෝධ ගාමිනී ප්‍රතිපදාව දැන විඥානයෙහි කලකිරීමෙන් නො ඇලීමෙන් නිරෝධයෙන් දැඩිලෙස නොගැනීමෙන් මිදුනාහුද, ඔව්හු මනාකොට මිදුනාහුය. යම්කෙනෙක් මනාකොට මිදුනාහුද ඔව්හු කරන ලද සියලු කටයුතු ඇත්තාහුය. යම් කෙනෙක් කරනලද සියලු කටයුතු ඇත්තාහුද ඔවුනට පැනවීමට (සංසාර) වෘත්තයක් නැත්තේයයි" වදාළේය.

(හතරවෙනි උපාදාන සූත්‍රය නිමි.)

---

## 5. සත්තට්ඨාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක.

'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ ශාසනයෙහි සත්තැනෙක්හි දක්ෂවූ තුන් ආකාරයකින් බලන්නාවූ මහණතෙමේ නිමවනලද සියලු කටයුතු ඇත්තාවූ වැස නිමවනලද බ්‍රහ්මචරියාව ඇත්තාවූ උතුම් පුරුෂයායි කියනු ලැබේ.

3. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙමේ සත්තැනෙක්හි දක්ෂවේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙමේ රූපය දනී, රූපයේ හේතුව දනී, රූපනිරෝධය දනී, රූපනිරෝධ ගාමිනී ප්‍රතිපදාව දනී, රූපයාගේ ආස්වාදය දනී, රූපයාගේ ආදීනව දනී, රූපයාගේ නිස්සරණය දනී, වේදනාව දනී. වේදනාවේ හේතුව දනී, වේදනා නිරෝධය දනී, වේදනා නිරෝධ ගාමිණී පටිපදාව දනී, වේදනාවගේ ආස්වාදය දනී, වේදනාවගේ ආදීනව දනී, වේදනාවගේ නිස්සරණය දනී, සංඥාව දනී, සංඥා හේතුව දනී, සංඥා නිරෝධය දනී, සංඥා නිරෝධ ගාමිනී පටිපදාව දනී, සංඥාවගේ ආස්වාදය දනී, සංඥාවගේ ආදීනව දනී, සංඥාවගේ නිස්සරණය දනී, සංස්කාරයන් දනී, සංස්කාර හේතුව දනී සංස්කාර නිරෝධය දනී, සංස්කාර නිරෝධ ගාමිනී පටිපදාව දනී, සංස්කාරයන්ගේ ආස්වාදය දනී, සංස්කාරයන්ගේ නිස්සරණය දනී, විඥානය දනී, විඥාන හේතුව දනී, විඥාන නිරෝධය දනී, විඥාන නිරෝධ ගාමිනී පටිපදාව දනී, විඥානයාගේ ආස්වාදය දනී, විඥානයාගේ ආදීනව දනී, විඥානයාගේ නිස්සරණය දනී.

4. "මහණෙනි, රූපය කවරේද? සතර මහා භූතයෝද සතර මහා භූතයන් නිසා පවත්නා සූවිසි උපාදා රූපයද, යන මෙය මහණෙනි, රූපයයි කියනු ලැබේ. ආහාරය හේතු කොට ගෙන රූපයන්ගේ හටගැනීම වෙයි. ආහාර නිරෝධයෙන් රූප නිරෝධය වේ. මෙම ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම රූප නිරෝධ ගාමිනී ප්‍රතිපදාවයි.

5. "හේ කවරීද යත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක්

ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය සම්‍යක් සමාධියයි. රූපය නිසා යම් සුඛයක් සොම්නසක් උපදිද' මෙය රූපයාගේ ආස්වාදයයි. යම් රූපයක් අනිත්‍යයද, දුකද, වෙනස්වන සුලුද, මෙය රූපයාගේ ආදීනවයි. රූපය කෙරෙහි යම් ඡන්දරාගය දුරුකිරීමක් වේද, යම් ඡන්දරාගය පහකිරීමක් වේද, මෙය රූපයාගේ නිස්සරණයයි.

6. "මහණෙනි, යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ රූපය දැන මෙසේ රූපසමුදය දැන මෙසේ රූප නිරෝධය දැන මෙසේ රූපනිරෝධ ගාමිනී පටිපදාව දැන මෙසේ රූපයාගේ ආස්වාදය දැන මෙසේ රූපයාගේ ආදීනව දැන මෙසේ රූපයාගේ නිස්සරණය දැන රූපයෙහි කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නාහුද? ඔව්හු මනාකොට පිළිපන්නාහු වෙත්. යම් කෙනෙක් මනාව පිළිපන්නාහුද, ඔව්හු මේ ධර්ම විනයෙහි පිහිට ලබත්.

7. "මහණෙනි, යම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ රූපය දැන මෙසේ සමුදාය දැන මෙසේ රූප නිරෝධය දැන, මෙසේ රූප නිරෝධගාමිනී පටිපදාව දැන, මෙසේ රූපයාගේ ආශ්වාදය දැන, මෙසේ රූපයාගේ ආදීනව දැන, මෙසේ රූපයාගේ නිස්සරණය දැන, රූපයෙහි කලකිරීමෙන්, නොඇලීමෙන්, නිරෝධයෙන්, දැඩිකොට නොගැනීමෙන් මිදුනාහුද, ඔවුහු මනාකොට මිදුනාහු වෙත්. යමෙක් මනාකොට මිදුනාහුද, ඔවුහු සම්පූර්ණ කළ කටයුතු ඇත්තාහුය. යම් කෙනෙක් කළ කටයුතු ඇත්තාහුද ඔවුන්ට පැනවීමට වෘත්තයක් නැත්තේය.

8. "මහණෙනි, වේදනාතොමෝ කවරීද? මහණෙනි, මේ වේදනා සයකි. චක්ෂුස්පර්ශයෙන් හටගත් වේදනාවය, ශ්‍රොතස්පර්ශයෙන් හටගත් වේදනාවය, ඝ්‍රානස්පර්ශයෙන් හටගත් වේදනාවය, ජිව්හාස්පර්ශයෙන් හටගත් වේදනාවය, කායස්පර්ශයෙන් හටගත් වේදනාවය, මනස්පර්ශයෙන් හටගත් වේදනාවය.

9. "මහණෙනි, මේ වේදනායයි කියනු ලැබේ. ස්පර්ශ හේතුයෙන් වේදනාවන්ගේ හටගැනීමවේ. ස්පර්ශ නිරෝධයෙන් වේදනා නිරෝධයවේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම වේදනා

නිරෝධ ගාමිනී ප්‍රතිපදාව වන්නීය. හේ කෙසේද යත්. සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් සමාධියයි. මේ වේදනාව නිසා යම් සැපයක් සොම්නසක් උපදියිද, මේ වේදනාවගේ ආස්වාදයයි. යම් වේදනාවක් අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තීද, මේ වේදනාවගේ ආදීනවයි. වේදනාවෙහි යම් ඡන්දරාගය දුරු කිරීමක් ඡන්දරාගය පහකිරීමක්වේද, මේ වේදනාවගේ නිස්සරණයයි.

10. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ වේදනාව දැන, මෙසේ වේදනා සමුදය දැන, මෙසේ වේදනා නිරෝධය දැන, මෙසේ වේදනා නිරෝධ ගාමිනී පටිපදාව දැන, මෙසේ වේදනාවගේ ආස්වාදය දැන, මෙසේ වේදනාවගේ ආදීනව දැන, මෙසේ වේදනාවගේ නිස්සරණය දැන, වේදනාව කෙරෙහි කලකිරීම පිණිස, නොඇලීම පිණිස, නිරුද්ධය පිණිස පිළිපන්නාහුද, ඔවුහු මනාකොට පිළිපන්නාහුද වෙති. යම් කෙනෙක් මනාකොට පිළිපන්නාහුද, ඔවුහු ධර්ම විනයෙහි පිහිටීම ලබත්.

11. "මහණෙනි, යම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මෙසේ වේදනාව දැන, මෙසේ වේදනාවගේ හේතුව දැන, වේදනාවගේ නිරෝධය කිරීම දැන, වේදනාවගේ නිරුද්ධ කිරීමට පමුණුවන පිළිවෙත දැන, මෙසේ වේදනාවගේ ආස්වාදය දැන, මෙසේ වේදනාවගේ ආදීනවය දැන, මෙසේ වේදනාවගේ නිස්සරණය දැන, වේදනාව කෙරෙහි කළකිරීමෙන්, නොඇලීමෙන්, නිරෝධයෙන් දැඩිකොට නොගැනීමෙන් මිදුනාහුද, ඔවුහු මනාකොට මිදුනාහු වෙති. යම් කෙනෙක් මනාකොට මිදුණාහුද, ඔවුහු කරන ලද සියලු කටයුතු ඇත්තාහුය. යම් කෙනෙක් කරන ලද සියලු කටයුතු ඇත්තාහුද ඔවුනට පැනවීමට (සංසාර) කටයුත්තක් නැත්තේය.

12. "මහණෙනි, සංඥාතොමෝ කවරේද? මහණෙනි, මේ සංඥා සයකි. රූප සංඥාය, ශබ්ද සංඥාය, ගන්ධ සංඥාය, රස සංඥාය, ස්පර්ශ සංඥාය, ධර්ම සංඥාය. මහණෙනි, මේ සංඥායයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, ස්පර්ශ හේතුවෙන් සංඥාවගේ හටගැනීමවේ. නිරෝධයෙන් සංඥා නිරෝධයවේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම නිරෝධ ගාමිනී ප්‍රතිපදාව වන්නීය. හේ කෙසේදයත්, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධියයි. මේ සංඥාව නිසා යම් සැපයක් උපදියිද, මේ සංඥාවගේ ආස්වාදයයි. යම් සංඥාවක් අනිත්‍යද, දුකද වෙනස්වන ස්වභාව ඇත්තීද, මෙ සංඥාවගේ ආදීනවයයි. මෙහි යම් ඡන්දරාගය දුරුකිරීමක් ඡන්දරාගය පහකිරීමක් වේද, මේ සංඥාවගේ නිස්සරණයයි.

13. "මහණෙනි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මෙසේ සංඥාව දැන, මෙසේ සංඥා සමුදය දැන, මෙසේ සංඥා නිරෝධය දැන, මෙසේ සංඥා නිරෝධගාමිනී ප්‍රතිපදාව දැන, සංඥාවගේ කලකිරීම පිණිස, නොඇලීම පිණිස, නිරෝධය පිණිස, පිළිපන්නාහුවෙත්ද, ඔවුහු මනාකොට පිළිපන්නාහුය. යම් කෙනෙක් මනාකොට පිළිපන්නාහුද, ඔවුහු ධර්මවිනයෙහි ස්ථිර ලෙස පිහිටියාහු වෙත්.

14. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ සංඥාව දැන, මෙසේ සංඥාවේ හේතුව දැන, මෙසේ සංඥා නිරෝධය දැන, මෙසේ සංඥාව නිරුද්ධ කිරීමට පමුණුවන පිළිවෙළ දැන, මෙසේ සංඥාවේ ආශ්වාදය දැන, මෙසේ සංඥාවේ ආදීනව දැන, මෙසේ සංඥාවේ නිස්සරණය දැන, සංඥාව කෙරෙහි කලකිරීමෙන්, නොඇලීමෙන්, නිරෝධයෙන් දැඩිකොට නොගැනීමෙන් මිදුනාහුද, ඔවුහු මනාකොට මිදුනාහු වෙත්. යම් කෙනෙක් මනාකොට මිදුනාහුද ඔවුහු මනාකොට නිමවන ලද සියලු කටයුතු ඇත්තාහු වෙත්. යම් කෙනෙක් කරන ලද සියලු කටයුතු ඇත්තාහුද, ඔවුන්ට පැනවීමට කටයුත්තක් නැත්තේය.

15. "මහණෙනි, සංස්කාරයෝ කවරහුද? මහණෙනි, මේ චේතනා සයකි. රූප සංචේතනාය, ශබ්ද සංචේතනාය, ගන්ධ සංචේතනාය. රස සංචේතනාය, ඵොට්ඨබ්බ සංචේතනාය. ධම්මසංචේතනාය.

16. "මහණෙනි, මේ සංස්කාරයෝයයි කියනු ලැබෙත්. ස්පර්ශ හේතුයෙන් සංස්කාරයන්ගේ හටගැනීම වේ. ස්පර්ශ නිරෝධයෙන් සංස්කාර නිරෝධයවේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම සංස්කාර නිරෝධගාමිනී ප්‍රතිපදාවය. හේ කෙසේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක්වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය (යන මොව්හුයි.) සංස්කාරයන් නිසා යම් සැපයක් සොම්නසක් උපදී ද, මේ සංස්කාරයන්ගේ ආශ්වාදයයි යම් සංස්කාරයක් අනිත්‍යද, වෙනස්වන ස්වභාව ඇත්තේද, මේ සංස්කාරයන්ගේ ආදීනවයි. සංස්කාරයන් කෙරෙහි යම් ඡන්දරාගයක් දුරුකිරීම, ඡන්දරාගය පහකිරීම වෙයිද, මේ සංස්කාරයන්ගේ නිස්සරණයයි.

17. "මහණෙනි, යම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ සංස්කාරයන් දැන, මෙසේ සංස්කාර හේතුව දැන, සංස්කාර නිරෝධය දැන, සංස්කාර නිරෝධගාමිනී ප්‍රතිපදාව දැන, මෙසේ සංස්කාරයන්ගේ ආශ්වාදය දැන, සංස්කාරයන්ගේ ආදීනව දැන, මෙසේ සංස්කාරයන්ගේ නිස්සරණය දැන, සංස්කාරයන් කෙරෙහි කලකිරීම පිණිස, නොඇලීම පිණිස, නිරෝධය පිණිස පිළිපන්නාහුද, ඔවුහු මනාකොට පිළිපන්නාහුය. යම් කෙනෙක් මනාකොට පිළිපන්නාහුය, ඔව්හු ධර්ම විනයෙහි පිහිටීම ලබත්.

18. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ සංස්කාරයන් දැන, මෙසේ සංස්කාර හේතුව දැන, මෙසේ සංස්කාර නිරොධයද දැන, මෙසේ සංස්කාර නිරෝධ ගාමිනී පටිපදාව දැන, මෙසේ සංස්කාරයන්ගේ ආස්වාදය දැන, මෙසේ සංස්කාරයන්ගේ ආදීනව දැන, මෙසේ සංස්කාරයන්ගේ නිස්සරණය දැන, සංස්කාරයන්හි කලකිරීමෙන් නොඇලීමෙන් නිරුද්ධවීමෙන් දැඩිකොට නොගැනීමෙන් මිදුනාහුද, ඔව්හු මනාකොට මිදුනාහු වෙති. යම් කෙනෙක් මනාකොට මිදුනාහුද, ඔව්හු කරනලද සියලු කටයුතු ඇත්තාහුද, ඔවුනට පැනවීමට (සංසාර) කටයුත්තක් නැත්තේය.

**19.** "මහණෙනි, විඤ්ඤාණය කවරේද? චක්ඛු විඤ්ඤාණය සොතවිඤ්ඤාණය, ඝානවිඤ්ඤාණය, මහණෙනි, මේ විඤ්ඤාණ සයෙකි. ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනො විඤ්ඤාණයද යන මෙය මහණෙනි, විඤ්ඤාණයයි කියනු ලැබේ. නාම රූප හේතුයෙන් විඤ්ඤාණයාගේ හටගැනීමවේ. නාමරූප නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධයවේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම විඤ්ඤාණ නිරෝධගාමිනී ප්‍රතිපදාවයි. හේ කෙසේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය සම්‍යක් සමාධියද වෙති. විඤ්ඤාණය නිසා යම් සැප සොම්නසක් උපදීද, එය විඤ්ඤාණයාගේ ආශ්වාදයවේ. යම් විඤ්ඤාණයක් අනිත්‍යයද, දුකද, වෙනස්වන සුළුද, මෙය විඤ්ඤාණයාගේ ආදීනවයි. විඤ්ඤාණය කෙරෙහි ඡන්දරාගය දුරුකිරීමක් ඡන්දරාගය පහකිරීමක් වෙයිද, මෙය විඤ්ඤාණයාගේ නිස්සරණයවේ.

**20.** "මහණෙනි, යම්ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ විඤ්ඤාණය දැන, මෙසේ විඥාන සමුදය දැන, මෙසේ විඥාන නිරෝධය දැන, මෙසේ විඥාන නිරෝධගාමිනී ප්‍රතිපදාව දැන, මෙසේ විඥානයාගේ ආස්වාදය දැන, මෙසේ විඥානයාගේ ආදීනව දැන, මෙසේ විඥානයාගේ නිස්සරණය දැන, විඥානය කෙරෙහි කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නාහුද ඔව්හු යහපත්කොට පිළිපන්නෝය. යම් කෙනෙක් යහපත්කොට පිළිපන්නාහුද, ඔව්හු මේ ශාසනයෙහි පිහිට ලබත්.

**21.** "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ විඥානය දැන මෙසේ විඥාන හේතුව දැන, මෙසේ විඥාන නිරෝධය දැන, මෙසේ විඥාන නිරෝගාමිනී පටිපදාව දැන, මෙසේ විඥානයාගේ ආස්වාදය දැන, මෙසේ විඥානයාගේ ආදීනව දැන, මෙසේ විඥානයාගේ නිස්සරණය දැන, විඥානයෙහි කලකිරීමෙන් නොඇලීමෙන් නිරෝධයෙන් දැඩිසේ නොගැනීමෙන් මිදුනාහුද ඔව්හු මනාකොට මිදුනාහුවෙත්. යම් කෙනෙක් මනාකොට මිදුනාහුද ඔව්හු කරනලද සියලු කටයුතු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තාහුය. යම් කෙනෙක් කරනලද සියලු කටයුතු ඇත්තාහුද, ඔවුනට පැනවීමට (සංසාර) කටයුත්තක් නැත්තේය. මහණෙනි, මෙසේ භික්ෂුහු සත්තැනෙක්හි දක්ෂවූවෝ වෙති.

"මහණෙනි, මේ සස්නෙහි භික්ෂුතෙමේ ධාතු වශයෙන් බලන්නේ වෙයි. ආයතන වශයෙන් බලන්නේ වෙයි. පටිච්චසමුප්පාද වශයෙන් බලන්නේ වෙයි.

22. "මහණෙනි, මෙසේ වනාහි තුන් ආකාරයෙන් බලන්නේ වෙයි. මහණෙනි, මෙසේ වනාහි සත් තැනෙක්හි දක්ෂවූ තුන් ආකාරයකින් බලන්නාවූ භික්ෂුතෙමේ නිමවනලද සියලු කටයුතු ඇත්තාවූ වැස නිමවනලද බ්‍රහ්මචර්‍ය්‍යා ඇති උතුම් පුරුෂයායයි" කියනු ලැබේ.

**(පස්වෙනි සත්තට්ඨාන සූත්‍රය නිමි.)**

---

## 6. සම්බුද්ධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, රූපයාගේ කලකිරීමෙන් නොඇලීමෙන්, නිරෝධයෙන්, තෘෂ්ණාදීන් දැඩිසේ නොගැනීමෙන් මිදුණාවූ, අර්හත් සම්බුද්ධතෙමේ සම්‍යක් සම්බුද්ධයයි කියනු ලැබේ.

"මහණෙනි, රූපයාගේ කලකිරීමෙන්, නොඇලීමෙන්, නිරෝධයෙන්, තෘෂ්ණාදීන් දැඩි වශයෙන් නොගැනීමෙන් ප්‍රඥාව කරණකොට මිදුණාවූ භික්ෂුතෙමේ පඤ්ඤාවිමුත්තයයි කියනු ලැබේ.

3. "මහණෙනි, වේදනාවගේ කලකිරීමෙන් නොඇලීමෙන්, නිරෝධයෙන්, තෘෂ්ණාදීන් දැඩි වශයෙන් නොගැනීමෙන්

මිදුණාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධතෙමේ සම්‍යක් සම්බුද්ධයයි කියනු ලැබේ.

"මහණෙනි, වේදනාවගේ කලකිරීමෙන්, විරාගයෙන්, නිරෝධයෙන්, තෘෂ්ණාදීන් නොගැනීමෙන්. ප්‍රඥාව කරණ කොටගෙන මිදුණාවූ භික්ෂුව පඤ්ඤා විමුත්තයයි කියනු ලැබේ.

4. "මහණෙනි, සංඥාවගේ කලකිරීමෙන්, නොඇලීමෙන්, නිරෝධයෙන්, තෘෂ්ණාදීන් දැඩිසේ නොගැනීමෙන්, මිදුණාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධතෙමේ සම්‍යක් සම්බුද්ධයයි කියනු ලැබේ.

"මහණෙනි, සංඥාවගේ කලකිරීමෙන්, නොඇලීමෙන්, නිරෝධයෙන්, තෘෂ්ණාදීන් දැඩි වශයෙන් නොගැනීමෙන් ප්‍රඥාව කරණකොටගෙන මිදුණාවූ භික්ෂුතෙමේ පඤ්ඤාවිමුත්තයයි කියනු ලැබේ.

5. "මහණෙනි, සංස්කාරයන්ගේ කලකිරීමෙන්, නොඇලීමෙන්, නිරෝධයෙන්, තෘෂ්ණාදීන් දැඩිසේ නොගැනීමෙන්, මිදුණාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධතෙමේ සම්‍යක් සම්බුද්ධ යයි කියනු ලැබේ.

"මහණෙනි, සංස්කාරයන්ගේ කලකිරීමෙන්, නොඇලීමෙන් නිරෝධයෙන්, දැඩිව අල්වා නොගැනීමෙන්, ප්‍රඥාව කරණ කොටගෙන මිදුණාවූ භික්ෂුතෙමේ පඤ්ඤාවිමුත්තයයි, කියනු ලැබේ.

6. "මහණෙනි, විඤ්ඤාණයාගේ කලකිරීමෙන්, නොඇලීමෙන්, නිරොධයෙන්, දැඩිකොට ගැනීමෙන් මිදුණාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධ තෙමේ සම්‍යක් සම්බුද්ධයයි කියනු ලැබේ.

"මහණෙනි, විඤ්ඤාණයාගේ කලකිරීමෙන්, නොඇලීමෙන් නිරෝධයෙන්, දැඩිකොට ගැනීමෙන්, ප්‍රඥාව කරණකොට ගෙන මිදුණු භික්ෂුතෙමේ පඤ්ඤාවිමුත්තයයි කියනු ලැබේ.

7. "මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන්ගේ පඤ්ඤාවිමුත්ත භික්ෂුවගේ කවර නම් විශෙෂයෙක්ද, කවර නම් අදහසක්ද, කවර නම් වෙනසක්ද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රධානකොට ඇත්තාහ. ස්වාමීනි, මේ වචනයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේටම වැටහෙනසේක් නම් ඉතා මැනවි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු ධරාගන්නාහයි" කීහ.

8. "මහණෙනි, එසේ නම් මනාකොට අසව්. මනාකොට සිත්හි ධරාගනිව්. කියන්නෙමියි" භාග්‍යවතුන් වහන්සේ වදාළේය.

"ස්වාමීනි, එසේයයි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

9. "මහණෙනි, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේ නූපන් මාර්ගය උපදවන්නේ වෙයි. පහළ නොවූ මාර්ගය පහළකරන්නේ වෙයි. නොකී මාර්ගය කියන්නේ වෙයි. මාර්ගය දන්නේ වෙයි. මාර්ගය අවබෝධ කරන්නේ වෙයි. දක්ෂ වූයේ වෙයි. මහණෙනි, දැන් ශ්‍රාවකයෝ මාර්ගයට අනුව යමින් පසුව මාර්ග අනුගමනය කරන්නෝව වෙසෙත්. මහණෙනි, මේ වනාහි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන්ගේ හා පඤ්ඤාවිමුත්ත භික්ෂුවගේ විශෙෂයයි, අදහසයයි, වෙනසයයි" වදාළේය.

**(හයවෙනිවූ සම්බුද්ධ සූත්‍රය නිමි.)**

---

## 7. පඤ්චවග්ග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ බරණැස මිගදාය නම්වූ ඉසිපතනාරාමයෙහි වැඩ වාසය කරණ සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා පස්වග භික්ෂූන්ට කථාකළ සේක. ඒ භික්ෂූහු 'ස්වාමීනි'යි

භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

2. "මහණෙනි, රූපය අනාත්මය, මහණෙනි, ඉදින් වනාහි මේ රූපය ආත්මය වූයේනම් මේ රූපය ආබාධ පිණිස නොපවත්නේය. මගේ රූපය මෙසේ වේවා, 'මගේ රූපය මෙසේ නොවේවායි' කියා රූපයෙහි කැමති ආකාරයක්ද ලබන්නේය.

"මහණෙනි, යම්හෙයකින් රූපය අනාත්මද, එහෙයින් රූපය ආබාධ පිණිස පවතී. 'මගේ රූපය මෙසේ වේවා, මගේ රූපය මෙසේ නොවේවයි' කියා රූපයෙහි කැමැති ආකාරයක්ද නොලැබෙන්නේය.

3. "මහණෙනි, වේදනාව අනාත්මය. මහණෙනි, ඉදින් මේ වේදනාව ආත්මය වූයේනම් මේ වේදනාව ආබාධ පිණිස නොපවත්නේය. 'මගේ වේදනාව මෙසේ වේවා, මාගේ වේදනාව මෙසේ නොවේවායි' වේදනාවෙහි (මෙබන්දක්) ලැබෙන්නේය.

"මහණෙනි, යම්හෙයකින් වනාහි වේදනාව අනාත්මද, එහෙයින් වේදනාව ආබාධ පිණිස පවතියි. 'මගේ වේදනාව මෙසේ වේවා, මගේ වේදනාව මෙසේ නොවේවායි' කියා වේදනාවෙහි (මෙබන්දක්) නොලැබෙන්නේය.

4 "මහණෙනි, සංඥාව අනාත්මය. මහණෙනි, ඉදින් මේ සංඥාව අනාත්මය වූයේ නම්, මේ සංඥාව ආබාධ පිණිස නොපවත්නේය. 'මාගේ සංඥාව මෙසේ වේවා, මාගේ සංඥාව මෙසේ නොවේවායි' සංඥාවෙහි (මෙබන්දක්) ලැබෙන්නේය.

"මහණෙනි, යම්හෙයකින් වනාහි සංඥාව අනාත්මද, එහෙයින් සංඥාව ආබාධ පිණිස පවතියි. 'මගේ සංඥාව මෙසේ වේවා මගේ සංඥාව මෙසේ නොවේවයි' කියා සංඥාවෙහි (මෙබන්දක්) නොලැබෙන්නේය.

5. "මහණෙනි, සංස්කාරයෝ අනාත්මයහ. ඉදින් මේ සංස්කාරයෝ ආත්ම වූවාහුනම් සංස්කාරයෝ ආබාධ පිණිස නොවන්නාහුය. 'මාගේ මේ සංස්කාරයෝ මෙසේ වෙත්වා,

මාගේ මේ සංස්කාරයෝ මෙසේ නොවෙත්වා' සංස්කාරයන් කෙරෙහි (මෙබන්දක්) ලබන්නේය.

"මහණෙනි, යම්හෙයකින් සංස්කාරයෝ අනාත්මද, එහෙයින් සංස්කාරයෝ ආබාධ පිණිස පවතිත්. 'මාගේ මේ සංස්කාරයෝ මෙසේ වෙත්වා. මාගේ මේ සංස්කාරයෝ මෙසේ නොපවත්වායි" 'සංස්කාරයන් කෙරෙහි (මෙබන්දක්) නොමලැබෙයි.

**6.** "මහණෙනි, විඥානය අනාත්මය. මේ විඥානය ආත්මය වූයේනම්, මේ විඥානය ආබාධ පිණිස නොපවත්නේය. මාගේ මේ විඥානය මෙසේ වේවා, මාගේ මේ විඥානය මෙසේ නොවේවායි විඥානයෙහි (මෙබන්දක්) ලැබෙන්නේය.

"මහණෙනි, යම්හෙයකින් වනාහි විඥානය අනාත්මද එහෙයින් විඥානය ආබාධ පිණිස පවතියි. 'මාගේ මේ විඥානය, මෙසේ වේවා, මාගේ මේ විඥානය මෙසේ නොවේවායි', විඥානය, කෙරෙහි (එබන්දක්) නොමලැබෙයි.

7. "මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද, රූපය නිත්‍ය හෝ වෙයිද? අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි, අනිත්‍යය," "යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි දුකය," "යමක් අනිත්‍යයද, දුකද පෙරලෙන සුලුද, එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි කියා දැකීමට සුදුසු වේද?" "ස්වාමීනි, එය නොවේමය."

8. "මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? වේදනාව නිත්‍ය හෝ වෙයිද? අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි අනිත්‍යයයි," "යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි දුකය," "යමක් අනිත්‍යයද දුකද පෙරලෙන සුලුද එය මාගේය. එය මම වෙමි එය මාගේ ආත්මයයි කියා දැකීමට සුදුසු වේද?"

"ස්වාමීනි එය නොවේමය."

**9.** "මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද, සංඥාව නිත්‍ය හෝ වෙයිද? අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි අනිත්‍යයයි"

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි දුකය," "යමක් අනිත්‍යයද දුකද පෙර ලෙස සුලුද එය මාගේය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි කියා දැකීමට සුදුසු වේද?" "ස්වාමීනි එය නොවේමය.

10. "මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? සංස්කාරයෝ නිත්‍ය හෝ වෙයිද? අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි අනිත්‍යයයි" "යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි දුකය," "යමක් අනිත්‍යයද දුකද පෙරලෙන සුලුද එය මාගේය එය මම වෙමි. එය මාගේ ආත්මයයි කියා දැකීමට සුදුසු වේද?" "ස්වාමීනි එය නොවේමය."

11. 'විඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?" "ස්වාමීනි අනිත්‍යය," "යමක් අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි දුකය," "යමක් අනිත්‍යද, දුකද වෙනස්වන සුලුද එය මාගේය. එය මම වෙමි. එය මගේ ආත්මයයි දැකීමට සුදුසු වේද?" "ස්වාමීනි එය නොවේමය"

12. "මහණෙනි එසේ හෙයින් මෙහි අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීත වූ හෝ දුරවූ හෝ සමීපයෙහි වූ හෝ අතීතවූද අනාගතවූද දැන් පවත්නාවූද යම්කිසි රූපයක්වේද ඒ සියලු රූපය 'එය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි' කියා තත්වූ පරිදි යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි.

13. "මහණෙනි, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපයෙහිවූ හෝ අතීතවූද අනාගතවූද දැන් පවත්නාවූද යම්කිසි වේදනාවක්වේද 'එය මාගේ නොවෙයි. එය මම නොවෙයි. එය මාගේ ආත්මයද නොවෙයි' කියා තත්වූ පරිදි යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි.

14. "මහණෙනි, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සියුම්වූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපයෙහිවූ හෝ අතීතවූද අනාගතවූද දැන් පවත්නාවූද යම්කිසි සංඥාවක්වේද

එය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මයද නොවෙයි' කියා තත්වූ පරිදි යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි.

**15.** "මහණෙනි, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සියුම්වූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපයෙහිවූ හෝ අතීතවූද අනාගතවූද දැන් පවත්නාවූද යම්කිසි සංස්කාරයෝත් වෙත්ද, එය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මයද නොවෙයි' කියා තත්වූ පරිදි යහපත් ප්‍රඥාවෙන් දත් යුතුයි.

**16.** "මහණෙනි, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඕලාරිකවූ හෝ සියුම්වූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපයෙහිවූ හෝ අතීතවූද අනාගතවූද දැන් පවත්නාවූද යම්කිසි විඥානයක් වේද, ඒ සියලු විඥානය 'එය මාගේ නොවෙයි එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි' කියා තත්වූ පරිදි යහපත් ප්‍රඥාවෙන් දතයුතුයි.

**17** "මහණෙනි මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ රූපය කෙරෙහිද කලකිරෙයි, වේදනාව කෙරෙයිද, සංඥාව කෙරෙහිද, සංස්කාරයන් කෙරෙහිද, විඥානය කෙරෙහිද, කලකිරෙයි, කලකිරුනේ නොඇලෙයි, නොඇලීමෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදෙයි, මිදුනු කල්හි මිදුනේය යන නුවණ (පහළ) වෙයි. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවනලදී. කළයුත්ත කරන ලදී. මේ ආත්මභාවය සඳහා කළයුතු අනිකක් නැත්තේයයි දනියි" භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටුසිත් ඇති පස්වග භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්හ. මේ ධර්මය දෙශනා කළ කල්හි පස්වග භික්ෂූන්ගේ සිත් දැඩි කොට අල්වා නොගැනීමෙන් (කෙලෙසුන්ගෙන්) මිදුනාහුය.

**(හත්වෙනි පඤ්චවග්ග සූත්‍රය නිමි.)**

---

# 8. මහාලි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර සමීපයෙහිවූ මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වාසය කරනසේක. එකල්හි මහාලී නම් ලිච්ඡවිතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක්හි හුන්නේය. එක්පසෙක්හි හුන්නාවූ මහාලි ලිච්ඡවිතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය.

2. "ස්වාමීනි, පූරණ කාශ්‍යපතෙමේ මෙසේ කීයේය. 'සත්වයන්ගේ කෙළෙසීමට හේතුවක් ප්‍රත්‍යයක් නැත. අහේතු අප්‍රත්‍යයෙන් සත්වයෝ කෙළෙසෙත්. සත්වයන්ගේ විශුද්ධිය පිණිස හේතුවක් ප්‍රත්‍යයක් නැත. අහේතු අප්‍රත්‍යයෙන් සත්වයෝ පිරිසිදු වෙත්.' මේ කරුණෙහි ලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදාරණසේක්දැයි" විචාළේය.

3. 'මහාලිය, සත්වයන්ගේ කෙළෙසීම පිණිස හේතු ඇත. ප්‍රත්‍යය ඇත. සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ කෙළෙසෙත්. මහාලිය, සත්වයන්ගේ පිරිසිදුවීම පිණිසද, හේතු ඇත, ප්‍රත්‍යය ඇත. සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ පිරිසිදු වෙත්"යි වදාළේය.

4. "ස්වාමීනි, සත්වයන්ගේ කෙළෙසීම පිණිස වනාහි හේතු කවරේද, ප්‍රත්‍යය කවරේද, සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ කෙසේ නම් කෙළෙසෙත්දැ"යි විචාළේය.

5. "මහාලිය, මේ රූපය වනාහි ඒකාන්තයෙන් දුක් වන්නේවේද දුකට වැටෙන්නේ වේද, දුකට බසින්නේ වේද, සැපයෙන් නොබස්නේ වේද, මේ සත්වයෝ රූපයෙහි නොඇලෙන්නාහුය. මහාලිය, යම් හේතුවකින් වනාහි මේ රූපය සැප වන්නේද, සැපට පැමිණෙන්නේද, සැපට බස්නේද, සැපයෙන් යුක්තද, එහෙයින් සත්වයෝ රූපයෙහි ඇලෙන්නාහුය. ඇලීම හේතුකොටගෙන බැඳෙන්නාහුය. බැඳීම හේතුකොට ගෙන කෙලෙසෙත්. මහාලිය, සත්වයන්ගේ

කෙලෙසීම පිණිස මෙයද හේතුවේ. මෙයද ප්‍රත්‍යයවේ. මෙසේද සහේතුසප්‍රත්‍යයයෙන් සත්වයෝ කෙළෙසෙත්.

**6.** "මහාලිය, මේ වේදනාවද ඒකාන්තයෙන් දුක් වන්නීද, දුකට වැටෙන්නේද, දුකට පැමිණෙන්නේද, දුකින්ම යුක්තවේද, මේ වේදනාව කෙරෙහි සත්වයෝ නොඇලෙන්නාහ. මහාලිය යම් හේතුවකින් වනාහි වේදනාව සැප වන්නීද, සැපට වැටෙන්නීද, සැපට පැමිණෙන්නේද, සැපයෙන් යුක්තද, එබැවින් සත්වයෝ වේදනාවෙහි ඇලෙත්. ඇලීමෙන් බැඳෙත්. බැඳීමෙන් කෙළෙසෙත්. මහාලිය, සත්වයන්ගේ කෙලෙසීම පිණිස මෙයද හේතුවෙයි. මෙයද ප්‍රත්‍යය වෙයි. මෙසේද සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ කෙළෙසෙත්.

**7.** "මහාලිය, මේ සංඥාවද ඒකාන්තයෙන් දුක් වන්නීද, දුකට වැටෙන්නේද, දුකින්ම යුක්තවේද, මේ සංඥාව කෙරෙහි සත්වයෝ නොඇලෙන්නාහ. මහාලිය, යම් හේතුවකින් වනාහි සංඥාව සැප වන්නීද, සැපට වැටෙන්නීද, සැපට පැමිණෙන්නීද, සැපයෙන් යුක්තද, එබැවින් සත්වයෝ සංඥාවෙහි ඇලෙත්. ඇලීමෙන් බැඳෙත්. බැඳීමෙන් කෙළෙසෙත්. මහාලිය, සත්වයන්ගේ කෙළෙසීම පිණිස මෙයද හේතුවෙයි. මෙයද ප්‍රත්‍යය වෙයි. මෙසේද සහේතු සප්‍රත්‍යයෙක් සත්වයෝ කෙළෙසෙත්.

**8.** "මහාලිය, මේ සංස්කාරයෝද ඒකාන්තයෙන් දුක් වන්නාහුද, දුකට වැටුනාහුද, දුකට පැමිණෙන්නාහුද, දුකින් යුක්ත වූවාහුද, සත්වයෝ මේ සංස්කාරයන් කෙරෙහි නොඇලෙන්නාහ. මහාලිය, යම් හේතුවකින් වනාහි සංස්කාරයෝ සැප වන්නාහුද, සැපතට වැටෙන්නාහුද, සැපට බස්නාහුද, සැපයෙන් යුක්ත වන්නාහුද, එහෙයින් සත්වයෝ සංස්කාරයන් කෙරෙහි ඇලෙත්. ඇලීමෙන් බැඳෙත්. බැඳීමෙන් කෙළෙසෙත්. මහාලිය, සත්වයන්ගේ කෙළෙසීම පිණිස මෙයද හේතුවෙයි. මෙයද ප්‍රත්‍යය වෙයි. මෙසේද සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ කෙළෙසෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**9.** "මහාලිය, මේ විඤ්ඤාණය වනාහි ඒකාන්තයෙන් දුක් වන්නේද, දුකට වැටෙන්නේද, දුකට බසින්නේද, දුකින් යුක්තවේද, සත්වයෝ මේ විඤ්ඤාණය කෙරෙහි නොඇලෙන්නාහ. මහාලිය, යම් හෙයකින් වනාහි විඤ්ඤාණය සැපද, සැපට වැටෙන්නේද, සැපට පැමිණෙන්නේද සැපයෙන් යුක්තද, එහෙයින් සත්වයෝ මේ විඤ්ඤාණය කෙරෙහි ඇලෙත්. ඇලීමෙන් බැඳෙත්. බැඳීමෙන් කෙළෙසෙත්. මහාලිය, සත්වයන්ගේ කෙළෙසීම පිණිස මෙයද වනාහී හේතුවෙයි. මෙයද ප්‍රත්‍යය වෙයි. මෙසේ සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ කෙළෙසෙත්යයි" වදාළේය.

**10.** "ස්වාමීනි, සත්වයන්ගේ පරිසුද්ධිය පිණිස වනාහි හේතු කවරේද, ප්‍රත්‍යය කවරේද? සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ කෙසේ පිරිසිදු වෙත්ද?"

"මහාලිය, මේ රූපය වනාහි ඒකාන්තයෙන් සැපවන්නේද, සැපට වැටෙන්නේද, සැපට පැමිණෙන්නේද, සැපට බස්නේද, දුකින් නොබසින්නේද, සැපයෙන් යුක්තද, සත්වයෝ මේ රූපය කෙරෙහි නොකළකිරෙන්නාහ. මහාලිය යම් හේතුවකින් වනාහි රූපය දුකද, දුකට වැටෙන්නේද, දුකට පැමිණෙන්නේද, සැපයෙන් නොබස්නේද, එහෙයින් සත්වයෝ රූපය කෙරෙහි කළකිරෙත්. කළකිරීමෙන් නොඇලෙත්. නොඇලීමෙන් පිරිසිදු වෙත්. මහාලිය සත්වයන්ගේ විසුද්ධිය පිණිස මෙයද හේතුවෙයි. මෙයද ප්‍රත්‍යය වෙයි. මෙසේද සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ පිරිසිදු වෙත්.

**11.** "මහාලිය, මේ වේදනාව වනාහි ඒකාන්තයෙන් සැපවන්නේද, සැපයට වැටෙන්නේද, සැපයට පැමිණෙන්නේද, දුකින් නොබසින්නේද, සැපයෙන් යුක්තද, සත්වයෝ මේ වේදනාව කෙරෙහි නොකළකිරෙන්නාහ. මහාලිය, යම් හේතුවකින් වනාහි වේදනාව දුක්වන්නේද, දුකට වැටෙන්නේද, දුකට පැමිණෙන්නේද, සැපයෙන් නොබස්නේද, එහෙයින් සත්වයෝ වේදනාව කෙරෙහි කළකිරෙත්. කළකිරීමෙන්

නොඇලෙත්. නොඇලීමෙන් පිරිසිදු වෙත්. මහාලිය, සත්වයන්ගේ පිරිසිදුවීම පිණිස මෙයද හේතුවෙයි. මෙයද ප්‍රත්‍යය වෙයි. මෙසේද සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ පිරිසිදු වෙත්.

12. "මහාලිය, මේ සංඥාව වනාහි ඒකාන්තයෙන් සැප වන්නේද, සැපයට වැටෙන්නේද, සැපයට පැමිණෙන්නේද, දුකින් නොබසින්නේද, සැපයෙන් යුක්තද සත්වයෝ මේ සංඥාව කෙරෙහි නොකළකිරෙන්නාහ.

"මහාලිය, යම් හේතුවකින් වනාහි සංඥාව දුක්වන්නීද, දුකට වැටෙන්නේද, දුකට පැමිණෙන්නේද, සැපයෙන් නොබස්නේද, එහෙයින් සත්වයෝ සංඥාව කෙරෙහි කළකිරෙත්. කළකිරීමෙන් නොඇලෙත්, නොඇලීමෙන් පිරිසිදු වෙත්.

"මහාලිය, සත්වයන්ගේ පිරිසිදු වීම පිණිස මෙයද හේතු වෙයි. මෙයද ප්‍රත්‍යය වෙයි. මෙසේද සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ පිරිසිදු වෙත්.

13. "මහාලිය, මේ සංස්කාරයෝ වනාහි ඒකාන්තයෙන් සැපවත් වන්නාහුද, සැපයට වැටෙන්නාහුද, සැපයට පැමිණෙන්නාහුද, දුකින් නො බස්නාහුද, සැපයෙන් යුක්තද, සත්වයෝ මේ සංස්කාරයන් කෙරෙහි නො කළකිරෙන්නාහ. මහාලිය, යම් හේතුවකින් වනාහි සංස්කාරයෝ දුක්වන්නාහුද, දුකට වැටෙන්නාහුද, දුකට පැමිණෙන්නාහුද, සැපයෙන් නොබස්නාහුද, එහෙයින් සත්වයෝ සංස්කාරයන් කෙරෙහි කළකිරෙත්. කළකිරීමෙන් නොඇලෙත්. නොඇලීමෙන් පිරිසිදු වෙත්. මහාලිය සත්වයන්ගේ විසුද්ධිය පිණිස මෙයද හේතුවෙයි, මෙයද ප්‍රත්‍යය වෙයි. මෙසේද සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ පිරිසිදුවෙත්.

14. "මහාලිය, මේ විඥානය වනාහි ඒකාන්තයෙන් සැප වන්නේද, සැපට වැටෙන්නේද, සැපට පැමිණෙන්නේද, දුකෙන් නොබස්නේ, සැපයෙන් යුක්තව සත්වයෝ මේ විඥානය කෙරෙහි නොකලකිරෙන්නාහ. මහාලිය, යම් හේතුවකින් වනාහි විඥානය දුකද, දුකට වැටෙන්නේද, දුකට පැමිණෙන්නේද,

සැපයෙන් නොබස්නේද, එහෙයින් සත්වයෝ විඥානය කෙරෙහි කළකිරෙත්. කළකිරීමෙන් නොඇලෙත්. නොඇලීමෙන් පිරිසිදු වෙත්. මහාලිය සත්වයන්ගේ පිරිසිදු වීම පිණිස මෙයද හේතුවෙයි. මෙයද ප්‍රත්‍යය වෙයි. මෙසේද සහේතු සප්‍රත්‍යයෙන් සත්වයෝ පිරිසිදු වෙත්යයි' වදාළේය.

(අටවෙනි මහාලිය සූත්‍රය නිමි.)

---

## 9. ආදිත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී, භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "මහණෙනි, රූපය දැවෙන්නේය. වේදනාව දැවෙන්නේය. සංඥාව දැවෙන්නේය. සංස්කාරයෝ දැවෙන්නාහුය. විඤ්ඤාණය දැවෙන්නේය. මහණෙනි, මෙසේ දක්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ වනාහි රූපයෙහි කලකිරෙයි. වේදනාවෙහි කලකිරෙයි. සංඥාවෙහි කලකිරෙයි. සංස්කාරයන්හි කලකිරෙයි. කලකිරුණේ නොඇලෙයි. නොඇලුනේ මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි නුවණ පහළ වෙයි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවන ලද්දේය. කළයුත්ත කරන ලද්දේය. මේ ආත්මභාවයෙහි කළයුතු අනිකක් නැත්තේයයි දනියි."

(නවවෙනි ආදිත්ත සූත්‍රය නිමි)

---

## 10. නිරුත්තිපථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, (අතීතයෙහිවූ) ශ්‍රමණයන්, බ්‍රාහ්මණයන් සහ ඥාණවන්තයන් විසින් නොවළක්වනු ලැබුවාවූ, අහක නොදමනු ලැබුවාවූ, බැහැර නොකරනු ලැබුවාවූ, මේ ව්‍යවහාර, සංඥා හෙවත් නාම තුන, (දැනුත්) බැහැර නොකෙරෙත්. (මත්තෙහිත්) බැහැර නොකරන්නාහුය. ඒ නාම තුන කවරේද?

3. "මහණෙනි, යම් රූපයක් නොපෙනීගියේ, නැතිවූයේ, විනාශවූයේ වේද, (එවිට) ඒ රූපයාගේ ව්‍යවහාරය වූයේයයි කියාද, ඒ රූපයාගේ සංඥාව වූයේයයි කියාද, ඒ රූපයාගේ නාමය වූයේයයි කියාද, කියනු ලැබේ. (එහෙත්) ඒ රූපයාගේ ව්‍යවහාරය (දැන්) ඇත්තේයයි කියාද, ඒ රූපයාගේ ව්‍යවහාරය (මතු) වන්නේයයි කියාද, නොකියනු ලැබේ.

4. "යම් වේදනාවක් නොපෙනීගියේ, නැති වූයේ, විනාශ වූයේ වේද, (එවිට) ඒ වේදනාවේ ව්‍යවහාරය වූයේ යයි කියාද, ඒ වේදනාවේ සංඥාව වූයේයයි කියාද, ඒ වේදනාවේ නාමය වූයේයයි කියාද, කියනු ලැබේ. (එහෙත්) ඒ වේදනාවේ ව්‍යවහාරය (දැන්) ඇත්තේයයි කියාද, ඒ වේදනාවේ ව්‍යවහාරය (මතු) වන්නේයයි කියාද, නොකියනු ලැබේ.

5. "යම් සංඥාවක් නොපෙනීගියේ, නැති වූයේ, විනාශ වූයේ වේද, (එවිට) ඒ සංඥාවේ ව්‍යවහාරය වූයේයයි කියාද, ඒ සංඥාවේ සංඥාව (හැඳිනීම) වූයේයයි කියාද, ඒ සංඥාවේ නාමය වූයේයයි කියාද, කියනු ලැබේ. (එහෙත්) ඒ සංඥාවේ ව්‍යවහාරය (දැන්) ඇත්තේයයි කියාද, ඒ සංඥාවේ ව්‍යවහාරය (මතු) වන්නේයයි කියාද නොකියනු ලැබේ.

6. "යම් සංස්කාරයක් නොපෙනීගියේ, නැති වූයේ විනාශවූයේ වේද, (එවිට) ඒ සංස්කාරයාගේ ව්‍යවහාරය වූයේයයි කියාද, ඒ සංස්කාරයාගේ සංඥාව වූයේයයි කියාද, ඒ සංස්කාරයාගේ නාමය වූයේයයි කියාද, කියනු ලැබේ. (එහෙත්) ඒ සංස්කාරයාගේ ව්‍යවහාරය (දැන්) ඇත්තේයයි කියාද, ඒ සංස්කාරයාගේ ව්‍යවහාරය (මතු) වන්නේයයි කියාද නොකියනු ලැබේ.

7. "යම් විඤ්ඤාණයක් නොපෙනී ගියේ නැති වූයේ විනාශ වූයේ වේද, (එවිට) ඒ විඤ්ඤාණයාගේ ව්‍යවහාරවූයේයයි කියාද, ඒ විඤ්ඤාණයාගේ සංඥාව වූයේයයි කියාද, ඒ විඤ්ඤාණයාගේ නාමය වූයේයයි කියාද, කියනු ලැබේ. එහෙත් ඒ විඤ්ඤාණයාගේ ව්‍යවහාරය (දැන්) ඇත්තේයයි කියාද, ඒ විඤ්ඤාණයාගේ ව්‍යවහාරය (මතු) වන්නේයයි කියාද නොකියනු ලැබේ.

8. "මහණෙනි, යම් රූපයක් නූපන්නේ, පහළ නොවූයේ වේද, (එවිට) ඒ රූපයාගේ ව්‍යවහාරය වන්නේයයි කියාද, ඒ රූපයාගේ සංඥාව වන්නේයයි කියාද, ඒ රූපයාගේ නාමය වන්නේයයි කියාද කියනු ලැබේ. (එහෙත්) ඒ රූපයාගේ ව්‍යවහාරය (දැන්) ඇත්තේයයි කියාද, ඒ රූපයාගේ ව්‍යවහාරය (අතීතයෙහි) වූයේයයි කියාද නොකියනු ලැබේ.

9. "යම් වේදනාවක් නූපන්නේ, පහළ නොවූයේ වේද, (එවිට) ඒ වේදනාවේ ව්‍යවහාරය වන්නේයයි කියාද, ඒ වේදනාවේ සංඥාව වන්නේයයි කියාද, ඒ වේදනාවේ නාමය වන්නේයයි කියාද, කියනු ලැබේ. (එහෙත්) ඒ වේදනාවේ ව්‍යවහාරය (දැන්) ඇත්තේයයි කියාද, ඒ වේදනාවේ ව්‍යවහාරය (අතීතයෙහි) වූයේයයි කියාද නොකියනු ලැබේ.

10. "යම් සංඥාවක් නූපන්නේ, පහළ නොවූයේවේද, (එවිට) ඒ සංඥාවේ ව්‍යවහාරය වන්නේයයි කියාද, ඒ සංඥාවේ සංඥාව (හැඳිනීම) වන්නේයයි කියාද, ඒ සංඥාවේ නාමය වන්නේයයි කියාද කියනු ලැබේ. (එහෙත්) ඒ සංඥාවේ ව්‍යවහාරය (දැන්)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇත්තේයයි කියාද, ඒ සංඥාවේ ව්‍යවහාරය (අතීතයෙහි) වූයේයයි කියාද, නොකියනු ලැබේ.

11. "යම් සංස්කාරයක් නූපන්නේ, පහළ නොවූයේ වේද, (එවිට) ඒ සංස්කාරයාගේ ව්‍යවහාරය වන්නේයයි කියාද, ඒ සංස්කාරයේ සංඥාව වන්නේයයි කියාද, ඒ සංස්කාරයේ නාමය වන්නේයයි කියාද, කියනු ලැබේ. (එහෙත්) ඒ සංඥාවේ ව්‍යවහාරය (දැන්) ඇත්තේයයි කියාද, ඒ සංඥාවේ ව්‍යවහාරය (අතීතයෙහි) වූයේයයි කියාද නොකියනු ලැබේ.

12. යම් විඥානයක් නූපන්නේ, පහළ නොවූයේ වේද, (එවිට) ඒ විඥානයාගේ ව්‍යවහාරය වන්නේයයි කියාද, ඒ විඥානයාගේ සංඥාව වන්නේයයි කියාද, ඒ විඥානයාගේ නාමය වන්නේයයි කියාද, කියනු ලැබේ. (එහෙත්) ඒ විඥානයාගේ ව්‍යවහාරය (දැන්) ඇත්තේයයි කියාද, ඒ විඥානයාගේ ව්‍යවහාරය (අතීතයෙහි) වූයේයයි කියාද නොකියනු ලැබේ.

13. "මහණෙනි, යම් රූපයක් උපන්නේ, පහළ වූයේවේද, (එවිට) ඒ රූපයාගේ ව්‍යවහාරය ඇත්තේයයි කියාද, ඒ රූපයාගේ සංඥාව ඇත්තේයයි කියාද, ඒ රූපයාගේ නාමය ඇත්තේයයි කියාද, කියනු ලැබේ. (එවිට) ඒ රූපයාගේ ව්‍යවහාරය (අතීතයෙහි) වූයේයයි කියාද, ඒ රූපයාගේ ව්‍යවහාරය (මතු) වන්නේයයි කියාද, නොකියනු ලැබේ.

14. "යම් වේදනාවක් උපන්නේ, පහළ වූයේ වේද, (එවිට) ඒ වේදනාවේ ව්‍යවහාරය ඇත්තේයයි කියාද ඒ වේදනාවේ සංඥාව ඇත්තේයයි කියාද, ඒ වේදනාවේ නාමය ඇත්තේයයි කියාද කියනු ලැබේ. (එහෙත්) ඒ වේදනාවේ ව්‍යවහාරය (අතීතයෙහි) වූයේයයි කියාද, ඒ වේදනාවේ ව්‍යවහාරය (මතු) වන්නේයයි කියාද නොකියනු ලැබේ.

15. "යම් සංඥාවක් උපන්නේ, පහළ වූයේවේද, (එවිට) ඒ සංඥාවේ ව්‍යවහාරය ඇත්තේයයි කියාද ඒ සංඥාවේ සංඥාව (හැඳිනීම) ඇත්තේයයි කියාද, ඒ සංඥාවේ නාමය ඇත්තේයයි

කියාද කියනු ලැබේ. (එහෙත්) ඒ සංඥාවේ ව්‍යවහාරය (අතීතයෙහි) වූයේයයි කියාද, ඒ සංඥාවේ ව්‍යවහාරය (මතු) වන්නේයයි කියාද නොකියනු ලැබේ.

16. "යම් සංස්කාරයක් උපන්නේ, පහළ වූයේ වේද, (එවිට) ඒ සංස්කාරයේ ව්‍යවහාරය ඇත්තේයයි කියාද, ඒ සංස්කාරයේ සංඥාව ඇත්තේයයි කියාද, ඒ සංස්කාරයේ නාමය ඇත්තේයයි කියාද කියනු ලැබේ. (එහෙත්) ඒ සංස්කාරයේ ව්‍යවහාරය (අතීතයෙහි) වූයේයයි කියාද, ඒ සංස්කාරයේ ව්‍යවහාරය (මතු) වන්නේයයි කියාද නොකියනු ලැබේ.

17. "යම් විඥානයක් උපන්නේ, පහළ වූයේ වේද, (එවිට) ඒ විඥානයාගේ ව්‍යවහාරය ඇත්තේයයි කියාද, ඒ විඥානයාගේ සංඥාව ඇත්තේයයි කියාද ඒ විඥානයාගේ නාමය ඇත්තේයයි කියාද කියනු ලැබේ. (එහෙත්) ඒ විඥානයාගේ ව්‍යවහාරය (අතීතයෙහි) වූයේයයි කියාද ඒ විඥානයාගේ ව්‍යවහාරය (මතු) වන්නේයයි කියාද නොකියනු ලැබේ.

18. "මහණෙනි, (අතීතයෙහිවූ) ශ්‍රමණයන්, බ්‍රාහ්මණයන් සහ ඥාණවන්තයන් විසින් නොවළක්වනු ලැබුවාවූ, අහක නොදමනු ලැබුවාවූ, බැහැර නොකරනු ලැබුවාවූ මේ ව්‍යවහාර, සංඥා හෙවත් නාම තුන (දැනුත්) බැහැර නොකෙරෙත්. (මත්තෙහිත්) බැහැර නොකරන්නාහුය.

"මහණෙනි, උක්කලා ජනපද වාසීවූ අහේතුකවාදී, අකිරියවාදී, (උච්ඡේද) නාස්තිකවාදී වූ යම් ඒ 'වස්සභඤ්ඤ' දෘෂ්ටි ගතිකයෝ දෙදෙනෙක් වෙත්ද, ඔව්හුද මේ ව්‍යවහාර සංඥා සහ නාම තුන බැහැර කළ යුතුයි. ඉවත් කළ යුතුයයි නොසිතූහ. ඊට හේතුව කවරේද? නින්දා අපහාස සහ දෝෂාරෝපණය කිරීමේ භය නිසාය."

**(දසවෙනි නිරුත්තිපථ සූත්‍රය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(උපාය සූත්‍රයද, බීජ සූත්‍රයද, උදාන සූත්‍රයද, උපාදාන සූත්‍රයද, සත්තට්ඨාන සූත්‍රයද, සම්බුද්ධ සූත්‍රයද, පඤ්චවග්ග සූත්‍රයද, මහාලි සූත්‍රයද, ආදිත්ත සූත්‍රය සහ නිරුත්තිපථ සූත්‍රය දැයි, මේ වර්ගයෙහි සූත්‍ර දසයකි.)

**(හයවෙනි උපාය වර්ගය නිමි.)**

---

# 7. අරහන්ත වර්ගය.

## 1. උපාදිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකෙළේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් ධර්මදේශනා කරන සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා සමූහයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි"යි කියායි.

3. "මහණෙනි, තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනුලබන්නේ මාර පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනු නොලබන්නේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි."

"භාග්‍යවතුන් වහන්ස, මා විසින් දැනගන්නා ලදී. සුගතයන් වහන්ස, මා විසින් දැනගන්නා ලදී."

"මහණ, නුඹ මා විසින් කොටින් දේශනා කරන ලද වචනයේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දැනගත්තෙහිද?"

4. "ස්වාමීනි, රූපය වනාහි තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. ගනු නොලබන්නේ මාරයාගේ පුඩුවෙන් මිදුනේ වෙයි.

"වේදනාව තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. ගනු නොලබන්නේ මාරයාගේ පුඩුවෙන් මිදුනේ වෙයි.

"සංඥාව තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. ගනු නොලබන්නේ මාරයාගේ පුඩුවෙන් මිදුනේ වෙයි.

"සංස්කාරයන් තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොගන්නා ලද්දේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි.

"විඥානය තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොගන්නා ලද්දේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ විසින් කොටින් දේශනා කරන ලද මේ වචනයේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දැන ගතිමි"යි කීයේය.

5. "මහණ, ඉතා මැනවි. ඉතා මැනවි මහණ, නුඹ වනාහි මා විසින් කොටින් දෙසනලද ධර්මයේ අර්ථය මනාකොට විස්තර වශයෙන් දැන ගත්තෙහිය.

"මහණ, රූපය වනාහි තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. ගනු නොලබන්නේ මරහුගේ පුඩුවෙන් මිදුනේ වෙයි.

"වේදනාව වනාහි තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. ගනු නොලබන්නේ මරහුගේ පුඩුවෙන් මිදුනේ වෙයි.

'සංඥාව වනාහි තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. ගනු නොලබන්නේ මරහුගේ පුඩුවෙන් මිදුනේ වෙයි.

"සංස්කාරයන් වනාහි තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනුලබන්නේ මරහුගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. ගනු නොලබන්නේ මරහුගේ පුඩුවෙන් මිදුනේ වෙයි.

"විඥානය තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. ගනු නොලබන්නේ මරහුගේ පුඩුවෙන් මිදුනේ වෙයි.

"මහණ, මා විසින් කොටින් දෙසනලද මේ ධර්මයේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දත යුතුයි.

**6.** එකල්හි ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ වචනයට සතුටුවී අනුමෝදන්වී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ, ගෞරවයෙන් ගියේය. අනතුරුව ඒ භික්ෂුතෙමේ හුදකලාවූයේ සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීය්‍ය්‍යීයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ නොබෝ කලකින්ම කුලපුත්‍රයෝ යමක් සඳහා මනාකොට ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවෙත්ද, මාර්ග බ්‍රහ්මචය්‍ය්‍යාව අවසානකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයේදීම තෙමේ විශිෂ්ට ඥානයෙන් අවබෝධකොට, ඊට පැමිණ, වාසය කෙළේය. ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මේ ආත්මභාවයෙහි කළයුතු අනිකක් නැත්තේයයි දැනගත්තේය ඒ භික්ෂු තෙමේ රහතුන්ගෙන් එක්තරා කෙනෙක්ද වූයේය.

**(පළමුවෙනි උපාදිය සූත්‍රය නිමි.)**

---

## 2. මඤ්ඤමාන සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් ධර්මය දේශනා කරන සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා, සමූහයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි" කියායි.

3. "මහණ, තෘෂ්ණා මාන දෘෂ්ටි විසින් හඟිනු ලබන්නේ මරහුගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොහඟිනු ලබන්නේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි."

"භාග්‍යවතුන් වහන්ස, මා විසින් දන්නා ලදී. සුගතයන් වහන්ස, මා විසින් දන්නා ලදී."

"මහණ, නුඹ මා විසින් කොටින් දෙසනලද ධර්මයේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දැන ගත්තෙහිද?"

4. "ස්වාමීනි, රූපය වනාහි තණ්හා මාන දෘෂ්ටි වශයෙන් හඟිනු ලබන්නේ මරහුගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොහඟිනු ලබන්නේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි.

"වේදනාව වනාහි තණ්හා මාන දෘෂ්ටි වශයෙන් හඟිනු ලබන්නේ මරහුගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොහඟිනු ලබන්නේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි.

"සංඥාව වනාහි තණ්හා මාන දෘෂ්ටි වශයෙන් හඟිනු ලබන්නේ මරහුගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොහඟිනු ලබන්නේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි.

"සංස්කාරයන් වනාහි තණ්හා මාන දෘෂ්ටි වශයෙන් හඟිනු ලබන්නේ මරහුගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොහඟිනු ලබන්නේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි.

"විඥානය තණ්හා මාන දෘෂ්ටි වශයෙන් හඟිනු ලබන්නේ මාර පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොහඟිනු ලබන්නේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කොටින් දේශනා කරන ලද ධර්මයේ අර්ථය මම වනාහි මෙසේ විස්තර වශයෙන් දකිමි"යි කීයේය.

**5.** "මහණ, ඉතා මැනවි. ඉතා මැනවි. මහණ, නුඹ වනාහි මා විසින් කොටින් දේශනාකළ දේශනාවේ අර්ථය විස්තර වශයෙන් මනාකොට දැන ගත්තෙහිය.

"මහණ, රූපය වනාහි තණ්හා දෘෂ්ටි මාන වශයෙන් හඟිනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොහඟිනු ලබන්නේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි.

"වේදනාව වනාහි තණ්හා මාන දෘෂ්ටි වශයෙන් හඟිනු ලබන්නේ මරහුගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොහඟිනු ලබන්නේ මාර පුටුවෙන් මිදුනේ වෙයි.

"සංඥාව වනාහි තණ්හා මාන දෘෂ්ටි වශයෙන් හඟිනු ලබන්නේ මරහුගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොහඟිනු ලබන්නේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි.

"සංස්කාර වනාහි තණ්හා මාන දෘෂ්ටි වශයෙන් හඟිනු ලබන්නේ මරහුගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොහඟිනු ලබන්නේ මාර පුඩුවෙන් මිදුනේ වෙයි.

"විඥානය වනාහි තෘෂ්ණා මාන දෘෂ්ටි වශයෙන් හඟිනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් බඳනා ලද්දේ වෙයි. නොහඟිනු ලබන්නේ මාරයාගේ පුඩුවෙන් මිදුනේ වෙයි.

"මහණ, මා විසින් කොටින් දේශනා කරන ලද මේ දේශනාවේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දත යුතුයි." වදාළේය.

**6.** එකල්හි ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුවී, අනුමෝදන්වී, හුනස්නෙන් නැගිට, භාග්‍යවතුන් වහන්සේට වැඳ, ගෞරවයෙන් ගියේය.

අනතුරුව ඒ භික්ෂුතෙමේ හුදකලාව, සමූහයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව, වාසය කරන්නේ නොබෝ කලකින්ම කුලපුත්‍රයෝ යමක් සඳහා මනාකොට ගිහිගෙයින් නික්ම, සස්නෙහි පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව අවසාන කොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයේදීම තෙමේ විශිෂ්ට ඥානයෙන් අවබෝධ කොට, ඊට පැමිණ, වාසය කෙළේය. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. කළ යුත්ත කරන ලදී. මේ ආත්මභාවයෙහි කළයුතු අනිකක් නැත්තේ යයි දැන ගත්තේය. ඒ භික්ෂුතෙමේ වනාහි රහතුන් අතුරෙන් එක්තරා රහත් කෙනෙක් වූයේය.

**(දෙවෙනි මඤ්ඤමාන සූත්‍රය නිමි.)**

---

## 3. අභිනන්දන සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක්හි හුන්නේය. එක්පසෙක්හි හුන්නාවූ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

**2.** "භාග්‍යවතුන් වහන්සේ මට කොටින් ධර්මදෙශනා කරණසේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා සමූහයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව, වාසය කරන්නෙමි" කියායි.

3. "මහණ, තණ්හා, දිට්ඨි, මානයන් කරණකොට අභිනන්දනයෙන් සතුටු වන්නේ මරහුගේ පුඩුවෙන් බැඳෙන ලද්දේ වෙයි. එයින් සතුටු නොවන්නේ මාර බන්ධනයෙන් මිදුනේ වෙයි."

"භාග්‍යවතුන් වහන්ස, මා විසින් දැනගන්නාලදී. සුගතයන් වහන්ස, මා විසින් දැනගන්නාලදැයි" කීයේය.

"මහණ, නුඹ වනාහි මා විසින් කොටින් දේශනා කරන ලද ධර්මයේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දැනගත්තෙහිද?"

4. "ස්වාමීනි, රූපය තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගෙන සතුටුවන්නේ මාරබන්ධනයෙන් බැඳුනේ වෙයි. සතුටු නොවන්නේ මරහුගේ පුඩුවෙන් මිදුනේ නම් වෙයි.

"වේදනාව තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගෙන සතුටු වන්නේ මාරබන්ධනයෙන් බැඳුනේ වෙයි. සතුටු නොවන්නේ මරහුගේ පුඩුවෙන් මිදුනේ නම් වෙයි.

"සංඥාව තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගෙන සතුටු වන්නේ මාර බන්ධනයෙන් බැඳුනේ වෙයි. සතුටු නොවන්නේ මරහුගේ පුඩුවෙන් මිදුනේ නම් වෙයි.

"සංස්කාරයන් තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගෙන සතුටු වන්නේ මාරබන්ධනයෙන් බැඳුනේ වෙයි. සතුටු නොවන්නේ මරහුගේ පුඩුවෙන් මිදුනේ නම් වෙයි.

"විඤ්ඤාණය තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගෙන සතුටු වන්නේ මරහුගේ බන්ධනයෙන් බැඳුනේ නම් වෙයි. සතුටු නොවන්නේ මාරබන්ධනයෙන් මිදුනේ නම් වෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කොටින් දෙසන ලද දේශනාවේ අර්ථය විස්තර වශයෙන් මෙසේ දනිමියි" කීයේය.

5. "මහණ, ඉතා මැනවි. ඉතා මැනවි. මහණ, නුඹ වනාහි මවිසින් කොටින් දෙසනලද ධර්මයේ අර්ථය විස්තර වශයෙන් දැනගත්සේ ඉතා මැනවි.

"මහණෙ, රූපය තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගෙන සතුටුවන්නේ මාරයාගේ පුඩුවෙන් බැඳුනේ නම් වෙයි. සතුටු නොවන්නේ මාරයාගේ පුඩුවෙන් මිදුනේ නම් වෙයි.

"වේදනාව තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගෙන, සතුටු වන්නේ මාරයාගේ පුඩුවෙන් බැඳුනේ නම් වෙයි. සතුටු නොවන්නේ මාරයාගේ පුඩුවෙන් මිදුනේ නම් වෙයි.

"සංඥාව තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගෙන, සතුටු වන්නේ මාරයාගේ පුඩුවෙන් බැඳුනේ නම් වෙයි. සතුටු නොවන්නේ මාරයාගේ පුඩුවෙන් මිදුනේ නම් වෙයි.

"සංස්කාරයන් තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගෙන සතුටු වන්නේ මාරයාගේ පුඩුවෙන් බැඳුනේ නම් වෙයි. සතුටු නොවන්නේ මාරයාගේ පුඩුවෙන් මිදුනේ නම් වෙයි.

"විඥ්ඥාණය තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගෙන සතුටු වන්නේ මාරයාගේ පුඩුවෙන් බැඳුනේ නම් වෙයි. සතුටු නොවන්නේ මාරයාගේ පුඩුවෙන් මිදුනේ නම් වෙයි.

"මහණෙ, මා විසින් කොටින් දේශනා කරණලද මේ ධර්මයේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දතයුතුයයි වදාළේය.

**6.** එකල්හි ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය අසා සතුටුවූයේය. සතුටුව, අනුමෝදන්ව, හුනස්නෙන් නැගිට, භාග්‍යවතුන් වහන්සේට වැඳ, ගෞරවයෙන් ගියේය.

ඉක්බිති ඒ භික්ෂුතෙමේ හුදකළාවූයේ සමූහයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූයේ ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ, නොබෝ කලකින්ම කුලපුත්‍රයෝ යම් අර්ථයක් සඳහා මනාකොට ගිහි ගෙයින් නික්ම සස්නෙහි පැවිදිවෙත්ද, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව අවසානකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයේදීම තෙමේ විශිෂ්ට ඥානයෙන් අවබෝධකොට, ඊට පැමිණ, වාසය කෙළේය. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවනලදී. කළයුත්ත කරනලදී. මේ ආත්මභාවයෙහි කළයුතු අනිකක් නැත්තේයයි දැනගත්තේය.

ඒ භික්ෂුතෙමේ වනාහි රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක්ද වූයේය.

(තුන්වෙනි අභිනන්දන සූත්‍රය නිමි.)

---

## 4. අනිත්‍ය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක්හි හුන්නේය. එක්පසෙක්හි හුන්නාවූ ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකෙළේය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් ධර්මදේශනා කරණසේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා, හුදකලාව සමූහයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි"යි කියායි.

3. "මහණ, යමක් අනිත්‍ය නම් එහි නුඹගේ ආශාව දුරු කටයුතුයි"

"භාග්‍යවතුන් වහන්ස, මා විසින් දැනගන්නාලදී. සුගතයන් වහන්ස, දැනගන්නා ලද්දේය"යි කීයේය.

4. "මහණ, නුඹ මා විසින් ප්‍රකාශකරනලද මේ දේශනාවේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දැනගත්තෙහිද?"

"ස්වාමීනි, රූපය වනාහි අනිත්‍යයි. එහි මා විසින් ආශාව දුරු කටයුතුයි. වේදනාව අනිත්‍යයි. එහි මා විසින් ආශාව දුරු කටයුතුයි. සංඥාව අනිත්‍යයි. එහි මා විසින් ආශාව දුරු කටයුතුයි. සංස්කාරයෝ අනිත්‍යහ. එහි මා විසින් ආශාව දුරු කටයුතුයි.

විඤ්ඤාණය අනිත්‍යයි. එහි මා විසින් ආශාව දුරු කටයුතුයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කොටින් දේශනා කරනලද මේ දේශනාවේ අර්ථය විස්තර වශයෙන් මෙසේ දනිමියි" කීයේය.

**5.** "මහණ, මැනවි, මැනවි. මහණ නුඹ වනාහි මා විසින් සැකෙවින් දේශනා කරනලද ධර්මයේ අර්ථය විස්තර වශයෙන් දැනගත් සේ මැනවි.

"මහණ, රූපය වනාහි අනිත්‍යයි. එහි නුඹගේ ආශාව දුරු කටයුතුයි. වේදනාව අනිත්‍යයි. එහි නුඹගේ ආශාව දුරු කටයුතුයි. සංඥාව අනිත්‍යයි. එහි නුඹගේ ආශාව දුරු කටයුතුයි. සංස්කාරයෝ අනිත්‍යයි. එහි නුඹගේ ආශාව දුරු කටයුතුයි. විඤ්ඤාණය අනිත්‍යයි. එහි නුඹගේ ආශාව දුරු කටයුතුයි.

"මහණ, මා විසින් කොටින් දේශනා කරනලද මේ ධර්මයේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දතයුතුයයි" වදාළේය.

**6.** ඉක්බිති භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගෙන, අනුමෝදන්ව, හුනස්නෙන් නැගිට, භාග්‍යවතුන් වහන්සේට වැඳ, ගෞරවයෙන් ගියේය. ඉක්බිති ඒ භික්ෂුතෙමේ හුදකලාව ජනයාගෙන් වෙන්ව, අප්‍රමාදව, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ නොබෝ කලකින්ම කුලපුත්‍රයෝ යම් අර්ථයක් සඳහා ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවෙත්ද, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව අවසානකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයේදීම තෙමේ විශිෂ්ට ඥානයෙන් අවබෝධකොට ඊට පැමිණ, වාසය කෙළේය. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවනලදී. කළයුත්ත කරනලදී. මින්පසු කළයුත්තක් නැතැයි දැනගත්තේය. ඒ භික්ෂුතෙමේ රහතුන් අතුරෙන් එක්තරා රහත් භික්ෂුවක් වූයේය.

**(හතරවෙනි අනිත්‍ය සූත්‍රය නිමි.)**

---

## 5. දුක්ඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ඒ භික්ෂුතමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකෙළේය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කොටින් දහම් දෙසනසේක්වා. මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා හුදකලාව, සමූහයාගෙන් වෙන්ව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි" කියායි.

3. "මහණෙනි, යමක් දුක නම් එහි තොපගේ ආශාව දුරු කළයුතුයයි වදාළේය."

"භාග්‍යවතුන් වහන්ස, මා විසින් දැනගන්නාලදී. සුගතයන් වහන්ස, මා විසින් දැනගන්නාලදැ"යි කීය.

4. "මහණ, මා විසින් කොටින් කියනලද දේශනාවේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දැනගන්නා ලද්දේද?"

"ස්වාමීනි, රූපය දුකය. එහි මාගේ ආශාව දුරු කළ යුතුය. වේදනාව දුකය. එහි මාගේ ආශාව දුරු කළ යුතුය. සංඥාව දුකය. එහි මාගේ ආශාව දුරු කළයුතුය. සංස්කාරයෝ දුකය. එහි මාගේ ආශාව දුරු කළ යුතුය. විඥ්ඥාණය දුකය. එහි මාගේ ආශාව දුරු කළ යුතුය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් වදාරණලද දේශනාවේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දනිමි"යි කීය.

5. "මහණ, යහපති, යහපති. මා විසින් කොටින් කියන ලද දේශනාවේ අර්ථය විස්තර වශයෙන් නුඹ දැනගත්තෙහිය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණ, රූපය වනාහි දුකය. එහි නුඹගේ ආශාව දුරු කටයුතුයි. වේදනාව දුකය. එහි නුඹගේ ආශාව දුරු කටයුතුයි සංඥාව දුකය. එහි නුඹගේ ආශාව දුරු කටයුතුයි. සංස්කාරයෝ දුකය. එහි නුඹගේ ආශාව දුරු කටයුතුයි. විඥ්ඤාණය දුකය. එහි නුඹගේ ආශාව දුරු කටයුතුයි. මහණ, මා විසින් කොටින් දේශනා කරනලද මේ දේශනාවේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දතයුතුයි."

**6.** එකල ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගෙන අනුමෝදන්ව, හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ, ගෞරවයෙන් ගියේය. ඉක්බිති ඒ භික්ෂුතෙමේ හුදකලාව, ජනයාගෙන් වෙන්ව, අප්‍රමාදව ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ නොබෝ කලකින්ම කුලපුත්‍රයෝ යම් අර්ථයක් සඳහා ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව අවසාන කොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිදීම තෙමේ විශිෂ්ට ඥානයෙන් අවබෝධකොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවනලදී. කළයුත්ත කරනලදී. මින්පසු කළයුත්තක් නැතැයි දැනගත්තේය. ඒ භික්ෂුතෙමේ රහතුන් අතුරෙන් එක්තරා රහත් භික්ෂුවක් වූයේය.

**(පස්වෙනි දුක්ඛ සූත්‍රය නිමි.)**

---

## 6. අනාත්ම සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක.

එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය.

**2.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කොටින් ධර්ම දේශනා කරන සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි"යි කියායි.

**3.** "මහණ, යමක් අනාත්මද එහි නුඹේ ආශාව දුරු කළ යුතුයි."

"භාග්‍යවතුන් වහන්ස, මා විසින් දන්නා ලදී. සුගතයන් වහන්ස, මා විසින් දන්නා ලදී" කීයේය.

"මහණ, නුඹ වනාහි මා විසින් කොටින් කියන ලද දේශනාවේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දැනගත්තෙහිදැ"යි විචාළේය.

**4.** "ස්වාමීනි, රූපය වනාහි අනාත්මයි. එහි මාගේ ආශාව දුරුකළ යුතුය.

වේදනාව අනාත්මයි. එහි මාගේ ආශාව දුරුකළ යුතුය.

සංඥාව අනාත්මයි. එහි මාගේ ආශාව දුරුකළ යුතුය.

සංස්කාරයෝ අනාත්මයහ. එහි මාගේ ආශාව දුරුකළ යුතුය.

විඥානය අනාත්මයි, එහි මාගේ ආශාව දුරුකළ යුතුය.

"ස්වාමීනි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් දේශනා කරන ලද මේ දේශනාවේ අර්ථය විස්තර වශයෙන් මෙසේ දනිමි"යි කීයේය.

**5.** "මහණ, යහපති, යහපති, මහණ, නුඹ වනාහි මා විසින් කොටින් දේශනා කරන ලද මේ දේශනාවේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දැනගත්තේ මැනවයි" වදාළේය.

"මහණ, රූපය වනාහි අනාත්මයි. එහි නුඹේ ආශාව දුරු කළ යුතුයි.

වේදනාව අනාත්මයි. එහි නුඹේ ආශාව දුරුකළ යුතුය.

සංඥාව අනාත්මයි. එහි නුඹේ ආශාව දුරුකළ යුතුය.

සංස්කාරයෝ අනාත්මයි. එහි නුඹේ ආශාව දුරුකළයුතුය.

විඥානය අනාත්මයි එහි නුඹේ ආශාව දුරුකළ යුතුය.

මහණ, මා විසින් කොටින් දේශනා කරන ලද මේ දේශනාවේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දතයුතුය."

**6.** එකල්හි ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුවී අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ, ගෞරවයෙන් ගියේය. අනතුරුව ඒ භික්ෂුතෙමේ හුදකලාවූයේ සමූහයාගෙන් වෙන්ව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ, නොබෝ කලකින්ම කුලපුත්‍රයෝ යමක් සඳහා මනාකොට ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවෙත්ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව අවසානකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයේදීම මෙසේ විශිෂ්ට ඥානයෙන් අවබෝධකොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මේ ආත්මභාවයෙහි කළයුතු අනිකක් නැත්තේයයි දැනගත්තේය. ඒ භික්ෂුතෙමේ රහතුන්ගෙන් එක්තරා රහත් භික්ෂුවක් වූයේය.

**(හයවෙනි අනාත්ම සූත්‍රය නිමි.)**

---

## 7. අනත්තනීය සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

**2.** එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්

වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය. "ස්වාමීනි, මට භාග්‍යවතුන් වහන්සේ කොටින් ධර්මදේශනා කරන සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි"යි කියායි.

3. "මහණ යමක් වනාහි තමා සතු නොවේද, එහි නුඹගේ ආලය දුරු කටයුතුයි" වදාළේය.

"භාග්‍යවතුන් වහන්ස, මා විසින් දන්නා ලදී. සුගතයන් වහන්ස, මා විසින් දන්නා ලදී."

"මහණ, නුඹ වනාහි මා විසින් කොටින් දේශනා කරන ලද මේ දේශනාවේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දැන ගත්තෙහිද?"

4. "ස්වාමීනි රූපය වනාහි තමා අයත් නොවෙයි, එහි මාගේ ආලය දුරු කටයුතුය. වේදනාව තමා අයත් නොවෙයි, එහි මාගේ ආලය දුරු කටයුතුය.

"සංඥාව තමා අයත් නොවේ. එහි මාගේ ආලය දුරුකටයුතුය.

"සංස්කාර තමා අයත් නොවෙත්. එහි මාගේ ආලය දුරු කටයුතුය.

"විඥානය තමා අයත් නොවෙයි. එහි මාගේ ආලය දුරු කටයුතුය කියායි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කොටින් දේශනා කරන ලද මේ දේශනාවේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දැන ගතිමි"යි කීයේය.

5. "මහණ, මැනවි. මැනවි. මහණ නුඹ මා විසින් කොටින් දේශනා කරන ලද මේ දේශනාවේ අර්ථය විස්තර වශයෙන්

දැන ගත්තෙහිය. මහණ රූපය වනාහි තමා අයත් නොවේ. එහි තොපගේ ආලය දුරු කටයුතුය.

වේදනාව තමා අයත් නොවේ. එහි තොපගේ ආලය දුරු කටයුතුය.

සංඥාව තමා අයත් නොවේ. එහි තොපගේ ආලය දුරු කටයුතුය.

සංස්කාරයෝ තමා අයත් නොවෙත්. එහි තොපගේ ආලය දුරු කටයුතුය.

විඥානය තමා අයත් නොවේ. එහි තොපගේ ආලය දුරු කටයුතුයි.

මහණ මා විසින් කොටින් දේශනා කරන ලද මේ දේශනාවේ අර්ථය විස්තර වශයෙන් දත යුතුය"යි වදාළේය.

**6.** එකල්හි ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගෙන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ, ගෞරවයෙන් ගියේය.

අනතුරුව ඒ භික්ෂුතෙමේ හුදකලාව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ නොබෝ කලකින්ම කුලපුත්‍රයෝ යමක් සඳහා මනාකොට ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව අවසාන කොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයේදී තෙමේ විශිෂ්ට ඥානයෙන් අවබෝධකොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මේ ආත්මභාවයෙහි කළයුතු අනිකක් නැත්තේයයි දැන ගත්තේය. ඒ භික්ෂුතෙමේ රහතුන් වහන්සේලාගෙන් එක්තරා රහත් භික්ෂුවක් වූයේය.

**(හත්වෙනි අනත්තනීය සූත්‍රය නිමි.)**

---

## 8. රජනීය සණ්ඨිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කෙළේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් ධර්මදේශනා කරන සේක්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා හුදකලාව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙමි"යි කියායි.

3. "මහණ, යමක් ඇලිය යුතු අයුරෙන් පිහිටියේද එහි නුඹගේ ආලය දුරු කටයුතුයි" කියායි.

"භාග්‍යවතුන් වහන්ස, මා විසින් දන්නා ලදී. සුගතයන් වහන්ස, මා විසින් දන්නා ලදියි" කීය.

"මහණ, නුඹ මා විසින් කොටින් දේශනා කරන ලද මේ දේශනාවේ අර්ථය විස්තර වශයෙන් කෙසේ දැනගත්තෙහිද?"

4. "ස්වාමීනි, රූපය වනාහි ඇලිය යුතු අයුරෙන් පිහිටියේය. එහි මාගේ ආලය දුරු කටයුතුයි.

වේදනාව ඇලිය යුතු ආකාරයෙන් පිහිටියේය. එහි මාගේ ආලය දුරු කටයුතුයි.

සංඥාව ඇලිය යුතු ආකාරයෙන් පිහිටියේය. එහි මාගේ ආලය දුරු කටයුතුයි.

සංස්කාරයෝ ඇලිය යුතු ආකාරයෙන් පිහිටියේය. එහි මාගේ ආලය දුරු කටයුතුය.

විඥානය ඇලිය යුතු ආකාරයෙන් පිහිටියේය. එහි මාගේ ආලය දුරු කටයුතුයි.

ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් කොටින් දේශනා කරන ලද මෙම දේශනාවේ අර්ථය විස්තර වශයෙන් මෙසේ දැන ගත්තෙමි”යි කීය.

**5.** “මහණ, මැනවි. මැනවි. මහණ නුඹ වනාහි මා විසින් කොටින් දෙශනා කරන ලද මේ දේශනාවේ අර්ථය විස්තර වශයෙන් මනාකොට දැන ගත්තෙහිය.

මහණ, රූපය වනාහි ඇලිය යුතු ආකාරයෙන් පිහිටියේය. එහි නුඹේ ආලය දුරු කටයුතුය.

වේදනාව ඇලිය යුතු ආකාරයෙන් පිහිටියේය. එහි නුඹේ ආලය දුරු කටයුතුයි.

සංඥාව ඇලිය යුතු ආකාරයෙන් පිහිටියේය. එහි නුඹේ ආලය දුරු කටයුතුයි.

සංස්කාරයෝ ඇලිය යුතු ආකාරයෙන් පිහිටියේය. එහි නුඹේ ආලය දුරු කටයුතුයි.

විඥානය ඇලිය යුතු ආකාරයෙන් පිහිටියේය. එහි නුඹේ ආලය දුරු කටයුතුය.

මහණ, මා විසින් කොටින් දේශනා කරන ලද මේ දේශනාවේ අර්ථය විස්තර වශයෙන් මෙසේ දත යුතුයි.

**6.** ඉක්බිති ඒ භික්ෂුතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගෙන අනුමෝදන්වී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ, ගෞරවයෙන් ගියේය. අනතුරුව ඒ භික්ෂුතෙම හුදකලාව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීය්‍යීයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරණුයේ, නොබෝ කලකින්ම කුල දරුවෝ යම් අර්ථයක් සඳහා ගිහිගෙයින් නික්ම සස්නෙහි මනාකොට පැවිදිවෙත්ද, මාර්ග බ්‍රහ්මචය්‍යීාව අවසන්කොට ඇති ඒ උතුම්

අර්ථය විශිෂ්ට ඥානයෙන් දැන, ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවූයේය. කළයුත්ත කරන ලදී. මේ ආත්මයෙහි කෙලෙසුන් දුරුකරනු සඳහා කළයුතු අනිකක් නැත. ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන් දැන ගත්තේය. ඒ භික්ෂුතෙමේද රහතුන් වහන්සේලාගෙන් එක්තරා රහත් භික්ෂුවක් වූයේය.

(අටවෙනි රජනීය සණ්ඨිත සූත්‍රය නිමි.)

---

## 9. රාධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. එකල්හි ආයුෂ්මත් රාධ ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් රාධ ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකෙළේය.

"ස්වාමීනි, කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ පුද්ගලයාට මේ සවිඤ්ඤාණක කයෙහිද, බාහිරවූ සියලු ආරම්මණයන්හිද, මමය මාගේය යන හැඟීම් සහිත මානානුසයෝ නොවන්නාහුදැ"යි විචාළේය.

3. "රාධ, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම් වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීතානාගත දැන් පවතින්නාවූ යම්කිසි රූපයක් වේද, ඒ සියලු රූප 'මෙය මාගේ නොවෙයි. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මයද නොවෙයි', කියන මෙය මෙසේ තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දකීද,

"අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීතානාගත දැන් පවතින්නාවූ යම්කිසි වේදනාවක් වේද, ඒ සියලු, වේදනා 'මෙය මාගේ නොවෙයි. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මයද නොවෙයි', කියන මෙය මෙසේ තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දකීද,

"අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම් වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීතානාගත දැන් පවතින්නාවූ යම්කිසි සංඥාවක් වේද, ඒ සියලු සංඥාවෝ 'මෙය මාගේ නොවෙයි. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මයද නොවෙයි', කියන මෙය මෙසේ තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දකීද,

"අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම් වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීතානාගත දැන් පවතින්නාවූ යම්කිසි සංස්කාරයෝ වේද, ඒ සියලු සංස්කාරයෝ 'මෙය මාගේ නොවෙයි. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මයද නොවෙයි', කියන මෙය මෙසේ තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දකීද,

"අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම් වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සියුම්වූ හෝ අතීතානාගත දැන් පවතින්නාවූ යම්කිසි විඥානයක් වේද, ඒ සියලු විඥානය 'මෙය මාගේ නොවෙයි. මේ මම නොවෙමි. මේ මාගේ ආත්මයද නොවෙයි', කියා මෙය මෙසේ තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දකීද,

4. "රාධ, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ පුද්ගලයාට මේ සවිඥානක කයෙහිද, බාහිරවූ සියලු ආරම්මණයන්හිද, 'මමය මාගේය, යන හැඟීම් සහිත මානානුසයෝ නොවෙතියි, වදාළේය..

5. එකල්හි ඒ භික්ෂු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගෙන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන්

වහන්සේට වැඳ ගෞරවයෙන් ගියේය. අනතුරුව ඒ භික්ෂු තෙමේ හුදකලාවූයේ සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ නොබෝ කලකින්ම කුල පුත්‍රයෝ යමක් සඳහා මනාකොට ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව අවසානකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයේදීම තෙමේ විශිෂ්ට ඥානයෙන් අවබෝධ කොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවනලදී. කළ යුත්ත කරන ලදී. මේ ආත්මභාවයෙහි කළ යුතු අනිකක් නැත්තේයයි දැනගත්තේය. ආයුෂ්මත් රාධ ස්ථවිරයන් වහන්සේද, රහතුන්ගෙන් එක්තරා රහත් භික්ෂුවක් වූයේය.

(නව වෙනි රාධ සූත්‍රය 1 නිමි)

---

## 10. සුරාධ සූත්‍රය 2.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක.

2. එකල්හි වනාහි ආයුෂ්මත් සුරාධ ස්ථවිර තෙමේ භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් සුරාධ ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කෙළේය.

"ස්වාමීනි, කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ පුද්ගලයාට මේ සවිඥානක කයෙහිද, බාහිරවූ සියලු ආරම්මණයන්හිද, 'මමය මාගේය' යන හැඟීම් සහිත මානය දුරුවූ ත්‍රිවිධ මානය ඉක්මගියාවූ මනාකොට මිදුනාවූ සිතක් වෙයිද,"

3. "සුරාධ, අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපවූ

හෝ යම්කිසි අතීතානාගත දැන් පවත්නා රූපයක් වෙයිද. ඒ සියලු රූප 'එය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මයද නොවෙයි', කියා මෙසේ එය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දැක දැඩිසේ අල්වා නොගෙන මිදුනේ වෙයිද;

"අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීතානාගත දැන් පවතින්නාවූ යම්කිසි වේදනාවක් වෙයිද,

ඒ සියලු වේදනා 'එය මගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි.' කියා මෙසේ එය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දැක දැඩිසේ අල්වා නොගෙන මිදුනේ වෙයිද,

"අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීතානාගාත දැන් පවතින්නාවූ යම්කිසි සංඥාවක් වෙයිද,

ඒ සියලු සංඥාවෝ 'මෙය මාගේ නොවෙයි එය මම නොවෙමි. එය මාගේ ආත්මයද නොවෙයි', කියා මෙය මෙසේ තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දැක දැඩිසේ අල්වා නොගෙන මිදුනේ වෙයිද,

"අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීතානාගත දැන් පවතින්නාවූ යම්කිසි සංස්කාරයෝත් වෙත්ද, ඒ සියලු සංස්කාරයෝ 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මයද නොවෙයි', කියා මෙය මෙසේ තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දකීද,

"අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ගොරෝසුවූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ සමීපවූ හෝ අතීත අනාගත දැන් පවත්නා යම් කිසි විඥ්ඥාණයක් වේද, ඒ සියලු විඥ්ඥාණ 'එය මාගේ නොවෙයි. එය මම නොවෙමි. එය මාගේ ආත්මයද නොවෙයි', කියා එය මෙසේ තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දැන දැඩිසේ නොගෙන මිදුනේ වෙයිද, සුරාධ,

මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ පුද්ගලයාට මේ සවිඥානක කයෙහිද, බාහිරවූ සියලු ආරම්මණයන්හිද, ‘මෙය මාගේයයි’ හැඟීම් සහිත මතයන් දුරුවූ ත්‍රිවිධ මානය මනාකොට ඉක්මවූ ශාන්තවූ මනාකොට මිදුනාවූ සිතක් වේයයි” වදාළේය.

**6.** එකල්හි ඒ භික්ෂු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්වී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ, ගෞරවයෙන් ගියේය. අනතුරුව ඒ භික්ෂු තෙමේ හුදකලාවූයේ සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ නොබෝ කලකින්ම කුල පුත්‍රයෝ යමක් සඳහා මනාකොට ගිහි ගෙයින් නික්ම සස්නෙහි පැවිදිවෙත්ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව අවසානකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයේදීම තෙමේ විශිෂ්ට ඥානයෙන් අවබෝධ කොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂය විය. බ්‍රහ්ම චර්‍ය්‍යාවෙහි හැසිර නිමවන ලදී. කළ යුත්ත කරන ලදී. මේ ආත්මභාවයෙහි කළ යුතු අනිකක් නැත්තේයයි දැනගත්තේය. ආයුෂ්මත් සුරාධ ස්ථවිර තෙමේද රහතුන්ගෙන් එක්තරා රහත් භික්ෂුවක් වූයේය.

**(දහවෙනි සුරාධ සූත්‍රය නිමි.)**

උපාදි සූත්‍රයද මඤ්ඤමාන සූත්‍රයද, අභිනන්දන සූත්‍රයද, අනිත්‍යය සූත්‍රයද, දුක්ඛ සූත්‍රයද, අනාත්ම සූත්‍රයද, අනත්තනීය සූත්‍රයද, රජනීය සණ්ඨිත සූත්‍රයද, රාධ සූත්‍රයද, සුරාධ සූත්‍රයද, වෙත්.

**(හත්වෙනි අරහන්ත වර්ගය නිමි.)**